# සතිපට්ඨාන භාවනා විවේචනය
## සහ
# තවත් කෘති

(පස්වන වන මුද්‍රණය)

මහාචාර්ය

**රේරුකානේ චන්දවිමල**

(සාහිත්‍ය චක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද,
අමරපුර මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)
මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්
සම්පාදිතයි.

සංස්කරණය:

**සී. තනිප්පුලි ආරච්චි**

ප්‍රකාශනය:

**ශ්‍රී චන්දවිමල ධර්මපුස්තක සංරක්ෂණ මණ්ඩලය**

ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථන : 034-2263958
ෆැක්ස් : 034-2265251

2552
2008

*Non-Commercial Distribution*

# පටුන


පෙරවදන vii

**සතිපට්ඨාන භාවනා විවේචනය 12**

නිදනය 13
සම්‍යක් සමාධිය හා මිථ්‍යා සමාධිය 24
භාවනා කරන්නවුන්ට වන අපහසුකම් 27
භාවනාව හා රෝග 31
සමාධිය හා ශරීර පාලනය 40
සමථය හා විදර්ශනාව 42
බුද්ධ දේශනාවට අනුකූල බව 47
භාවනාව පිළිබඳ විවිධ මත 49
සතිපට්ඨාන විපස්සනා භාවනාව 55

**පූජාවාද නිරාකරණය 61**

පින්පව් 64
බුද්ධ පූජාව 65
වරකට මැටි ගොඩක් වරකට බුදුවීම 70
ප්‍රතිපත්ති පූජාව 70
විහාර වල පින්පෙට්ටි 73
පන්සල හා බුදු සසුන 74
ධර්ම පූජාව 75

**ස්වර්ණමාලී චූඩා මාණික්‍ය වර්ණනාව හා විනයාලංකාර මාහිමි චරිතය 79**

සංඥාපනය 81
රුවන්වැලි මහ සෑ චූඩා මාණික්‍ය විස්තරය 83
විනයාලංකාර නාහිමි චරිතය 92
මහනුවර අභිනව දළඳ මැදුර 106


*Non-Commercial Distribution*

**ශ්වේජින් නිකාය** 109
ප්‍රාරම්භය 111
ශ්වේජින් නිකායේ ආරම්භය 112
ශ්‍රී ලංකාවට ශවේජින් ආභාෂය 115
ශ්‍රී ලංකාවට ශ්වේජින් නිකාය පැමිණීම 116
ප්‍රථම සීමා සම්මුතිය 118

**සඟරුවන** 123
ධර්ම විජය පුවත් ලිපි 125
රිවිරැස පුවත් ලිපිය 158
ජාතිය පුවත් ලිපිය 164

**විනයාලංකාර සම්ප්‍රදය** 171
විහාර කර්මාන්ත පුණ්‍යානුමෝදනාව 173

(මේ මාතාකාව සම්පූර්ණ වීම සඳහා
ථේරුකානේ නාහිමියන්ගේ පහත සඳහන්
පොත්වල අදාල ලිපි කියවන්න.)

**අභිධම්මයේ මූලික කරුණු** - අභිධර්මය පසුකාලීනද?
**පටිච්ච සමුප්පාද විවරණය** - අන්තරාභවය හා පුනර්භවය
**බෝධි පූජාව** - ධර්ම චක්‍රය.
**පාරමිතා ප්‍රකරණය** - පඤ්චශීලය හා ආජීවාෂ්ටමක ශීලය

*Non-Commercial Distribution*

## දහම් පොත් සංරක්ෂණ මණ්ඩලයෙන් ප්‍රකාශිත
## රේරුකානේ නාහිමියන්ගේ පොත් සහ වෙනත් පොත්

**විනය ග්‍රන්ථ**

ශාසනාවතරණය
විනය කර්ම පොත
උපසම්පදා ශීලය
උභය ප්‍රාතිමෝක්ෂය (අනුවාද සහිත)

**අභිධර්ම ග්‍රන්ථ**

අභිධර්ම මාර්ගය
අභිධර්මයේ මූලික කරුණු
පට්ඨාන මහා ප්‍රකරණ සන්නය
අනුවාද සහිත අභිධර්මාර්ථ සංග්‍රහය

**භාවනා ග්‍රන්ථ**

විදර්ශනා භාවනා ක්‍රමය
පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය
චත්තාලීසාකාර මහා විපස්සනා භාවනාව
සතිපට්ඨාන භාවනා විවේචනය හා වෙනත් කෘති

**ධර්ම ග්‍රන්ථ**

චතුරාර්‍ය සත්‍යය
පාරමිතා ප්‍රකරණය
බෝධිපාක්ෂික ධර්ම විස්තරය
පටිච්ච සමුප්පාද විවරණය
ධර්ම විනිශ්චය
බෞද්ධයාගේ අත් පොත
මංගල ධර්ම විස්තරය
පුණ්‍යෝපදේශය
සූවිසි මහා ගුණය
පොහොය දිනය
කෙලෙස් එක්දහස් පන්සියය
චෛතසික ධර්ම හා චිත්තෝපක්ලේශ ධර්ම
බුද්ධනීති සංග්‍රහය
නිර්වාණ විනිශ්චය හා පුනරුප්පත්ති ක්‍රමය
බෝධි පූජාව
Four Noble Truths (චතුරාර්‍ය සත්‍යය පරිවර්තනය.)

**වෙනත්**

මෙකල නිවුණු ඇත්තෝ
(නාහිමි චරිත වත හා අනුමෙවෙනි දම් දෙසුම් 15 ක්.)
සූරාධූර්තය හෙවත් මද්‍යලෝලය (වෛද්‍ය නීල් කෙසල් - පරිවර්තන)
බුදුසසුන පුබුදු කළ ශ්‍රී ලංකා ශ්වෛජින් නිකාය සියවස (ශාස්ත්‍රීය සමරු කලාපය)

---

විමසීම් :- ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක සංරක්ෂණ මණ්ඩලය,
ශ්‍රී විනයාලංකාරාරාමය, පොකුණුවිට.
දුරකථනය : 034-2263958, (2263979) ෆැක්ස් : 034-2265251

*Non-Commercial Distribution*

# පෙර වදන

බුරුම ජාතික **ඌ. විනයාලංකාර** හිමිපාණන් ලක්දිව සැපත් වූයේ මෙහි නැවතීමේ අදහසකින් නොවේ. එකල ලංකාවේ වෙහෙර විහාර වන්දනාව සඳහා පැමිණි බොහෝ විදේශිකයන් අතර උන් වහන්සේ ද කෙනෙකි. (විස්තර ඇතුළත ලිපිවල පලවේ) ඒ විසිවන සියවසේ මුලම ය. ක්‍රි. ව. 1901 දී ය. වස් කාලයේ වස් වසමින් හා රුවන් වැලි මහ සෑ ප්‍රතිසංස්කරණාදි කටයුතුවලට සහාය වෙමින් පයින් ම ගමන් කරමින් දීර්ඝ වන්දනා ගමනක යෙදී ශ්‍රීපාද වන්දනාවෙන් පසු ආපසු සිය රට බලා වඩනා උන් වහන්සේ පොකුණුවිට ප්‍රදේශයේ නවාතැන් ගැනීම ශ්‍රී ලංකා බෞද්ධයන්ගේ භාග්‍යයකි.

එවකට නිකායත්‍රය තුළ ක්‍රියාත්මක වූ භේදකර ගති ලක්ෂණ වලින් කම්පිතව සිටි බෞද්ධයන්ට බුරුම හිමියන්ගේ පැවතීම් කොතරම් සිත් ගත්තේ ද යත්, උන් වහන්සේ නවතාගෙන මහා පින්කම් කිරීමටත්, කුල දරුවන් පැවිදි කිරීමටත්, පටන් ගත්තෝ ය.

පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේ සීමා බන්ධනය කර, 27 නමක් පැවිදි කිරීමෙන් ආරම්භ වූ ශ්‍රී විනයාලංකාර වංශය අද දක්වා සදහනට කර ඇති සේවය අගය කිරීම, ලිහිල් බසින් දහම් පොත් රැසක් ලියා 2500 බුද්ධ ජයන්තිය වෙනුවෙන් අති විශාල සේවයක් කර අපවත් වී වදළ රේරුකානේ චන්දවිමල නාහිමිපාණන් ගේ අභාවයෙන් දෙවන සංවත්සර පිංකමේ අංගයක් සේ ඉටු කිරීම සුදුසු යයි සිතුවෙමු.

අංගුත්තර නිකායේ නවක නිපාතයේ නවංගුපෝසථ සූත්‍රය අනුව අටසිල්හි හා මෛත්‍රී භාවනාවේ යෙදවූ නවාංග උපෝසථ ශීලය සමාදන් කරවීමෙන් බුරුම හිමියන් කළ ශාසන සේවය ඉවසිය නොහැකිව වාදකරුවන් එවීමෙන් හා **'නවංග උපෝසථය'** නමින් 1905 දී විවේචන පොතක් පළ කර වීමෙන් ලාංකික භික්ෂූන් වහන්සේගේ පළමු ප්‍රහාරය බුරුම හිමියන්ට විරුද්ධව එල්ල විය.

උන් වහන්සේ තමන්ට ලැබුණු පිරිකරාදිය පිරිනමා, දීමට සැලසූ මහා දනට නො වැඩීමෙන් දෙවන විරෝධතාවය එල්ල කළ නමුත්

Non-Commercial Distribution

**වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමියන්** ඉදිරිපත්ව සියක් නමක් වඩමවා ඊට සහාය දීමෙන් එම අභියෝගය ද ජය ගන්නට විනයාලංකාර හිමියන්ට හැකි විය.

මහනුවර යුගයේ ශාසන පරිහානියෙන් පසුව සරණංකර සංඝරාජ හිමියන්ගේ උත්සාහයෙන් ලක්දිව යළි භික්ෂු ශාසනය පිහිටවූ නමුත් ප්‍රතිපත්තිය අභිභවා ආමිෂය පමණක් මතු වී පැවැත්තේය. ශ්‍රද්ධාවෙන් ආමිෂ පූජාවේ යෙදෙන අතර ඊට වැඩි උනන්දුවකින් ප්‍රතිපත්ති ශාසනය ආරක්‍ෂා කිරීමේ වැදගත්කම සලකා බුරුම ජාතික භික්‍ෂූන් වහන්සේ ප්‍රචලිත කළ භාවනා මාර්ගයට විරුද්ධව තෙවන අභියෝගයක් ද එල්ල විය. '**බෞද්ධ භාවනා ක්‍රමය හා අළුත් බුරුම භාවනාව**' නමින් 1958 දී උගත් ධර්මධර නාහිමිවරුන්ගේ ලිපි ඇතුලත් පොතක් පල කිරීමෙන් මේ විරෝධතාව දැඩිව එල්ල කරන ලදී. භාවනා මධ්‍යස්ථාන 'සෝවාන් පැක්ටරි' නමින් හැඳින්වූ **එම පොත රේරුකානේ නාහිමියන්ගේ භාවනා පොත් ද ඊට අනුබල දෙතියයි නිර්දය විවේචනයට ලක් කළහ**. (මේ සතිපට්ඨාන භාවනා විවේචනය ලියවුණේ ඊට පිළිතුරු වශයෙනි.)

මේ සියලු විරෝධතා වලට කරුණු සහිතව පිළිතුරු දීමෙන් හා නොබියව සසුන් කටයුතු වල යෙදීමෙන් කලක් යන විට සත්‍ය පැහැදිලි කිරීමට හැකි විය. හුදු තම ක්‍රියා මාර්ග සසුනේ පැවැත්මට මිස ලාභ සත්කාර ලැබීමේ මඟක් නොවන බව අල්පේච්ඡ ජීවිකාවෙන් තහවුරු කළ විනයාලංකාර පරපුර ක්‍රමයෙන් සියල්ලන්ගේ ප්‍රසාදයට පත් වූහ.

ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා, ටිබෙට් ජාතික ඇස්. මහින්ද හිමි ආදීන් කළ ජාතික ආගමික මෙහෙවරට නොදෙවෙනි ශාසන පුනරුදයක් කළ විනයාලංකාර හිමියන්, අල්පේච්ඡව හා නිශ්ශබ්දව තම කටයුතු කළ නිසාම ඉතිහාසයේ සටහන් නොවීය. **රුවන්වැලි සෑ චූඩාමාණික්‍ය සැපයීම**. **ශ්‍රී දළදා මාළිගයට විහාර මන්දිරයක් තැනීම**. උන් වහන්සේ නිසා **භාවනා ක්‍රම ප්‍රචලිත වීම** තුළ ඇති වූ සසුන් දියුණුව එසේ අමතක කළ හැකි නොවේ. උන් වහන්සේගේ සිසු පරපුරින් ඇති වූ ශාසන දීපක කටයුතු අතර **භාවනා මධ්‍යස්ථාන සහ රේරුකානේ මහ නාහිමියන්ගේ දහම් පොත් සම්පාදනය** ද විශේෂ ස්ථානයක් ගනී.

ඒ අතරම මිෂනාරී අධ්‍යාපනයෙන්, දේශීයත්වය අමතක කර. බුද්ධාගමත්, ජාතිකත්වයත් හෑල්ලුවට ලක් කරන්නවුනට පිළිතුරු දෙන්නටත්, ඒ සඳහා දේශීය උගතුන් ඇති කරගත් සංවිධානයන්ට උදව් දෙන්නටත් විනයාලංකාර පරපුර කටයුතු කර ඇති බව රේරුකානේ

*Non-Commercial Distribution*

නාහිමියන් **ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ශ්‍රීමතාණන් පිහිටවූ සිංහල මහා සභාවට** ප්‍රාදේශීයව උදව් කිරීමෙන් හා **සංඝරත්නය** නමින් '**ධම්විජය**' පුවත් පතට 1955 දී ලියූ ලිපි වලින් හා '**ජාතිය**' පුවත් පතට ලියූ ලිපිවලින් පෙනේ.

මෙම පරපුරේ විශේෂ සේවාවක් කළ හිමිවරුන් වශයෙන් **අරංගල සිරිධම්ම, උඩුවේ විමලරංසි, කහටපිටියේ සුමතිපාල, දෙවිනුවර ඤාණාවාස, රේරුකානේ අරියඤාණ, ඇම්. යූ. ශ්‍රී කවීශ්වර, රේරුකානේ චන්දවිමල** ආදී නාහිමිවරුන් සටහන් කළ හැකිය. එයිනුත් වඩා ප්‍රකට වන්නේ ජාතියට හා ආගමට වන සියලු අභියෝගයන්ට නොබියව පිළිතුරු දෙමින් ජනතාව අතර බුද්ධ ධර්මය ගැන හැඟීමක් ඇති කිරීමට මහත් උත්සාහයක යෙදුණු රේරුකානේ චන්දවිමල නාහිමියෝය. උන් වහන්සේගෙන් පසු මහා නායක ධුරයට පත් **හේනේගම කල්‍යාණසිරි** නාහිමියන් ද එය තහවුරු කරන්නට මහත් උත්සාහයක් ගනිති.

විදේශිකයන්ට නතු වීමේ සිට 20 වන සියවසේ මුල්භාගය දක්වා විදේශිකයන්ගේ ගැහැටට ලක්වූ බුදුසමය ඉන්පසු තවමත් නිසි සැලකිල්ල නො ලබා දුෂ්කරව රැකෙන බව නො රහසකි. අප රටේ අනන්‍යතාව රැකෙන එක් අංගයක් වූ බුද්ධාගම ඊට නිසි අයුරින් පෝෂණය කිරීමේ වගකීම දරණ අමාත්‍යාංශයක් පවා තිබුණ ද, පැවරෙන අභියෝගය භාර ගන්නට තරම් සවිමත් මානසිකත්වයක් වගකිව යුත්තන් තුළ නොතිබීම නිසාදෝ බුද්ධාගමත්, භික්ෂූන් වහන්සේත් ඔවුන් තුළම හැල්ලුවට ලක්වනු කොතෙකුත් දක්නට ලැබේ. සිංහල බෞද්ධයින් වශයෙන් අන්‍යාගම්වලට හා ජාතිකත්වයට ගරු කරන මුත් අපේ ම ආගම හා ජාතිය පිළිබඳව හැල්ලුවෙන් සිතීම ජාතික අභාග්‍යයකි. **විවිධාකාරයෙන් බෙදී සිටින භික්ෂූන් වහන්සේත්, දේශපාලන නායකයනුත් නිසා සියලු අනන්‍යතා නසා ගත්තා ජාතියක් බවට පත්ව සිටින අප ලාංකිකයන් වශයෙන් සමගි වීමේ අගය වටහා ගන්නේ කවදා ද?**

මේ පොත **විනයාලංකාර ගමන් මග** නමින් මුද්‍රණය කිරීම අපේ මුල් අදහස විය. එහෙත් රේරුකානේ නාහිමියන් ලියූ පොත් හා ලිපි කීපයක එකතුවක් නාහිමියන්ගේ නමින්ම මුද්‍රණය කරන විට එසේ වෙනස් නමක් ආරූඪ කිරීම අයෝග්‍යයයි කල්පනා කර, මෙනමින් මුද්‍රණය කළෙමු. කෙසේ නමුත් මේ සියලු කෘතිවලින් පිළිබිඹු වන්නේ 'විනයාලංකාර ගමන් මග' බව පැහැදිලිය.

විනයාලංකාර හිමියන් ප්‍රමුඛ එම පරපුරෙන් වූ ප්‍රධාන සේවාවන් අතර ප්‍රතිපත්ති ශාසනය ඉස්මතු කිරීම (භාවනා හා ශීල සමාදනය) දළද

Non-Commercial Distribution

මැදුරේ සංවර්ධනය, රුවන්වැලි සෑයෙහි සංවර්ධනය, ජාතික ආගමික කටයුතු පිළිබඳ උද්යෝගය, දහම් පොත් පත් සැපයීම ප්‍රධාන වශයෙන් අගය කළ හැකිය.

මේ පළ කිරීම විනයාලංකාර පරපුරටත්, රේරුකානේ නාහිමියන්ටත් ප්‍රණාමයක් වේවා. විනයාලංකාර ගමන් මග ශ්වේජින් නිකායික භික්ෂූන් වහන්සේට ආදර්ශයක් වේවා. සියලු බොදුනුවන්ගේ සත්‍යාවබෝධයට උපකාරයක් වේවා.

මේ සංග්‍රහය සකස් කිරීමේ ලා මා උනන්දු කර වූ රේරුකානේ මහ නාහිමියන් ගත් ආගමික ක්‍රියාමාර්ග තවදුරටත් සරු කොට තහවුරු කරන්නට මහත් උත්සාහයක යෙදෙන විහාරාධිපති කිරිඔරුවේ ධම්මානන්ද හිමියන්ටත්, සෝදුපත් කියවූ මාලනීටත්, සංශෝධිත පිටු සැකසීමේදී පරිගණක අකුරු ලංකළ හොරණ රූ මායා ග්‍රැෆික් හි සාලිය ජයකොඩි මහතාටත්, මුද්‍රණයෙන් සහාය වූ සිකුරු ප්‍රකාශක ගිහාන් අනුරංග ජයවර්ධන මහතා ඇතුළු කාර්‍යය මණ්ඩලයටත් ස්තුති වන්ත වෙමි.

**තිසරණ සරණයි!**

**සී. තනිප්පුලි ආරච්චි**
ගරු ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්මපුස්තක
සංරක්ෂණ මණ්ඩලය

2008 ජූලි මස 26 වන දින,
පොකුණුවිටදී ය.

*Non-Commercial Distribution*

# සතිපට්ඨාන භාවනා විවේචනය

ප්‍රථම මුද්‍රණය - 1958

*Non-Commercial Distribution*

# නිදානය

## මේ පොත ලියූයේ කුමටද?

මා විසින් මේ පොත ලියූයේ භාවනා මධ්‍යස්ථානයක් අල්ලා ගැනීමේ අදහසින් ද නොවේ. අපට ඇති භාවනා මධ්‍යස්ථානයක් අන්‍යයන් අල්ලා ගනිතිය යන බිය නිසාත් නොවේ. අපට භාවනා මධ්‍යස්ථාන නැත. අප විසින් මේ භාවනාව පුහුණු කරවන පිරිසක් අනුන් අල්ලා ගනිත්ය යන බිය නිසාත් නොවේ. අප විසින් මේ භාවනාව කාටවත් පුහුණු කරවන්නේත් නැත. අළුත් දයක පිරිසක් අල්ලා ගැනීමටත් නොවේ.

මේ භාවනාව ප්‍රචාරය කරන **මහාසී** තෙරුන් වහන්සේ හා අපගේ ඇති සම්බන්ධයක් නිසා ද නොවේ. ඒ තෙරුන් වහන්සේ හා මා කතාකර ඇත්තේ එක් දිනයක් පමණෙකි. මේ භාවනාව පුහුණු කරවන භාවනා මධ්‍යස්ථානයන් හා අප අතර ඇති සම්බන්ධයක් නිසා ද නොවේ. මේ භාවනාව කරවන පුද්ගලයන් හා අපේ ඇති මිත්‍ර කමක් නිසා ද නොවේ. යම් කිසිවකු විසින් කරන ලද ආරාධනාවක් හෝ පෙළඹවීමක් නිසා ද නොවේ. මේ භාවනාවට විරුද්ධ අය හා අපගේ ඇති වෛරයක් නිසා ද නොවේ. ඒ අයට රිදවීමේ අදහසින් ද නොවේ.

මේ විවේචනයෙන් සමහරුන් ගේ සිත් රිදෙන්නටත් බැරි නැත. එසේත් නො වන පරිදි විවේචනයක් කිරීම අපහසු ය. කිසිවකුගේ නම් ගම් මෙහි සඳහන් කර නැත. එසේ කරන ලද්දේ ද හැකිතාක් අනුන්ගේ සිත් රිදවීමෙන් වළකිනු පිණිස ය.

කාලාන්තරයක් යටපත් වී තුබූ මේ භාවනා ක්‍රමය බුද්ධ ජයන්ති කාලයේ අප රටට පැමිණීමෙන් සිදු වූයේ ඉමහත් යහපතකි. දැනට මේ භාවනා ක්‍රමය පවත්නේ සුළු පිරිසක් අතේ ය. බලවතුන්

Non-Commercial Distribution

නඟන ප්‍රශ්නවලට සෑහෙන පිළිතුරු දීගන්නට ඒ අය අසමර්ථ වුව හොත් සමහර විට මේ උතුම් භාවනා ක්‍රමය නැවතත් අප රටෙන් තුරන් වන්නට ඉඩ තිබේ. එසේ වුව හොත් අනාගත පරම්පරාවට ඉමහත් පාඩුවකි. මා විසින් මේ පොත ලියූයේ මේ භාවනා ක්‍රමය මේ රටෙන් තුරන් නොවී දීඝී කාලයක් පැවතීම පිණිසය.

මීට - ශාසනස්ථිකාමී,

**රේරුකානේ චන්දවිමල ස්ථවිර**

01-12-58
පොකුණුවිට
ශ්‍රී විනයාලංකාරාරාමයේදී ය.

*Non-Commercial Distribution*

# සතිපට්ඨාන භාවනා විවේචනය

නමෝ තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

**තස්මා තිහ ත්වං බාහිය! ආදිමෙව විසොධෙහි කුසලෙසු ධම්මෙසු. කොචාදි කුසලානං ධම්මානං? සීලඤ්ච විසුද්ධං දිට්ඨී ච උජුකා. යතො බො තෙ බාහිය සීලඤ්ච විසුද්ධං භවිස්සති දිට්ඨී ච උජුකා, තතො ත්වං බාහිය සීලං නිස්සාය සීලෙ පතිට්ඨාය චත්තාරො සතිපට්ඨානෙ භාවෙය්‍යාසි.**

(සතිපට්ඨාන සංයුත්ත)

**තේරුම :–**

බාහියය! එසේ නම් කුශල ධර්මයන් කෙරෙහි මුලම පිරිසිදු කර ගනුව. කුශල ධර්මයන්ගේ මුල කවරේද? පිරිසිදු ශීලයත් ඍජු වූ දෘෂ්ටියත් ය. බාහියය! යම් කලෙක නුඹට පිරිසිදු ශීලයත් ඇද නැති දෘෂ්ටියත් ඇතිවන්නේ ද එතැන් පටන් නුඹ ශීලය නිසා ශීලයෙහි පිහිටා සතර සතිපට්ඨානයන් භාවනා කරන්නෙහි ය.

**යෙ තෙ භික්ඛවෙ! භික්ඛූ නවා අචිරපබ්බජිතා අධුනාගතා ඉමං ධම්මවිනයං තෙ වො භික්ඛවෙ! භික්ඛූ චතුන්නං සතිපට්ඨානානං භාවනාය සමාදපෙතබ්බා නිවෙසෙතබ්බා පතිට්ඨාපෙතබ්බා**

(සතිපට්ඨාන සංයුත්ත)

**තේරුම :**

මහණෙනි! ළඟදී පැවිදි වූ ළඟදී මේ සස්නට ආවා වූ යම් ඒ අලුත් භික්ෂූහු වෙත් නම්, තොප විසින් ඒ භික්ෂූහු සතර සතිපට්ඨානයන් භාවනා කිරීමෙහි යෙදවිය යුත්තාහු ය, පිහිට විය යුත්තාහුය.

Non-Commercial Distribution

**චතුසු භික්ඛවෙ! සතිපට්ඨානෙසු සුපපතිට්ඨිත චිත්තා විහරථ**

(සතිපට්ඨාන සංයුත්ත)

**තේරුම:**

මහණෙනි! සතර සතිපට්ඨානයන්හි මනා කොට පිහිටුවා ගත් සිත් ඇතිව වාසය කරව්.

මේ සූත්‍ර ධර්මවලින් දැක්වෙන්නේ එක් එක් පුද්ගලයකු විසින් සතිපට්ඨාන සතර ම භාවනා කළ යුතු බව ය. තවත් සූත්‍ර බොහෝ ගණනක ම එක වර ම සතිපට්ඨාන සතර ම භාවනා කළ යුතු බව හා එසේ කිරීමෙන් ලැබෙන අනුසස් ද වදරා තිබේ.

**යො හි කොචි භික්ඛවෙ! ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තවස්සානි තස්ස දිට්ඨානං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං, දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා, සති වා උපාදිසෙසෙ අනාගාමිතා**

යනාදීන් මහා සතිපට්ඨාන සූත්‍රයෙහි සත් වස පටන් සත් දවස දක්වා ඒ ඒ කාල පරිච්ඡේදයන්හි භාවනා කිරීමෙන් ඒ ආත්ම භාවයේ දී ම මගපල ලැබෙන බව දක්වා වදරා ඇත්තේ ද ආනාපානාදි එක් භාවනාවක් කිරීමෙන් නොව සතිපට්ඨාන සතර ම භාවනා කිරීමෙන් ය.

නොයෙක් සූත්‍රවල සතර සතිපට්ඨාන භාවනාවක් දැක්වෙන තුමුත් ඒ භාවනාව කළ යුතු ආකාරය පැහැදිලි ලෙස විස්තර කර ඇති සූත්‍ර ධර්මයක් නැත්තේ ය. **විශුද්ධිමාර්ගයෙහි ද** ඒ ගැන කිසිවක් සඳහන් කර නැත්තේ ය. අන් අටුවාවක ද එය විස්තර කර නැත.

අලුත පැවිදි වූ කුලපුත්‍රයන් සතර සතිපට්ඨාන භාවනාවෙහි යෙදවිය යුතු බව වදරා තිබීමෙන් සිතන්නට ඇත්තේ පෙර බුද්ධ කාලයෙහි හා එයට සමීප අතීත කාලයෙහිත් විසූ භික්ෂූන් වහන්සේලා සැම දෙන ම සතර සතිපට්ඨානය භාවනා කරන සැටි දැන සිටින්නට ඇතය කියා ය. හැම දෙන ම දන්නා ප්‍රසිද්ධ කරුණු පොතපතට ඇතුළු කිරීමෙන් වැඩි ප්‍රයෝජනයක් නැති නිසා

Non-Commercial Distribution

අතීතයේදී සතර සතිපට්ඨාන භාවනාව කළ යුතු ආකාරය ගැන විස්තරයක් පොත පතට ඇතුළු නො කළා විය හැකි ය.

සතර සතිපට්ඨාන භාවනාව ගැන බුද්ධ දේශනාවෙහි නොයෙක් තැන්වල සඳහන් වන බැවින් ඒ භාවනාව කරන ක්‍රමය ගැන කලක් ම අපි විමසිල්ලෙන් විසුවෙමු. ඒ ගැන දන්නා එක ද යෝගාවචරයෙක් අපට මුණ නො ගැසින. පසුගිය කාලයේදී **බුද්ධරක්ඛිත** නමැති වංග භික්ෂුවක් අප වෙත පැමිණ, අභිධර්මය උගෙන, භාවනා පුහුණු කිරීම සඳහා බුරුමයට ගියේ ය. බුරුම යෙහි සුප්‍රසිද්ධ කර්මස්ථානාචාර්යවරයකු වන **මහාසි** තෙරුන් වහන්සේ වෙත එළඹ, කමටහන් පුහුණු කළ ඒ වඞග භික්ෂුව විසින් මහාසි තෙරුන් වහන්සේ විසින් බුරුම බසින් සම්පාදනය කර තුබූ විදර්ශනා භාවනා ක්‍රමය නමැති පොත අප වෙත එවන ලදී. එය පිටු 800 ක් පමණ ඇති විශාල ග්‍රන්ථයෙකි. එහි විස්තර කර තුබුණේ සතර සතිපට්ඨාන භාවනාව ය. එයින් අපි සතර සතිපට්ඨානයන් භාවනා කළ යුතු සැටි දැනගතිමු.

මහාසි තෙරුන් වහන්සේගේ භාවනා පොතෙහි දක්වා ඇත්තේ දැනට ඇතමුන් විසින් **"අලුත් බුරුම භාවනාවය"** යි නම් කොට නින්ද කරන, විවේචනය කරන, වාද කරන උදර මාංසයේ පිම්බීම හැකිලීම සිහි කිරීම මුල්කොට කරන භාවනාව ය. ඒ පොත කියවීමේදී එහි දැක්වෙන උදරයේ පිම්බීම් හැකිලීම් දෙක සිහි කරමින් විසීම ගැන තුබූ අනුශාසනය ගැන අපට ද විමති ඇති විය. අන්කිසි පොතක එබඳු භාවනාවක් ගැන සඳහන් වී තුබුණා නුදුටු බැවින් එය දුටු සැටියේ නම් අපට ද පිළිගත නො හැකි විය. එහෙත් යමක් එක වරට ම අත්හැර නො දමා වැඩිදුර විමසීම අපගේ සිරිතක් වූ බැවින් ඒ පොත අවසන් වන තුරු ම කියවූයෙමු. ඇතැම් ස්ථාන කීප වාරය බැගින් ද කියවා බැලීමු.

පරීක්ෂාකාරීව පොත කියවා බැලූ පසු පිම්බීම් හැකිලීම් පිළිබඳ භාවනාව ගැන අපට ඇති වූ අප්‍රසන්න භාවය දුරු විය. වැඩිදුරටත් විමසීම් වශයෙන් අපි ද ඒ භාවනාව පුරුදු කර බැලූ වෙමු. ඉන් පසු අප දැන සිටින විදර්ශනා ක්‍රම අතුරෙන් ඉක්මනින්

Non-Commercial Distribution

ඵල ලැබිය හැකි හොඳ ම විදර්ශනා ක්‍රමය මහාසි තෙරුන් වහන්සේ ගේ පොතේ දැක්වෙන ක්‍රමය බව අපට අවබෝධ විය.

යුද්ධ දුර්භික්ෂාදි අන්තරායයන් නිසා අප රටේ බුදුසස්න වරින් වර පිරිහී ගියේ ය. ඒ නිසා මේ සතිපට්ඨාන භාවනා ක්‍රමයත් අප රටෙන් තුරන් වන්නට ඇත. මෙය අප රටෙන් තුරන් වුව ද බුරුමයේ ඇතැම් වනගත භික්ෂූන් වහන්සේලා අතර පැවැත්තේ ය. එහෙත් ඒ ගැන ඒ රටේ ද ප්‍රසිද්ධියක් නො තිබිණ. මෙයට සතළිස් වසකට පෙර අපිදු බුරුමයේ අවුරුදු ගණනක් විසුවෙමු. එහෙත් ඒ කාලයේදී මේ භාවනාව ගැන අපට අසන්නට නො ලැබිණ. මේ භාවනාව ප්‍රසිද්ධියට පැමිණියේ බුද්ධ ජයන්ති කාලයේ ය. **බුද්ධ ජයන්ති කාලයේ සිදු වූ දේ වලින් මේ භාවනාව ප්‍රසිද්ධියට පැමිණීම ඉතා උසස් කරුණක් හැටියට** සැලකිය හැකිය.

**විවේචනය කිරීම ප්‍රයෝජනවත් කරුණෙකි. යම් කිසිවක් විවේචනය කළ යුත්තේ ඒ දෙය පිළිබඳ මනා දැනුමක් ඇති කර ගෙන ය.** නො දන්නා දේ ගැන කරන බොරු විවේචන වලින් ලොවට වන්නේ නපුරෙක් ම ය. මහාසි තෙරුන් වහන්සේ විසින් ප්‍රචාරය කර ඇති සතිපට්ඨාන භාවනාව පිළිබඳ විවේචන ගණනක් ම අපට කියවන්නට ලැබිණ. ඒවායින් අපට පෙනීගියේ ඒවා මහාසි තෙරුන් වහන්සේ ගේ සතිපට්ඨාන භාවනා ගැන කිසිවක් නො දැන කළ විවේචන බවය.

බොහෝ දෙනකුන් මේ භාවනාව විවේචනය කරන්නේ ප්‍රාතිහාර්‍ය්‍ය පාන්න තැත් කරන ඇතැම් නූගත් උපාසක අම්මලා ගේ ඉරියව් බැලීමෙන් හා නූගත් උපාසක අම්මලා ගේ හා පිස්සන් ගේ කියුම් අනුවය. යමක් ගැන විවේචනය කරත හොත් කළ යුත්තේ එහි අග මුලවත් දැනගෙන ය. ඇතැමුන් මේ භාවනාව විවේචනය කරන්නේ මෙය මහාසි තෙරුන් විසින් ම උපදවා ගත් අළුත් භාවනාවක් ලෙසය.

මහාසි තෙරුන් ගේ භාවනා පොතෙහි කියා තිබෙන්නේ අවුරුදු තිසක් පමණ කාලයක් මේ භාවනාව තමන් වෙතට පැමිණෙන අයට පුහුණු කරවා දීමෙන් ඒ ගැන මනා පලපුරුද්දක්

Non-Commercial Distribution

ලබා ඇති **'ජේතවන සයාඩෝ'** නමැති කර්මස්ථානාචාර්ය මහාස්ථවිර තුමකු යටතේ සාර මසක් වෙසෙමින් මේ භාවනා ක්‍රමය මහාසි ස්ථවිරයන් විසින් පුහුණු කරගත් බවය. මේ කාරණය කලින් දැන සිටියා නම් ඒ පින්වත්හු මෙය 'මහාසි තෙරුන්ගේ අලුත් භාවනාවකැ' යි නො කියනු ඇත. විවේචනය කිරීමේ දී තමන් විවේචනය කරන කාරණයෙහි අග මුලවත් දැන ගන්නට ඕනෑ ය කියන්නේ මෙබඳු වැරදි ඇති නො වීමට ය.

එක්තරා වෘද්ධ ස්ථවිර තුමෙකු විසින් මහාසි ස්ථවිරයන් විවේචනය කර තිබෙන්නේ,

> "ඒ බුරුම ස්ථවිර යටත්පිරිසෙයින් සමාධි ලක්ෂණයවත් නො දන්නා මොන ම භාවනාවක් වත් හරියට නො දන්නා හිස් පුද්ගලයකු සැටියට ය."

මානයෙන් ඉදිමී සිටින ඒ ස්ථවිරතුමා මහාසි ස්ථවිරයන් එසේ පහත් කොට කථාකරන නමුත් ඒ මහාසි නම් වූ බුරුම ස්ථවිරතුමා පඬිවරයෙකු හැටියටත්, ධර්මාචාර්යවරයකු හැටියටත්, ග්‍රන්ථ කර්තෘවරයකු හැටියටත්, කර්මස්ථානාචාර්යවරයකු හැටියටත්, ධර්ම දේශකයකු හැටියටත් ලංකා බුරුම දෙරටෙහි ම බොහෝ දෙනකුන් විසින් ගරු කරනු ලබන්නෙකි.

විවේචනය කරන සිංහල ස්ථවිරතුමා මහාසි ස්ථවිර තුමා මොකවත් නො දන්නකු බවට සාධක දෙකක් දක්වා තිබේ. ඉන් එකක් නම්,

> මෛත්‍රී භාවනාවෙන් ලැබෙන උපචාර සමාධිය ගැන මහාසි තෙරුන් වහන්සේගෙන් ඇසූවාම 'මෛත්‍රී භාවනාව ගැන පලපුරුද්දක් තමාට නැතය' යි මහාසි ස්ථවිරයන් විසින් කියන ලදය යන්නය.

ඕනෑම ප්‍රශ්නයක් ඇසූවාම ඒ ගැන තමන්ට දැනුම නැතත් බොරු ඇද බා තමන් ගේ තත්ත්වය රැකගන්නට උත්සාහ කරන්නෝ රටේ බොහෝ ය. මහාසි තෙරුන්ගේ ඉහත කී පිළිතුරෙන් අපට සිතා ගන්නට ඇත්තේ, ඒ ස්ථවිර තුමා නො දන්නා දේ දන්නකු

Non-Commercial Distribution

ලෙස පෙනී සිටීම සඳහා බොරු නො කියන තමා හරියට ම දන්නා දෙයක් පමණක් කියන අවඩක පුද්ගලයකු බවය.

බොහෝ භාවනා ඇත්තේ ය. ඒ හැම භාවනාවක් ම හැම දෙනා ම නො කරති. ඒ ඒ පුද්ගලයා විසින් හරියට දන්නේ තමන් පුරුදු පුහුණු කළ භාවනා ගැන පමණකි. මෛත්‍රී භාවනාව සාමාන්‍යයෙන් භාවනා කරන සැමදෙනා විසින් ම කරන භාවනා වෙකි. ඒ නිසා මෛත්‍රී භාවනාවත් මහාසි තෙරුන් වහන්සේ විසින් කරන්නට ඇතුවාට සැකයක් නැත. එහෙත් සතිපට්ඨාන භාවනාව තමන් ගේ ප්‍රධාන කර්මස්ථානය සැටියට භාවිත කරන මහාසි තෙරුන් වහන්සේ මෛත්‍රී භාවනාවෙන් සමාධියක් ඉපදවූ කෙනකු නො විය හැකිය. එබැවින් අසන පැනයට අවඩකව පිළිතුරු දෙන උන්වහන්සේ මෛත්‍රී සමාධිය ගැන තමන්ට පුරුද්දක් නැති බව පවසන්නට ඇත. මේ කරුණ මහාසි තෙරුන් වහන්සේ ගේ තත්ත්වය පහත් කිරීමට ඉදිරිපත් කර ගැනීම අනුවණ කමක් නො වන්නේ ද?

> 'මහාසි තෙරුන් ගේ භාවනා ක්‍රමයෙහි පිම්බීම හැකිලීම සැපීම හිඳීම සිටීම යනාදි නොයෙක් දේට සිත යැවීමක් ඇතය, අරමුණෙන් අරමුණට සිත යවන භාවනාවකින් සමාධියක් නො ලැබිය හැකි ය, මෙබඳු භාවනාවක් උගන්වන බැවින් මහාසි ස්ථවිරයන් සමාධි ලක්‍ෂණය දැනුමෙහි පවා අසමර්ථයකු ලෙස මේ අනුව සැලකිය හැකිය'

යනු මහාසි ස්ථවිරයන් පහත් කොට දැක්වීමට ඔසවා ගෙන සිටින අතික් කරුණ ය. මෙයින් පෙනෙන්නේ මහාසි ස්ථවිරයන් නොව, කොතෙක් භාවනා කළාය කියතත් මේ විවේචකයන් වහන්සේ ම සමාධි ලක්‍ෂණය නො දන්නා බවය.

සමාධිය ලැබීමට එක අරමුණක් ම ගන්නේ ශමථ භාවනා කරන්නවුන් විසින් ය. සමාධිය එක අරමුණකින් ම ලැබිය හැකි බොහෝ අරමුණුවලින් නො ලැබිය හැකියක් නොවේ. විදර්ශනා යානිකයන්ට සමාධිය ලැබෙන්නේ නොයෙක් අරමුණු වලින්

Non-Commercial Distribution

ම ය. "බොහෝ අරමුණුවලින් සමාධිය නො ලැබිය හැකි ය" යන අදහස මේ විවේචකයාණන්ගේ මුලාවෙකි. විදර්ශනා යානිකයා ගේ සමාධිය බුදුන් වහන්සේ විසින් වදරා ඇත්තේ මෙසේ ය.

**'කතමා ච භික්ඛවෙ! සමාධි භාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති? ඉධ භික්ඛවෙ! භික්ඛු පඤ්චුපාදානක්ඛන්ධෙසු උදයබ්බයානුපස්සී විහරති ඉති රූපං ඉති රූපස්ස සමුදයො ඉති රූපස්ස අත්ථඞ්ගමො. ඉති වෙදනා ඉති වෙදනාය සමුදයො ඉති වෙදනාය අත්ථඞ්ගමො. ඉති සඤ්ඤා ඉති සඤ්ඤාය සමුදයො ඉති සඤ්ඤාය අත්ථඞ්ගමො. ඉති සඞ්ඛාරා ඉති සඞ්ඛාරානං සමුදයො ඉති සඞ්ඛාරානං අත්ථඞ්ගමො. ඉති විඤ්ඤාණං ඉති විඤ්ඤාණස්ස සමුදයො ඉති විඤ්ඤාණස්ස අත්ථඞ්ගමොති. අයං භික්ඛවෙ! සමාධි-භාවනා භාවිතා බහුලීකතා ආසවානං ඛයාය සංවත්තති'**

(අංගුත්තර නිකාය චතුක්කනිපාත)

'මහණෙනි! වඩනා ලද්දා වූ නැවත නැවත වඩනා ලද්දා වූ කිනම් සමාධියක් ආශ්‍රවයන්ගේ ක්ෂයය පිණිස පවතී ද? මහණෙනි! මේ සස්නෙහි මහණ තෙමේ මේ රූපයය, මේ රූපයා ගේ ඉපදීමය, මේ රූපයා ගේ නිරෝධයය, මේ වේදනාවය, මේ වේදනාවේ ඉපදීමය, මේ වේදනාවේ නිරෝධයය, මේ සංඥාවය, මේ සංඥාවගේ ඉපදීමය, මේ සංඥාව ගේ නිරෝධය ය, මේ සංස්කාරයෝ ය, මේ සංස්කාරයන්ගේ ඉපදීම ය, මේ සංස්කාරයන් ගේ නිරෝධය ය, මේ විඤ්ඤාණය ය, මේ විඤ්ඤාණයා ගේ ඉපදීමය, මේ විඤ්ඤාණයා ගේ නිරෝධය ය, කියා පඤ්චුපාදනසකන්ධයන්ගේ ඉපදීම් බිඳීම් දෙක බලමින් වෙසේද මහණෙනි! වඩනා ලද නැවත නැවත වඩනා ලද මේ සමාධි භාවනාව ආශ්‍රවක්ෂය පිණිස පවතී ය' යනු එහි තේරුම ය.

අරමුණු එකින් එකට සිත යවමින් කරන සමාධි භාවනාවක් ඇති බව මේ දේශනාවෙන් නො පෙනේ ද? ඉහත කී දේශනාවෙන් දැක්වෙන්නේ විදර්ශකයා ගේ සමාධි භාවනාව ය. මහාසි තෙරුන් වහන්සේ උගන්වන සමාධිභාවනාවත් මෙය ම ය. උදර මාංශයේ පිම්බීම හැකිළීම සිහිකිරීම් වශයෙන්

Non-Commercial Distribution

යෝගාවචරයා කරන්නේ රූප හා ඒවායේ ඉපදීම බිඳීම බැලීම ය. තමන් ගේ නො දැනීම ම පණ්ඩිත කම වශයෙන් ගෙන දතුවන්ට ගැරහීම නුසුදුසු ය.

මහාසි තෙරුන් වහන්සේ වනාහි බොහෝ දෙනකුන් විසින් අධිගම ලාභියකු ලෙස සලකන කෙනෙකි. එබඳු සැලකීමක් ඇති වී තිබෙන්නේ ඒ තෙරුන් වහන්සේ වර්‍තමාන භික්‍ෂූන් අතුරෙන් විශේෂයෙන් සිල්වත් ගුණවත් ස්ථවිර නමක් වී සිටින නිසා ය. අධිගම ලාභය කෙසේ වුවත් ඒ තෙරුන් වහන්සේ විශේෂයෙන් සිල්වත් ගුණවත් උගත් ස්ථවිර නමක් ලෙස අපිදු පිළිගනිමු. එබඳු උසස් ගුණවත් පුද්ගලයකු මොකවත් නො දන්නා මෝඩයකු කොට පහත් කොට කථා කිරීම, එසේ කරන තැනැත්තාට ම නපුරක් වන කරුණක් බව සැලකිය යුතු ය.

පුරිසස්සහි ජාතස්ස - කුඨාරි ජායතෙ මුඛෙ
යාය ඡින්දති අත්තානං - බාලො දුබ්භාසිතං භණං

යො නින්දියං පසංසති
තං වා නින්දති යො පසංසියො
විචිනාති මුඛෙන සො කලිං
කලිනා තෙන සුඛං න වින්දති.

මේ භාවනාව පුරුදු කරවන බුරුම තෙරුන් වහන්සේලා පහත් කොට දැක්වීම සඳහා ඇතමුන් ඔසවා ගෙන එන තවත් ආයුධයෙක් වෙයි. මෙය බුදු දහම ගැන සෑහෙන දැනුමක් නැති ජනයා මුළා කිරීමට නම් ඉතා ම හොඳ අවියෙකි.

එනම් :– "සම්‍යක් සමාධිය ඉපදවිය හැකි වීමට සත්ත්ව ගුණය ඇති කරන ආහාර වුවමනා ය. මස් මාංස අනුභව කිරීමෙන් ඇති වන්නේ රජෝ ගුණ දෙකය. සත්ත්ව ගුණය ඇති වන්නේ නැත. ආහාර සම්බන්ධයෙන් පරෙස්සම් නො වන මේ බුරුම භික්ෂූන්ට සම්‍යක් සමාධියක් තිබිය නො හැකි ය."

යනු ඔවුන් මහජනයාට දෙන්නට අදහස් කරන කරුණය.

Non-Commercial Distribution

**සත්ත්ව ගුණ - රජෝ ගුණ - තමෝ ගුණ යන මේවා ඇත්තේ හින්දි යෝග පොත්වලය**. මේවා ත්‍රිපිටකයෙහි සඳහන් නැත. අටුවා ටීකාවලත් නැත. අන් බෞද්ධ ග්‍රන්ථවලත් නැත. සම්‍යක් සමාධිය වැඩීමට ගත යුතු ආහාර මේවාය, නො ගත යුතු ආහාර මේවාය කියා ආහාර පිළිබඳ විවේචනයක් බුදු දහමෙහි නැත. බුදුන් වහන්සේ විසින් යෝගාවචරයන්ට වදාරා ඇත්තේ ආහාරයෙහි පමණ දැන ගත යුතු බව පමණෙකි.

භොජනෙ මත්තඤ්ඤුතාව **සෙඛ සූත්‍රයෙහි** විස්තර කර තිබෙන්නේ මෙසේ ය.

**කථඤ්ච මහානාම! අරිය සාවකො භොජනෙ මත්තඤ්ඤු හොති? ඉධ මහානාම! අරියසාවකො පටිසඞ්ඛායොනිසො ආහාරං ආහාරෙති නෙව දවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යාත්‍රා ච මෙ භවිස්සති අනවජ්ජතා ච ඵාසු විහාරොචා ති. එවං ඛො මහානාම අරියසාවකො භොජනෙ මත්තඤ්ඤු හොති**.

මේ ආහාරය වළඳන්නේ ක්‍රීඩා කළ හැකිවීම පිණිසත් නො වේ ය, මද වඩනු පිණිසත් නො වේය, ශරීරය ලස්සණ කර ගැනීමටත් නො වේය, ඇඟ තර කර ගැනීමටත් නො වේය. මෙය වළඳන්නේ මේ ශරිරය පවත්වා ගැනීම පිණිස ය, දිවි පවත්වා ගැනීම පිණිස ය, නිරාහාරත්වය නිසා වන දුක් වේදනා වළකා ගැනීම පිණිස ය, මේ ආහාරය වැළඳීමෙන් පරණ වේදනා ද නැති කර ගනිමි ය, අලුත් වේදනා ද වළකා ගනිමි ය, මේ ආහාරයෙන් මාහට යැපිය හැකි වන්නේ ය, පමණට වැළඳීමෙන් නිරවද්‍යතාව ද වන්නේ ය, සැප විහරණය ද ඇති වන්නේ ය යි නුවණින් අහර වළඳන තැනැත්තා භෝජනයෙහි පමණ දන්නේ වන්නේ ය යනු ඉහත දැක්වූ පාඨයේ අදහසය.

දැහැමින් ලද කිනම් ආහාරයක් වුව ද කියන ලද පරිදි නුවණින් සලකා වළඳන භික්ෂුවට සමාධිය ඇති කර ගැනීමට කිසි බාධාවක් නො වන්නේ ය. යෝගාවචරයන්ගේ භෝජනය පිළිබඳව සැරියුත් මහතෙරුන් වහන්සේ විසින් මෙසේ වදාරා ඇත්තේ ය.

Non-Commercial Distribution

අලලං දුක්ඛං වා භුඤ්ජන්තො න බාල්හං
සුහිතො සියා,
ඌනූදරෝ මිතාහාරෝ සතො භික්ඛු පරිබ්බජෙ.
චත්තාරෝ පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය පහිතත්තස්ස භික්ඛුනො

(සාරිපුත්තථෙර ගාථා)

මේ ගාථාවලින් දැක්වෙන්නේ යෝගාවචරයන් විසින් හොඳට ම කුස පිරෙන තෙක් ආහාර නො ගත යුතු බවත්, බත් පිඩු සතරක් පහක් නො වළඳ ඒ වෙනුවට පැන් පානය කළයුතු බවත් ය. කිනම් ආහාරයකින් වුවත් හොඳට ම බඩ පුරවා ගැනීම යෝගාවචරයන්ට නුසුදුසු ය.

**බෞද්ධ පොතපතෙහි යෝගාවචරයන් පිළිබඳව ආහාර විවේචනයක් ඇත්තේ** රාත්‍රිකාලයේ සොහොන් වල භාවනා කරන යෝගාවචරයන් ගැන පමණෙකි. අමනුෂ්‍යයන් කැමති වන තෙලින් පිසූ ආහාර පිටියෙන් පිසූ ආහාර මස් මාලු ආදිය සොහොන්වල භාවනා කරන්නවුන් විසින් නො ගත යුතු බව විශුද්ධිමාර්ගාදියෙහි කියා තිබේ. දෙවියන් අදහන හින්දි යෝගීහු මස් මාලු දෙවියන් නො කැමති ආහාරයක් යයි සලකා ඒවායින් වැළකෙති. බෞද්ධ යෝගීහු දෙවියන් අදහන්නෝ නො වෙති. ධර්මයෙන් ලැබෙන, තමාගේ ශරීරයට අපථ්‍ය නො වන, කවර ආහාරයක් වුව ද බුද්ධාගමේ සැටියට භාවනා කරන තැනැත්තාට සුදුසු ය.

## සම්‍යක් සමාධිය හා මිථ්‍යා සමාධිය

"මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා ක්‍රමයෙන් ලබන සමාධිය ඇතැම්හු මිථ්‍යා සමාධියකැයි පවසති."

එසේ පවසන්නේ ඒ අය සම්‍යක් සමාධි - මිථ්‍යා සමාධි දෙක නො හඳුනන නිසා හෝ ඊර්ෂ්‍යාව නිසා හෝ විය හැකිය. **මිථ්‍යා සමාධිය යයි කියනුයේ** අකුශල චිත්තයන්හි යෙදෙන ලෝභ සහගත වූද, ද්වේෂ සහගත වූද, මෝහ සහගත වූද, ඒකග්ගතා චෛතසිකයටය.

Non-Commercial Distribution

මහාසි තෙරුන් වහන්සේ ගේ ක්‍රමයට භාවනා කරන පින්වතුන්, උදරමාංශයෙහි සිත පිහිටුවා ගෙන ඒ භාවනාව කරන්නේ පළමුව ශීලයෙහි පිහිටා, රත්නත්‍රය වැඳ, තමාගේ ජීවිතය බුදුන් වහන්සේට පූජා කොටය. බුදුරජාණන් වහන්සේ වදාළ මඟ ගමන් කොට නිවන් ලැබීමේ අදහසින් ය. රූපය පිරිසිඳ දන්නා විදර්ශනාඥනය ඇතිකර ගැනීම පිණිස ය. සමාධිය හා සිහි නුවණ දියුණු කිරීම පිණිස ය. කාමච්ඡන්දාදි නීවරණයන් කෙරෙන් තමාගේ සිත පිරිසිදු කිරීම පිණිස ය.

උදරමාංශය අරමුණු කරමින් භාවනා කරන යෝගාවචරයා ගේ සමාධිය මිථ්‍යා සමාධියක් වන්නට නම්, උදරමාංසය අරමුණු කරන ඒ සිත අකුශල චිත්තයක් විය යුතුය. මේ කියන සැටියට නම් **කඳුබොඩ** ආදි භාවනා මධ්‍යස්ථානවල භාවනා කරන අය භාවනා කරමියි කියමින් අකුසල් රැස් කරනවා විය යුතුය. යම්කිසි සිතක් අකුසල් වන්නට නම්, ඒ සිත ලෝභයෙන් හෝ ද්වේෂයෙන් හෝ මෝහයෙන් හෝ යුක්ත විය යුතුය. ඉහත කී පරිදි ශීලයෙහි පිහිටා භාවනා කරන පින්වතුන් ගේ සිත ලෝභාදියෙන් යුක්ත වන සිතක් විය හැකි දැයි නුවණින් සලකා බැලිය යුතුය. ලෝභයෙන් තොර වූ ද්වේෂ මෝහ මාන දෘෂ්ටි ඊර්ෂ්‍යාදි අකුශලයන් ගෙන් තොර වූ ඒ යෝගාවචරයන්ගේ භාවනා චිත්තය කවරාකාරයකින් වත් අකුසල් විය නො හැකිය.

ආශ්වාස ප්‍රශ්වාස දෙක හා කෙස් ලොම් ආදි ශාරීරික කොට්ඨාසයන් අරමුණු කරන භාවනා සිත් සම්‍යක් සමාධියෙන් යුක්ත වන කුසල් සිත් වේ නම්, උදර මාංශය අරමුණු කරන සිත් මිථ්‍යා සමාධියෙන් යුක්ත වන අකුසල් සිත් වන්නට කිසි ම කරුණක් නැත. උදර මාංශය අරමුණු කරන සිත පමණක් ඇතැම් භවතුන්ට අකුසල් සිතක් සැටියට පෙනීම ඔවුන්ගේ ඊර්ෂ්‍යාව නිසා ම සිදු වන්නක් විය යුතුය. මහාසි තෙරුන් වහන්සේ ගේ ක්‍රමය අනුව භාවනා කිරීම මිථ්‍යා සමාධි ප්‍රතිපදාවකැයි කීම, කුශලය - අකුශලය වශයෙන් දැක්වීමකි. කුශලය අකුශලයක් කොට දක්වා ලෝකයා මුළා කරවීම ඒ භවතුන්ට මෙලොවදී කෙසේ වුවත් පරලොවදී නම් නපුරක් වන කරුණකි.

Non-Commercial Distribution

## කැලේ තිබෙන කුණු පාරට ඇද දැමීම

එක්තරා ස්ථවිර නමකගේ භාවනා පුහුණු කරවීමට වශීකරණයකුත් යොදා ගෙන ඇති බව කියති. ඒ තෙරුන් වහන්සේ භාවනා කරවන පිරිස්වල දැගලීම් - වෙව්ලීම් - අත් එසවීම් - කෑ ගැසීම් - බිම ඇදවැටීම් - මූර්ඡාවීම් ආදිය ඇති බවකුත් කියති. වෙවුලා අත් ඔසවා සමාධි වීමක් ඇති බවකුත් කියති.

මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා ක්‍රමයට ඒවායේ ඇති සම්බන්ධයක් නැත. වෙවුලන අත් ඔසවන සමාධියක් ඇති බවක් මහාසි තෙරුන් වහන්සේගේ භාවනා පොතෙහි කියා නැත. මහාසි තෙරුන් වහන්සේ ගේ ක්‍රමය අනුව සතිපට්ඨාන භාවනාව පුරුදු කරන **කඳුබොඩ - තලගල** ආදි භාවනා මධ්‍යස්ථානවල ද වෙවුලා අත් ඔසවා සමාධිවීමක් නැත. මහාසි තෙරුන් වහන්සේගේ භාවනා ක්‍රමය පහත් කොට දැක්වීම සඳහා මේ අහක ඇති දේවල් ගෙන හැර දැක්වීම කැලේ තිබෙන කුණු පාරට ඇද දැමීම වැනි නො මනා ක්‍රියාවෙකි. මේවා ඉදිරිපත් කොට කථා කිරීම මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා ක්‍රමය ගැන මිනිසුන් කළකිරවීමට දුෂ්ට චේතනාවෙන් ම කරන වැඩකැයි සිතමු.

වශීකරණයක් ඇතය කියන තෙරුන් වහන්සේත් කරන්නේ මහජනයා ශීල භාවනා දෙක්හි යෙදවීම ය. ඇතමුන්ට එය මහ අමාරුවක් වී ඇතත් එයින් මහජනයාට වන අනර්ථයක් ඇති බවක් අපට නම් නො පෙනේ. දහස් ගණන් ජනයා ඒ තෙරුන් වහන්සේගේ අනුශාසනය පරිදි ශීලභාවනා ව්‍යාපාරයෙහි යෙදෙති. එය නපුරක් වන වැඩපිළිවෙළක් නම්, මෙතරම් විශාල ජනකායක් ඉතා කැමැත්තෙන් එයට සම්බන්ධ නො වනු ඇත. ඒ තෙරුන් වහන්සේ විසින් භාවනා කරවීමට වශීකරණ බලයකුත් යොදගෙන ඇතද නැත ද කියා අපි නො දනිමු. වශීකරණ බලයකින් වුව ද මහජනයා සුමග යවනවා නම්, ශීලයෙහි පිහිටවනවා නම්, මහජනයා ලවා භාවනා කරවනවා නම් එය නපුරක් ද? වශීකරණ බලයට යටත් වී සිල් රැකීම භාවනා කිරීම පවක් ද?

Non-Commercial Distribution

## භාවනා කරන්නවුන්ට වන අපහසුකම්

භාවනා කරන්නවුන්ට චිත්ත සමාධිය දියුණුවීමෙහිදී ශරීරදහය, ඩහදිය වැගිරීම, සන්ධිස්ථානවල තද වේදනා ඇතිවීම, ඇඟ වෙවුලන්න හෝ පැද්දෙන්න වීම, ඉදිකටුවලින් අනින්නාක් මෙන් දැනීම, කුඩා සතුන් ශරීරයෙහි ඇවිදින්නාක් මෙන් දැනීම යනාදි උපද්‍රව ඇතිවන බව මහාසි තෙරුන් වහන්සේගේ භාවනා පොතෙහි කියා තිබේ.

> 'නියම භාවනාව කිසි කරදරයක් නැති සැපදයක වැඩක්ය, මහාසි තෙරුන් වහන්සේගේ භාවනා ක්‍රමය වැරදි එකක් නිසා ඒ උපද්‍රව ඇති වෙනවාය' යි කියාද ඒ භාවනා ක්‍රමයට දොස් දක්වති.

එය ඊර්ෂ්‍යා පරවශව කියන්නක් නො වනවා නම්, ඒ පින්වතුන් විසින් කවදවත් හරියට භාවනාවක් කර නැති නිසා කියන දෙයකි. හරියට භාවනාවක් කර ඇති නම්, එයින් බොහෝ ශාරීරික දුක් වේදනා ඇති වන බව දන්නවා ඇත. භාවනා කරමියි කියා මඳ වේලාවක් සියලු සත්ත්වයෝ නිදුක් වෙත්වා, නිරෝගී වෙත්වා, සුවපත් වෙත්වා කියා හෝ, අත්ථි ඉමස්මිං කායෙ කෙසා ලොමා නඛා දන්තා යනාදිය කීවාට හෝ ආශ්වාස ප්‍රශ්වාස සිහි කළාට හෝ භාවනාවේ අමාරුකම් දැනෙන්නේ නැත.

භාවනාවෙන් ශාරීරික වේදනා ඇතිවන බව දැනෙන්නට නම් බද්ධපර්‍ය්‍යඞ්කයෙන් හිඳ ශරීරය නිශ්චල කොට තබා ගෙන පැයක් දෙකක් ක්‍රමානුකූලව භාවනාවෙහි යෙදිය යුතු ය. පැය දෙක තුනක් නිශ්චලව හිඳ භාවනාවෙහි යෙදිය හැකි තත්ත්වයට ශරීරය සකස් කර ගැනීම එතරම් පහසු වැඩක් නොවේ. සමහරුන්ට දිවි හිමියෙන් උත්සාහ කොටත් ඒ තත්ත්වයට පැමිණෙන්නට නො ලැබේ. මහාසි තෙරුන් වහන්සේගේ ක්‍රමය අනුව භාවනා කරවන තැනකදී නම්, බොහෝ දෙනාට දින ගණනකදී ඒ තත්ත්වයට පැමිණිය හැකි වේ. ඒ තත්ත්වයට ඉක්මනින් පැමිණෙන්නට ලැබෙන්නේ දුක් විඳීමට පසුබට නො වන ධෛර්‍ය්‍යවත් අයට පමණෙකි. ඇතැම් පින්වතුන් කියන පරිදි භාවනාව සැප ඇති ලෙහෙසි වැඩක් නම් හැමදෙනාම

Non-Commercial Distribution

එය කරනු ඇත. හරියට කරතහොත් භාවනාවෙහි යෙදීම තරම් අමාරු වැඩක් තව නැති තරම් ය. භාවනා කළ යුතු අයුරු බුදුන් වහන්සේ විසින් වදරා ඇත්තේ මෙසේ ය.:–

**"අප්පටිවානී සුද හං භික්ඛවෙ! පදහාමි, කාමං තචො ච නහරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංසලොහිතං, යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං අපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති, තස්ස මය්හං භික්ඛවෙ! අප්පමාදධිගතා බොධි අප්පමාදධිගතො අනුත්තරො යොගක්ඛෙමො.**

**තුම්හෙ වෙපි භික්ඛවෙ! අප්පටිවානං පදහෙය්‍යාථ, කාමං තචො ච නහරු ච අට්ඨි ච අවසිස්සතු සරීරෙ උපසුස්සතු මංස ලොහිතං යං තං පුරිසථාමෙන පුරිසවිරියෙන පුරිසපරක්කමෙන පත්තබ්බං න තං ආපාපුණිත්වා විරියස්ස සණ්ඨානං භවිස්සතීති"**

(අංගුත්තර නිකාය දුක නිපාත)

"මහණෙනි! සමත් නහරත් ඇටත් ඉතිරි වෙතොත් ඉතිරි වේවා, ලේ මස් වියළී යතොත් වියළී යේවා, යමකට පුරුෂ බලයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් පැමිණිය යුතු ද, එයට නො පැමිණ වීර්‍ය්‍ය කිරීමෙහි නැවැත්මක් නො වන්නේ ය යි සලකා නො නවත්වා වීර්‍ය්‍ය කරමි. මහණෙනි! එසේ වීර්‍ය්‍ය කරන මා විසින් අප්‍රමාදයෙන් සතර මාර්ගඥානය හා සර්වඥතාඥානය අධිගමනය කරන ලද්දේ ය. ඒ අප්‍රමාදයෙන් උත්තම නිර්වාණය අධිගමනය කරන ලද්දේ ය.

මහණෙනි, තෙපි ද සමත් නහරත් ඇටත් ඉතිරි වෙතොත් ඉතිරි වේවා, ලේ මස් වියළී යතොත් වියළී යේවා, පුරුෂ බලයෙන් පුරුෂ වීර්‍ය්‍යයෙන් පුරුෂ පරාක්‍රමයෙන් යමකට පැමිණිය යුතු ද එයට නො පැමිණ වීර්‍ය්‍යයාගේ නැවැත්මක් නොවේය යි සලකා නො නවත්වා ම වීර්‍ය්‍ය කරවිය" යනු එහි තේරුම ය.

භාවනා කිරීම හෙවත් සමාධිය වැඩීම ඇතැමුන් කියන පරිදි සනීප ඇති ලෙහෙසි වැඩක් නම් බුදුන් වහන්සේ විසින් එසේ වදරණ සේක් ද? උන් වහන්සේ විසින් එසේ වදරා ඇත්තේ හරියට භාවනාවෙහි යෙදෙතොත් එය ශරීරයේ දුහය හට ගෙන ලේ මස්

Non-Commercial Distribution

වියලී යන තරමේ දුෂ්කර වැඩක් වන බැවිනි. භාවනාවට විරෝධය පළ කරන මේ ආයුෂ්මතුන් වහන්සේලා භාවනා කර නැතත් පොත-පතවත් සැහෙන තරමට භාවිත කර තිබෙනවා නම්, භාවනාවේ අමාරුකම් දැන ගන්නවා ඇත. මහ ලොකුවට රටට අනුශාසනයට ඉදිරි පත් වන්නේ එසේත් නැතිවය. මහාසි තෙරුන් වහන්සේ ගේ සතිපට්ඨාන භාවනා ක්‍රමය විදර්ශනා භාවනා ක්‍රමයෙකි. ශමථ භාවනාවට ද වඩා විදර්ශනා භාවනාව බොහෝ අපහසුකම් ඇතියකි. ඒ බව **මහාසච්චක සූත්‍ර අටුවාවෙහි** දක්වා ඇත්තේ මෙසේ ය.

**විපස්සනං පට්ඨපෙත්වා නිසින්නස්ස හි අද්ධානෙ ගච්ඡන්තෙ ගච්ඡන්තෙ තත්ථ තත්ථ අග්ගි උට්ඨානං විය හොති. කච්ඡෙහි සෙද මුච්චන්ති මත්ථකතො උසුමවට්ටි උට්ඨානං විය හොති. චිත්තං හඤ්ඤති විහඤ්ඤති විප්ඵන්දති.**

මේ අනුවා පාඨයෙන් දැක්වෙන්නේ විදර්ශනාවෙහි යෙදී වාඩි වී ඉන්නා තැනැත්තා හට කල් යත් යත් ම ශරීරයේ ඒ ඒ තැන් ගිනි ගන්නාක් මෙන් වන බවත් කිසිලිවලින් ඩහදිය ගලන්නට වන බවත්, හිස මුදුනෙන් හුමාලය නගින්නාක් මෙන් වන බවත්, යෝගාවචරයා ගේ සිත වෙහෙසට පත් වන බවත් සැලෙන්නට පටන් ගන්නා බවත් ය.

මේ ගැන **මධ්‍යමනිකායේ දෙවධාවිතක්ක** සූත්‍ර අටුවාවේ ද මෙසේ කියා තිබේ.

**යස්ස හි සමාධි තරුණො විපස්සනා පි, තස්ස විපස්සනං පට්ඨපෙත්වා අතිචිරං නිසින්නස්ස කායො කිලමති, අන්තො අග්ගි විය උට්ඨහති. කච්ඡෙහි සෙද මුච්චන්ති. මත්ථකතො උසුමවට්ටි විය උට්ඨහති. චිත්තං හඤ්ඤති විහඤ්ඤති විප්ඵන්දති.**

මේ පාඨයෙන් දැක්වෙන්නේ ද සමාධිය හා විදර්ශනාව නො මේරූ අවස්ථාවෙහි යෝගාවචරයන්ට ඉහත කී උවදුරු ඇති වන බවය.

සමාධිය ලබන්නට උත්සාහ කරන්න වුන්ට ඇති
වෙනවාය යි මහාසි තෙරුන් වහන්සේගේ භාවනා
පොතෙහි දක්වා ඇති නොයෙක් දුක් වේදනා ඉපදීම්

Non-Commercial Distribution

ආදී ලක්ෂණ බුදු දහමෙහි කොතැනකවත් ප්‍රකාශ වී නැතය යි.

මේ භාවනා විරෝධීහු මහ ලොකු දෙයක් කොට පවසති. මෙයත් ඒ ආයුෂ්මතුන් වහන්සේලාගේ මෝඩ කථාවෙකි. යමක් වන්නට ඒ දේ වෙනවාය කියා තථාගතයන් වහන්සේ විසින් වදරා තිබෙන්නට ඕනෑ නැත. බුදුන් වහන්සේ වදරා ඇතත් නැතත් වෙන දේ වෙන සැටියට වන්නේ ය. නො වන දේ නො වන්නේ ය. මහාසි තෙරුන් වහන්සේගේ පොතෙහි ඒවා කියා තිබෙන්නේ අත් දැකීම් අනුවය.

පන්සාළිස් වසක් මුළුල්ලෙහි බුදුන් වහන්සේ දේශනය කළ ධර්ම සියල්ල දත් කෙනෙක් ලෝකයෙහි නැත. අද තිබෙන පිටකත්‍රයට උන්වහන්සේ දේශිත ධර්මවලින් දහසෙන් පංගුවකුදු දසදහසින් පංගුවකුදු ඇතුළත් වී නැත.

**'බුද්ධානං හි භත්තානුමොදනා කාලෙපි ථොකං වඩ්ඪෙත්වා අනුමොදෙන්තානං දෙසනා දීඝමජ්ඣිම නිකායප්පමාණා හොති. පච්ඡාභත්තං පන සම්පත්ත පරිසාය ධම්මං දෙසෙන්තානං දෙසනා සංයුත්ත අඞ්ගුත්තරික ද්වෙ මහානිකායප්පමාණාව හොති'**

යනුවෙන් මඳක් දික් කොට දේශනය කරන බුදුන් වහන්සේගේ භුත්තානුමෝදනාවක් දීඝමජ්ඣිම දෙනිකාය තරම් වන බවත් සවස් කාලයෙහි පැමිණෙන පිරිසට කරන ධර්ම දේශනාව සංයුත්ත අඞ්ගුත්තර නිකාය දෙක තරම් වන බවත් **අත්ථසාලිනී අටුවාවෙහි** කියා තිබේ. මේ නයින් බලන කල දැනට ඇති සම්පූර්ණ සූත්‍ර පිටකය බුදුරජාණන් වහන්සේ විසින් එක දවසකදී දෙසන ධර්මය තරම්වත් නො වන බව දත හැකිය. බුදුන් වහන්සේ වදළ ධර්මවලින් ලක්ෂයෙන් පංගුවකුත් නො දැන, අසවල් දේ බුදුන් වහන්සේ නො වදළහ'යි කියන්නට ඉදිරිපත් වීම කොතරම් අනුවණ කමක් ද?

අප විසින් සම්පාදිත **විදර්ශනා භාවනා ක්‍රමයෙහි** දැක්වෙන කරුණු වගයක් සම්බන්ධයෙනුත් එක්තරා ආයුෂ්මතුන්වහන්සේ නමක් මෙබඳු ම ප්‍රකාශනයක් කර තුබුණා දුටිමු. ඒ ආයුෂ්මතුන් වහන්සේට දෙන පිළිතුරත් මෙය ම ය.

Non-Commercial Distribution

# භාවනාව හා රෝග.

වැඩි කාලයක් යොද ක්‍රමානුකූලව භාවනාවෙහි යෙදෙතහොත් එයින් සමහරුන්ට යටපත්ව තුබූ රෝග මතු වන්නේ ය. සමහරුන්ට අලුත් රෝග ද හට ගන්නේ ය. සමහරුන්ට කලක් පැවති රෝග සුව වන්නේ ය. උම්මත්තක රෝගය විශේෂයෙන් ම භාවනාවෙන් මතු වන රෝගයකි. මේ කරුණු අත්දැකීම් අනුව අප දන්නා ඒවා ය. කල් නො යවා එල දැකිය හැකි වන පරිදි භාවනාවෙහි යෙදෙන යෝගාවචරයන්ට එය කළ යුතු සැටි බුදුන් වහන්සේ විසින් **දන්තභූමි සූත්‍රයෙහි** වදරා ඇත්තේ ය.

**දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි. රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි. රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙය්‍යාසි පාදෙන පාදං අච්චාධාය සතො සම්පජානො උට්ඨානසඤ්ඤං මනසිකරිත්වා, රත්තියා පච්ඡිමං යාමං උට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙහි.**

මේ දේශනාවෙන් දැක්වෙන්නේ දවල් කාලය මුළුල්លෙහි සක්මනින් හා හිඳීමෙන් ආවරණීය ධර්මයන්ගෙන් සිත පිරිසිදු කළ යුතු බව හා රාත්‍රියේ ප්‍රථම පශ්චිම යාම දෙක්හි ද නො නිද ආවරණීය ධර්මයන් කෙරෙන් සිත පිරිසිදු කරමින් වාසය කළ යුතු බවය. ආවරණීය ධර්මයන්ගෙන් සිත පිරිසිදු කරන්නේ සිතෙහි කාමච්ඡන්දාදි නීවරණයන්ට නැඟී සිටින්නට අවකාශයක් නො තබා භාවනාවෙහි යෙදීමෙන් ය. තවත් ක්‍රමයකින් කියත හොත් සිහියෙන් යුක්තව විසීමෙන්ය. මේ ක්‍රමයට භාවනාවෙහි යෙදෙන පින්වතුන්ට නිද ගැනීමට ඇත්තා වූ කාලය දිනකට පැය සතරක් පමණකි. මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා පොතෙහි දක්වා තිබෙන්නේ මේ ක්‍රමය ය.

මහාසි තෙරුන් වහන්සේ ගේ උපදෙස් අනුව යෝගීන් පුහුණු කරවන කඳුබොඩ ආදි ස්ථානවල පිහිටුවා ඇති භාවනා මධ්‍යස්ථානවල මේ ක්‍රමය ක්‍රියාවේ යොදවනු ලැබේ. මිනිත්තු ගණනකදී සමාධි කරවීම් ඒවායේ නැත. ආවරණීය

Non-Commercial Distribution

ධර්මයන් සිතට ඇතුළුවන්නට ඉඩක් නො තබා ම භාවනාවෙහි යෙදෙන්නා වූ පින්වතුන්ට ඉක්මනින් එහි ප්‍රතිඵල ද දකින්නට ලැබේ. මේ භාවනා ක්‍රමය අවලංගු කරන්න දඟලන එක්තරා **වයෝවෘද්ධ ස්ථවිර නමක්** විසින් භාවනාවේ ඉක්මන් ප්‍රතිඵලය ගැන මෙසේ කියා තිබේ.

> මෙය පුරුදු කළවුන් හා පුරුදු කරන්නන් ද පුරුදු කරනු දුටු අය ද අපට කියා තිබෙන ඉක්මන් ප්‍රතිඵල නම් :– ඇතැම් විට ශරීරයේ ඇති වන දැඩි දහගතිය ද, ඇතැම්විට සිරුර පැද්දීමේ ස්වභාවය ද, ඇතැම් විට මස්පිඩු දරදඬු වීම ද, සිරුර විනිවිද යන්නා සේ දැනෙන වේදනාව ද සමෙහි ඉදිකටු ඇනෙන්නාක් මෙන් දැනෙන වේදනාව ද, අත්දිගු කිරීම, නොයෙක් ආකාර ආලෝක දක්නට ලැබීම, ඇතැම් කෙනකුන්ට මම උසස්මියි හැඟෙන මානාධික කම, මූර්ජා ස්වභාවය යනාදිය යි. මේ ඒ තෙරුන් වහන්සේ ගේ ප්‍රකාශනය ය.

මේ තෙරුන් වහන්සේ කියන කරුණු භාවනාවෙහි ප්‍රතිඵල නොව එයට වන අපල ය. සමහර විට භාවනා මධ්‍යස්ථානවලට මෝඩයන් හා පිස්සෝත් ඇතුළු වෙති. මේ අපල භාවනාවේ ප්‍රතිඵල වශයෙන් එවැනි අයකු විසින් මේ තෙරුන් වහන්සේට කියන්නට ඇතැ යි සිතමි. මේ ලෙඩ සාද ගන්නට යන්තමටවත් මොළය ඇති අයෙක් ඔය භාවනා මධ්‍යස්ථානවලට යෙත් ද? මේවා භාවනාවෙහි ප්‍රතිඵල වශයෙන් පිළිගත් ඒ මහලු තෙරුන් වහන්සේ ගේ මොළය ගැනත් වෛද්‍ය පරීක්‍ෂණයක් කරවන්නට නො වටනේ ද?

භාවනා කරගෙන යන බොහෝ දෙනාට ඉහත කී අපලවලින් සමහරක් වත් ඇතිවේ. ඒ අපල දුරුකර ගැනීමට උපදෙස් ද මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා පොතෙහි ඇත්තේ ය. භාවනා ප්‍රතිඵල දක්නට ලැබෙන්නේ ඒ අපල මැඩ පවත්වා ගෙන දුරු කර ගෙන භාවනාව නො නවත්වා ම ඉදිරියට ගෙන යන ධෛර්‍යවත් යෝගාවචරයන්ට ය.

Non-Commercial Distribution

භාවනා කරනු බලා සිට එහි ප්‍රතිඵල දත හැක්කේ පරචිත්ත විජානනඥානය ඇතියවුන්ට පමණෙකි. භාවනාවෙහි ප්‍රතිඵල තබා මේ තෙරුන් වහන්සේ කියන භාවනා අපල වලිනුත් වැඩිහරියක් බලා සිට නො දත හැකි ඒවාය. භාවනා කරන තැනැත්තාට ඇති වන ශරීරදහය මස් පිඩු දරදඬු වීම සිරුර විනිවිද යන්නා සේ දැනෙන වේදනාව සමෙහි ඉදිකටු අනින්නාක් මෙන් දැනෙන වේදනා නොයෙක් ආකාර ආලෝක දක්නට ලැබීම මම උසස්මි ය කියා ඇතිවන මාන්නාධිකකම යන මේවා භාවනා කරනු බලා සිට කෙසේ දත හැකි ද? මේවා භාවනා පුරුදු කරනවා බලා සිටි අය මේ තෙරුන් වහන්සේ ට කීවා ය යනු ගජබින්නයක් නො වේ ද?

මේ භාවනාවෙන් ඉක්මනින් ලැබෙන ප්‍රතිඵල නම් :– කාමච්ඡන්දාදි නීවරණයන්ට තමා ගේ සිතට ඇතුලුවන්නට ඉඩ නො තබා දවස මුලුල්ලේ ම සිහියෙන් යුක්තව හිඳ උදර මාංශයේ හැකිලීම් පිම්බීම් දෙක බලමින් ද සිටින්නා වූ යෝගාවචරයනට උදරමාංශ චලනානුසාරයෙන් පඨවි - ආපෝ - තේජෝ - වායෝ යන මහාධාතු සතර පරමාර්ථයෙන් ම ප්‍රකටවීම, මේ රූපත් ඒවා අරමුණු කරන සිත් පරම්පරාවත් හැර ආත්මය කියා අන් කිසිවක් නැති බව ප්‍රත්‍යක්ෂවීම, ශරීරයේ රූප ඉපද ඉපද බිඳි බිඳී යන සැටි ප්‍රත්‍යක්ෂ වීම, ඒවා අරමුණු කොට නාම ධර්ම ඉපද ඉපද බිඳි බිඳී යන සැටි ප්‍රත්‍යක්ෂ වීම, නාම රූප ධර්ම නිතර ම බිඳි බිඳී යාම දුකක් බව ප්‍රත්‍යක්ෂ වීම, නාම රූප ධර්ම ඒ ඒ හේතුන් ගෙන් ඇති වී බිඳී යනවා මිස ඒවා කිසිවකු ගේ කැමැත්තේ හැටියට නො පැවැත්විය හැකි බව ප්‍රත්‍යක්ෂ වීම, සංස්කාරයන් පිළිබඳ වූ නිත්‍ය සුඛ සුභ සංඥවන් බොහෝ දුරට තුනීවී යාම, කෙලෙස් තුනීවී යාම යනාදිය ය. සියලු දුෂ්කර කම් මැඩපවත්වා ගෙන ඉදිරියට ගිය යෝගාවචරයාට පසුව මහත් වූ කායික චෛතසික සුවයක් ද ලැබෙන්නේ ය. එය මේ භාවනාවේ ආනිසංසයෙකි.

කියන ලද පරිදි දිනකට සතර පැයක් පමණක් නිද ගනිමින් දින ගණනක් භාවනාවෙහි යෙදීම එතරම් ලෙහෙසි වැඩක් නොවේ. ඒ ක්‍රමයට යෝගකර්මය පවත්වා ගෙන යා හැක්කේ

Non-Commercial Distribution

**ප්‍රධානියාඞග** පසෙකින් යුක්ත වන අයට පමණෙකි. තථාගතයන් වහන්සේ **මධ්‍යම නිකායේ බෝධිරාජකුමාර සූත්‍රයෙහි** ප්‍රධානියාඞග පසක් වදාරා තිබේ.

**'අප්පාබාධො හොති අප්පාතඞෙකා සමවෙපාකිනියා ගහණියා සමන්නාගතො හොති නාතිසීතාය නාච්චුණ්හාය මජ්ඣිමාය පධානක්ඛමාය'**

යනුවෙන් දැක්වෙන්නේ එහි දෙවන අඞගය ය. ආබාධ නැති, ලෙඩ නැති, ඉතා ශීත ද උෂ්ණද නො වූ සමව ආහාර පැසවීම කරන, භාවනාව සඳහා කළ යුතු වීර්‍ය්‍යයට ඔරොත්තු දෙන මධ්‍යම ප්‍රමාණයේ බඩගින්න ඇති පුද්ගලයකු වන බව ඒ දෙවන ප්‍රධානියාඞගය ය. නිතර ලෙඩ සෑදෙන ස්වභාවය ඇති දුබල අය මේ යෝගකර්‍මයට ඔරොත්තු දෙන්නෝ නො වෙති. වීර්‍ය්‍ය කළ හොත් ඔවුන්ට ඇති පරණ රෝග මතුවන්නේ ය. අලුත් රෝග ද ඇති වන්නේ ය.

අප හඳුනන තිස් හතළිස් දෙනෙක් පමණ මේ භාවනා මධ්‍යස්ථානවල භාවනා කළහ. පෙරළා පැමිණි පසු ඔවුන්ගෙන් සමහරෙක් තමන්ට ඇති වූ රෝගාබාධයන් නිසා හරියට භාවනාව කර ගන්න නො ලැබුණු බව කීහ. සමහරු කලින් සිටියාට වඩා සනීප වී සිටියහ. එක් ස්ථවිර නමක් ඒ නමට කලෙක පටන් පැවැති රෝගයක් ඒ භාවනාවෙන් පසු සුව වූ බවත් භාවනාවේ ප්‍රතිඵලයක් වශයෙන් එයමත් ඒ ස්ථවිරයන්ට ප්‍රමාණ බවත් අප සමඟ කීහ. සමහරුන්ට යම් යම් අපහසු කම් ඇති වීම භාවනා ක්‍රමයේ වරදක් නොව, ඒ ඒ අයගේ ශරීරවල - සිත්වල වරද ය.

මහාසි තෙරුන් වහන්සේ ගේ ක්‍රමය අනුව භාවනා කොට කලින් සිටියාට වඩා ශාන්ත බවට පත් ව මහත් සතුටක් ලබා ගෙන සිටින ගිහි පැවිදි බොහෝ දෙනෙක් මේ රටේ වෙසෙති. භාවනාවට විරෝධය පළකරන මේ ආයුෂ්මත්වරුන්ට එයින් එක් අයකු වත් නො හමු වීම පුදුමයෙකි. මේ අයට හමුවී ඇත්තේ භාවනාව වැරදුණු අය පමණෙකි. මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනාවට විරෝධය පළ කරන ඉහත කී තෙරුන් වහන්සේ, —

Non-Commercial Distribution

මේ උදර භාවනාව පුරුදු කිරීමට ගිය උගත් කාන්තාවන් දෙදෙනකු ඉතා ඕනෑ කමින් භාවනා කරගෙන ගිය නමුත් දොම්නස මලානික භාවය උමතු ගතිය යන අනිටු ලකුණු පහළවී විකාර ස්වභාවයකට පත් වූයෙන් ඒ දෙදෙනාගේ මාපියන් විසින් ඔවුනට සිදුවන්නට ගිය ඒ භයානක විපතින් යම්තම් බේරාගත් බව මම දනිමි" යි කියති.

සමහර විට මේ කීම සත්‍යයක් වන්නට ද බැරි නැත. එහෙත් මෙයින් උත්සාහ කර තිබෙන්නේ භාවනාවට යන සැදැහැවතුන් බිය ගන්වා ඔවුන් නො මඟ යැවීමට ය. ඇතැම් කාන්තාවන්ට බෙර ශබ්ද ඇසුණාම, පිරිත් කියනු ඇසුණාම, බිය වූවාම, ශරීරයේ දොස් කිපුණාම ඇවිස්සී එන ශාරීරික දෝෂයකින් හෝ සිතේ දෝෂයකින් හෝ අමනුෂ්‍ය දෝෂයකින් හෝ එක්තරා උමතු ගතියක් ඇත්තේ ය. වැඩි වේලාවක් වාඩිවී වෙහෙස ගෙන භාවනාවෙහි යෙදුනත් දෙස් ඉසට ගසා ඔවුන්ට ඒ රෝගය උත්සන්න වේ. එසේ වූ කාන්තාවන් ගැනත් මේ රෝගය ඇති කාන්තාවන් බොහෝ දෙනකුන් ගැනත් අපි ද දනිමු.

මේ උමතුකම් ඇවිස්සීම මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනාවෙන් පමණක් සිදුවන්නක් නොවේ. උමතු කම මද වශයෙන් ඇති අයටත් උමතු කම ඇති වීමේ හේතූන් ශරීරයෙහි ඇති අයටත් කිනම් භාවනාවක වුවත් වඩා මහන්සි වී යෙදුන හොත් උමතු කම ඇවිස්සෙන්නේ ය. ආනාපාන භාවනාවෙන් හා කසිණ භාවනාවෙන් උමතු කමට පත්වූවන් කීපදෙනකුන් ගැන අපි දනිමු. වර්ෂ දෙක තුනකට පෙර එක් දවසක ලක්දිවට වන්දනාවට පැමිණි බුරුම උපාසිකාවක් අපට හමු වූවා ය. සැමද ම අටසිල් රකිනා බවත්, මස් මාලු කෑමෙන් සදහට ම වැලකී සිටින බවත්, යන එන සෑම වේලේ ම බුදුරජාණන් වහන්සේ සමඟ ම ඇය ගමන් කරන බවත් ඈ අපට කීවා ය. "බුදුන් වහන්සේ සමඟ ගමන් කරන්නේ කෙසේද?" කියා ඇසුවාම ඇය ඉදිරියෙන් නිතර ම බුදුන් වහන්සේ ගමන් කරන බව ඈ කීවා ය. මෙයත් එක්තරා උමතු ගතියකි. ඇයට මේ උමතු ගතිය ඇති වන්නට ඇත්තේ බුද්ධානුස්මෘති භාවනාවෙනි.

Non-Commercial Distribution

මහාසි තෙරුන් වහන්සේගේ ක්‍රමයට භාවනා කිරීමෙන් පමණක් උමතු කම් ඇතිවන බව කියන්නේ රට මුළා කිරීමටය. කෙනකු දෙදෙනකු ගේ උමතු කම් ඇවිස්සුනාය කියා උමතු කම් නැති අයට භාවනා කිරීම සඳහා බිය වීමට කරුණක් නැත. නරක පැත්තක් නැති කිසිවක් ලොව නැත්තේ ය. සමහර අවස්ථාවලදී රිය අනතුරු සිදු වෙනවාය කියා මහජනයා රියෙන් ගමන් යාම අත් නො හරිති. සමහරවිට මඟ යන අයට රියවලින් අනතුරු වෙනවාය කියා මහජනයා මඟ යාම නො නවත්වති. දරුවන් වදන්නට ගොස් සමහර කාන්තාවන් නැසෙනවාය කියා අතික් කාන්තාවෝ විවාහ නොවී නො සිටිති. කෙනකුට දෙදෙනකුට පිස්සුව ඇවිස්සුණාය කියා නුවණැත්තෝ භාවනාව අත් නො හරිති. ඒ නිසා මේ බිය ගැන්වීමෙන් ඒ තෙරුන් වහන්සේ ගේ අභිමතාර්ථය සිදු නො වනු ඇත.

## පඞ්ක්ති භේදයකුත්

'වැඩිපුර ම මේ තාන්ත්‍රික ක්‍රමය පුහුණු කිරීමට
යන්නේ රළු ලෙස ජීවත් වන සාමාන්‍ය ගම්බද මිනිසුන්
බැවින් සුඛුමාල අයට මෙසේ වීමේ කිසි පුදුමයක් නැත'

මෙය ද ඒ තෙරුන් වහන්සේ ගේ එක් ප්‍රකාශනයෙකි.

මෙයින් අදහස් කරනවා ඇත්තේ පඞ්ක්ති භේදයක් ඇති කොට පොහොසත් අය ස්වපක්ෂයට හරවා ගැනීම විය හැකිය. ජනයා රැස්වන කොතැන බැලුවත් වැඩිය ඇත්තේ දුප්පත් ජනයා ය. එයට හේතුව රටේ දුප්පතුන් වැඩි බව ය. මේ භාවනා මධ්‍යස්ථානවලට පැමිණ භාවනා කරන අය අතරත් දුප්පතුන් වැඩිවීමේ හේතුව එය ය. භාවනාව සිත පිළිබඳ වැඩකි. එයට වඩා යෝග්‍ය වන්නේ ඕජාවත් ආහාරයෙන් හොඳින් වැඩුණු පිනාගිය ඉඳුරන් ඇති උගත් අය ය. හොඳට නුවණ ඇත්තේ ඒ අයට ය. නිකාය භේද කුල භේද පක්ෂ භේදාදිය නැති කොට ජනයා සමගි කළ යුතුව තිබිය දී මේ භාවනාවටත් පඞ්ක්ති භේදයක් ඇති කරන්නට තැත් කිරීම මහ තෙර කෙනකුන්ට සුදුසු වැඩක් නොවන බව කිය යුතු ය.

Non-Commercial Distribution

# භාවනා ප්‍රතිඵල

භාවනාවෙන් සුළු ඵලයක් වත් ලැබෙන්නට සමහරුන්ට බොහෝ කල් ගත වේ. සමහරුන්ට වැඩි කල් ගත නො වීම භාවනා ඵලය ලැබේ. සමහරුන්ට ඵලයක් නො ලබා ම ලදිමුය යන වැරදි හැඟීම ඇති වේ. එය බොහෝ සෙයින් ඇති වන්නේ සුළු සුළු උමතු ගති ඇති අයට ය.

> සෘධි බලයක් ලබා සිටිනවාය කියන රැන්ගුන් නුවර මහාසි තෙරුන් වහන්සේගේ භාවනා මධ්‍යස්ථානයෙහි පුහුණුව ලැබූ සිංහල භික්‍ෂුවක් තමාට හමුවූ බවත් පරීක්‍ෂාකර බැලුවාම ඒ භික්ෂුව භාවනාවට හිඳගන්නා හැටිවත් නො දන්නා කෙනකු බවත් එක්තරා ස්ථවිර නමක් කියා තිබේ.

මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා මධ්‍යස්ථානයෙහි සෘධි බල පුහුණුවක් නො දෙති. සෘධිබලයක් ලැබුණාය කියන ඒ භික්‍ෂුව උමතු ගතියක් ඇති කෙනකු විය හැකිය. මහාසි තෙරුන් වහන්සේගේ භාවනා මධ්‍යස්ථානයෙහි පුහුණුව ලැබූ යෝගාවචරයෙක් භාවනාවට හිඳගන්නා හැටියවත් දැන නො සිටියේ ය යි කීම අපට නම් පිළිගත හැකි නො වේ. ඒ ප්‍රවෘත්තිය අනුව නම් අපට සිතුනේ, ඒ කතාව මහාසි තෙරුන් වහන්සේ පහත් කොට දැක්වීමට ගොතා ගත් බොරුවක් විය යුතු ය කියා ය.

සමාධිය ලැබීමේ බලවත් උත්සාහයෙන් තොරව, දිනපතා ම හෝ සමහර දවස්වල පමණක් හෝ සුළු වේලාවක් භාවනා කරන අයට කවර භාවනාවක් කළත් එයින් දැනෙන තරමේ අමුත්තක් සිදු නොවේ. මහාසි තෙරුන් වහන්සේගේ ක්‍රමය අනුව භාවනා කරන බොහෝ දෙනාට වැඩිකල් ගත නොවී සුළු ඵලයක් වත් දක්නට ලැබෙන්නේ එය ක්‍රමානුකූලව ඉක්මනින් දියුණුවක් ලැබෙන අන්දමට කරවන නිසා ය. මහාසි තෙරුන් වහන්සේගේ ක්‍රමය අනුව භාවනා කරන යෝගාවචරයන්ට කථා කරමින් විසීමට, පුවත් පත් පොත්පත් කියවීමට, කාලයක් තබා නැත. කෑම බීම නෑම මුහුණ

Non-Commercial Distribution

සේදීම අත් පා සේදීම යාම ඊම ආදි සැම දෙයක් ම ඒ භාවනාවට සම්බන්ධ කොට ඇත්තේ ය. යෝගාවචරයාට හිස් කාලයක් ඇත්තේ නිදන කාලය පමණෙකි. එසේ භාවනා කරන තැනැත්තාගේ සිතට නීවරණ ධර්මයන්ට පැමිණීමට ඉඩක් නැත්තේ ය. භාවනා ඵලය ඉක්මනින් ලැබෙන්නේ ඒ නිසා ය.

හොඳට භාවනා කළ හොත් ධ්‍යාන මාර්ගඵල' සඞ්ඛ්‍යාත උසස් ඵල නො ලැබුණත් කාහට වුවත් යම් කිසි ඵලයක් වැඩිකල් නො ගොස් ලැබෙන්නේ ය.

සතර සතිපට්ඨාන භාවනාවෙන් ඒ ඒ පුද්ගලයාගේ තත්ත්වයේ හැටියට සත් අවුරුද්දේ පටන් සත් දවස දක්වා ඒ ඒ කාලයන්හි ඵල ලැබෙන බව මහා සතිපට්ඨාන සූත්‍රයෙහි වදාරා තිබේ. ඒ සූත්‍රයෙහි භාවනා ඵලය ලැබීමේ අන්තිම කාලය සත් දවස හැටියට වදාරා ඇත්තේ සත් දිනකින් මොබ භාවනා ඵලය නො ලැබෙන නිසා නොවේ. ඒ බව බෝධිරාජකුමාර සූත්‍රයෙන් ඔප්පු වේ. සත් දිනකින් මොබ භාවනා ඵලය ලැබීමක් ඇති බව තථාගතයන් වහන්සේ වදාරා ඇති බවක් නො දන්නා එක්තරා ආයුෂ්මතුන් වහන්සේ නමක් තමාගේ සුළු දැනුම නිසා මානයෙන් මත්ව මහාසි තෙරුන් වහන්සේට නින්දා කරන අටියෙන් ප්‍රකාශනයක් කර තිබේ. ඒ මෙසේ ය :–

> තථාගතයන් වහන්සේ ගේ සතිපට්ඨාන භාවනා ක්‍රමය පුහුණු කිරීමෙන් ප්‍රතිඵල ලබා ගත හැකි අඩුම කාලය සත් දවසක් තුළදීය යි දේශනා කොට තිබේ. එහෙත් මේ මහාස්ථවිරයන් වහන්සේගේ භාවනාවෙන් පස් දිනකින් උදයබ්බයඤාණය ලබා ගත හැකි බව ප්‍රකාශ කිරීම, මේ මහා ස්ථවිරයන් වහන්සේගේ බුද්ධ ඥානයත් ඉක්මවා ගිය අසදෘශ ඥනය ගැන දැන ගැනුම ගැන කදිම නිදසුනක් නොවේ ද?

මේ ඒ උඩඟු ආයුෂ්මතුන්ගේ ප්‍රකාශනය ය.

භාවනා ඵලය ලැබීමේ කාලය බුදුරජාණන් වහන්සේ **බෝධිරාජ කුමාර සූත්‍රයේ** වදාරා ඇත්තේ මෙසේ ය :–

Non-Commercial Distribution

**තිට්ඨතු රාජකුමාර සත්තරත්තින්දිවානි ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො යස්සත්ථාය කුලපුත්තා සම්මදෙව අගාරස්මා අනගාරියං පබ්බජන්ති තදනුත්තරං බ්‍රහ්මචරිය පරියොසානං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍ය ඡරත්තින්දිවානි -පෙ- පඤ්ච රත්තින්දිවානි -පෙ- චත්තාරි රත්තින්දිවානි -පෙ- තීණි රත්තින්දිවානි -පෙ- ද්වෙ රත්තින්දිවානි -පෙ- එකං රත්තින්දිවං.**

**තිට්ඨතු රාජකුමාර එකං රත්තින්දිවං ඉමෙහි පඤ්චහි පධානියඞ්ගෙහි සමන්නාගතො භික්ඛු තථාගතං විනායකං ලභමානො සායමනුසිට්ඨො පාතො විසෙසං අධිගමිස්සති. පාතමනුසිට්ඨො සායං විසෙසං අධිගමිස්සති.**

මේ දේශනාවෙන් දැක්වෙන්නේ තථාගතයන් වහන්සේ නමැති අනුශාසකයකු ලදහොත් ප්‍රධානියඞ්ග පසින් යුක්ත වන භික්ෂුව සත් දවසකින් නොව සය දවසකිනුත් පස් දවසකිනුත් සතර දවසකිනුත් තුන් දවසකිනුත් දෙදවසකිනුත් එක් දවසකිනුත් අර්හත්වයට පැමිණෙන බව හා සමහර විට සවස ගුරුකම් දුන්නාම උදය වන විටත් උදය ගුරුකම් දුන්නාම සවස් වන විටත් විශේෂාධිගමය කරන බවය. එක් රාත්‍රියකින් එක් දවාලකින් වුව ද සමහරුන් භාවනා ඵලය ලබන බව බුදුන් වහන්සේ වදරා ඇති බව දැන්වත් දැන ගන්න. මේ බෝධිරාජකුමාර සූත්‍රදේශනාව නැතද පස් දිනකින් උදයබ්බය-ඤාණය ලබා ගත හැකිය යන කියමනෙහි ඇති වරදක් නැත

**'යො හි කොචි භික්ඛවෙ! ඉමෙ චත්තාරො සතිපට්ඨානෙ එවං භාවෙය්‍ය සත්තාහං තස්ස ද්වින්නං ඵලානං අඤ්ඤතරං ඵලං පාටිකඞ්ඛං දිට්ඨෙව ධම්මෙ අඤ්ඤා සති වා උපාදිසෙසෙ අනාගාමිතා'**

යනුවෙන් සතිපට්ඨාන සූත්‍රයෙහි සතියකින් ලැබෙන බව වදරා ඇති භාවනා ඵලය උදයබ්බයඤාණය නොව අනාගාමි ඵලය හා අර්හත් ඵලය ය. උදයබ්බයඤාණය වනාහි අනාගාමි අර්හත්ඵලවලට ගවුගණකින් මොබ ඇති ඤාණයෙකි. සතිපට්ඨාන සූත්‍ර දේශනාවේ එන සැටියට සත් දිනකින් අනාගාමි අර්හත්ඵල ලැබිය හැකි වීමට උදයබ්බයඤාණය කලින් ලැබිය යුතුය. එය පහළ විදර්ශනාඥානයෙකි. උදයබ්බයඤාණය ලැබූ තැනැත්තා

Non-Commercial Distribution

විසින් අනාගාමි ඵලයට පැමිණිය හැකි වීමට භඞ්ගඤාණය, භය ඤාණය, ආදීනව ඤාණය, නිබ්බිදා ඤාණය, මුඤ්චිතුකම්‍යතා ඤාණය, පටිසඞ්ඛා ඤාණය, සඞ්ඛාරුපෙක්ඛා ඤාණය, සෝතාපත්ති මග්ග ඤාණය, සකදාගාමි මග්ග ඤාණය යන ඥාන නවය ලැබිය යුතු ය.

උදයබ්බය ඤාණය මහාසතිපට්ඨාන සූත්‍රයෙහි සත් දිනකින් ලැබෙන ඵල සැටියට දේශනා කර ඇති අනාගාමිත්වයට ඉතා පහළ ඤාණයක් බැවින් පස්දිනකින් නොව පළමුවන දිනයේ ම ලබනවාය කීවත් එහි ඇති වරදක් නැත. මේ ආයුෂ්මතුන් වහන්සේලා අනුන්ගේ දේවල් විවේචනය කරන්නට ඉදිරිපත් වන්නේ මෙතරම් දෙයක් ගැනවත් දැනුම නැතිව ය. නො දන්නා දේ ගැන බොරු පළ කොට මහජනයා මුළා කිරීම ඉමහත් පාපයෙකි. උතුමන්ට ගර්හා කිරීමත් එබඳු ම පාපයෙකි.

## සමාධිය හා ශරීර පාලනය.

ශරීරය පාලනය කරන්නේ සිතිනි. වාඩි වී ඉන්නා කෙනකු නින්දට වැටුණ හොත් ඒ තැනැත්තා ගේ හිස පසෙකට ඇල වී යන්නේය. සම්පූර්ණ ශරීරය ම හෝ ඇල වී යන්නේ ය. සමහර විට කටින් කෙළත් වැගිරෙන්නේ ය. සමහර විට මහ හඬින් ආශ්වාස ප්‍රශ්වාස කරන්නටත් වන්නේ ය. මේවා සිදු වන්නේ නිදෙහි සිටින අවස්ථාවෙහිදී ශරීරය පාලනය කරන ඉරියව් සකස් කරන සිත් ඇති නො වන බැවිනි. බොහෝ වේලාවක් එක් ඉරියව්වකින් හිඳ භාවනා කරන තැනැත්තාගේ සිත වෙහෙසට පත් වී දුබල වන්නේ ය. ඒ දුබල සිත් ද ශරීරය පාලනය කිරීමට අසමත් බැවින් එබඳු අවස්ථාවල දී ද යෝගාවචරයන්ට ඉහත කී දේවල් සිදු වන්නේ ය.

සමහර විට වෙහෙසට පත් වූ යෝගාවචරයන්ට වාඩි වී සිටියදී ම භාවනා සිත් ඉපදීම නැවතී භවාඞ්ග සිත් ම ඇති වන්නට පටන් ගනී. එබඳු අවස්ථාවලදී ද යෝගාවචරයන්ගේ ශරීරවල ඉහත කී ලකුණු පහළ වේ. සමහරවිට වෙහෙසට පත් යෝගාවචරයෝ වාඩි වී සිටියදී ම නින්දට වැටෙති. එබඳු අවස්ථා-

Non-Commercial Distribution

වලදී ඉහත කී ලකුණු පහළ වේ. මෙය මහන්සි වී කවර භාවනාවක් හෝ කරන්නා වූ යෝගාවචරයන්ට සිදු වන්නකි. මේවා හොඳට දක්නට ලැබෙන්නේ බොහෝ දෙනකුත් එකවිට භාවනා කරන ස්ථානවලදී ය. භාවනා ගැන දන්නෝ මේ කරුණු දනිති.

නැවත නැවත ඉරියව් වෙනස් කරමින් ශරීරය සකස් කරමින් සමාධියක් නැතිව භාවනා කරන අයට ඉහත කී දේවල් සිදු නොවේ. බොහෝ කලක පටන් භාවනා කරනවාය කියන එක්තරා මහතෙර නමක් භාවනා කරන කාටත් සමහරවිට සිදු වන ඉහත කී කරුණු ටික ගෙන හැර දක්වා කඳුබොඩ විදශීනා භාවනා මධ්‍යස්ථානය පහත් කොට දැක්වීමට උත්සාහයක් කර තිබේ. ඒ ස්ථවිරයන්ගේ ප්‍රකාශනයක් මෙසේ ය.

> ළඟදී ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයෙක් මෙහි පැමිණියේ ය. ඔහු කඳුබොඩ තාන්ත්‍රික භාවනා ප්‍රදශීනයට ගිය කෙනෙකි. එහිදී ඔහු භාවනා ඉගැන්වීම -භාවනාක්‍රමය- එය පුරුදු කිරීම යන මේවා ගැන හොඳින් විමසා බලා තිබේ. එවිට ඔහුට දක්නට ලැබුණේ භාවනා කොට උසස් සමාධිය ලැබූවන්ගේ ඉමහත් පිළිකුල් ස්වභාවය යි. ඇඟ දරදඬු වී ගොරවන්නවුන්, කට ඇදවූවන්, කෙළ පෙරන්නන් යනාදි නොයෙක් අප්‍රිය දශීනවලින් පිරී පවත්නා තැනක් බව හේ ප්‍රකාශ කෙළේ ය. මෙය උදනයේ දැක්වෙන සමාධිප්‍රාප්ත තෙරුන්ගේ ආකාරයට කොතරම් වෙනස්දැයි සිතා බැලීම වටී. භාග්‍යවතුන් වහන්සේ අනුදත් සමාධිය වඩන්නවුන් ගේත්, බුරුම රටින් පටවා එවන ලද තාන්ත්‍රික මිථ්‍යාසමාධිය වඩන්නවුන් ගේත් වෙනස මෙකී කරුණු අනුව සලකා ගත හැකි ය.

මේ ඒ මහතෙරුන් වහන්සේගේ ප්‍රකාශනය ය.

උසස් සමාධියට පැමිණ ඉන්නා අවස්ථාවෙහි ඇති ලක්ෂණ යෝගාවචරයකුට නිතර ම කොයින්ද? ඒ හැරත් උසස් සමාධි ලබා සිටින අය භාවනා මධ්‍යස්ථානවල කුමට වෙසෙත්ද? ඒවායේ

Non-Commercial Distribution

ඇත්තේ උසස් සමාධියකට පැමිණෙන්නට උත්සාහ කරන අයය. ඔවුනට උසස් සමාධි ලැබූවන් ගේ ලක්‍ෂණ කොයින්ද? භාවනා ගැන නො දත් නවකයකු වන ඒ ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයා කඳුබොඩ මධ්‍යස්ථානයට ගොස් මුළා වී පෙරළා පැමිණීම පුදුමයක් නොවේ. කලක් භාවනා කළාය කියන මහාස්ථවිරතුමා භාවනා කිරීමේදී සිදුවන දේ ගැනවත් දැනුමක් නැතිව සිටීම නම් පුදුමයෙකි.

## ශමථය හා විදර්ශනාව

මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා ක්‍රමය ශුද්ධ විදර්ශනාවෙකි. ඒ භාවනා මාර්ගයට විරුද්ධත්වය පළ කරන ඇතැම්හු ශමථයෙන් තොර විදර්ශනාවක් මේ ශාසනයෙහි නො ලැබෙන බවත්, ශමථයෙන් නීවරණ විෂ්කම්භනය නො කොට විදර්ශනා වඩන්නට නුපුළුවන් බවකුත් කියති. **එය තහවුරු කිරීමට ඔවුහු පෙල අටුවා පාඨ කැබලි දක්වමින් ඒවා විනයවර්ධනකාරයන් තෝරන ආකාරයෙන් තමන්ට වාසිවන සැටියට තේරුම් කරති**. "ශමථයෙන් නීවරණ විෂ්කම්භනය නො කොට විදර්ශනා වැඩිය නො හැකිය" කියා ත්‍රිපිටකයෙහි කොතැනකවත් සඳහන් වී නැත. අටුවා ටීකාවල ද කොතැනකවත් සඳහන් වී නැත. "ශමථයෙන් නීවරණ විෂ්කම්භනය නො කොට විදර්ශනා වැඩිය නො හැකිය" යි ඔවුන් කියන්නේ ඊර්ෂ්‍යාව නිසා හෝ ශමථ විදර්ශනා දෙක නො හඳුනන නිසා හෝ විය හැකි ය.

ශමථය යනු සමාධිය ය. එනම් ශමථ විදර්ශනා භාවනා කරන්නා වූ සිත්වල යෙදෙන ඒකාග්‍රතා චෛතසිකය ය. විදර්ශනා යනු සාමාන්‍ය ජනයාගේ දැනීම ඉක්මවා විශේෂයෙන් දන්නා විශේෂයෙන් දක්නා ප්‍රඥාවය. තවත් ක්‍රමයකින් කියතොත් ප්‍රඥප්තිය ඉක්මවා පරමාර්ථ නාමරූප ධාතූන් දක්නා ප්‍රඥාව විදර්ශනාව ය. අනිත්‍යාදි ලක්ෂණ පෙනෙන ලෙස රූප වේදනා සඤ්ඤා සංඛාර විඤ්ඤාණ යන පරමාර්ථධර්මයන් නැවත නැවත බැලීම විදර්ශනා භාවනාවය. ආශ්වාස ප්‍රශ්වාසාදි යම්කිසි ප්‍රඥප්තියක් නැවත නැවත සිහි කිරීම සමථ භාවනාවය. ශමථ භාවනාවෙන් සමාධිය පමණක් දියුණු වේ. විදර්ශනාව එහි නො ලැබේ.

Non-Commercial Distribution

ශමථ භාවනා චිත්තය ධ්‍යාන සම්ප්‍රයුක්ත වුවද ප්‍රඥප්තිය අරමුණු කරන ඒ ධ්‍යානය විදර්ශනාව නොවේ. විදර්ශනා චිත්තය සමාධියෙන් තොරව ඇති වන්නක් නොවේ. සෑම විදර්ශනා චිත්තයක ම සමාධිය ඇත්තේ ය. එබැවින් විදර්ශනා කරන යෝගාවචරයන්ට විදර්ශනා ඥානයත් සමග ශමථය යි කියන සමාධිය ද වැඩේ. විදර්ශනා ඥානයේ ප්‍රතිෂ්ඨාව විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත සමාධිය ය. පළමුවෙන් ආනාපානාදි භාවනාවක් කොට සමාධිය උපදවා පසුව විදර්ශනා භාවනාව කරන්නා වූ යෝගාවචරයාගේ විදර්ශනා ඥානයට ප්‍රතිෂ්ඨාව වන්නේ ද විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත සමාධිය ම ය. විදර්ශනා කරන කල්හි ආනාපානාදි භාවනාවලින් ලැබූ සමාධි නැත. ඒවා ශමථ භාවනා සිත් නිරුද්ධ වීමේදී ඒවා සමග නිරුද්ධ වී ගියේ ය. ඒ නිරුද්ධ වී ගිය සමාධි විදර්ශනාවට උපනිඃශ්‍රය වශයෙන් දුරින් ප්‍රත්‍යය වේ. විදර්ශනා චිත්ත සම්ප්‍රයුක්ත සමාධිය විදර්ශනා ඥානයට නිඃශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

විදර්ශනා භාවනාව කරන්නාහට විදර්ශනා චිත්තය සමග ඇතිවන වැඩෙන සමාධිය ලෝකෝත්තර මාර්ගඵල ඇති වන්නට සමීප කාලයේ දී උපචාර සමාධිය ද, ලෝකෝත්තර මාර්ග ඵල සිත් වලදී අර්පණා සමාධිය ද වේ. '**විපස්සනා පුබ්බඞ්ගමං සමථං භාවෙති**' යන දේශනාවෙහි දැක්වෙන ශමථය නම් කියන ලද උපචාර අර්පණා සමාධි දෙකය. ශමථ භාවනාවක් නො කොට විදර්ශනාව නො කළ හැකි බව කියන ස්ථවිරතුමා ඒ පාඨය තෝරන්නට ගොස් ඒ පාඨයෙන් දැක්වෙන විපස්සනාව "යම් කිසි විපතක් වැනි අවස්ථාවකදී අනිච්චං යි කීමට හෝ සිතීමට පුරුදුවී සිටීම ය" යි කියා තිබේ. එයත් විදර්ශනාවක්ද? එබඳු විදර්ශනා නම් හරක් හොරුන් අතරත් ඇත. ඒ ස්ථවිර තුමා ස්වමතය ස්ථිර කිරීමට '**පකතියා විපස්සනා ලාභී විපස්සනාය ඨත්වා**' යනාදි මනෝරථපූරණී අටුවා පාඨය විනය වර්ධන කාරයන් ගේ න්‍යාය අනුව තේරුම් කර තිබේ.

භික්ෂූන් වහන්සේලා බුදුපියාණන් වහන්සේ ගේ දයාදය ලබා ගත යුත්තෝ ය. තථාගතයන් වහන්සේ ගේ දයාදය පිළිබඳව උන්වහන්සේ විසින් දේශිත සූත්‍ර ධර්මයක් ඇත්තේ ය. එයට **ධම්මදයාද සූත්‍රය** යි කියනු ලැබේ. එය සියලු ම භික්ෂූන් වහන්සේලා විසින්

Non-Commercial Distribution

දැනගත යුතු සූත්‍රයෙකි. විපස්සනා භාවනාව නො මඟට තෝරන මේ ස්ථවිර තුමා ධම්දයාද සූත්‍රයවත් දන්නා හැඩක් නැත. විපස්සනා පුබ්බඞ්ගම සමථය මනෝරථපූරණීයෙහි දක්වා තිබෙන්නේ ඉතා කෙටියෙනි. ඒ නිසා මනෝරථපූරණී පාඨය ඕනෑ අතකට හරවා තෝරන්නට පුළුවන. නො මනා ලෙස තෝරා ලෝකය රවටන්නට බැරි සැටියට ධම්මදයාද සූත්‍ර අටුවාවෙහි **සමථ පුබ්බඞ්ගම විපස්සනාවත් විපස්සනා පුබ්බඞ්ගම සමථයත් විස්තර කර තිබේ.**

ඒ මෙසේ ය. :–

> ඉධෙකච්චො පඨමං උපචාරසමාධිං වා අප්පණාසමාධිං වා උප්පාදෙති, අයං සමථො. සො තඤ්ච තං සම්පයුත්ත ධම්මෙ අනිච්චාදීහි විපස්සති, අයං විපස්සනා. ඉති පඨමං සමථො පච්ඡා විපස්සනා තෙන වුච්චති සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙතීති. තස්ස සමථ පුබ්බඞ්ගමං විපස්සනං භාවයතො මග්ගො සඤ්ජායති සො තං මග්ගං ආසෙවති භාවෙති බහුලීකරොති. තස්ස තං මග්ගං ආසෙවයතො භාවයතො බහුලීකරොතො සංයොජනානි පහීයන්ති, අනුසයා ව්‍යන්තිහොන්ති, එවං සමථපුබ්බඞ්ගමං විපස්සනං භාවෙති.
>
> ඉධ පනෙකච්චො වුත්තප්පකාරං සමථං අනුප්පාදෙත්වාව පඤ්චුපාදනක්ඛන්ධෙ අනිච්චාදීහි විපස්සති, අයං විපස්සනා, තස්ස විපස්සනා පාරිපූරියා තත්ථ ජාතානං ධම්මානං වවස්සග්ගාරම්මණතා උප්පජ්ජති චිත්තස්ස එකග්ගතා අයං සමථො, ඉති පඨමංවිපස්සනා පච්ඡා සමථො තෙන වුච්චති විපස්සනා පුබ්බඞ්ගමං සමථං භාවෙතීති.

විපස්සනා පුබ්බඞ්ගම සමථය මේ අටුවා පාඨයෙහි ඉතා හොඳින් පැහැදිලි කොට තිබේ. 'පකතියා විපස්සනාලාභී' යන මනෝරථපූරණී පාඨය විනයවඩීන කාරයන් බණ පද තෝරන ක්‍රමයට තේරුම් කළාක් මෙන් මේ පාඨයට බොරු තේරුම් දෙන්නට

Non-Commercial Distribution

ඉඩක් නැත. විපස්සනා පුබ්බඞ්ගම සමථය වඩන යෝගාවචරයාගේ විදර්ශනාව විපතක් පැමිණි විට අනිච්චං යි කීම නොව, පඤ්චුපාදාන ස්කන්ධයන් අනිත්‍යාදි වශයෙන් විදර්ශනා කිරීම බව මේ අටුවා පාඨයෙහි පැහැදිලි ලෙස ම දක්වා තිබේ. සමථ පුබ්බඞ්ගම විපස්සනාදිය පිළිබඳ දීඝවිස්තරයක් පටිසම්භිදා මග්ගයේ යුගනද්ධ කථාවෙහි ද ඇත්තේ ය. මේ කාරණය ගැන වැඩිදුරටත් දැන ගනු කැමැත්තෝ පටිසම්භිදා මග්ගයත් බලත්වා.

මේ ස්ථවිරතුමා විශුද්ධිමාර්ගය දන්නා බවක් අභවතත් අපට පෙනෙන්නේ එතුමා විශුද්ධිමාර්ගයේ පිට පැත්ත මිස ඇතුළ නොදන්නා සේය. විශුද්ධිමාර්ගය පිළිබඳ දැනුමක් ඇති නම් මේ ස්ථවිර තුමා සමථය නො වඩා විදර්ශනා නො වැඩිය හැකි ය යි නො කියන්නේ ය. **සමථ යානිකයාය විදර්ශනායානිකයාය** කියා දෙදෙනකු ඇති බව දක්වා ඒ දෙදෙනාට වෙන වෙනම භාවනා කළ යුතු සැටි **විශුද්ධිමාර්ගයෙහි දක්වා තිබේ**. ඒ මෙසේ ය.

"සමථයානිකෙන තාව ඨපෙත්වා නෙවසඤ්ඤානාසඤ්ඤායතනං අවසෙස රූපාරූපාවචර ඣානානං අඤ්ඤතරතො වුට්ඨාය විතක්කාදීනි ඣානඞ්ගානි තං සම්පයුත්තාච ධම්මා ලක්ඛණරසාදි වසෙන පරිග්ගහෙතබ්බා -පෙ- සුද්ධවිපස්සනා යානිකො පන අයමෙව වා සමථයානිකො චතුධාතු වවත්ථානෙ වුත්තානං තෙසං තෙසං ධාතුපරිග්ගහ මුඛානං අඤ්ඤතර මුඛවසෙන සඞ්ඛෙපතො වා විත්ථාරතො වා චතස්සො ධාතුයො පරිග්ගණ්හාති."

(විශුද්ධිමග්ග 441, 442 පිටු)

මේ පාඨයෙහි "සුද්ධ විපස්සනායානිකො" යනුවෙන් දක්වා ඇත්තේ කලින් ශමථභාවනාවක නො යෙදී විදර්ශනාභාවනාව පමණක් කරන යෝගාවචරයා ය. මේ කාරණය මේ ස්ථවිරතුමාට මොන ම විධියකින් වත් බොරු කරළා තෝරන්නට බැරිවන සැටියට විශුද්ධිමාර්ග ටීකාවෙහි විස්තර කර තිබේ. ඒ මෙසේ ය.:–

"තත්ථ සමථයානිකස්ස සමථමුඛෙන විපස්සනාභිනිවෙසො, විපස්සනායානිකස්ස පන සමථං අනිස්සායාති ආහ, සුද්ධ විපස්සනා යානිකොති. සමථභාවනාය අමිස්සිත විපස්සනා යානවා ති අත්ථො.

Non-Commercial Distribution

මෙසේ පටිසම්භිදා මග්ගයෙහි හා අටුවා ටීකාවල ඉතා පැහැදිලි ලෙස දක්වා ඇති මේ කරුණ ගැන බොරුවක් ප්‍රචාරය කිරීම, නො දැනීම නිසා කළත් පාපයකි. එය දැන දැන ම අනුන්ගේ භාවනා ක්‍රම අවලංගු කර දැමීමේ අදහසින් ඊර්ෂ්‍යාවෙන් පළ කළා නම්, මේ ආයුෂ්මතුන් වහන්සේට ලෙහෙසියෙන් ගෙවා ගත නොහෙන පාපයක් වනු ඇත.

නීවරණ විෂ්කම්භනය නො කොට විදර්ශනා වඩන්නට නුපුළුවන් බවකුත් මේ ආයුෂ්මතුන් වහන්සේ කියති. මෙයත් මේ ආයුෂ්මතුන් ගේ තත්ත්වය මැන ගැනීමට හොඳ නිදසුනෙකි. කාමච්ඡන්දාදි නීවරණයන් සිතේ නැඟී සිටින අවස්ථාවක් වුවහොත් ඒ අවස්ථාවේදී මොනම භාවනාවක්වත් නො කළ හැකි ය. කාමච්ඡන්දය යනු ලෝභයය. ලෝභසහගත සිතින් ශමථ භාවනාවක් කළ හැකිද? ව්‍යාපාද නීවරණය යනු ද්වේෂයය. ද්වේෂ සහගත සිතින් කළ හැකි භාවනාවක් තිබේද? ථීනමිද්ධ නීවරණය පවත්නේ ද ලෝභ සහගත වූ ද ද්වේෂ සහගත වූ ද සසංඛාරික සිත්වලය. ඒ සිත්වලින් කෙරෙන භාවනාවක් තිබේද? උද්ධච්ච කුක්කුච්ච විචිකිච්ඡා යන මේවා යෙදෙන්නේත් අකුසල් සිත්වලය. ඒ සිත්වලින් කරන භාවනාවක් තිබේ ද? මේ ස්ථවිර තුමා අදහස් කරනවා ඇත්තේ නීවරණ තිබියදී විදර්ශනා භාවනාව නො කළ හැකිවුවත් ශමථ භාවනාව කළ හැකිය කියා ය. යම්තම් වත් භාවනාවක් කර ඇති නම් කාමච්ඡන්දාදිය නැඟී ඇති අවස්ථාවල භාවනා නො කළ හැකි බව තේරුම් යා යුතුය. මේ ස්ථවිරතුමාට මෙය නො වැටහෙන්නේ කවදාවත් භාවනාවක් කර නැති නිසා විය හැකිය. පෙනේද රටට භාවනා උගන්වන්න තැත්කරන අයගේ තරම?

තථාගතයන් වහන්සේ විසින් ඇතැම් සූත්‍රවලදී සමථ-පුබ්බඞ්ගම විපස්සනාව දේශනා කර තිබේ. ඇතැම් සූත්‍රවලදී ශුද්ධ විදර්ශනාව දේශනා කර තිබේ. ශුද්ධ විදර්ශනාව දැක්වෙන සූත්‍ර සියගණනක් සංයුක්ත නිකායේ ඇත්තේ ය. ශුද්ධවිදර්ශනාවෙන් අර්හත්වයට පැමිණි බොහෝ දෙනකුන් ගේ නම් සංයුක්තනිකායෙහි සඳහන් වී ඇත්තේ ය. සමථපුබ්බඞ්ගම විපස්සනාව නිවන් යාමේ දීර්ඝමාර්ගය ය. එය බොහෝ පින් ඇති උසස් පුද්ගලයන්ට පමණක් සුදුසු මගය. ශුද්ධවිදර්ශනාව නිවන් ලැබීමේ කෙටිමඟය. සාමාන්‍ය

Non-Commercial Distribution

පුද්ගලයන්ට සුදුසු මඟ එය ය. ඒ මඟ ඇවිරීමට උත්සාහ කිරීම ඉමහත් පාපයෙකි.

## බුද්ධ දේශනාවට අනුකූල බව.

උදරයේ පිම්බීම හැකිලීම පිළිබඳ වූ සතිපට්ඨාන භාවනාව **'යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති. කායඤ්ච පජානාති. පොට්ඨබ්බෙ ච පජානාති'** යන සතිපට්ඨාන සූත්‍ර පාඨවලටත් **'කායො අභිඤ්ඤෙය්‍යො පරිඤ්ඤෙය්‍යො පොට්ඨබ්බා අභිඤ්ඤෙය්‍යා පරිඤ්ඤෙය්‍යා. කාය විඤ්ඤාණං අභිඤ්ඤෙය්‍යං පරිඤ්ඤෙය්‍යං'** යන සංයුත්ත පාලි පාඨයත් **'කායො අනිච්චාති යථා භූතං පජානාති පොට්ඨබ්බා අනිච්චාති කාය විඤ්ඤාණං අනිච්චන්ති යථා භූතං පජානාති'** යනාදී සංයුත්ත පාලි පාඨවලටත් අනුකූල බව මහාසි තෙරුන් වහන්සේගේ විපස්සනා භාවනා පොතෙහි කියා තිබේ.

මේ පාඨවලින් දැනට මත භේදයක් පහළ වී ඇත්තේ 'යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති' යන පාඨය පිළිබඳව ය. මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනාවට විරුද්ධත්වය පළ කරන තෙරුන් වහන්සේලා ඒ සතිපට්ඨාන සූත්‍ර පාඨය අන් අයුරකින් තේරුම් කරති. මේ දෙපක්ෂයෙන් කවර පක්ෂයකින් දෙන තේරුම වඩා යුක්ති සහගත වේද යනු මෙහිලා විමසිය යුතු කරුණය. මෙය ගැන විමසීමක් කළ යුත්තේ සම්පූර්ණ ඉරියාපථ පබ්බය ඉදිරිපත් කර ගෙන ය. ඉරියාපථ පබ්බය මෙසේ ය.

1. පුන ච පරං භික්ඛවෙ! භික්ඛු ගච්ඡන්තො වා ගච්ඡාමීති පජානාති
2. ඨිතො වා ඨිතොම්හීති පජානනාති
3. නිසින්නො වා නසින්නොම්හීති පජානාති
4. සයානො වා සයානොම්හීති පජානාති
5. යථා යථා වා පනස්ස කායො පණිහිතො හොති තථා තථා නං පජානාති.

Non-Commercial Distribution

මෙහි පළමු වන පාඨයෙන් දැක්වෙන්නේ යන කල්හි යන බව දැන ගැනීමය. දෙවන පාඨයෙන් දැක්වෙන්නේ සිටින කල්හි සිටින බව දැන ගැනීමය. තුන් වන පාඨයෙන් දැක්වෙන්නේ හිඳින කල්හි හිඳිනා බව දැන ගැනීමය. සතර වන පාඨයෙන් දැක්වෙන්නේ නිදන කල්හි නිදන බව දැන ගැනීම ය. මේ පාඨ සතරින් කියැවෙන්නේ ඉරියව් සතරය. මතභේදය ඇත්තේ පස්වන වගන්තිය පිළිබඳව ය.

මහාසි තෙරුන් වහන්සේට විරෝධය දක්වන ආයුෂ්මතුන් වහන්සේලා කියන්නේ ඒ අවසාන පාඨය මුලින් ඇති පාඨ සතරෙන් දක්වන ලද ඉරියව් සතර නැවත වරක් දක්වන පාඨයක්ය කියා ය. මේ ආයුෂ්මතුන් වහන්සේලාට මෙහි ලා මතක් කර දිය යුත්තක් නම් '**අමොඝ වචනා ජිනා**' යන තථාගත වචනය ය. එහි තේරුම, බුදුවරයන් වහන්සේලා හිස් වචන - පලක් නැති වචන නැත්තෝය යනුයි. ඉදින් පළමු වගන්ති සතරෙන් දැක්වෙන සතර ඉරියව්ව නැවත දැක්වීමට යථා යථා වා පනස්ස කායො' යනාදි පාඨය වදළා නම් එය හිස් කියමනක් වන්නේ ය. කියන ලද කරුණ නැවත නැවත කීමෙන් පලක් නැත. කියන්නට දෙයක් නො දත් මෝඩ කථිකයන් තමන්ගේ දේශනය දික් ගැස්සීමට කී දෙය ම නැවත නැවත කියන්නාක් මෙන් බුදුන් වහන්සේත් කී දෙය ම නැවත නැවත කියමින් දේශනය දික් ගස්සන සේක් ද? මේ ගැන මේ ආයුෂ්මතුන් වහන්සේලා කියන්නේ කුමක් ද?

නො දන්නා බණ තෝරන්නට දඟලන මේ ආයුෂ්මතුන් වහන්සේලාට සිතට ගන්නට තවත් ප්‍රශ්නයක් මෙන්න. මේ ඉරියාපථ පබ්බයෙහි කියන ලද්ද නැවත නැවත දැක්වීම පිණිස 'යථා යථා වා පනස්ස' යනාදී පාඨය වදරන්නට වුවමනා නම්, එබඳු කියන ලද්ද නැවත කියන පාඨයක් ආනාපාන පබ්බාදි අනික් කොටස් වලටත් තිබෙන්නට ඕනෑ නොවේ ද? 'යථා යථා වා පනස්ස අස්සාස පස්සාසො පවත්තති තථා තථා නං පජානාති' යි ආනාපානපබ්බයෙහිත් වදරන්නට වුවමනා නොවේ ද? 'යං යං කරොති තං තං සම්පජානකාරී හොති' කියා චතුසම්පජඤ්ඤ පබ්බයේත් තිබෙන්නට ඕනෑ නොවේද? 'යං යං වෙදනං වෙදියමානො තං තං වෙදනං වෙදියාමී ති පජානාති' කියා වේදනානුපස්සනාවෙහිත්

Non-Commercial Distribution

තිබෙන්නට වුවමනා නොවේද? "යං යං චිත්තං හොති තං තං චිත්තං පජානාති" කියා චිත්තානුපස්සනාවේත් තිබෙන්නට ඕනෑ නොවේද? මේ ගැන මේ ආයුෂ්මතුන්ලා කියන්නේ කුමක් ද?

අප කියන්නේත් "යථා යථා වා පනස්ස" යනාදි පාඨය වදරා තිබෙන්නේ ගමනාදි ඉරියව් සතර පමණක් නොව ඇලවීම - හැරීම - උස්වීම - පහත් වීම - දිගුකිරීම - වකුටු කිරීම - අත් පා ඒ ඒ අතට ගෙනයාම - ශරීරය පිම්බීම - හැකිලීම යනාදි වශයෙන් යම් කාය විකෘතියක් වේ නම් ඒ සියල්ල ම ගැනීම පිණිසය කියා ය.

ආරංචි මාත්‍රයෙන් අනුන්ගේ දේවල් විවේචනය කරන මේ ආයුෂ්මතුන් වහන්සේලා සිතා ගෙන ඇත්තේ මහාසි තෙරුන් වහන්සේ ගේ විපස්සනා භාවනාවට ඇත්තේ උදරයේ පිම්බීම හැකිලීම සිහි කිරීම පමණය කියා විය හැකිය. පිම්බීම හැකිලීම බැලීම ඒ භාවනා ක්‍රමයේ සුළු කොටසක් පමණෙකි. තවත් බොහෝ දේ එහි ඇත්තේ ය.

## භාවනාව පිළිබඳ විවිධ මත.

> "උදරයේ පිම්බීම හැකිලීම මුල් කොට කරන මේ භාවනාව එය කරන්නවුන් විසින් ආනාපාන භාවනාවය යි කියනවාය, එබඳු ආනාපාන භාවනාවක් බුදුසස්නෙහි නැතය යනාදීන් කියමින් ඒ භාවනාවට විරුද්ධ ආයුෂ්මතුන් වහන්සේලා එය ආනාපාන භාවනාව නොවන බව දැක්වීමට ඉමහත් උත්සාහයක් කරති."

මහාසි තෙරුන් වහන්සේ පවසන ඒ භාවනාව කරවන අය, එය ආනාපාන භාවනාවය යි කියන බවක් අපි නම් නො දනිමු. එය කරවන අයත් බොහෝ දෙනකුන් ඇති බැවින් ඒ ගැන හරියට ම කියන්නට අපි නො දනිමු. මහාසි තෙරුන් වහන්සේ නම් එසේ නො කියන බව අපි දනිමු. අප එය දන්නේ ඒ භාවනා ක්‍රමය සම්පූර්ණයෙන් විස්තර කර මහාසි තෙරුන් වහන්සේ විසින් බුරුම බසින් සම්පාදනය කර ඇති විපස්සනා භාවනා පොත අප හොඳින් කියවා තිබෙන හෙයිනි. ඒ පොතෙහි නම් උදරයේ පිම්බීම හැකිලීම

Non-Commercial Distribution

සිහි කිරීමේ භාවනාව ආනාපාන භාවනාවයයි කියා නැත, එහි ආනාපාන භාවනාව වෙන ම භාවනාවක් සැටියට විස්තර කර තිබේ. මහාසි තෙරුන් වහන්සේ උගන්වන සතිපට්ඨාන භාවනාව විපස්සනා භාවනාවකි. ආනාපාන භාවනාව ශමථ භාවනාවකි. ඒ දෙක වෙන් වෙන් වූ භාවනා දෙකකි. ඒ දෙක්හි කිසිම සම්බන්ධයක් ද නැත්තේ ය.

බුදුන් වහන්සේ වදළ ආනාපාන භාවනාවක් තිබියදී අමුතු උදර භාවනාවක් කරන්නේ කුමට ද? කියා බොහෝ දෙනා ප්‍රශ්න කරති. එසේ ප්‍රශ්න කරන අය බුදුන් වහන්සේ වදළ, පිළිකුල් භාවනාව තිබියදී අශුභ භාවනා තිබියදී අනුස්සති භාවනා තිබියදී කසිණ භාවනා තිබියදී, බ්‍රහ්මවිහාර භාවනා තිබියදී මේ උදර භාවනාවක් කරන්නේ කුමටදැයි නො අසති. මෙයින් අපට පෙනෙන්නේ මහාසි තෙරුන් වහන්සේ උගන්වන භාවනාව ආනාපාන භාවනාවයයි බොහෝ දෙනකුන් වරදවා තේරුම් ගෙන සිටින බවය. ආනාපාන භාවනා වත් උදරයේ පිම්බීම් හැකිලීම් සිහි කිරීමේ භාවනාවත් එකක් නොව දෙකක් බව දැන්වත් තේරුම් ගනිත්වා!

උදරයේ පිම්බීම හැකිලීම පිළිබඳ වූ මේ සතිපට්ඨාන භාවනාවට **නාභිමණ්ඩල භාවනාවය** යන නම තබා එය අබෞද්ධ තාන්ත්‍රික භාවනාවක් හැටියට හඳුන්වා ලොව මුළා කිරීමටත් මේ ස්ථවිරවරු උත්සාහ කරති. ශරීරය කපා බැලුවත් පියවි ඇසින් දැකිය නො හෙන, යෝගීන්ගේ නුවණැසට පමණක් පෙනෙන චක්‍ර වගයක්, ශරීරයේ ඒ ඒ තැන්වල ඇති සැටියට හිඳුයෝගීහු සලකති. ඒවා ප්‍රබෝධ කරවා ගැනීමෙන් නොයෙක් බල ලැබෙතැයි කියති. ඉන් එක් චක්‍රයක් ඇත්තේ නාභිය සමීපයේ ය. එය ප්‍රබෝධ කරවීමට ඔවුන් කරන්නේ උදරයේ පිම්බීම හැකිලීම සිහිකිරීම නොව ආනාපානසති භාවනාව ම ය. ඒ නාභිමණ්ඩල භාවනා වේත් මේ සතිපට්ඨාන භාවනාවේත් කිසිම සම්බන්ධයක් නැත. මේ භාවනාව නාභිය සමීපයෙහි ඇති චක්‍රයක් ප්‍රබෝධ කරවීමට කරන්නක් නොවේ.

ආනාපාන භාවනාව නම් ඔය කියන තන්ත්‍රවලත් ඇත්තේය. හිඳුයෝගීන් බොහෝ දෙනකුන් කරන භාවනාව එය ය. ඒ නිසා

Non-Commercial Distribution

තන්ත්‍ර භාවනාවක් වශයෙන් හඳුන්වතොත් හැඳින්විය යුත්තේ ආනාපාන භාවනාව ය. උදරයේ පිම්බීම හැකිලීම පිළිබඳ භාවනාව මොනම තන්ත්‍රයකවත් ඇති බවක් අප නම් අසා නැත. එය තන්ත්‍රවල සඳහන් නාභිමණ්ඩල භාවනාව නොවන බව මේ ආයුෂ්මතුන් වහන්සේලා දන්නවා ඇතුවාට නම් සැකයක් නැත. ඔය තන්ත්‍ර ගැන දන්නා අය බෞද්ධයන් අතර සුලභ නැත. එබැවින් මේ කාරණයෙහි ලා තන්ත්‍ර තබා බුද්ධාගමවත් නො දන්නා බෞද්ධයන් ලෙහෙසියෙන් රැවටිය හැකි ය. මෙය අනුන් රැවටීමේ චේතනාවෙන් ම මේ ආයුෂ්මතුන්ලා විසින් කරන වැඩක් විය යුතුය. මේවාට බෞද්ධයෝ නො රැවටෙත්වා.

## භාවනා මධ්‍යස්ථාන හා ගුරුවරු.

"භාවනා දන්නෝත් අපි ය, බණ දන්නෝත් අපි ය, සිල් රකින්නෝත් අපි ය, ගරු බුහුමන් ලැබීමට සුදුස්සෝත් අපි ය, සැම වැඩක ම පෙරමුණේ සිටින්නට සුදුස්සෝත් අපි ය" කියා තමන් ගැන මුළාවී සිටින ඇතැම් අයට කඳුබොඩ ආදි ස්ථානවල භාවනා මධ්‍යස්ථාන තිබීමත් භාවනා පුහුණු කරවන බුරුම භික්ෂූන් මේ රටට පැමිණීමත් හිසරදයක් වී තිබෙන්නාක් සේ පෙනේ. ඒ ස්ථවිරවරු භාවනා මධ්‍යස්ථානවලට භාවනා ප්‍රදර්ශන ස්ථානයන් යයි කියමින් නින්ද කෙරෙති. තම තමන්ගේ සිත්වල ඇති අනුන් ගේ සම්පත් නො ඉවසන ස්වභාවය නිසා ඇතමුන් නින්ද කළත් නිවන් සොයන සැදැහැවතුන්ට භාවනා මධ්‍යස්ථානවලින් ඇති ප්‍රයෝජනය ඉතා මහත් ය.

මෙලොවදී ම භාවනාවෙන් යම් කිසි ඵලයක් දැකිය හැකි වීමට නම්, බුදුරජාණන් වහන්සේ වදරා ඇති පරිදි නිදන කාලය හැර ඉතිරි සම්පූර්ණ කාලයෙහි ම නීවරණයන් කෙරෙන් සිත පිරිසිදු කිරීම් වශයෙන් භාවනාවෙහි යෙදිය යුතු ය. මාස ගණනකදී සති ගණනකදී දින ගණනකදී භාවනා ඵලය ලැබිය හැකි බව බුදුන් වහන්සේ වදරා ඇත්තේ එසේ භාවනා කරන අයට ය. පන්සල්වල හෝ ගෙවල වෙසෙමින් භාවනා කරන අයට පිට පිට සති ගණනක් දින ගණනක් තබා සම්පූර්ණ කාලයෙහි භාවනාවෙහි යෙදීමට එක්

Non-Commercial Distribution

දිනක් වත් අවකාශ ලබා ගැනීම ඉතා දුෂ්කරය. භාවනා මධ්‍යස්ථානවල ඒවායේ නැවතී භාවනා කරන අයට මුළු දවසේ ම භාවනාවෙහි යෙදිය හැකි වන පරිදි සියල්ල පිළියෙල කොට තිබේ. එබැවින් ඒ තැනකට ගිය පින්වතාට තමාගේ අදහස මුදුන්පත් කර ගැනීමට ඉඩ ලැබේ. තවත් පිරිසක් සමඟ භාවනාවෙහි යෙදෙන්නාට භාවනා කිරීම සඳහා මහත් උනන්දුවක් ඇති වේ. මහත් ධෛර්‍ය්‍යක් ඇති වේ.

යෝගාවචරයකුට විවේකය නැති වන්නේ තමා සමීපයෙහි භාවනා නො කරන අය සිටිය හොත් ය. තමා සේ ම භාවනා කරන අය කොතෙක් සිටියත් එයින් යෝගාවචරයකුට යහපතක් මිස නපුරෙක් නොවේ. කෙනකු තනිව විවේකස්ථානයකට එළඹ භාවනා කරන්නට පටන් ගත්තත් ක්‍රමයෙන් ඒ තැනැත්තාගේ ධෛර්‍ය්‍ය හීන වේ. සමහර විට බිය ද ඇති වේ. සමූහයක් හා එක්ව භාවනා කරන තැනැත්තාට අන්‍යයන් දැකීමෙන් වඩ වඩා ධෛර්‍ය්‍යය ඇති වේ. බිය ද ඇති නොවේ.

පෙර බුද්ධ කාලයේදී බුදුන් වහන්සේගෙන් කමටහන් ගත් බොහෝ භික්ෂූන් වහන්සේලා තනි තනිව ම භාවනාවට නො ගොස් තවත් අය සොයාගෙන සමූහ වශයෙන් සුදුසු ස්ථානවලට ගියේ එහෙයිනි. තනි තනිව භාවනා කරනවාට වඩා තවත් අය භාවනා කරන ස්ථානයකට ගොස් භාවනා කිරීමෙන් කාහට වුවත් වඩා යහපතක් වන බව කිය යුතු ය. කරුණු මෙසේ හෙයින් භාවනා මධ්‍යස්ථාන තිබීම සසර දුකින් මිදෙනු කැමති ගිහි පැවිදි සැම දෙනාට ම ඉමහත් යහපතක් බව කිය යුතු ය. අනුන්ට දැනෙන ලෙස ප්‍රසිද්ධියේ භාවනා නො කළ යුතු ය කියා තථාගතයන් වහන්සේගේ නියමයක් නැත. ප්‍රතිපත්තියට විරුද්ධ ජනයා අතර වෙසෙමින් ඔවුනට දැනෙන සේ භාවනා කරන පින්වතුන්ට සමහර විට අන්‍යයන්ගෙන් කරදර විඳින්නට සිදු වේ. එබැවින් එබඳු ජනයා අතර වෙසෙන පින්වතුන්ට නම් රහසින් භාවනා කිරීම ආත්මාරක්ෂාවට හොඳය.

භාවනා කරන පිරිසක් දුටු කල්හි ඒ පිරිස ආදර්ශයට ගෙන තවත් අය භාවනා කරන්නට පටන් ගන්නා බැවින් ප්‍රසිද්ධියේ

Non-Commercial Distribution

භාවනා කිරීමෙන් වන්නේ ලොවට යහපතකි. අනුන්ට ක්‍රියාවෙන් ආදර්ශ දිය යුතුය කියා දහම් දෙසන ඇතැම් ආයුෂ්මතුන් වහන්සේලා භාවනා කිරීමට ආදර්ශය දෙන, භාවනා මධ්‍යස්ථාන වලට 'භාවනා ප්‍රදර්ශනස්ථානය' යි කියමින් නින්ද කිරීමේ රහස නුවණැතියන්ට අවබෝධ වෙනවා ඇත.

භාෂා දෙක තුනක් දැනගත්තාට, බණ ටිකක් කියන්නට දැන ගත්තාට, ප්‍රවෘත්ති පත්‍ර කියවන්නාක් මෙන් අතනින් මෙතනින් බණ පොත් ටිකක් කියවා තුබුණාට, ඉඳහිට මතක් වූ වේලාවකදී සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා යි කීවාට, අනිච්චං දුක්ඛං අනත්තායි කීවාට, භාවනා ගැන දැනෙන්නේ නොවේ. හොඳ ගුරුවරයන්ගේ උපදෙස් අනුව කලක් හොඳින් භාවනා පුරුදුකර ඇති, පිටකත්‍රය ධර්මය ගැන දැනීම ඇති, නොයෙක් භාවනා ක්‍රම ගැන විමසා ඇති, භාවනා කළ බොහෝ දෙනකුන් ගේ තතු විමසා බලා ඇති අය ම භාවනා ගැන දන්නා අය වෙති. එබඳු අය ම කර්මස්ථානාචාර්යත්වයට සුදුසු වන්නේ ය. පිටකත්‍රය ම දැන සිටියත් එපමණින් ඒ තැනැත්තා හොඳ කර්මස්ථානාචාර්යවරයෙක් නොවේ. කමටහන් වඩනු කැමති නම් ත්‍රිපිටකධාරියකුට වුවද කර්මස්ථානාචාර්යවරයකු සොයාගෙන ඒ ආචාර්යවරයාගේ උපදෙස් අනුව වැඩ කිරීම ම කමටහන් වැඩීමේ හොඳ ක්‍රමය ය.

**පොට්ඨිල තෙරුන් වහන්සේ ය මහාසීව තෙරුන් වහන්සේය** යන මේ දෙනම ම ත්‍රිපිටක ධරයෝ ය. ගණාචාරයෝ ය. ඒ දෙනමගෙන් පොට්ඨිල තෙරුන් වහන්සේ කර්මස්ථානාචාර්ය වරයකු ගේ උපදෙස් අනුව භාවනා කොට නොබෝ කලකින් සියලු කෙලෙස් නසා රහත් වූහ. මහාසීව තෙරුන් වහන්සේ කාගෙන්වත් උපදෙස් නො ගෙන තමන්ගේ පණ්ඩිතකමේ හැටියට ම භාවනා කළහ. උන් වහන්සේට රහත් විය හැකි වූයේ තිස් වසක් දුක් විඳීමෙන් පසුව ය. ත්‍රිපිටකය පිළිබඳ දැනුම ම කර්මස්ථානාචාර්යත්වයට ප්‍රමාණ නොවන බවට මෙය හොඳ නිදසුනෙකි. පොට්ඨිල තෙරුන් වහන්සේගේ කථාව ධම්පියාඅටුවාවේ මග්ගවග්ගයෙහි ඇත්තේ ය. මහාසීව තෙරුන් වහන්සේගේ කථාව සක්කපඤ්හ සූත්‍ර අටුවාවෙහි ඇත්තේ ය. දික් වන බැවින් මෙහි නො දක්වනු ලැබේ. දනු කැමැත්තෝ ඒ පොත්වලින් බලා ගනිත්වා.

Non-Commercial Distribution

අප දන්නා අය අතුරෙන් ඉතාම හොඳ කර්මස්ථානාචාර්‍ය්‍ය වරයා හැටියට සැලකිය යුතු තැනැත්තා මහාසි ස්ථවිරයන් වහන්සේ ය. උන්වහන්සේ උගතෙකි. කමටහන් වඩා පලපුරුදු කම් ඇති යෙකි. කමටහන් පුහුණු කරවීමේ පලපුරුදු කම් ඇතියෙකි. උන්වහන්සේ උගන්වන භාවනා මාර්‍ගය උගෙන දැනට අප රටේ භාවනා මධ්‍යස්ථානවල භාවනාව පුහුණු කරවන ස්ථවිරයන් වහන්සේලා ද, සාමාන්‍යයෙන් හොඳ ගුරුවරයන් බව කිය යුතු ය. මේ කාලයේ ඒ කර්මස්ථානාචාර්‍ය්‍ය පිරිස ඇති වීම අප රටට සිදු වූ ඉතාම යහපතකි.

## භාවනා ක්‍රම

බොහෝ භාවනා ඇත්තේ ය. එක් එක් භාවනාවකට ද පුහුණු කිරීමේ ක්‍රම බොහෝ ඇත්තේ ය. විදර්‍ශනා භාවනාවට වඩාත් ක්‍රම ඇත්තේ ය. තථාගතයන් වහන්සේ චූලපන්ථක තෙරුන් වහන්සේට භාවනාවට දුන්නේ රෙදි කැබෙල්ලකි. සුවණ්ණකාර තෙරුන් වහන්සේට දුන්නේ පද්මයෙකි. බුදුන් වහන්සේ වෙත පැමිණ කමටහන් ඉල්លූ ඒ ඒ භික්ෂූන්ට තථාගතයන් වහන්සේ විසින් දුන් නොයෙක් ක්‍රමවල කමටහන් දැක්වෙන සූත්‍ර බොහෝ ගණනක් සංයුත්ත නිකායෙහි ඇත්තේ ය. විශුද්ධිමාර්‍ගයෙහි ද විදර්‍ශනා වැඩීමේ ක්‍රම ගණනක් ඇත්තේ ය. ඒ ඒ ආචාර්‍ය්‍ය පරම්පරාවල පුරුදු කරගෙන එන විදර්‍ශනා භාවනා ක්‍රම බොහෝ ඇත්තේ ය. සූත්‍රවල එන භාවනා ක්‍රමවලින් බොහෝවක් ම ඒවා අසාගත් තෙරුන් වහන්සේලාට පමණක් සුදුසු ඒවා ය.

ආචාර්‍ය්‍ය පරම්පරාවල එන භාවනා ක්‍රම බොහෝ දෙනාට සුදුසු ඒවා ය. ආචාර්‍ය්‍යපරම්පරාවල එන භාවනා ක්‍රමවලින් මහාසි තෙරුන් වහන්සේ පුහුණු කරවන භාවනා ක්‍රමය ඒ ක්‍රමයට භාවනා කළ බොහෝ දෙනකුන් විසින් සතුටක් ලබා ඇති භාවනා ක්‍රමයෙකි. "ඔය බුරුම භාවනා අපට එපාය අපේ රටේ පරම්පරාගතව එන බුදුන් වහන්සේ වදාළ භාවනා අප දන්නවා" ය යි භාවනා නො කරන ඇතමුන් ඝෝෂා කරතත් අරණ්‍ය සේනාසනවල වෙසෙමින් බොහෝ කල් භාවනා කොට සතුටට පත් වීමට තරම් දෙයක්

Non-Commercial Distribution

නොවූ බොහෝ භික්ෂූන් වහන්සේලා මත්තේගොඩ පිහිටවා තුබූ භාවනා මධ්‍යස්ථානයටත් කඳුබොඩ භාවනා මධ්‍යස්ථානයටත් ගොස් මහාසි තෙරුන් වහන්සේ ගේ භාවනා ක්‍රමය පුහුණු කර ගත් බව අපි දනිමු. මේ භාවනාව ගැන අමාරු වී ඇත්තේ භාවනා නො කරන අයට ය.

## සතිපට්ඨාන විපස්සනා භාවනාව

මහාසි තෙරුන් වහන්සේ පුහුණු කරවන සතිපට්ඨාන විපස්සනා භාවනාව ශුද්ධ විපස්සනා භාවනාවකි. එය කිරීමේදී උදරයේ පිම්බීම හැකිලීම මෙනෙහි කිරීමේ තේරුම බොහෝ පින්වතුන් නො දන්නා බැවින් එය ගැන විස්තරයක් කරනු ලැබේ. තථාගතයන් වහන්සේ **භද්දේක රත්ත** සූත්‍රවලදී විපස්සනා භාවනාව කළ යුතු අයුරු මෙසේ වදරා ඇත්තේ ය.

(1) අතීතං නාන්වාගමෙය්‍ය නප්පටිකඞ්ඛෙ අනාගතං,
යදතීතං පහීණං තං අප්පත්තඤ්ච අනාගතං.

(2) පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති
අසංහීරං අසඞ්කුප්පං තං විද්වා මනුබ්‍රූහයෙ.

(3) අජ්ජෙව කිච්චං ආතප්පං කො ජඤ්ඤා මරණං සුවෙ
නහි නො සඞ්ගරං තෙන මහාසෙනෙන මච්චුනා.

(4) එවං විහාරිං ආතාපිං අහොරත්ත මතන්දිතං
තං වෙ භද්දේකරත්තොති සන්තො ආචික්ඛතෙ මුනි.

මේ ගාථා භද්දේකරත්ත උද්දේසය ය. මේ ගාථා තථාගතයන් වහන්සේ විසින් මිනිස් ලොවදී පමණක් නොව දෙව්ලොවදීත් වදාළ බව භද්දේකරත්ත සූත්‍රවල සඳහන් වේ. දෙව් ලොවදීත් වදාළ බැවින් මේ ගාථා දෙවියන් අතරත් ප්‍රසිද්ධ ය. භද්දේකරත්ත සූත්‍ර ඇත්තේ මජ්ඣිම නිකායේ උපරිපණ්ණාසකයේ ය. මේ ගාථාවල තේරුම නියම සිංහලයෙන් කිය යුත්තේ මෙසේ ය.

(1) අතීත සංස්කාරයන් අනුව සිත දුවන්නත් එපාය. අනාගත සංස්කාරයන් පතන්නත් එපාය. යම් සංස්කාරයක් අතීත නම් ඒවා නැතිවිය. අනාගත සංස්කාරයන් දැනට ඇත්තේත් නැත.

Non-Commercial Distribution

(2) දැනට ඇත්තා වූ සංස්කාරයන් ම ඒවා ඇති වන ඇති වන තැන්වලදී ම විදර්ශනා කරන්න ය. තෘෂ්ණා දෘෂ්ටීන් විසින් ඇදගත නොහෙන පරිදි කිළිටි කළ නොහෙන පරිදි වර්තමාන සංස්කාරයන් පිළිබඳ විදර්ශනාව දියුණු කළ යුතු ය.

(3) කරන්නට ඇති දෙය අදම කරන්නට ඕනෑ ය. හෙට මැරේද යන වග දන්නේ කවුද? මහාසේනා ඇති මාරයා හා අපගේ ගිවිසුමක් නැත.

(4) අනලසව රෑ දවල් දෙක්හි කෙලෙස් නැසීමට වීර්‍ය්‍ය කරන ඒ යෝගාවචරයා හුදකලාව වෙසෙන යහපත් තැනැත්තාය යි ශාන්ත වූ මුනිවරයෝ පවසත්.

'ඒකාරත්ත' යන වචනයෙන් කියැවෙන්නේ තනිව වෙසෙන තැනැත්තාය. යෝගාවචරයන් බොහෝ සෙයින් තනිව වෙසෙන බැවින් ඔවුනට 'ඒකරත්ත' යන නම කියනු ලැබේ. "භද්දෙකරත්ත" යනුවෙන් කියැවෙන්නේ යහපත් යෝගාවචරයා ය. යහපත් යෝගාවචරයාය කියන්නේ අනලසව රෑ දවල් දෙක්හි ම භාවනා කරන තැනැත්තාය. දක්වන ලද ගාථාවල '**පච්චුප්පන්නඤ්ච යො ධම්මං තත්ථ තත්ථ විපස්සති**' යනුවෙන් දැක්වෙන්නේ ඒ ඒ තැන උපදනා වර්තමාන සංස්කාරයන් ඒ ඒ තැනදී ම ඒ ඒ වේලාවේදී ම විදර්ශනා කළයුතු බවය. '**එවං විහාරිං ආතාපිං අහොරත්ත මතන්දිතං**' යනුවෙන් දැක්වෙන්නේ අනලසව රෑ දවල් දෙක්හි ම විදර්ශනා කළයුතු බව ය. මතක් වුණු වේලාවකදී ඉඳහිට කරන භාවනාව ප්‍රමාණවත් නො වන බවද එයින් දත හැකි ය.

මහාසි තෙරුන් වහන්සේ පුහුණු කරවන විදර්ශනා භාවනාව මේ භද්දෙකරත්ත සූත්‍රය අනුව පිළියෙල කරන ලද්දකි. එය කරන යෝගාවචරයා විසින් ඒ ඒ අවස්ථාවෙහි තමාගේ චක්ඛු සෝත ඝාණ ජිව්හා කාය මන යන සදොරට ඒ ඒ වෙලාවේදී හසුවන සියලු සංස්කාරයන් ම විදර්ශනා කළ යුතු ය. ඇතමුන් සෝෂා කරන්නේ උදරයේ පිම්බීම් හැකිළීම් සිහි කිරීම ම මහාසි තෙරුන් වහන්සේගේ භාවනා ක්‍රමය යි වරදවා තේරුම් ගැනීමෙනි. ඒ විදර්ශනාව කරන ක්‍රමය අප විසින් සම්පාදිත **පෞරාණික සතිපට්ඨාන භාවනා ක්‍රමය** නමැති පොතෙහි විස්තර කර ඇත.

Non-Commercial Distribution

උදරයේ පිම්බීම හැකිළීම සිහි කිරීමත් ඒ විදර්‍ශනා භාවනා මාර්‍ගයේ එක් කොටසකි. උදරයේ පිම්බීම හැකිළීම සිහි කිරීම් වශයෙන් කරන්නේ කුමක් ද? යන වග තේරුම් ගත හැකි වන්නේ, විදර්‍ශනාවය කියන්නේ කුමකටද යන බව තේරුම් ගත්තාට පසුවය. විපස්සනා යන වචනයෙහි 'වි, පස්සනා' කියා කොටස් දෙකක් ඇත්තේ ය. 'පස්සනා' යන කොටසෙන් කියැවෙන්නේ 'දැකීම' ය. 'වි' යන්නෙන් කියැවෙන්නේ දැකීම පිළිබඳ විශේෂත්වය' ය. කෙස්ය ලොම්ය නියය දත්ය යනාදීන් ඒ ඒ දෙය සිහි කරන්නා වූ තැනැත්තාගේ මනැසට හසුවන්නේ ප්‍රඥප්තියකි. එය සාමාන්‍ය දැකීමය. ප්‍රඥප්තිය ඉක්මවා එයට යටින් ඇති පෘථිවිධාත්වාදි පරමාර්‍ථ රූප ධාතුන් දැකීම විශේෂ උසස් දැකීමකි. විදර්‍ශනය කියන්නේ ඒ විශේෂ දර්‍ශනයට ය.

පඤ්චෝපාදානස්කන්ධයන්ට අයත් නාම රූප ධර්‍ම හා ඒවායේ අනිත්‍යාදි ලක්‍ෂණත්‍රය ප්‍රත්‍යක්‍ෂ වශයෙන් දක්නා ඥානය විදර්‍ශනාවය. ඒ ඥානය ඇති කර ගැනීම සඳහා දියුණු කර ගැනීම සඳහා යෝගාවචරයන් විසින් කරන උත්සාහය විදර්‍ශනා භාවනාවය. නිකම්ම "අනිච්චං දුක්ඛං අනත්තා" යි කීවාට විදර්‍ශනාඥානය ඇති වන්නේ නොවේ. ඒ ඥානය ඇති වන්නේ පරමාර්‍ථ නාම රූප ධර්‍ම ඉපද ඉපද බිඳි බිඳී යන සැටි දැකීමෙනි. බිඳි බිඳී යනු දැකීම අනිත්‍ය දර්‍ශනය ය. එය අනුව දුඃඛ දර්‍ශන අනාත්ම දර්‍ශන දෙක ද ඇති වේ. නාම රූප දෙකින් නාමය සියුම්ය. රූපය ඖදරිකය. එබැවින් විදර්‍ශනා කරන්නට පටන් ගන්නා තැනැත්තාට රූපයෙන් පටන් ගත්තා ම පහසු ය. රූපවලිනුත් පළමුවෙන් විදර්‍ශනා කරන්නට පටන් ගත යුත්තේ තමාගේ ශරීරයේ ම රූප ගැන ය.

මුළු ශරීරයට ම එකවර සිත යවා බැලීමෙන් පරමාර්‍ථ රූප ධාතුන් සොයා ගැනීම පහසු නැත. යම්කිසි එක් තැනකට සිත යොමු කර ගෙන එක් තැනක ම සිත පිහිටවා ගෙන සිටියාම එහි ඇති රූප වෙන් වෙන්ව වැටහෙන්නේ ය. ඒ රූප පිරිසිඳීම අසවල් තැන සිට පටන් ගත යුතුය කියා බුදුන් වහන්සේගේ නියමයක් නැත්තේ ය. යෝගාවචරයා කැමති තැනක සිත පිහිටුවා ගෙන භාවනා කිරීමට ඇති තහනමක් ද නැත්තේ ය. සෙලවෙන තැනක

Non-Commercial Distribution

සිත පිහිටුවා ගැනීමෙන් පහසුවෙන් රූප ධාතු හැඳින ගත හැකි ය. එසේ ම ඒවායේ ඉපදීම බිඳීම ද දැකිය හැකි ය. මේ ශරීරයෙහි උදරමාංශය නිතර ම සෙලවෙන තැනකි. එහි සිත පිහිටවා ගැනීමෙන් රූප ධාතුන් හා ඒවායේ ඉපදීම බිඳීම පහසුවෙන් දැකිය හැකිය. උදරයේ පිම්බීම හැකිළීම පිළිබඳ භාවනාව පවත්වන්නේ ඒ නිසා ය.

උදර මාංශයෙහි සිත පිහිටවා ගෙන ඉන්නා යෝගාවචරයාට එහි එහා මෙහා යන ස්වභාවය පහසුවෙන් වැටහෙන්නේ ය. එය වායෝ ධාතුවය. ඒ එහා මෙහා යන ස්වභාවය හා යම්කිසි තදගතියක් රළු ගතියක් ඇති බව ද දැනෙන්නේ ය. එය පෘථිවි ධාතුව ය. ඒවා නො විසිරෙන පරිදි එකට ඇලී එකට බැඳී ඇති ස්වභාවයක් ඇති බව ද දැනෙන්නේ ය. එය ආපෝ ධාතුව ය. කල් යාමෙන් ඒ උදර මාංශයේ උණුසුම් ගතියක් ඇති බව ද දැනෙන්නේ ය. එය තේජෝ ධාතුව ය. මෙසේ මහා ධාතු සතර දුටු යෝගාවචරයාට ක්‍රමයෙන් එහි ඇති ඉතිරි රූප ද පෙනෙන්නට වන්නේ ය. මෙසේ පරමාර්ථ රූප ධාතුන් දුටු යෝගාවචරයාට ඒ රූප ධාතු හැර උදරමාංශය කියා දෙයක් සත්‍ය වශයෙන් නැති බව වැටහෙන්නේ ය.

උදරමාංශයේ ඉදිරියට යන ස්වභාවය පවත්නා කල්හි පස්සට යන ස්වභාවය නැති බවත්, පස්සට යන කල්හි ඉදිරියට යන ස්වභාවය නැති බවත් යෝගාවචරයාට වැටහෙන්නේ ය. එයින් ඔහුට ඉදිරියට යන වායෝ ධාතුව අනිකක් බවත් පස්සට යන වායෝ ධාතුව අනිකක් බවත් වැටහෙන්නේ ය. ඉදිරියට යන ස්වභායක් ඇති විට එය නැති වී ගිය පසු පස්සට යන ස්වභාවයක් ඇති වී නැති වී යන බව ඔහුට පෙනෙන්නට වන්නේ ය. මේ පෙනීම වායෝ ධාතුව පිළිබඳ වූ උදයබ්බයඤාණය ය. වායෝ ධාතුවේ ඉපදීම් බිඳීම් දෙක පැහැදිලි වූ යෝගාවචරයාට වායෝ ධාතුව හා සම්බන්ධ වී පවත්නා පඨවි ආපෝ තේජෝ ධාතුන්ගේ උපාදාය රූපයන්ගේ ද වායෝ ධාතුව සමඟ ම ඉපද ඉපද බිඳි බිඳී යන සැටි පෙනෙන්නට වන්නේ ය. එය උදයබ්බයඤාණය තව දුරටත් දියුණු වීමකි.

Non-Commercial Distribution

මේ සෙලවෙන ස්වභාවය ඇත්තේ උදරමාංශයෙහි පමණක් නොවේ. භාවනා නො කළ අයට ශරීරයේ අනික් තැන්වල චලනයක් ඇති බව නො දැනේ. එහෙත් මේ චලනය ශරීරය සැම තැන ම ඇත්තේ ය. උදරමාංශයේ සිත පිහිටුවා භාවනා කරන තැනැත්තාට සමාධිය හා ඥානය දියුණු වන්න දියුණු වන්න මුළු ශරීරයේ ම පවත්නා චලනය වැටහෙන්නට වන්නේ ය. එයින් ඔහුට උතුරන බත් සැලියක පෙණ බුබුලු නැග නැඟ පුපුර පුපුරා යන්නාක් මෙන් මුළුශරීරයේ ම රූප ඉපද ඉපද බිඳි බිඳී යාම පෙනෙන්නට වන්නේ ය. රූපයන් පිළිබඳ දර්ශනය පිරිසිදු වූ පසු යෝගාවචරයාට නාමධර්ම ඉපද ඉපද බිඳි බිඳී යාම ද පෙනෙන්නට වන්නේ ය. ඉන්පසු ඔහුට සකල සංස්කාරයන් පිළිබඳ වූ ම සත්‍ය වූ අනිත්‍ය දුඃඛ අනාත්ම දර්ශනය ඇති වන්නේ ය. නාමරූප හැර ආත්ම වශයෙන් පිළිගත යුතු අනිකක් ඒවා අතර නැති බවද ඔහුට ප්‍රත්‍යක්ෂ වන්නේ ය. විදර්ශනා ඥානය දියුණු කර ගැනීමෙන් ඔහුට සතර මාර්ග සතර ඵලයන්ට පැමිණ දුකින් මිදී නිවන් සැපයට පැමිණිය හැකි වන්නේ ය. කියන ලද දර්ශන මඳ වේලාවක් උදරයේ පිම්බීම හැකිලීම සිහි කළ පමණින් ඇති වෙතැයි වරදවා නො ගත යුතු ය.

මේ උතුම් විදර්ශනා භාවනා මාර්ගය ය. තමන්ගේ නො දැනීම ම පණ්ඩිතකම සැටියට වරදවා තේරුම් ගෙන සිටීම නිසා හෝ මේ භාවනා ක්‍රමය පැතිර යාමෙන් තමන්ගේ තත්ත්වය පහත්වී යනු ඇතය යන හැඟීම නිසා හෝ තමන්ට දයකයන් අඩු වී යති ය යන හැඟීම නිසා හෝ මෙය පුරුදු කරවන කර්මස්ථානාචාර්‍යවරයන්ට ඇති වන කීර්තිය නො ඉවසිය හැකි නිසා හෝ ඇතමෙක් මෙම උත්තම විදර්ශනා භාවනා මාර්ග වසා දමන්නට තැත් කරති. සසර දුකින් මිදෙනු කැමති නුවණැත්තෝ එයට නො රැවටී මේ උත්තම භාවනා මාර්ගයෙන් අත්‍යුත්තම ලෝකෝත්තර නිර්වාණධාතුව පසක් කොට දුකින් මිදෙත්වා.

Non-Commercial Distribution

# පූජාවාද නිරාකරණය

මේ කුඩා පොත් පිං.ච රේරුකානේ නාහිමියන් ගේ අදහස, උන්වහන්සේගේ ශිෂ්‍ය වර්තමාන ශ්වේජින් නිකායේ මහානායක **හේනේගම කල්‍යාණසිරි** ස්වාමිපාදයන් වහන්සේගේ නමින් පල වූවකි.

මහ පිරිවෙන් විශ්ව විද්‍යාල තත්ත්වයට පත් අලුත, සමහර ගැටවර භික්ෂූන් වහන්සේ සාම්ප්‍රදයික ආගමික රටාව විවේචනය කිරීම යම් යම් බලවේගයන්ට නතු වීමක් ද විය හැකි ය.

මේ ලිපියට ප්‍රස්තුත වූ හිමිපාණන් වහන්සේ පසුව ඒ මත බැහැර කොට සසුනට විශාල සේවයක් ද කළහ.

**සංස්කාරක**.

ප්‍රථම මුද්‍රණය 1950

Non-Commercial Distribution

# පූජාවාද නිරාකරණය

**නමෝ තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

**පිත්වත්ති.**

සාමාන්‍ය මනුෂ්‍යඥානයට අවිෂය වූ පරලොව පිළිබඳ වූ ද (මෝක්ෂය පිළිබඳ වූද) පඤ්චේන්ද්‍රියයන්ට අවිෂය වූ අද්‍රව්‍ය වූ පරම සූක්ෂම වූ පින් පව් ආදි ධර්මයන් පිළිබඳ වූ ද ඉගැන්වීමක් වූ තථාගත ධර්මය අතිශයින් ම ගැඹුරු ය. ඒ ධර්මය පාලි සංස්කෘත ඉංග්‍රීසි ආදි භාෂාවක් ඉගෙනීමෙන් හෝ ධර්මයෙන් අන්‍ය ශාස්ත්‍රයක් ඉගෙනීමෙන් හෝ නො දත හැකි ය. වර්තමාන කාලයේ සමහරු සභාවක් මැද මොකවත් කියන්නට පුරුදු කරගත් පමණින් ද වාක්‍යයක් ගලපා ලිපියක් ලියා ගත හැකි වූ පමණින් ද අපිත් ධර්මධරයම්හ, ධර්මකථිකයම්හයි තමා ගැන ම තමා මුලාව මානයෙන් මත්ව අතනින් මෙතනින් අවුලාගත් බණපදටිකට තමාගේ ලපටි කල්පනාවට පෙනෙන මිථ්‍යා මත රැසක් එකතු කොට බණ වගේ ජාතියක් තැන තැන කියති.

ඒවාම පත්‍රිකාවල මුද්‍රණය කරවා මහජනයා අතර පතුරුවති. මොනම බණක්වත් හරිහැටි නොදත් මොවුන්ගේ මේ ක්‍රියා කලාපය අන්ධයන්ගේ මත් පෙන්වීමට පටන් ගැනීමක් වැනිය. මගත් නො මගත් දෙක ම මගයයි සිතන අන්ධයා පෙන්වන මගක් වැනිවූ බොරු සැබෑ දෙවර්ගයෙන් ම මිශ්‍ර වූ මොවුන්ගේ දේශනාවෝ ඔවුනට හලාහල විෂයක් වැනි ය. මතු දියුණුවී අප ආගම ජාතිය ගෙනයන්නට සිටින තරුණ පෙලට මී විෂයක් වැන්න.

නිර්මල වූ සර්වඥ ධර්ම නමැති ශ්වේත වස්ත්‍රයෙහි දැලිගෑමක් වැන්න. තමාගේ අඥකම ම බලය කරගෙන සිටින මොව්හු

Non-Commercial Distribution

උතුමන්ට ගර්හා කරති. පරම්පරාගතව පවත්වාගෙන එන බෞද්ධ වැඩ ද හෙලා දකිති. අඥානකම වැඩි පමණට අනුන්ට හා අනුන් කරන වැඩවලටත් ගර්හා කිරීම ලෝක ස්වභාවක් මැයි. නුමුත් බොරු බණ කියා ධර්මය සොයන සැදැහැවතුන් නොමග යැවීම හා පින් කැමතියන්ගේ සිත් කලකිරවීමත් ලෝකශාසන දෙකට කරන මහත් වූ අන්තරායකි.

පින් පව් නො හඳුනන මේ පුද්ගලයෝ ඇතැම් පින්කම් හිස් කම් කොට ද පව්කම් කොට ද ඇතැම් පව්කම් පින්කම් කොට ද ප්‍රකාශ කරමින් ආගම ධර්මය පිළිබඳ මහත් වූ විපර්‍යාසයක් කරති. බුද්ධපූජා නිෂ්ඵලය, පහන් පින්කම් නිෂ්ඵලය, සම්මාදම් නොකළ යුතුය, නොදිය යුතුය, විහාරවල තිබෙන පිං පෙට්ටි පව් පෙට්ටිය, ඒවාට මුදල් නොදැමිය යුතුය, ධර්ම පූජා නො කළ යුතුය, යනාදීන් මොවුන් විසින් උපදවන ලද මිථ්‍යාමත නමැති ශාසන කණ්ඨක රාශියකි. මේ මිථ්‍යාමත වලින් මහජනයාට ආරක්ෂාවීම පිණිස හා බුදු සස්න චිරකාලයක් පැවතීම පිණිසත් මේවා පිළිබඳ නියම ධර්ම මාර්ගය සැකෙවින් දක්වනු ලැබේ.

## පින් පව්.

තථාගත ධර්මයෙහි පින් පව් යයි උගන්වන්නේ යම් කිසි ද්‍රව්‍ය ජාතියක් නොව තමා සතු දෙය පරහට දීම් අන්සතු දෙය පැහැරගැනීම් ආදි ක්‍රියා සිද්ධ කරමින් සත්ත්වයන් තුළ උපදනා. චිත්ත චෛතසික ධර්මයෝ ය. චෛතසික ධර්මයන් අතුරෙන් ලෝභය ද්වේෂය මෝහය යන මොව්හු අකුශල මූලයෝ ය. යම් කිසි සිතිවිල්ලක් මේ තුනෙන් එකකින්වත් යුක්තවී නම් එය පාපයක් වන්නේ ය. අලෝභය මෛත්‍රිය ප්‍රඥාව යන මේ තුන කුශල මූලයෝ ය. මේවායින් යුක්තව උපන් සිතිවිල්ල කුශල් වන්නේ ය. මෙය ඉතා කොටින් පින් පව් තේරුම් ගත යුතු ආකාරයයි. චිත්ත චෛතසික ධර්ම වූම ඒ කුශලය දාන සීල භාවනා වශයෙන් තෙවදෑරුම් වේ. එයින් තමා අයත් වූ ආහාර පාන මල් පහන් ආදි යම් කිසි වස්තුවක් හෝ මුදලක් හෝ පරිත්‍යාග කිරීම් වශයෙන් පහළවන්නා වූ චිත්ත චෛතසික ධර්ම සමූහය දානමය

Non-Commercial Distribution

කුශලය යි. පරිත්‍යාගය ද පූජා වශයෙන් කරන්නා වූ පරිත්‍යාගය අනුග්‍රහ වශයෙන් කරන්නා වූ පරිත්‍යාගයයි දෙවැදෑරුම් වේ. යම් කිසිවෙකුට ඇත්තාවූ අඩුපාඩුව අමාරුකම බලා ආහාරපාන වස්ත්‍ර මිල මුදල් ආදිය දීම අනුග්‍රහ වශයෙන් කරන්නා වූ පරිත්‍යාගයයි. මෙය යාචකාදීන් විෂයෙහි කරනු ලැබේ. දීමනාව මහත්ඵල කිරීමෙහි සමර්ථ ගුණයන් ගෙන් යුක්ත වූවන් කෙරෙහි ගරු බුහුමන් පෙරටුකොට දීම පූජා වශයෙන් දෙන්නා වූ දනයයි. පූජාව ලැබීමට සුදුස්සෝ බුද්ධාදි උත්තමයන් වහන්සේලා ය. පූජාහී බුද්ධාදි උත්තමයන් වහන්සේලාට පූජා කරන්නේ උන්වහන්සේලාගේ අඩුපාඩුවක් අමාරුවක් පිරිමසාලීම නිසා නොවේ.

දනමය කුශලය මහත්ඵල වීමට හේතු කීපයකි. එයින් දන වස්තු වූ මල් පහන් ආහාර පානාදිය පිළිගන්නා තැනැත්තා තුළ පිහිටි ගුණයෝ එක් කාරණයකි. ගුණ හීනයාට දෙන දනය අල්ප ඵල වන්නේ ය. එබැවින්,

'විචෙය්‍ය දනං සුගතප්ප සත්‍ථං
යෙ දක්ඛිණෙය්‍යා ඉධ ජීව ලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි
බීජානි වුත්‍ථානි යථා සුඛෙත්තෙ'

යන්න වදරණ ලදී. මෙයින් දැක්වෙන්නේ ගුණවතුන් සොයා දන් දිය යුතු බව යි.

## බුද්ධ පූජාව.

ආගම ධර්මය නොදත් පුණ්‍යාන්තරාය කාරක විතණ්ඩ වාදීහු වනාහි පිළිමවලට ආහාර පාන නුවමනා බැවින් දැනට කරන්නා වූ ආහාර පූජාව නිෂ්පල ක්‍රියාවකැයි කියති. මෙය ධර්මයට ඉඳුරාම විරුද්ධ වූ හිස්කීමක් උවත් ලොව මැවීමට කෙනෙක් සිටිය යුතු බව දැක්වීමට කියන තර්ක බඳුවූ හිස් තර්ක වලින් ධර්මය නුගතුන් නොමග යැවිය හැකි ප්‍රශ්නයකි. මොවුන්ගේ මෝඝ තර්කවලට බෞද්ධයන් කලබල නොවිය යුතුය.

Non-Commercial Distribution

ආගම දත් බෞද්ධයෝ ප්‍රතිමාවලට ආහාර පූජා නොකරති. බුදුනට කරන පූජා කිරීමට ස්ථානයක් උවමනා බැවින් ප්‍රතිමා සාද පූජාසන තනා ඒ තැන්වල දී බුද්ධ පූජා කරති. ප්‍රතිමාවක් නැති කල්හි ද ඊට සුදුසු තැනක ඒ පූජා පවත්වති. සුදුසු ගුරු ආශ්‍රයක් නොමැතිව ස්වමතය පරිදි වැඩුන නවීනයන්ට මෙහි තේරුම දත නොහැකිව පිළිමවලට ආහාර නුවමනාය යනාදින් දොඩවන්නට වූහ. දැනට අප ඉදිරියේ නැත්තාවූ බුදුන් වහන්සේට දැන් කරන ආහාර පූජාවලින් ප්‍රයෝජනයක් නොවන බැවින් ඒවා බුද්ධ පූජා නොවෙතැයි සැලකීමද මුළාවකි. ප්‍රතිග්‍රාහකයා තමා ඉදිරියේ සිටීම හෝ නොසිටීමත් ප්‍රතිග්‍රාහකයාට ඉන් ප්‍රයෝජනයක් වීම හෝ නොවීමත් යමෙක් කරන්නාවූ පූජාවක් පූජා නොවීමට කාරණයක් නොවේ. ඉදින් ප්‍රතිග්‍රාහකයා තමා ඉදිරියේ වේනම් මෙය ඔබ තුමාට වේවායි පූජා කරනු ලබන වස්තුව කෙරෙහි ආලය හා තමාගේ අයිතිය අත්හැරීමත් පූජා ලබන්නා ඉදිරියෙහි නොමැති නම් මෙය අසවලාට වේවායි වස්තුව කෙරෙහි ආලය හා අයිතිය අත්හැරීමත් පූජා කිරීම නම් වේ. මේ වස්තුව බුදු රජාණන් වහන්සේට වේවායි සලකා තමා අයත් යම් කිසි වස්තුවක ආලය හා අයිතිය හැර යම්කිසි තැනක තැබුවාම බුද්ධපූජා කළා නම් වේ. මේ පූජාවෙන් බුදුරජාණන් වහන්සේට ප්‍රයෝජනයක් නොවන බව නම් ඇත්තකි. නුමුත් එය පූජාවක් නොවීමට කාරණයක් නොවේ. කෙනෙක් කෙනකුගෙන් මුදලක් ණයට ගතහොත් එයින් තමාට ප්‍රයෝජනයක් නොවූවත් ඔහු මුදලට ණයකාරයෙක් නොවන්නේ නොවේ. ණය හිමියාගේ මුදල් දීම ණය දීමක් නො වූයේ නොවේ. ඒකාන්තයෙන් ම ණයදීම සිද්ධ වූයේ ය. මුදලක් ගත් තැනැත්තාගේ ණයකාරයෙක් වීම ද සිද්ධ වූයේය. එපරිද්දෙන් පූජා කරන්නාවූ වස්තුවෙන් බුදුනට ප්‍රයෝජනයක් නොවූවාට දයකයාගේ පූජාව නම් සිද්ධවන බව දත යුතු ය.

පින් වනාහි මුදලක් දී වෙළෙන්දකුගෙන් බඩුවක් ගන්නාක් මෙන් පූජාව දී බුදුන්ගෙන් ගන්නා දෙයක් නොවේ. එය තමන් තුළම ඇති වන්නක් බව යට කියන ලදී. එබැවින් ප්‍රයෝජනයක් වුවත් නොවූවත් පූජාකළ හොත් පින ද ඒකාන්තයෙන් ලැබෙන බව දත යුතු. පූජාව දී පින බුදුන්ගෙන් ගන්නා දෙයක් වීනම් අජීවමාන

Non-Commercial Distribution

බුදුන්ට පූජාකොට පින් ලැබිය හැකි නොවේ. එය එසේ නොවන බැවින් තුවණැත්තාට ජීවමාන බුදුන්ට පූජා කිරීමෙන් මෙන්ම පිරිනිවියා වූ බුදුන්ට පූජාකිරීමෙන් ද පින් ලැබිය හැකි වේ.

'තිට්ඨන්තෙ නිබ්බුතෙ චාපි
සමෙ චිත්තෙ සමං ඵලං'

බුදුන් වැඩ සිටින කල්හි ද පිරිනිවි කල්හි ද පූජා කරන්නාගේ සිත සමවී නම් සම වූ විපාක ලැබේය යනු මෙහි තේරුමයි.

ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පූජා කිරීමෙන් ප්‍රතිමාවට ආයුවර්‍ණාදි කිසි ආනිසංසයක් නො ලැබෙන බැවින් පූජා කරන්නාට ද ආනිසංසයක් නොලැබිය හැකිය යනු මොවුන්ගේ එක තර්‍කයකි. මෙයින් පෙනෙන්නේ පූජාව ලබන්නාට ඉන් ලැබෙන ප්‍රයෝජනයට සමානානිසංසයක් ම පූජා කරන්නාට ලැබිය යුතු බවයි. විතණ්ඩවාදීන්ගේ මේ තර්‍කයේ සැටියට නම් කුසගින්නෙන් පෙළෙන්නකුට ආහාරයක් දුන් කල්හි ඒ ආහාරය අජීර්‍ණවී ඒ තැනැත්තාට ලෙඩක් වී නම් ඒ දනයෙන්, දුන් තැනැත්තාට ලැබෙන්නා වූ ආනිසංසය ලෙඩක් සෑදීම විය යුතු ය. ඉදින් ඒ රෝගයෙන් ප්‍රතිග්‍රාහකයා කාලක්‍රියා කළේ නම් දයකයාට ලැබෙන විපාකයත් මැරෙන්නට වීම විය යුතුය. බොහෝ ආයුෂ ලබන්නට නම් දීර්‍ඝායුෂ්ක ප්‍රේතයෙක් හෝ සොයා දන් දිය යුතුය. බොහෝ ශරීර ශක්තිය ලැබීමට නම් ඇතකුට හෝ දන් දිය යුතු ය. පින්වත්නි, මෝස තර්‍කයෙන් වන විපර්‍ය්‍යාසය කොපමණද බලන්න.

## පුදුම බුද්ධපූජා ක්‍රමයක්

ප්‍රතිමා ඉදිරියේ පවත්වන පූජා බුදුන් වහන්සේට නොලැබෙන බැවින් බුද්ධ පූජා කළා වීමට බුදුන් වෙනුවෙන් කුස ගින්නේ සිටින කෙනකුට අහරක් දියයුතු යයි විතණ්ඩවාදීහු කියති. වෙනුවෙන් දියයුතුය යන මේ ප්‍රකාශය බුදු බණක් නොව බයිබල් බණකි. දෙවියන් වහන්සේ වෙනුවෙන් දුප්පතුන්ට සංග්‍රහ කළ යුතු බව බයිබලයේ කියා තිබේ. බුදු රජාණන් වහන්සේ වනාහි මා වෙනුවෙන් මේ කුසගින්නේ පෙළෙන අසරණයන්ට දෙන්නයයි

Non-Commercial Distribution

කොතනකදීවත් නො වදළ සේක. උන්වහන්සේ ප්‍රතිග්‍රාහකයන් බෙදු වදරා තිබේ. දක්ෂිණා විභඞ්ග සූත්‍රය බලනු. බුදු රජාණන් වහන්සේ අග්‍ර දක්ෂිණෙය්‍ය වූ සේක. උන්වහන්සේට වරක් ආහාර පූජා කිරීමෙන් ලැබෙන ආනිසංසය ගුණ හීනවූ යාචකයන් ලක්‍ෂයකට ආහාර දීමෙනුත් ලැබිය නොහේ. එබැවින් බුදුරජාණන් වහන්සේට පූජාකළ යුතු දෙය යාචකාදි නිර්ගුණයන්ට නොදෙවූ සේක. මහා කාරුණිකවූ භාග්‍යවතුන් වහන්සේ සියල්ලන්ට ම කරුණා කරන සේක. කෙනකුට පිරිහීමක් වන පරිදි තවත් කෙනකුට කරුණා නො කරන සේක. බුදුන්ට පුද විශාල ආනිසංසයක් ලැබිය හැකි දනය යාචකයකුට දෙවා අල්පානිසංසයක් ලබාදීම කෙනකුට වාසිකොට කෙනකුට පාඩු කිරීමකි. එබඳු දේ තථාගතයන් වහන්සේලා නො කරන සේක. විතණ්ඩවාදීන් කියන බයිබල් බණ පදයේ සැටියට බුදුනට කළයුතු සත්කාර උන්වහන්සේ වෙනුවෙන් අසරණයන්ට කරන්ට ගියහොත් වන්නේ මහ අවුලකි. මේ හිස්මතයේ සැටියට පිළිපදිතහොත් විතණ්ඩවාදීහු දැන් බුදුන් නැති බැවින් 'බුද්ධං සරණං ගච්ඡාමි' යි බුදුන් සරණ ගොස් බුද්ධශ්‍රාවකයෙක්ව බුදුනට උවටැන් කරනවා වෙනුවට මරණාසන්නයට වතුර උගුරක් දෙන්ට කෙනකුදු නොමැතිව අම්බලම්වල වෙසෙන අසරණයන් වූ ජුවානිස්ලා ජේම්ස්ලා සීමන්ලාගෙන් කෙනෙක් 'ජුවං සරණං ගච්ඡාමි, යනාදීන් සරණ ගොස් ඔහුට උවටැන් කරන්ට වෙනවා ඇත, ගරු බුහුමන් කරන කිසිවෙක් නැත්තෙන් ගරුබුහුමන් පිපාසාවෙන් පෙළෙන ඔවුන්ටම බුදුන් වහන්සේ වෙනුවෙන් වැඳීම මල් පිදීම පහන් පිදීම යනාදිය ද කරන්ට වෙනවා ඇත. අහෝ හාස්‍යජනක ප්‍රකාශයක සැටි.

බුද්ධපූජා කිරීමෙන් කරුණා මෛත්‍රී ආදි ගුණයන් පහළ නොවන බැවින් කරුණා මෛත්‍රී ගුණ පහළ වන්නාවූ අසරණ සංග්‍රහය බුද්ධ පූජාවට වඩා උතුම් යයි විතණ්ඩ වාදීහු කියති. මෙය ද විතණ්ඩවාදීන්ගේ මෝඩ කියමනකි. බුද්ධපූජා කිරීමේදී පහළ වන ගුණ ධර්මයෝ ශ්‍රද්ධා ප්‍රඥාදීහුය. ශ්‍රද්ධා ප්‍රඥාවන්ට වඩා මිසදිටුවන්ට පවා ඇති වන කරුණාව උතුම්ද? කරුණා මෛත්‍රී දෙක බෝධි පාක්ෂික ධර්මයන්ට ද ඇතුලත් නැත.

Non-Commercial Distribution

එබැවින් අසරණ සංග්‍රහයෙහිදී ඇති වන කරුණා මෛත්‍රියට වඩා බුද්ධ පූජා කිරීමෙහි පහළ වන ශ්‍රද්ධා ප්‍රඥාවෝ උතුම් බව දතයුතු.

## බුදුන්ටත් වැරදීම

අනේපිඬු මහසිටාණෝ පනස්සතරකෝටියක් ධනය වියදම් කොට ජේතවන මහවිහාරය කරවා බුදුනට පූජාකළෝය. විසාඛා මහ උපාසිකාවෝ සත්විසි කෝටියක් වියදම්කොට පූර්වාරාමය කරවා පූජාකළෝ ය. ආසදෘශ දානය දෙද්දී කොසොල් රජ්ජුරුවෝ එක දන් වේලට ම තුදුස් කෝටියක් ධනය වියදම් කළෝ ය. විතණ්ඩවාදීන්ගේ මතයේ සැටියට අසරණ සංග්‍රහය ම උතුම් නම් එද බුදුරජාණන් වහන්සේට වදරන්ට තිබුණේ අපට මෙපමණ විශාල විහාර උවමනා නැත. එක දන් වේලට මෙපමණ වියදමක් නොකළ යුතුය. තරමකට විහාරයක් කොට යැපෙන පමණට දනයක් දී ඉතිරි ධනයෙන් අසරණයන්ට සංග්‍රහ කරන්නටයයි නියම කිරීමටය. එසේ නොකොට එකී පූජා ඉවසා වදළේ වැරදීමකින් විය යුතු ය. අහෝ මේ විතණ්ඩවාදීහු බුදුනටත් වරද්දන්නට එන සැටි.

## ආනන්ද ස්ථවිරයන් වහන්සේගේ පිස්සුව

මේ විතණ්ඩවාදීහු අජීවමාන බුදුන්ට දන්දෙන්ට, වත් පිළිවෙත් කරන්ට යෑම විහිළුවක, පිස්සුවකැයි පවසති. බුදුරජාණන් වහන්සේගේ අග්‍ර උපස්ථායකවූ ද ධර්ම භාණ්ඩාගාරිකවූ ද ආනන්ද ස්ථවිරයන් වහන්සේ බුදුන් පරිනිර්වාණයෙන් පසු ද ජීවමාන කාලයේ උන්වහන්සේට කළ සියලු ම වත් පිළිවෙත් කළ සේක. බුදුන් විසූ ගඳකිළියට වැදගෙන ස්වාමීනි, දැන් ස්නාන වේලාවය, දැන් දහම් දෙසීමට වේලාවය යනාදීන් ඒ ඒ වේලාවල් දැන්වීම ද කළ සේක.

"දසබලෙන වසිත ගන්ධකුටිං වන්දිත්වා ද්වාරං විවරිත්වා මඤ්ච පීඨං නීහරිත්වා පප්ඵොටෙත්වා ගන්ධකුටිං සම්මජ්ජිත්වා මිලාත මාලාකචවරං ඡඩ්ඩෙත්වා මඤ්චපීඨං අතිහරිත්වා පුන යථාඨානෙ

Non-Commercial Distribution

ඨපෙත්වා භගවතො ධීතකාලෙ කරණීයං වත්තං සබ්බමකාසි. කුරුමානොව නහාන කොට්ඨක සම්මජ්ජන උදකුපට්ඨානාදි කාලෙසු ගන්ධකුටිං වන්දිත්වා නනු භගවා අයං තුම්හාකං නහාන කාලො ධම්මදෙශනාකාලො අයං භික්ඛූනං ඔවාදදාන කාලො අයං සීහසෙය්‍යා සන්තප්පන කාලො අයංමුඛධොවනකාලොති ආදිනා නයෙ නපරිදෙව මානොව අකාසි" යනුවෙන් ඒ බව දක්වා තිබේ. විතණ්ඩවාදීන්ගේ ප්‍රකාශයේ සැටියට නම් ඒ කාලයේ ආනන්දස්ථවිරයන් වහන්සේට ද තරමක පිස්සුවක් තිබුණා විය යුතු ය. පින්වත්ති සිංහ සම් පෙරවාගත් ශෘගාලයන් සේ මහෝත්තමයන් වහන්සේලාගේ නම් ආරූඪ කර ගෙන සිටින මේ බුද්ධ පූජා නාසකයන්ට පිස්සු වැටී තිබෙනවාද? ඒ කාලයේ නියම ආනන්ද ස්ථවිරයන් වහන්සේට පිස්සුව තිබුණාද? යන බව නුවණැත්තෝ දනිත්වා.

## වරකට මැටිගොඩක් වන වරකට බුදුවන පිළිමය

මේ විතණ්ඩ වාදීහු වරෙක මැටිගොඩක් වූ පිළිමයට ආහාර පිදීම පහන් පිදීම නුවමනාය පිළිමයට කරන පූජාව බුදුනට පූජා වක් නොවේයයි පවසති.

තවත් වරකදී විහාරවල පිළිමය ඉදිරියේ පිංපෙට්ටියක් තැබීම බුදුනට කරන නින්දාවකැයි කියති. මෙහි ඇති පුදුමය නම් මොවුන්ට එකම පිළිමය වරෙකට මැටිගොඩක් වීමත් වරෙකට බුදුවරයෙක් වීමත් ය. කටට ආ ආ දෙය ම බණකොට කියන මොව්හු තමන්ගේ කීමේ පූර්වාපර විරුද්ධය පවා නො දනිති.

## ප්‍රතිපත්ති පූජාව

පිරිනිවන් මඤ්චකයෙහි හොත්තාවූ භාග්‍යවතුන් වහන්සේට දිව්‍ය බ්‍රහ්මයන් අනේකාකාර පූජා පවත්වත්දී උන් වහන්සේ ආනන්ද ස්ථවිරයන් වහන්සේ අමතා "ආනන්දය, මේ පූජා වලින් තථාගතයන්වහන්සේ පුදන ලද්දේ නොවෙයි. යමෙක්

Non-Commercial Distribution

ධර්‍මානුධර්‍මප්‍රතිපත්තියෙහි යෙදේ නම් හෙතෙමේ උතුම්වූ පූජාවෙන් තථාගතයන් වහන්සේ පුදන්නේ වේ යයි˝ වදාල සේක. විතණ්ඩවාදීහු මේ වචනය ගෙන බුද්ධපූජාව නම් ආහාරපානාදියෙන් බුදුන් පිදීම නොව ප්‍රතිපත්ති පිදීමයයි කියමින් ජනයා මුළාකරති. පින්වත්නි, කල්පනාකර බලන්න. යමෙක් තමාගේ මවට ආහාරපානාදි යමක් ගෙන ගොස් දුන් විට දරුවාට මව් මෙසේ කියන්නීය. ˝දරුව, නුඹ මට කරන සඞ්ග්‍රහය නම් මට යමක් ගෙනැවිත් දීම නොවෙයි. නුඹ ලොකු පොහොසතෙක් වී රටේ හොඳින් කල්ගත කරන්නෙහි නම් එය ම මට කරන්නා වූ උතුම්වූ සංග්‍රහය වන්නේ ය. එබැවින් දරුව නුඹ දියුණුවෙන්ට වෑයම් කරන්න.˝ මවගේ මේ අවවාදය ඇසූ දරුවා ඉන්පසු මව ගේ වචනය කරමියි කියා මව ගැන කිසිත් නොසලකා තමාගේ වැඩම හොඳින් කරන්නට උවහොත් ඔහු තමාගේ වැඩ ම කරගත් පමණින් මවට සඞ්ග්‍රහ කළේ වේද? නැත. මව් ගැන නොසලකා තමාගේ සැපපහසු පමණක් බලන හෙතෙමේ පරම පව්කාරයෙක් ය. තුන්ලොවට මව් කෙනෙක් වූ තථාගතයන් වහන්සේ පිළිබඳව ද මේ කාරණය මෙසේ මය. උන්වහන්සේ බුද්ධපූජා කිරීම් මාත්‍රයෙන් තෘප්තියට නොපැමිණ තවත් කළයුතු පින් කිරීම සඳහා පිරිනිවන් මඤ්චකයේදී මෙසේ වදළේ ය.

දරුවාගේ පොහොසතෙකුවීම මවට සඞ්ග්‍රහයක් නොවන්නාක් මෙන් ප්‍රතිපත්තිය බුද්ධපූජාවක් නොවන බව දත යුතු යි. විතණ්ඩ-වාදීන් පවසන සැටියට ප්‍රතිපත්තිය ම බුද්ධපූජාව වේ නම් දරුවාගේ පොහොසත්වීම මව්පියනට සංග්‍රහය විය යුතු ය. හොඳින් ඉගෙනීම ම ගුරුන්ට කරන සංග්‍රහය විය යුතුය. හොඳින් බෙහෙත් වැළඳීම වෙදහුට කරන සංග්‍රහය විය යුතු ය. අහෝ විතණ්ඩවාදය නිසා කෙළෙහිගුණ සැලකීම නමැති උතුම් ගුණයටත් පහර වදින සැටි.

## කණ්ඩ සූත්‍රය

විතණ්ඩවාදීයෙනි! බුද්ධ පූජාව පිළිබඳ අප විසින් පොත පතින් දැක්වූ කරුණු ගැන දැන් යුෂ්මතුන්ලාට කියන්න දෙයක් නැත. දැන් ඉතින් පුරුදු සිරිත පරිදි ඕවා බුදු බණ නො වේය.

Non-Commercial Distribution

පැරණියන් තමාගේ වාසියට ලියා තැබූ කණ්ඩ සූත්‍රය කියා උතුමන්ට නිඥාකොට ධර්මයේ දැලිගා සැනසෙන්න.

ධර්මය දැන ඉගෙනීම තබා ත්‍රිපිටක ධර්මයට අයත් පොත් සියල්ලෙහි පිටපැත්ත පවා අතගා නැති සමහරු දුරදිග නොබලා කටට එන එන දේ බණකොට කියා පසුව පොතපතෙහි එන බණ පද ඒවාට වෙනස්වී තුබුණාම ඕවා බුදුන් වදළ දේ නො වේය, පැරණියන් තම තමාගේ වාසියට ලියාගත් දේවල්ය කියා ධර්මය අවලංගුකොට තමාට වැරදුණු දේ ස්ථිරකරන්ට තැත් කරති. පූජා පිළිබඳ කරුණක් වූ කල පොතපතෙහි එන කෝකක් උවත් ඕවා පැරණියන්ගේ කණ්ඩ සූත්‍රයයි කීවාම ආගම ධර්ම නොදත්තෝ මේ ඇත්ත කියන එකම හාමුදුරුවෝයයි මුළා වෙති. එබැවින් මොවුහු කණ්ඩසූත්‍රයයි කියා ධර්මය කිලුටු කිරීම නූගතුන් මුළා කිරීමට විජ්ජාවක් කර ගෙන තිබේ. බුද්ධ පූජා ප්‍රශ්නය ගැන නම් මේ විජ්ජාව හරි නොයයි. ත්‍රිපිටක ධර්මය සඞගායනා කළා වූද අටුවා ටීකා ආදිය කළා වූද මහෝත්තමයෝ මේ විතණ්ඩවාදීන් මෙන් අනුන්ගේ පිහිටෙන් දිවි පැවැත්විය යුතු දීනයෝ නොවූහ. රජපවුල් සිටු පවුල් ආදි උසස් පවුල්වලින් පැවිදි වූද ලාභයෙන් යසසින් අගතැන් පැමිණියා වූද උත්තමයෝ ය. උන්වහන්සේලාට බුද්ධපූජාව කුමටද? දැනුදු භික්ෂූන් වහන්සේලාට තමාගේ ප්‍රයෝජනයට නොගෙන යාචකාදීන්ට දීම හෝ එබන්දෙක් නැති විට ඉවතලෑම හෝ කරවන බුද්ධ පූජාව කන්ට සූත්‍ර සැදූවාය කියන නූගතුන් මුළා කරන මන්ත්‍රය කොපමණ ජප කළත් එය තරමක් වත් නුවණැති කෙනෙක් නොපිළිගනිති. මෙය විතණ්ඩවාදීන් තමන්ව ම කන්ට සූත්‍රය කරගැනීමට මහෝත්තමයනට නැගූ අභූත චෝදනාවකි. එය මුළු සඞඝරත්නයට ම කළ අපහාසයකි. විතණ්ඩවාදීලාට මෙය සෙල්ලමක් වුවත් මතු ලෙල්ලමක් වන බරපතල පාපයකි.

පුරිසස්සහි ජාතස්ස කුඨාරි ජායතෙ මුඛෙ
යාය ඡින්දති අත්තානං බාලො දුබ්භාසිතං භණං

උපන්නාවූ සත්වයාගේ කටෙහි කෙටේරියක් ද හටගන්නේ අඥාන සත්වයා දුෂ්ට වචන කීමෙන් එයින් තමාගේ ආත්මය තමාම සිඳගන්නේය, යනු මෙහි අදහසයි,

Non-Commercial Distribution

# විහාරවල පිත්පෙට්ටි

සෑම ගොඩනැගිල්ලක ම කළයුතු නවකම් ඇති වේ. ඒවා කිරීමට වසක් පාසා මෙන් ම කවුරු විසින් ම උවත් මුදලක් වියදම් කළයුතු වේ. මේ මුදල වියදම් කිරීමට කෙනෙක් නො මැති විහාරවල ශ්‍රද්ධාවන්තයින්ගෙන් ආධාර ලබා ගැනීම සඳහා පිං පෙට්ටි තබා තිබේ. ඒවාට මුදලක් දමන්නේ ද කලාතුරකින් කෙනෙකි. විහාරවල නවකම් කරවන්නෝ මේ සුලු මුදලින් ඉතා අමාරුවෙන් ඒවා කරවති. ඇතැම්විට වසක් පාසා කළයුතු සුණුගෑම් ආදිය මුදල් මඳ බැවින් වෂී කීපයකින් කරන්ට ද සිදු වේ. පිංපෙට්ටි ඉවත ලුවහොත් විහාර කෙසේ රැකෙත්ද? මේවා ගැන කිසිත් නො දන්නාවූ බෝඩින්වල වෙසෙන විතණ්ඩ වාදීහු ඒවා පිංපෙට්ටි නොව පව් පෙට්ටියයි දෙව්දත් බණක් කියති. මේවාට බෞද්ධයන් මුළා නොවිය යුතුයි. විහාරාරාම රැකගැනීම බෞද්ධවූ කාගේත් යුතුකමකි. විහාරාරාමයන්හි නව කම් පිණිස ශතයක්මුත් පරිත්‍යාග කිරීම පුණ්‍ය කර්‍මයක් බව කව්රුත් දනිති. විහාරවල පිංපෙට්ටි පව්පෙට්ටි වීමට නම් විහාර දියුණුව සඳහා ඒවාට මුදලක් දැමීම පාපයක් විය යුතු යි. එය පාපයක් යයි කීම දෙව්දත් බණකි.

# පිත්කම් වෙනුවට නාඩගම්

විහාරාරාම දියුණුව සඳහා කරන බණ පිත්කම් පිරිත් පිත් කම් නවත්වා පිං පෙට්ටි ඉවතලා ඒ වෙනුවට විහාරස්ථාන-යෙන් පිට තැනක නාඩගම් නටවා මුදල් සපයන්නයයි විතණ්ඩවාදීහු අනුශාසනා කරති. මේක නම් එසේ මෙසේ අනුශාසනයක් නොව නියම දෙව්දත් බණකි. බුදු බණේ සැටියට නම් නාඩගම් නැටවීම කොතන කළත් තහනම් වැඩකි. පව් ගොඩකි. මෙලොව පිරිහීමට ද එය හේතුවකි. සිඟාලෝවාද සූත්‍ර වසල සූත්‍රාදිය බලනු.

"පුබ්බෙ ච ඛො ගාමිනී සත්තා අවීතරාගාබන්ධන බද්ධා අවීත දොසා අවීතමොහා තෙසං නච්ච රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ

Non-Commercial Distribution

ධම්මා රජනීයා දොසනීයා මොහනීයා තෙ උපසංහරති. භීයොසො සරාගාය සදොසාය සමොහාය සො අත්තනා මත්තො පමත්තො පරෙ මදෙත්වා පමාදෙත්වා කායස්ස භෙද පරම්මරණා පහාසො නාමනිරයො තත්ථ උප්පජ්ජති.

මේ බුදුරජාණන්වහන්සේ නාඩගම්වල විපාකය වදළ සැටිය. ගාමිණිය, මේ සත්වයෝ පළමුවද රාග සහිතයෝ ය, බන්ධනයෙන් බැඳුනෝය, ද්වෙෂසහිතයෝය, මෝහ සහිතයෝ ය, නළුවා ඒ සත්වයන් වඩාත් රාගසහිතයන් ද්වේෂසහිතයන් මෝහසහිතයන් කිරීමට රාගද්වේෂ මෝහයන් වැඩෙන දේ පෙන්වන්නේය. ඔහු තමා මත්ව ප්‍රමාදව අනුන් මත්කරවා ප්‍රමාද කරවා මරණින් මතු පහාස නම් නරකයෙහි උපදනේය., යනු මෙහි අදහසයි. **පහාස** යනු දැන් දෙව්දත් පැසෙන අවීචි මහා නරකයෙහි නළුවන් පැසෙන කොටසට කියන නමය. නළුවෝ එහි නටන්නන් සේ පැසෙති. නැටීම පමණක් නොව නැටවීම බැලීම යන සියල්ලක් ම පාප ක්‍රියාවෝය. එබැවින් අප බෞද්ධයන් කවදවත් නාඩගම් නටවන්ටවත් බලන්ටවත් සූදනම් නො විය යුතුය.

පින්වත්නි, මේ මිථ්‍යාලබ්ධි ගත් විතණ්ඩවාදීන් සැරසෙන්නේ බුද්ධපූජා නවත්වා ධර්මපූජා නවත්වා බණ පින්කම් පිරිත් පින්කම් නවත්වා සැදැහැවතුන්ගේ ධන වියදම්කරවා මිථ්‍යාධර්ම වපුරවා ටිකදෙනකුට මුත් දෙව්දත් අජාසත් රජුට කළහරිය කරන්ටය, බෞද්ධයෝ මොවුන්ගෙන් ප්‍රවේසම් වෙත්වා.

## පන්සල් හා බුදු සසුන

විතණ්ඩවාදීහු ශාසනය නම් ප්‍රතිපත්තියය, විහාර පන්සල් ශාසනය නොවෙතිය, විහාර පන්සල්වලින් ශාසන දියුණුවක් නැතයයිද ඝෝෂාවක් කරති. බුදු සස්න නම් විහාර පන්සල් යයි කියන කෙනෙක් නැති බැවින් මෙය ද මොවුන්ගේ පිස්සුවකි. අනුන්ට බුදුසස්න හඳුන්වන්ට එන මොව්හු ද බුදුසස්න කුමක්දැයි නොදනිති. ශාසනය නම් ප්‍රතිපත්තිය පමණක් නොව පර්‍ය්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධ යන තුනය. මොවුන් දක්වන ශාසනයෙහි මැද

Non-Commercial Distribution

මිස දෙකොණ නැත. විහාර පන්සල්වලින් ශාසන දියුණුවක් නැතය යන්නත් ඒ තරම් කුඩා බොරුවක් නොවේ. විහාර පන්සල් නොවූවා නම් අද වනතෙක් බුදුසස්න නො පවතින බව ළමයකුටත් තේරුම් ගත හැකි කරුණකි. විහාර පන්සල් නැත්නම් භික්ෂූන්වහන්සේලා පර්‍යාප්ති ශාසනය වූ ධර්මය උගන්වන්නේ ඉගෙනගන්නේ බෝඩින්වල ඉස්කෝල්වලද? ප්‍රතිපත්ති පුරන්නේ කොහි සිටගෙනද? විහාර පන්සල් නැත්නම් යුෂ්මතුන්ලාට ඔය කරේ තිබෙන සිවුර කරලාගන්ට ලැබේද? විහාර පන්සල් නොමැතිව බුද්ධශාසනය පවත්නා රටක් ලෝකයේ කොතැනකවත් දැනුදු නැත. අතීතයේද නොවූයේ ය. යුෂ්මතුන්ලා මේ එන්නේ පෙර වල්ගය කඩාගත් හිවලෙක් අනික් හිවලුන්ගේ වල්ගා නැති කිරීමට තැත්කළාක් මෙන් තමන්ට විහාර පන්සල් නැති පලියට මිනිසුන් භේදකරවා තිබෙන විහාර පන්සල් ටිකත් නැති කරන්නටය. බෞද්ධයෝ මේවාට මුළා නොවෙත්වා.

## ධර්ම පූජාව

ධර්මපූජාව නම් ධර්මය පිළිපැදීමය. බණ කී තැනැත්තාට යමක් පිදීම ධර්ම පූජාවක් නොවේය, යනුද මොවුන්ගේ එක් මිථ්‍යා තර්කයකි. මේ දුප්පත් තර්කයේ සැටියට නම් වෙදකුගෙන් වෙදකම ගත්තාම වෙදැදුරුට කරන සංග්‍රහය හොඳින් බෙහෙත් වැළඳීම විය යුතුයි. ගුරුන්ට කරන සංග්‍රහය ඉගෙනීමම විය යුතුය. මව්පියනට කරන සංග්‍රහය තමා හොඳින් කාබී ජීවත් වීම විය යුතුය. අහෝ කෙළෙහි ගුණ නසන මෝඝතර්කයේ සැටි. මේ ගැන බුදුන් වදාළ සැටි මෙසේ ය.

යස්මාහි ධම්මං පුරිසො විජඤ්ඤා
ඉන්දංච නං දේවතා පූජයෙය්‍ය

යමෙක් යමකුගෙන් ධර්මය දැනගත්තේ නම් ඔහු දෙවියන් ඉන්ද්‍රයා පුදන්නාක් මෙන් පිදිය යුතුය යනු මෙහි තේරුමයි. මෙ බඳු දේශනා පිටකත්‍රයේ බොහෝ ය. කෙළෙහිගුණ සැලකීම උතුම් ගුණධර්මයෙකි. එබැවින් බණ කියාදෙන තැනැත්තන්ට තමාට හැකි දෙයක් පිදීම ලෝකයේ ඉතා පුරාණයෙහි සිට පැවත එන චාරිත්‍රයකි.

Non-Commercial Distribution

සුතසෝම රජ්ජුරුවෝ ගාථා සතරක් කී බමුණාට එක එක ගයට දහස බැගින් සාරදහසක් පිදුවේ ය. සුතසෝම රජ්ජුරුවන්ගෙන් බණ ඇසූ පෝරිසාදයා පවා දහම් පඬුරු වශයෙන් පිදීමට දෙයක් තමහට නැති බැවින් වර සතරක් දුන්නේ ය. මෙසේ බෝසතාණන්වහන්සේ දහම් පඬුරු පිදූ බව හා පිළිගත් බව සඳහන් වන ජාතක ධර්‍ම බොහෝ ගණනක් තිබේ. විතණ්ඩවාදීලා දන්නේ බුදුන්ට හා ආනන්ද ස්ථවිරයන්වහන්සේට කළ ධර්‍මපූජා දෙකක් ගැන පමණමුත් එබඳු පූජා බොහෝ ගණනක් ගැන පොතපතෙහි සඳහන් වේ. ඔය දෙක පමණක් සඳහන් වන්නේ ඉංග්‍රීසි පිටකත්‍රයේ වෙන්ට ඇත. යුෂ්මතුන්ලාට පාලි නොතේරෙනවා නම් පූජාවලියවත් බලන්න. එවිට බුදුන් රහතුන් කලැ ධර්‍ම පූජාකර තිබෙන සැටි දත හැකි ය.

ධර්‍ම පූජා කිරීම කුලිය දීමකැයි පවසන්නේත් කුලියේ හා පූජාවේ වෙනස නොදැනීමෙනි. යුෂ්මතුන්ලා බුද්ධ පූජා පිළිමවලට කෑම දීමකැයි වරදවා තේරුම් ගත්තා මෙන්ම ධර්‍මපූජා පිළි ගන්නා කළේ කුලිය ගැනීම කැයි සිතා ධර්‍ම පූජා පිළිගත්තා විය හැකිය. එය යුෂ්මතුන්ලාට වැරදීමකි. කුලියේ හා ධර්‍ම පූජාවේ වෙනස ඉතා මහත් ය. කුලිය නම් ස්වාමියා මෙහෙකරුවාට දෙන මිලයයි. ධර්‍ම දේශකයන් වහන්සේලා බණ අසන්නන්ගේ මෙහෙකරුවෝ නොවෙති. එබැවින් උන්වහන්සේලාට ස්වාමීන් වහන්සේලා යයි කියති. ධර්‍ම පූජාව ද දෑතින් ගෙන වුත් පුදා ස්වාමීන්වහන්සේගේ පා වඳිති. මෙලෙස කුලිය දීමකුත් ලොව තිබේද? පූජාවේ හා කුලියේ වෙනසවත් නොදැන සබයට ආවේ කුමට.

## ත්‍රිවිධරත්නයට කරන අපහාසය

ත්‍රිවිධරත්නයට අපහාසත් යුෂ්මතුන්ලා කියන දේවල් නො වෙති. දැනගනු කැමති නම් ඔන්න අසන්න. බුද්ධපූජාවෙන් පලක් නැතය කියා 'අරහං' යන පළමුවන බුදුගුණය මැකීම බුදුනට අපහාසයකි. පැරණියන් ලිව් කණ්ඩසූත්‍රය කියා ධර්‍මයෙහි දැලිගෑම ධර්‍මරත්නයට කරන අපහාසයකි. තමාට සිතෙන සිතෙන දේ බණයයි තැන තැන කීමද ධර්‍මය කිලුටු කිරීමකි.

Non-Commercial Distribution

බුදුන් පිරිනිවීමෙන් පසු කණ්ඩ සූත්‍ර ලියා ගත්තාය කියා පැරණි උතුමන්ට චෝදනා කිරීම සඞ්ඝරත්නයේ මුල් කණුවූ ශාරීපුත්‍ර මෞද්ගල්‍යාන ආනන්ද රාහුලාදි මහරහතන් වහන්සේලාගේ නම් උන්වහන්සේලාගේ පයේ දූවිලි පමණවත් නොවටිනවුන්ට ආරූඪ කර ගැනීමෙන් සඞ්ඝරත්නයට කරන අපහාසයකි. ත්‍රිවිධ රත්නයට කරන ලොකු අපහාස මේවාද දැන් කරන සම්මාදම් ආදිය දැයි නුවණැත්තෝ දනිත්වා.

## බුදු සසුන බැබලේවා!

Non-Commercial Distribution

# ස්වර්ණමාලී චූඩා මාණික්‍ය වර්ණනාව
# හා
# විනයාලංකාර මාහිමි චරිතය

ප්‍රථම මුද්‍රණය - 1940
Non-Commercial Distribution

# සංඥාපනය

ස්වර්ණමාලී චෛත්‍ය රාජයා මත පැළඳ වීමට බුරුම බෞද්ධයන් විසින් පිළියෙල කරන ලද චූඩා මාණික්‍යය වනාහි මහඟු වස්තුවෙකි. මෙබඳු මහඟු පූජා කිරීමට වෛදේශිකයන්ගේ සිත් ඇදෙන තරම් ප්‍රබල වූ සිද්ධස්ථාන ලක්දිව තිබීම සියලු සිංහල බෞද්ධයකුගේ ම ප්‍රීතියට කාරණයෙකි. බුරුම චූඩාමාණික්‍යය පමණ වටනා වස්තුවක් ලංකාවෙහි කිසිම සිද්ධස්ථානයකට වෛදේශික රජකු විසින් පවා මීට පෙර පූජා කළ බවක් ප්‍රකට නැත. මේ මහඟු පූජාවෙන් පෙනී යන්නේ මෙකල ලංකා බෞද්ධයන්ගේ හා බුරුම බෞද්ධයන්ගේ සම්බන්ධය පෙර තිබුණාට වඩා දැන් අතිශයින් වැඩිවී තිබෙන බව යි. අන්‍ය බෞද්ධ රාජධානීන් හා මිත්‍රත්වය ඇති වීම ලංකා බෞද්ධයන්ගේ යහපතට ප්‍රබල හේතුවක් වනු නිසැක ය.

මෙකල බුරුම බෞද්ධයන් විසින් රුවන්මැලි චෛත්‍යරාජයන් වහන්සේට කරන ලද මේ පූජාව - ගරා වැටී තුබූ චෛත්‍ය රාජයන් වහන්සේගේ මෙකල කරන ලද ප්‍රතිසංස්කරණය මෙන් ම ඉතිහාස ගත විය යුතු වැදගත් කාරණයෙකි. මහඟු වස්තුවක් වූ මේ චූඩා මාණික්‍යයේ තතු දැන ගැනීම ලංකා බෞද්ධයන්ගේ ප්‍රීතියට හේතු වන බැවින් චූඩා මාණික්‍යය පිළිබඳ තොරතුරු දැක්වෙන මේ කුඩා පොත ලිවීම ආරම්භ කරන ලදී.

චූඩා මාණික්‍ය ප්‍රවෘත්තිය සමඟ ම ලංකා බෞද්ධයන් හමුවෙහි තැබිය යුතු තවත් කරුණෙක් වෙයි. විශාල ධනස්කන්ධයක් පරිත්‍යාගකොට මේ චූඩා මාණික්‍යය බුරුම බෞද්ධයන් විසින් පිළියෙල කරන ලද්දේ ඔවුන් තුළ ඉබේ ම හටගත් අදහසක් නිසා නොව අවුරුදු සතළිසෙක පමණ කාලයේ පටන් ලක්දිව වැඩ සිටින

Non-Commercial Distribution

ගරු **යූ. විනයාලංකාර** බුරුම නායක මාහිමියන් වහන්සේගේ මෙහෙයීම නිසා ය.

මුන්වහන්සේ නිසා ලෝකශාසනද්වයට සිදුවී තිබෙන තවත් වැඩ මහත් රාශියෙකි. මුන්වහන්සේ වනාහි මෙකල ලෝසසුන් වැඩකරන්නෙමුයි ඝෝෂා කරන බොහෝ දෙනා මෙන් නොව ඝෝෂාවක් නැති ව ම වැඩ පමණක් කරන කරවන කෙනකු බැවින් මුන්වහන්සේ ගැන හා මුන්වහන්සේ විසින් සිදු කර තිබෙන වැඩ ගැන ද බොහෝ දෙනා නො දනිති. ඒවා ගැනත් ලංකා බෞද්ධයන් විසින් දැන ගනු සඳහා ඒ බුරුම නායක මාහිමියන් වහන්සේගේ සංක්ෂිප්ත ජීවන චරිතය ද මේ ග්‍රන්ථයට ඇතුළත් කරන ලදී.

මේ පොත කියවීම ලංකා බුරුම බෞද්ධයන්ගේ සම්බන්ධය තව තවත් දිවුණු වීමට හා චිරකාලයක් පැවැත්මට ද හේතු වෙනවා ඇත. එබැවින් මෙය සැම සිංහල බෞද්ධයකු විසින් ආදරයෙන් කිය විය යුතු ය.

මීට,

රේරුකානේ චන්‍දවිමල ස්ථවිර.

$\frac{2483}{1940}$ පෙබරවාරි 20 වෙනි දින දීය.

ශ්‍රී විනයාලංකාර පිරිවෙණ,
පොකුණුවිට.

Non-Commercial Distribution

# ස්වර්ණමාලී චූඩාමාණික්‍ය වර්ණනාව
හා
# විනයාලඞ්කාර මහා ස්වාමී චරිතය

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

**අමර මනුජ පාලිං ජප්පදලී අමන්දං**
**නිකර කුසුම සාලිං විත්තියාකඞ්ඛ මානං**
**රුචිර දූම්ව සාලං සත්ථු ධාතුභි භාරිං**
**පවර රතන මාලිං ථූප රාජං නමෙ තං**

සනරාමර ලෝක ශිවඞ්කර වූ අප භාග්‍යවත් අභීත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේගේ පරිනිර්වාණයෙන් තුන්සිය දෙවැනි වර්ෂයෙහි ලක්දිව රජ පැමිණි දුටුගැමුණු මහරජතුමා විසින් කෝටි දහසක් පමණ ධන වියදමින් අනුරාධපුර නගරයට දක්ෂිණ දිශාභාගයෙහි වූ මහමෙවුනා උයනෙහි මේ මහා භද්‍රකල්පයෙහි බුදු වූ කකුසඳ, කෝණාගමන, කාශ්‍යප, ගෞතම යන සිවු බුදු වරයන් වහන්සේ පැමිණ පරිභෝග කොට වදළා වූ පරිශුද්ධ භූමිභාගයෙහි ද්‍රෝණයක් පමණ සර්වඥ ශාරීරික ධාතුන් වහන්සේ නිදන්කොට කරවන ලද්ද වූ ලක්දිවට පමණක් නො ව මුළු ලොවට මුදුන් මල්කඩක් බඳු වූ ස්වර්ණමාලී චෛත්‍යරාජයන් වහන්සේ වනාහි ඒ ඒ කාලවලදී ලක්දිව රජ පැමිණි සිංහලීය නරවරයන් විසින් නැවත නැවත ප්‍රතිසංස්කරණය කරමින් ආරක්ෂා කරන ලදහ. සිංහල නරවරයන්ගේ ජයභූමියක් වූ ඒ අනුරාධපුර නගරය පසු කාලයකදී ලෝක ධර්මය වූ පරිදි නටබුන් විය. නගරය පමණක් නොව මුළු පළාත ම ජනයාගෙන් හිස්ව වල්වැවී වන මෘගයන්ගේ වාසස්ථානයෙක් විය. මේ කාලයේ

Non-Commercial Distribution

දී මනුෂ්‍යයන් ගේ නො පැමිණීම නිසා චෛත්‍ය රාජයා මත ගස් වැවෙන්ට විය. ගස් වැවීමෙන් මදින් මඳ බිඳ වැටුණා වූ චෛත්‍ය රාජයන් වහන්සේ වන මැද පිහිටි පර්වතයක් මෙන් දර්ශනය වූහ. මෙසේ පවත්නා කල්හි **නාරන්විට සුමනසාර** තෙරුන් වහන්සේ එහි පැමිණ මහ වනය මැද පිහිටි චෛත්‍ය රාජයා හෙළිකරවන්නට පටන් ගත්හ. ක්‍රිස්තු **වර්ෂ 1884** පමණේදී උන්වහන්සේ විසින් චෛත්‍යය බඳ වන්නට පටන් ගන්නා ලදී. පටන් ගත් නමුත් උන්වහන්සේට එය අවසන් කරන්නට නුපුළුවන් විය. උන්වහන්සේ විසින් වර්ෂ බොහෝ ගණනක් මුලුල්ලේ මහෝත්සාහයෙන් බැඳවූ ඒ බැම්ම ද දුර්වල වූයෙන් **1912** දී බිඳ වැටුණේ ය.

ඉන්පසු ඒ වර්ෂයේ **ඇවරිවත්තේ කුමාරසිංහ රත්සිරි තෙල් පෙරේරා** වෙදරාලහාමිගේ ප්‍රධානත්වයෙන් **රුවන්වැලි චෛත්‍යවර්ධන සමිතිය** නමින් සමාගමක් පිහිටුවා චෛත්‍යය බඳවන්ට පටන් ගන්නා ලදී.


දක්ෂ ඉංජිනේරු මහතුන්ගේ උපදේශ පරිදි ශක්තිමත් ලෙස චෛත්‍යරාජයා බඳවන්නට පටන්ගත් සමිතියේ මහතුන්ගේ අවංක භාවයේ ද වීර්‍ය්‍යයේ ද ප්‍රතිඵල වශයෙන් බැඳීම අවසන් වන්නට ළංවූ කල්හි එය මත පැළඳවීමට ටොන් සයක් පමණ බරැති අඩි සූවිස්සක් උස් වූ ලෝහමය **කොතක්** ද කරවිය හැකි විය.

ලක්ෂ බොහෝ ගණනෙක වියදමින් කළ යුතු වූ චෛත්‍ය කර්මාන්තය අවසානයට ම ළං කළා වූ ඒ මහතුන්ට චෛත්‍ය රාජයන් වහන්සේ මස්තකයෙහි පැළඳවිය යුතු **චූඩාමාණික්‍යය** සම්බන්ධයෙන් දුෂ්කර තත්ත්වයකට මුහුණ පාන්නට සිදු විය. ඔවුහු පුවත් පත් වල දැන්වීම් පළකරවීම් ආදී නොයෙක් ක්‍රමවලින් චූඩාමාණික්‍යයක් වර්ෂ ගණනක් මුළුල්ලේ සෙවූ නමුත් කොතැනෙකින්වත් එයට සෑහෙන පළිඟුවක් නො ලැබුණෙන් අන්තිමේදී **කොළඹ දෙමටගොඩ මහා මකුටාරාමාධිපති ගරු පූ. විනයාලංකාර** බුරුම නායක මාහිමියන් වහන්සේගේ උපකාරය සෙවූහ. බුරුම නායක මාහිමියන් වහන්සේ මේ කාලයේ **අභිනව දළදා මාළිගය** කරවමින් **මහනුවර** වැඩ සිටියහ. රුවන්වැලි චෛත්‍යවර්ධන සමිතියේ නිලධාරී පිරිසක් උන්වහන්සේ වෙත

Non-Commercial Distribution

ගොස් චෛත්‍යරාජයන් වහන්සේ පිළිබඳ අවසාන කෘත්‍යය සඳහා මුහුණ පාන්නට සිදු වී තිබෙන දුෂ්කරත්වය උන්වහන්සේට දන්වා බුරුමයෙන් වත් චූඩාමාණික්‍යයක් සොයන්නට උත්සාහ කරන ලෙස ආරාධනා කළහ.

බෞද්ධ මහජනයා විසින් මහා ධන සම්භාරයක් වියදම් කොට දීර්ඝ කාලයක් පරිශ්‍රම දරා කරවාගෙන ආ චෛත්‍ය කර්මාන්තය අවසන් වන්නට යන මේ මොහොතෙහි මුහුණ පාන්නට සිදු වී තිබෙන චූඩාමාණික්‍යය පිළිබඳ දුෂ්කරත්වය පහකරලීමේ වටිනාකම



**(කපන්නට පෙර පළිඟුව)**

දත් බුරුම නායක මාහිමියන් වහන්සේ තමන් වහන්සේ විසින් කරවමින් සිටින දළදා මාලිගා කර්මාන්තය ද රුවන් මැලි සෑය බැඳවීමට දෙ වැනි නො වන තරමේ බරපතල දෙයක් වුව ද එය අන්‍යතර බුරුම තෙරුන් වහන්සේ නමකට භාර කොට 1933 මැයි මස 17 වැනි දින කොළඹ වරායෙන් නැව් නැඟ චූඩාමාණික්‍යයක් සොයනු සඳහා රැන්ගුන් නුවරට වැඩි සේක. උන්වහන්සේ රැන්ගුන් නුවර දින කීපයක් නැවතී සම්මුඛ වන මහතෙරුන් වහන්සේලාගෙන්

Non-Commercial Distribution


හා රට තොට ගැන දන්නා මහතුන්ගෙන් ද චූඩාමාණික්‍යයට ප්‍රමාණවන පළිඟුවක් ගැන විමසූ නමුත් එයින් පලක් නො වී ය. ඉන්පසු උන්වහන්සේ **අමරපුරය** නම් වූ උඩබුරුමයෙහි මැණික් ගැන ප්‍රසිද්ධියක් උසුළන **මෝගොක්** නගරයට වැඩියහ. ඒ නගරය වනාහි මැණික් ආකර හිමියන්ගේ ද, මැණික් වෙළෙඳුන්ගේ• ද, මැණික් කර්මාන්තය කරන ශිල්පීන්ගේ ද වාසස්ථානයෙකි. නායක හිමියන් වහන්සේ එහි වෙසෙන මැණික් වෙළෙඳුන්ට හා මැණික් ආකර හිමියන්ට තමන් වහන්සේ පැමිණි කාරණය දැන්වූ හ. වෙළෙඳුන් හා ආකර හිමියෝ ලංකාවෙන් පැමිණි නායක මාහිමියන් වහන්සේ ගේ කීම ගැන මහත් සැලකිල්ලක් දක්වා වුවමනා කරන පළිඟුවේ ගණන් මිනුම් ගෙන එතෙක් ලැබී තුබුණ පළිඟු ඉතා ඕනෑකමින් පරීක්‍ෂා කළහ. **යූ. ටො, දෝනන්වේ, ෂන්ඨීදස්, යූ. මට්,** යන සතරදෙනකුට අයිති ව තුබූ පළිඟුවෙක් චූඩාමාණික්‍යයට ප්‍රමාණ වී ය. චූඩාමාණික්‍යය සඳහා ඒ පළිඟුව නායක මාහිමියන් වහන්සේට ඔවුහු පරිත්‍යාග කළහ. එහි වටිනාකම **රුපියල් සය දහසෙකි**. මෝගොක් ආකර වලින් ලැබුණු පළිඟුව ලඩකා පළිඟුවට වඩා බෙහෙවින් ආලෝකවත් ය. එබැවින් එහි වටිනාකම ද අධික ය. බුරුම නායක මාහිමියන් වහන්සේ **1938** අගෝස්තු මාසයේදී ඒ පළිඟුව ලක්දිවට ගෙනවුත් චෛත්‍යවර්ධන සමිතියේ මහතුන්ට දැක්වූයෙන් දුර්ලභ වස්තුවක් වූ එය දර්‍ශනයෙන් ඒ මහත්මෝ අතිශයින් ප්‍රීති වූහ. පළිඟුව දර්‍ශනයට පැමිණියා වූ බොහෝ ජනයෝ ද දුර්ලභ වස්තුව සපයාගෙන ඊම ගැන බුරුම නායක මාහිමියන් වහන්සේට අනේකාකාරයෙන් ස්තුති කරමින් ප්‍රීති වූහ.

ඉක්බිති චෛත්‍යවර්ධන සමිතියේ මහත්මෝ ආකරයෙන් ගොඩගත් පරිදි ම ගෙන ආවාවූ ඒ පළිඟුව කැප්පවීමට ශිල්පියකු සෙවූහ. කුඩා මැණික් මිස විශාල ගල් කැපිය හැකි යන්ත්‍රෝපකරණ සහිත කර්මාන්තශාලා ලංකාවේ නොමැති බැවින් එය කැපිය හැකි කෙනෙක් සොයා ගත නො හැකි විය. එයින් දෙවැනි දුෂ්කර ප්‍රශ්නයකට ද ඒ මහතුන්ට මුහුණ පාන්නට සිදු විය. ඒ ප්‍රශ්නය විසඳා ගැනීමට ද ඔවුහු පළිඟුව සැපයූ බුරුම නායක මාහිමියන් වහන්සේගේ උපකාරය ම සෙවූ හ. බුරුම බෞද්ධයන් වෙනුවෙන් එය කපවා පරිත්‍යාග කරතහොත් පිළිගැනීමට සමිතිය සතුටු බව

Non-Commercial Distribution

බුරුම නායක මාහිමියන් වහන්සේට දන්වා චූඩාමාණික්‍යය සැපයීමේ සම්පූර්ණ භාරය උන්වහන්සේට ම පැවරූහ. උන්වහන්සේ ඒ ආරාධනාව සතුටින් පිළිගෙන සමිතිය මගින් පිළියෙල කරන ලද චූඩාමාණික්‍යයේ සැලැස්ම හා පළිඟුව රැගෙන සමුද්‍රය තරණය කොට මෝගොක් නුවරට ම ගොස් චූඩා මාණික්‍යය කැපීම සඳහා පළිඟුව ශිල්පීන් අතට පැමිණ වූහ.

## බලාපොරොත්තු සුන්වීමෙක්.



චූඩාමැණික්‍යයේ සැලැස්ම

චූඩාමාණික්‍යයේ සැලැස්ම පරිදි පළිඟුව කපා ගෙන ගිය නමුත් එක් පසෙකින් පාඩුවක් සිටිය බැවින් එය නො ගත හැකි විය. එයින් බලාපොරොත්තු සුන් විය. මාස ගණනක් මුළුල්ලෙහි රටින් රට ඇවිදිමින් කරන ලද ව්‍යායාමය නිෂ්ඵල විය. කොතෙක් දුෂ්කරතා පැමිණියත් කරන්නට පටන් ගත් දෙය මුදුන් පත් වන තෙක් නො නවත්වන ස්වභාවය වූ වීර-භාවය උත්පත්තියෙන් ම පිහිටි මහාපුරුෂයකු වූ බුරුම නායක මාහිමියන්වහන්සේ එපමණෙකින් නොපසු බැස නැවතත් පළිඟුවක් සොයන්නට වන්හ. රුවන්මැලි චෛත්‍ය කර්මාන්තය මෙබඳු චූඩා මාණික්‍යයෙකින් ම නිම විය යුතු නිසාදෝ

Non-Commercial Distribution

මහා ලාභී වූ විනයාලංකාර බුරුම නායක මාහිමියන් වහන්සේගේ පුණ්‍ය මහිමය නිසා දෝ පළමු පළිඟුවට ද මහත් වූ පළිඟුවක් පළමු පළිඟුව පරිත්‍යාග කළ මහතුන්ට ම ලැබී තිබුණේ ය. ඔවුහු එය ද නොමසුරුව ඒ නායක මාහිමියන් වහන්සේට පරිත්‍යාග කළහ. ඒ පළිඟුව **රුපියල් අටදහසක්** අගනේ විය. මෝගොක් නුවර ආකර වලින් ඉන් පෙර කිසිවකු විසින් එපමණ මහත් පළිඟුවක් ලබා නැත. මේ අවස්ථාවේ ම මෙබඳු චූඩාමාණික්‍යයට ප්‍රමාණවන පළිඟුවක් ලැබීම ආශ්චර්‍ය්‍යයෙකි. මේ ගැන තතු දන්නා සැම දෙනා ම පුදුම වූහ. දෙවනුව ලද ඒ පළිඟුවෙන් ඉංජිනේරු මහතුන් විසින් තැනූ සැලැස්ම පරිදි චූඩාමාණික්‍යය කපන ලදී. එහි උස අඟල් 18 කි. වටප්‍රමාණය අඟල් 26 කි. බර රාත්තල් 66 කි.

## චූඩාමාණික්‍යය සැරසීම

පළිඟුව කපා අවසාන වූ කල්හි බුරුම නායක මාහිමියන් වහන්සේ එය ස්වර්ණමය ආධාරකයෙක පිහිටුවා මුදුනෙහි ධාතු කරඬුවක් ද පිහිටුවා තවත් මාණික්‍යයන්ගෙන් ද සරසන්නට සිතා ඒ බව බුරුම බෞද්ධයන්ට දැන් වූහ. උන්වහන්සේගේ වචනය ඇසූ බොහෝ දෙනා ඒ සඳහා රන් රිදී හා මැණික් පරිත්‍යාග කරන්නටත් මුදල් වියදම් කිරීමටත් කැමැත්ත දැක්වූහ. එයින් සතුටට පත් නායක මාහිමියන් වහන්සේ එය කරවීමට මෝගොක් නුවර ධනවත් බෞද්ධ මහතකුට පැවරූහ. ඒ මහතා කිසිවකුගෙන් උපකාරයක් නොලැබුණත් තමාගේ ම වියදමින් නායක මාහිමියන් වහන්සේගෙන් අවසර ලැබෙන සැටියකට කරවා දෙමි' යි ප්‍රතිඥා කොට කටයුත්ත භාර ගත්තේ ය. කර්මාන්තය සිය ඇස් ඉදිරියේ ම පිරිසිදු ව කරවන්නට කල්පනා කළා වූ ඒ මහතා කර්මාන්තයට වුවමනා සියලු ම උපකරණ අලුතින් ම සිය නිවසට රැස් කරවා රන් කරුවන් හා මැණික් කපන්නන් ද සිය නිවසට ම ගෙන්වා ආරක්ෂා සහිත කොට කර්මාන්තය කරවන්නට පටන් ගත්තේ ය. මේ බුරුම නායක මාහිමියන් වහන්සේ වනාහි සිතුවහොත් කොතරම් වියදම් වන දෙයක් වුව ද ලෙහෙසියෙන් සිදුකළ හැකි මහ පිනැත්තෙකි. එබැවින් කර්මාන්තය ආරම්භ කරනු සමග ම රන් රිදී හා මැණික් උන්වහන්සේ වෙත ගලා එන්නට විය. රිදියෙන් වාත්තු කොට රත්රනින් සියල්ල

Non-Commercial Distribution

වසා මැණික් ඇල්லූ අඩියෙක චූඩාමාණික්‍යය සවිකොට මුදුනෙහි ස්වර්ණමය ධාතු කරඬුවක් පිහිටුවා මැණික් සැරසූ ස්වර්ණමය කෝෂයෙකින් මුදුන වසා සතර දිශාවට මැණික් වැල් සතරක් එල්ලා නවමාසයෙකින් චූඩාමාණික්‍ය කර්මාන්තය නිමවන ලදී. චූඩා මාණික්‍යය පිහිටැවූ අඩියේ උස අඟල් 13 කි. බර රාත්තල් 156 කි. එය වසා පෙරවීමට රත්රන් රාත්තල් දොළොසක් ගන්නා ලදී. එහි ඉතිරි රාත්තල් 144 රිදී ය. මේ සඳහා ලැබුණු මැණික් ගල් සත් දහස් සයසිය අසූ සතරෙකි. ඒවා අතර රුපියල් පසළොස් දහසක් පමණ වටිනා ලෝහිතඞ්ක මාණික්‍යයෙක් ද වි ය. තවත් රුපියල් සියය, දෙසියය, තුන්සියය, සාරසියය, පන්සියය බැගින් වටිනා මැණික් ද ඒ අතර බොහෝ ගණනක් විය. ඒ මාණික්‍ය සමූහයෙහි රුපියල් පසක් නො වටනා එක ම ගලකුදු නැති බව මාණික්‍ය ශිල්පීහු කීහ. ඒ සියල්ල ම චූඩාමාණික්‍යයට ඇල්ලිය නොහැකි බැවින් එයින් තෝරාගත් වඩා වඩා වටනාකම ඇති මැණික් සාරදහස් තුන්සිය පණසෙකින් චූඩාමාණික්‍යය අලංකාර කරන ලදී. ගන්නා ලද මැණික් අතර ඉතා ම බාල ගල ද රුපියල් 25 ක් වටිනා බව කියති. ඒ මැණික් වලින් පසළොස් දහසක් අගනා ලෝහිතඞ්ක මාණික්‍යය සහිත අගනා ගල් එක් දහස් එක් සිය සිවුසාළිසෙකින් චූඩාමාණික්‍යයේ මුදුන සරසා තිබේ. මැණික් තුන් දහස් දෙසිය සයෙකින් ඉන් යට කොටස සරසා තිබේ. අඩිය සහිත සම්පූර්ණ චූඩාමාණික්‍යයේ උස අඟල් 31 කි. මෙයට ගන්නා ලද මාණික්‍යයන් ඒ ඒ සැදැහැවතුන් විසින් පරිත්‍යාග කරන ලද ඒවා ම වූ බැවින් එහි වටිනා කම නිශ්චය කළ නොහේ. එය සමහරු ලක්ෂයක් අගනේ ය යි ද, සමහරු දෙලක්ෂයක් අගනේ යයි ද, සමහරු ඊට ද වඩා අගනේ යයිද කියති.

## ධාතු වැඩීමේ ආශ්චර්‍ය්‍ය සිද්ධිය.

චූඩා මාණික්‍යය මුදුනෙහි පිහිටුවන ස්වර්ණමය කරඬුවෙහි වඩා හිඳුවනු සඳහා බුරුම නායක මාහිමියන් විසින් ඒ ඒ තැනින් සපයා ගත් ධාතූන් වහන්සේලා නව නමෙක් වීදුරු කුප්පියෙක තැන්පත් කර ගෙන තුබුණෝ ය. චූඩා මාණික්‍යය මුදුනෙහි ධාතු කරඬුව සවිකරන්නට බලාපොරොත්තු වූ දිනයෙහි නායක

Non-Commercial Distribution



**චූඩා මාණික්‍යය මුදුනෙහි පිහිටුවා තිබෙන ධාතු කරඬුව**

මාහිමියන් වහන්සේ ධාතූන් වහන්සේලා වැඩ සිටින කුප්පිය වැඩකරන තැනට ගෙන ගිය නමුත් කරඬුව සවිකිරීම එදින අවසන් කරන්නට නුපුළුවන් වූයෙන් ධාතූන් වහන්සේලා වැඩ සිටින කුප්පිය එහි ම සුදුසු තැනෙක තබා වැඩියහ. පසුදින උන්වහන්සේ එහි වැඩ කරඬුවෙහි තැන්පත් කරනු පිණිස ධාතූන් වහන්සේලා ගන්නට බැලූ කල්හි කුප්පිය පුරා ධාතූන්-වහන්සේලා වැඩ සිටින බව දුටහ. ඒ කාරණයෙන් එහි උන් සැම දෙන ම පුදුම වූහ. ඒ ආශ්චර්යය දැක සැම දෙනම ප්‍රීතියෙන් පිනා ගියහ. ඉක්බිති කුප්පියෙහි වැඩහුන් ධාතූන් වහන්සේලා ඉන් පිටතට වැඩමවා ගැණ බැලූ කල්හි ධාතූන් වහන්සේලා **අනූඅට නමක්** දක්නා ලදහ. ඉක්බිති බුද්ධාලම්බන ප්‍රීතියෙන් පින පිනා එහි වූවන් සාධුනාද පවත්වත්දී නායක මාහිමියන් වහන්සේ චූඩා මාණික්‍යය මුදුනෙහි වූ කරඬුවෙහි ඒ ධාතූන් වහන්සේලා අනූ අට නම වඩා හිඳවූ හ.

ඉක්බිති චූඩා මාණික්‍යය ලක්දිවට පමුණුවනු සඳහා මෝගොක් නුවර සිට විශේෂ දුම්රියෙකින් මහත් වූ උත්සවශ්‍රීයෙන් බුරුමයේ වර්තමාන අගනුවර වූ රැන්ගුන් නගරයට පමුණුවනු ලැබීය. රැන්ගුන් නුවරට ගෙන යන චූඩා මාණික්‍යය දර්ශනය සඳහා දුම්රිය නවත්වන සැම ස්ථානයෙක ම දහස් ගණන් ජනයා රැස් ව උන්හ. රැන්ගුන් නුවරදී එය **ශ්වේද ගොන්** චෛත්‍යයේ භාරකාර මහත්මෝ දුම්රිය ස්ථානයට පැමිණ අත්‍යාදරයෙන් මහත් වූ උත්සවයෙන් පිළිගත්තෝ ය. ඒ පිළිගැනීමේ උත්සවයට සහභාගි වනු සඳහා රැන්ගුන් නුවර නායක තෙරුන් වහන්සේලා ඇතුළු බොහෝ භික්‍ෂූන් වහන්සේලා ගෙන් ද, රජයේ ඇමතිවරුන් ගෙන් හා උසස් නිලධාරීන්ගෙන් ද නොයෙක් සමිති වෙනුවෙන් පැමිණ සිටි නියෝජිතයන් ගෙන් ද ජන ප්‍රධානයන්ගෙන් හා

Non-Commercial Distribution

මහදනිසුරන් ගෙන් ද, යුක්ත වූ ලක්ෂයකට අධික ජනකායෙක් පැමිණියෝ ය.

දුම්රිය පළේ සිට විශේෂයෙන් පිළියෙල කරන ලද රථයෙක තබා චූඩාමාණික්‍යය ලක්ෂයක් පමණ ජනයාගෙන් යුක්ත වූ මහ පෙරහරෙකින් රැන්ගුන් නුවර ශ්වේදගොන් චෛත්‍යස්ථානයට පමුණුවා එහි දී මහජනයාට ප්‍රදර්ශනය කරන ලද්දේ ය. මේ උත්තම වස්තුව ලක්දිවට පැමිණ විය යුතු කාලය පැමිණෙන තුරු ශ්වේදගොන් චෛත්‍යරාජයාගේ භාරකාර මහතුන් විසින් චෛත්‍යරාජයා සමීපයෙහි වූ විශේෂ මන්දිරයෙක තැන්පත් කොට ආරක්ෂා කර සුදුසු කාලය පැමිණි කල්හි ලක්දිවට යැවීම පිණිස බුරුමයේ ආණ්ඩුකාර තුමාට භාර කිරීමට ද එතුමා විසින් එය රාජකීය භාණ්ඩයක් වශයෙන් ලඞකා ආණ්ඩුකාරතුමා වෙත එවීමට ද ලඞකා ආණ්ඩුකාරතුමා විසින් මහ ඇමති තුමාගේ මාර්ගයෙන් රුවන්මැලි චෛත්‍යරාජයා මත පැළඳවීම සඳහා චෛත්‍ය වර්ධන සමිතියට භාර කිරීමට ද නියම කර ගන්නා ලදී.

මෙසේ ආශ්චර්‍ය්‍ය ලෙස ලැබී සැපයුණ, මේ අනර්ඝ වස්තුව චෛත්‍යවර්ධන සමිතිය පිළිගෙන පැළඳවීමෙන් පසු චෛත්‍යරාජයන් වහන්සේ පමණක් නොව මුළු ලංකාව ම උත්සව ශ්‍රීයෙන් විරාජමාන වෙනවා ඇත.

## ස්වර්ණමාලී මහා චෛත්‍යයන් වහන්සේට වන්දනා කරන ගාථාව

සම්බුද්ධ රාජ වරදෙහ සමුබ්භවා නං
ධාතූනමායතනභූත සුපූජනී යං
ලඞකඞගනා සිරසි මොලි සිරිං වහන්තං
සොවණ්ණමාලි වරථූප මහං නමෙතං

---

(පසුව චෛත්‍ය වර්ධන සමිතිය විසින් චූඩාමාණික්‍යය පැළඳවීමේ භාග්‍යය ද විනයාලංකාර නාහිමියන්ට ම ලබා දුන් බව රේරුකානේ නාහිමියෝ "ශ්වේජින් නිකාය" නම් කෘතියේ ලියූහ. බලන්න - 117 පිට.)

සංස්කාරක

Non-Commercial Distribution

# පූ. විනයාලඞ්කාර බුරුම නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ චරිතය



බුරුම නායක මාහිමියන් වහන්සේ.

ලක්‍ෂ බොහෝ ගණනක් ධනය විසඳා රුවන්මැලි චෛත්‍ය රාජයා බැඳවූ ලංකා බෞද්ධයන්ට අවසානයෙහි දුෂ්කර කාර්‍ය්‍යයක්ව

Non-Commercial Distribution

පැවති චූඩාමාණික්‍යයක් සැපයීමේ භාරය සතුටින් පිළිගෙන බලාපොරොත්තු වූවාට ද වඩා සිය වාරයෙන් යහපත් වන පරිදි පිරිවර මාණික්‍ය සාරදහස් තුන්සිය පනසෙකින් හා අනූඅට නමක් සර්වඥ ධාතූන් වහන්සේලා වැඩ සිටින ධාතු කරඬුවෙකින් ද ස්වර්ණමය ආධාරකයෙකින් ද යුක්ත කොට සපයා ලංකා බුද්ධ ශාසනයට අගනා සේවයක් කළා වූ **පූ. විනයාලංකාර බුරුම නායක මාහිමියන් වහන්සේ** වනාහි තවත් ලෝසසුන් වැඩ රාශියක් සිදු කළා වූ මහා වීරවරයෙකි. එබැවින් උන් වහන්සේ ගැන දැන ගැනීම සඳහා උන්වහන්සේගේ **සංක්ෂිප්ත ජීවන චරිතය** දක්වනු ලැබේ.

## ජන්මභූමිය

උන්වහන්සේගේ ජන්මභූමිය වූ **බුරුම දේශය** වනාහි ජීවමාන සර්වඥයන් වහන්සේ අතින් ම ලත් කේශ ධාතූන් වහන්සේලා නිදන් කොට කරවන ලදැයි ප්‍රකට ස්වර්ණමය පර්වතයක් සේ රැන්ගුන් නගරයට හා ඒ අවට සිය ගණනක් නගර ග්‍රාමවලට ද රෑ දවල් දෙක්හි පෙනෙන්නා වූ කූඩා චෛත්‍ය හා ප්‍රතිමා ගෘහ සිය ගණනක් පිරිවර කොට ඇත්තා වූ, සැමතැන ම රනින් වසා තිබෙන්නා වූ, **ශෙවදගොන්** නමැති මහා චෛත්‍ය රාජයාගෙන් හා ඒ ඒ නගරග්‍රාමයන්හි පිහිටියා වූ පුරාණ වූ ද නවීන වූ ද සිය ගණන් ස්වර්ණලිප්ත චෛත්‍යයන් ගෙන් ද, සියක් රියන් - දෙසිය රියන් පමණ විශාල බුද්ධ ප්‍රතිමා වහන්සේලාගෙන් ද, දහස් ගණන් ප්‍රතිමා ගෘහයන් ගෙන් ද, සිය ගණන් භික්ෂූන් වහන්සේලා වෙසෙන දෙමහල් තුන්මහල් සංඝාවාසයන් ගෙන් යුත් සිය ගණන් මහා සංඝාරාමයන් ගෙන් ද, රත්නත්‍රය සරණ පරායන ජනයන් ඇති සිය ගණන් නගරග්‍රාමයන් ගෙන් ද, අතිමනෝඥ වූයේ ය. ශීලය ජීවිතයට ද වඩා උතුම් කොට රක්ෂා කරමින් කටුක දුක් තණපතක් පමණටවත් ගණන් නොගෙන ජනයාගෙන් ඈත් ව අරණ්‍ය සෙනසුන් වලට වැද මහණ දම් පුරන දහස් ගණන් යෝගාවචර භික්ෂූන් වහන්සේලා ගෙන් ද, ත්‍රිපිටක ධර්මයෙහි හා නොයෙක් ශාස්ත්‍රයන්හි පරතෙරට පැමිණි මහා ස්ථවිරවරුන් ගෙන් ද, ලක්ෂ සංඛ්‍යාත ධනය නොමසුරුව බුදු සස්නට පරිත්‍යාග කරන මහා ධනවතුන් ගෙන්

Non-Commercial Distribution

ද, දිනපතා දස නම, විසි නම, පනස් නම, සියක් නම බැගින් භික්ෂූන් වහන්සේලාට දන් දෙන සැදැහැවත් උපාසකෝපාසිකාවන් ගෙන් ද යුක්ත ය. මැණික් ආකර රන් ආකර රිදී ආකර යකඩ ආකර තෙල් ආකර වලින් හා එක් යළෙකදී ම මුළු රටට ම වර්ෂ ගණනකට සෑහෙන ධාන්‍ය පැසෙන සාරවත් කෙත් වලින් ද නොයෙක් දේ වැඩෙන සාරවත් බිම් වලින් ද සමෘද්ධ ය.

## උත්පත්තිය.

අප නායක මාහිමියන් වහන්සේ ඒ බුරුම දේශයෙහි **මෝල්මේන්** නමැති නගරයෙහිදී ශ්‍රද්ධා ශීල ප්‍රාඥාදි ගුණ සම්පත්ති යෙන් හා ධන සම්පත්තියෙන් ද අනූන වූ වෙළෙඳ පවුලෙක ශකවර්ෂ **1800** වැන්නෙහි **උඳුවප් මස පුර පසළොස්වක් පොහෝ දින** මධ්‍යම රාත්‍රියෙහි පළමු කොට මෙලොව එළිය දුටහ.

## ප්‍රව්‍රජ්‍යාව

ඒ දරුවා ශුක්ල පක්ෂයෙහි චන්ද්‍රයා මෙන් මවුපියන්ගේ හා ඥාතීන්ගේ මනකොඳ පොබයමින් වැඩී ස්වජාතික ශිල්ප ශාස්ත්‍ර යන්හි ද නිපුණත්වයට පැමිණ තරුණ වයසට පැමිණ සිටි කල්හි **සෑම පිරිමි දරුවකු ම සසුන් ගත කිරීම නමැති බුරුම ජාතික සිරිත වූ පරිද්දෙන්** මවුපියන් විසින් **ශකවර්ෂ 1817** වැන්නෙහි **වෙසක් පුරපසළොස්වක් පොහෝ දිනයෙහි** ඒ නගරාසන්නයෙහි වූ **ටවුන් වයින්ජ්** නමැති වනවාස විහාරයට පමුණුවා **යූ. චන්දාභිධාන** මහා ස්ථවිරයන් වහන්සේ සමීපයෙහි මහත් වූ උත්සවශ්‍රීයෙන් පැවිදි කර වන ලද්දේ ය. පැවිදි කර වනු ලැබූ කුල දරුවන් විසින් හැකිතාක් කල් මහණ දම් පුරා ඉන් ඉවත් වීම හෝ උත්සාහය ඇති නම් දිවිහිමියෙන් මහණ දම් පිරීම එරට පවත්නා චාරිත්‍ර ධර්මය යි.

## ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය

**විනයාලංකාර** සාමණේරයන් වහන්සේ ගේ සුවිනීත භාවය හා ක්‍රියා ශූරභාවයත් දුටු යූ. චන්දාභිධාන මහා ස්ථවිරයන් වහන්සේ විසින් මේ කුඩා නම අනාගතයෙහි ලෝ සසුන් දෙකට

Non-Commercial Distribution

බොහෝ වැඩ කළ හැකි කෙනෙක් වන්නේ ය යි සිතා විශේෂ උගෙනීමක් ලබා දෙනු පිණිස එවකට සුප්‍රසිද්ධ විද්‍යාස්ථානයක්ව පැවැත්තා වූ **රුත්ගුත් නුවර මහා ධම්මදීපිකාරාමයෙහි** වැඩ වෙසෙන තදාරාමාධිපති **සාසනාලංකාර සද්ධම්මාභිවංස සිරිපවර මහාධම්මරාජාධි රාජගුරු මහානායක මාහිමියන් වහන්සේ** වෙත උන්වහන්සේ යවන ලදහ.

ඒ මහා නායක මා හිමියන් වහන්සේ වනාහි බුරුම දේශයෙහි අති ප්‍රසිද්ධ ශික්ෂාකාමී මහා ස්ථවිර තුමෙකි. උන් වහන්සේ දිනකට එක් වරක් මිස දෙවරක් ආහාර නො වැළඳූහ. පාත්‍රයෙහි මිස දෙවැනි බඳුනෙක නො වැළඳූහ. දිනපතා පිඬුසිඟා වැඩියහ. මත්ස්‍ය මාංශ නො වැළඳූහ. සියතින් ම හැමදීම් ආදි වත් පිළිවෙත් කළහ. ඇතුළු ගම්හි තබා ආරාමයෙහිදී ද බඹයකින් ඔබ නො බැලූහ. කිසිවකු සමග හිස් කථාවක් කිසිකලෙක නො කළහ. උන් වහන්සේ දක්නට යමකු පැමිණියහොත් ඔහුට ධර්මකථාවක් ම කළහ. එක් දිනෙක පස් වාරයක් රත්නත්‍රය වැන්දහ. උන් වහන්සේගේ ශිෂ්‍යයන් දහසකට අධික වූ නමුත් උන්වහන්සේ දෙවැන්නකු හා එක් ආවාසයක නො වැසූහ. **රුත්ගුත් නුවර මහාධම්මදීපිකාරාමය, සඳවුන්ඩුන් නුවර මහා මංගලාරාමය** යන ආරාම දෙකට ම උන්වහන්සේ අධිපති වූ සේක. ඒ ආරාම දෙක්හි විසූ භික්ෂු සාමණේරවරුන්ගේ ගණන **පන්සියයක්** පමණය. උන්වහන්සේ ඒ ආරාම දෙක්හි ම කලින් කල වාසය කළහ. උන්වහන්සේ පිඬු සිඟා වඩිනුයේ තමා සඳහා ම නොව භික්ෂුසංඝයා ද සඳහා ය. මහා ලාභියකු වූ උන්වහන්සේ පිඬුසිඟා වැඩි කල්හි මනුෂ්‍යයෝ උන්වහන්සේට බොහෝ ආහාරපාන පිරිනැමූහ. එයින් ම උන්වහන්සේ වෙසෙන ආරාමයෙහි දෙසියයක් පමණ භික්ෂූහු යැපුණාහු ය. උන්වහන්සේට ලැබෙන ආහාර පාන දිනපතා විහාරයට පමුණුවා දීම පිණිස නගර වැසියන් විසින් කරත්ත හා කත්කාරයෝ ද යොදනු ලැබූහ. පිඬු සිඟා වැඩි කල්හි උන්වහන්සේට ආහාර පාන පමණක් නොව චීවරාදි පරිෂ්කාර ද පිරිනමනු ලැබීය. ඒ සියල්ල රැස් කර තබවා වරින් වර සංඝයාට බෙදා දීම එතුමන්ගේ සිරිත විය. උන්වහන්සේ පරිභෝග කෙළේ තුන් සිවුර පමණකි. නින්ද අඩු කොට මහණ දම් පිරීම නිසාදෝ, පෙර

Non-Commercial Distribution

කළ පාපයෙකින් දෝ අවසාන කාලයේදී උන්වහන්සේගේ නේත්‍රයෝ අඳුරු වූහ. එකල්හිදු උන්වහන්සේ කප්පිය කාරකයන්ගේ උපකාරයෙන් නො නවත්වා ම පිඩු සිහා වැඩි සේක. උන්වහන්සේගේ මූලනාමය **යූ. සාසන** යනුයි. '**සාසනාලංකාර සද්ධම්මාභිවංස සිරිපවර මහාධම්මරාජාධි රාජගුරු**' නාමය උන්වහන්සේට අන්තිමට රජ කළ බුරුම රජතුමා විසින් පිරිනැමූ ගරු නාමයෙකි.

උන්වහන්සේගේ ආරාමයන්හි ප්‍රතිපත්තිකාමී සැබෑ භික්ෂූන්ට මිස හිස් පුද්ගලයන්ට වාසය කිරීමට අවකාශයෙක් නොවීය. ඒවායේ වෙසෙන සැමදෙනා විසින් කාලසටහනට අනුව සියලු වැඩ නො වරදවා කළ යුතු විය. ඒ අනුව ඔවුනොවුන් එක්වී කථා කරමින් හිස්ව කාලය ගත නො කළ යුතු විය. දුෂ්ප්‍රතිපත්ති පිරීමට ද අවකාශ නොවීය. මුදල් පරිහරණය, ගිලන් කමක් නොමැතිව වහන් පයලා ගම් වැදීම, වැසි නැති කල්හි කුඩ ඉසලා ගම් වැදීම, කරත්තවලින් යාම, දුම් බීම, විකාලයෙහි බුලත් දුම්කොළ සැපීම, නීතියෙන් ම තහනම් විය. වරද කළ සැමදෙනාට ම පාලක තෙරුන් වහන්සේලා විසින් දඬුවම් පමුණුවනු ලැබීය. නැවත නැවත වරද කරන්නෝ ආරාමයෙන් නෙරපනු ලැබූහ. ඒවාට උගෙනීමට පැමිණෙන කුසීත භික්ෂූන් වැඩි කල් නොසිට පලා යාමත් ප්‍රතිපත්තිකාමී කුලපුත්‍රයන් දීර්ඝ කාලයක් ඒ ආරාමයන්හි වාසය කිරීමත් ස්වභාවය විය.

## උපසම්පත්තිය

**විනයාලංකාර** සාමණේරයන් වහන්සේ රැන්ගුන් නුවර මහා ධම්මදීපිකාරාමයෙහි ඒ මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ ගේ සිත් දිනා ගෙන වාසය කළහ. විසි අවුරුදු වයස පිරුණු කල්හි උපසම්පදව ලැබීමට සුදුසු වූ සකල ගුණාංගයන් ගෙන් සම්පූර්ණව සිටි උන්වහන්සේ **සාසනාලංකාර** මහානායක මාහිමියන් වහන්සේ උපාධ්‍යාය කොට එක්සිය පනස් නමක් පමණ වූ භික්ෂු සංඝයා වහන්සේ විසින් **මහාධම්මදීපිකාරාම සීමා මාලකයේදී** මහත් වූ උත්සවයෙන් උපසම්පදවට පත් කරනු ලැබූහ. උපසම්පද කරනු ලැබීමෙන් පසු ද උන්වහන්සේ ඒ මහා ධම්මදීපිකාරාමයෙහි ම වැඩි

Non-Commercial Distribution

දුරටත් ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කරමින් වාසය කරන කල්හි ලක්දිව පෙර විසූ පඬිවරයන් විසින් කරන ලද ග්‍රන්ථයන් දැකීමෙන් හා පොත් පත් වල ලංකාව ගැන දක්වා තිබෙන කරුණු දැකීමෙන් ද, උන්වහන්සේගේ සිත ලංකාව දෙසට නැමුණේ ය.

## ලංකාවතරණය.

තමන් තුළ හටගත් ලක්දිවට පැමිණීමේ අදහස ක්‍රමයෙන් වර්ධනය වීමෙන් උන්වහන්සේ **ක්‍රිස්තු වර්ෂ 1901** දී ස්වකීය ආචාර්‍ය්‍යවරයෙකු වූ **ඌ. ජින** නමැති බුරුම මහා ස්ථවිරයන් වහන්සේ සමග රැන්ගුන් නුවර සිට කොළඹ බලා යාත්‍රා කරන නැවකින් සමුද්‍රය තරණය කොට ලක්දිවට සම්ප්‍රාප්ත වූහ. උන් වහන්සේ ලක්දිවට පැමිණ සිද්ධස්ථාන වන්දනා කරමින් ඇවිද ඒ වර්ෂයේ වස් වසන කාලය එළඹි කල්හි **මිහින්තලා පර්වතයේ ගල් ගෙයක** වස් වැසූහ. වස් වසා ඒකාසනිකව පිණ්ඩපාතිකව භාවනාවෙහි යෙදෙමින් වස් කාලය අවසන් කළහ. වසෙන් පසු නැවතත් සිද්ධස්ථාන වන්දනා කරමින් ඒ ඒ දිශාවල ඇවිද **1902** දී කොළඹ වත්තෙක වස් වැසූහ. ඉන් පසු ද නැවතත් සිද්ධස්ථාන වන්දනා කරමින් ද, ඒ ඒ තැන්වල භාවනා කරමින් ද, හැසිර **1903** දී මිහින්තලා පර්වතයේ ම වස් වැසූහ. **1904** දී උන්වහන්සේට ලක්දිවදී මුණ ගැසුණු **ယූ. ජයන්ත** නමැති බුරුම ජාතික භික්ෂූන් වහන්සේ කෙනකු ද සමඟ **සියනෑ කෝරළයේ දොරනෑගොඩ** නමැති ග්‍රාමයේ **සොහොන් භූමියෙක** වස් වැසූහ. එහිදී මුන් වහන්සේට **සද්ධාතිස්ස** නමැති දසසිල් උපාසක කෙනෙක් ද එක් විය. වස් අවසානයෙහි උන්වහන්සේ ජයන්ත තෙරුන් වහන්සේ හා උපාසක තුමාද සමග නැවතත් වන්දනාවෙහි ඇවිදින්නට වූහ. මුන්වහන්සේට ලංකාවේ සිද්ධස්ථාන වන්දනාවට මෙපමණ දීර්ඝ කාලයක් ගත වූයේ ලංකාව සැම තන්හි ම පයින් ම ගමන් කළ බැවිනි. ලංකාවේ තිබෙන පෞරාණික සිද්ධස්ථානයන් ගෙන් උන්වහන්සේ නො පැමිණි තැනෙක් නැත. වර්ෂ කීපයක් ම ලංකාවේ ඇවිද්දා වූ උන්වහන්සේ මේ වර්ෂයේදී සියරටට පෙරළා වඩනා අදහසින් **ශ්‍රී පාදය** වන්දනා කොට කොළඹ බලා පයින් ම ගියහ. ජයන්ත තෙරුන් වහන්සේ හා සද්ධාතිස්ස උපාසක තුමා ද සමග වඩනාහු **හොරණට** පැමිණියෝ ය.

Non-Commercial Distribution

## කුළුපණ කන්ද.

වන්දනාවෙහි ඇවිදින්නා වූ උන් වහන්සේ විඩා සන්සිඳුවා ගැනීම පිණිස පන්සල්වලට ගිය කල්හි විදේශක වූ උන්වහන්සේ ගෙන් නොයෙක් ප්‍රශ්න අසා වඩාත් වෙහෙසට පත් කරවන බැවින් උන්වහන්සේ පන්සල්වල නවාතැනට යාම අත්හළහ. බොහෝ සෙයින් නවාතැන් ගත්තේ ගල්ලෙන් ආදී ජනශූන්‍ය ස්ථානවල ය. **හොරණට** පැමිණ ගල්ලෙන් විචාළ කල්හි මිනිස්සු **කුළුපණ කන්ද** ගැන උන් වහන්සේට කීහ. කුළුපණට පැමිණි කල්හි එක් මිනිසෙක් කුළුපණ **වැරැල්ලගේන කන්දට** වැඩමවා ගෙන ගොස් එහි තිබෙන ගල් ගෙය උන්වහන්සේට දැක්වීය. උන්වහන්සේ එහි වැඩියේ එද රාත්‍රිය ගත කිරීම පිණිස ය. එහෙත් ගල්ගෙය වාසය කළ හැකි පරිද්දෙන් නොතිබුණ බැවින් එහි නො විසිය හැකි විය. දීර්ඝ කාලයක් ඇවිදීමට සැරසී සිටි උන්වහන්සේලා වාසයට සුදුසු තැනක් නො ලැබෙන තැන්වලදී ගසෙක එල්ලා එය යට වාසය කළ හැකි වන පරිද්දෙන් සාදවා ගන්නා ලද විශාල කුඩ දෙකක් තිබුණේ ය. එද ද උන්වහන්සේලා කුඩ ගස්වල එල්ලා ඒවා යටට වී වාසය කළහ. මෙය විනයාලංකාර නායක මාහිමියන්ගේ **ජය භූමිය** විය. වෂී කීපයක් මුළුල්ලෙහි ලංකාවේ හැසුරුන නුමුත් මේ ස්ථානයට පැමිණෙන තුරු උන්වහන්සේගේ කීර්තිය නො පතළේ ය. කීර්තිය පැතිරෙන්නට වූයේ මේ කන්දට පැමිණීමේ පටන් ය. එද රාත්‍රිය කුඩ යට වාසය කළා වූ උන්වහන්සේලා පසු දින පිඩුසිඟා වැඩියෝ ය. ඒ කාලයේ ඒ පලාතේ මිනිසුන්ට එය ආශ්චර්ය දර්ශනයෙක් වී ය. නුදුටු විරූ ජාතියෙක භික්ෂූන් දැකීම ද ආශ්චය්‍යීයෙක් වි ය. කුළුපණ කන්දට අමුතු රටෙක භික්ෂූන් වහන්සේලා දෙනමක් පැමිණ සිටින්නාහ යන ආරංචිය ගම්වල පැතිරෙන්නට වි ය. එදින උන්වහන්සේලා දක්නට මිනිස්සු එහි ගියෝ ය. ගොස් උන්වහන්සේලාට බොහෝ සැලකිලි දැක් වූහ. විනයාලංකාර නායක මාහිමියන් වහන්සේ ඒ මිනිසුන්ට ධර්මදේශනා කළහ. මනුෂ්‍යයෝ උන්වහන්සේ කෙරෙහි බොහෝ ප්‍රසන්න වූහ. මිනිසුන්ගේ බලවත් සැලකීමක් ඇති නිසාද, වන්දනාවේ කලක් ඇවිද බොහෝ වෙහෙසී සිටි නිසා ද, උන් වහන්සේ දින කීපයක් එහි නැවතී විඩා සංසිඳුවා ගෙන යන්නට ඉටා ගත්හ. උන්වහන්සේලාගේ පැමිණීමේ ආරංචිය ද ඒ සමග ම උන්වහන්සේලාගේ කීර්ති ඝෝෂය ද දිනෙන්

Non-Commercial Distribution

දින වේගයෙන් පැතිරෙන්නට විය. දිනෙන් දින ම කුළුපණ කන්දට එන මිනිසුන්ගේ සංඛ්‍යාව අධික වි ය. උන්වහන්සේලා කෙරෙහි අතිශයින් ප්‍රසන්න වූ මනුෂ්‍යයෝ හැකිතාක් කල් නවත්වාගෙන උන්වහන්සේලාට සත්කාර කොට පින් ලබා ගන්නා අටියෙන් උන්වහන්සේලාගේ වාසය පිණිස **කුටි දෙකක්** තැනූහ. මිනිසුන්ගේ බලවත් ඉල්ලීම නිසා උන්වහන්සේ තවත් ටික කලක් එහි ම වාසය කරන්නට ඉටා ගත්හ. උන්වහන්සේ දිනපතා පැමිණෙන විශාල පිරිසට **ආජීවාෂ්ටමක ශීලය** සමාදන් කරවූහ. පොහෝ දිනයන්හි පැමිණෙන පිරිසට ද **නවාංග උපෝසථ සීලය** සමාදන් කර වූහ. මේ පළාතේ මනුෂ්‍යයෝ ඉන් පෙර ඒ ශීලයන් ගැන අසා නො සිටියහ. එයින් වඩාත් උන්වහන්සේ කෙරෙහි පැහැදුණා වූ ඔවුහු කන්දෙහි එක් ප්‍රදේශයක් වහා සමතලා කොට කඩිමුඩියේ **මහා ධර්මශාලාවක්** ද තැනූහ. සිල් සමාදන් වන පිරිස ද දිනෙන් දින ම අධික වූහ. පොහෝ දිනයන්හි කැලණි විහාරයට මෙන් කුළුපණ කන්ද දෙසට සේනාව ගලා එන්නට විය. සමහර පෝය වලදී දහසක් පමණ මනුෂ්‍යයෝ සිල් සමාදන් වූහ. පොහෝ දිනයන්හි කුළුපණ කන්දේ බට පඳුරක් නොහැර සිල් සමාදන් ව භාවනා කරන්නෝ වූහ.

## නවාංග උපෝසථ සීලවාදය.

බොහෝ ලාංකික භික්ෂූහු නවාංග ශීලයෙක් නැත, එය මිථ්‍යාවෙකැයි ප්‍රකාශ කරන්නට වූහ. විරුද්ධ වූ ඇතැම් ගෘහස්ථ ප්‍රව්‍රජිතයෝ නොයෙක් පළාත් වලින් ගෘහස්ථ ප්‍රව්‍රජිත පණ්ඩිතයන් ගෙන්වා මුන්වහන්සේ හා වාදයට එවන්නට පටන් ගත්හ.[1] නවා-තැනට පැමිණියා වූ මුන්වහන්සේ සමීපයෙහි කිසි ම පොත පතෙක් නො තිබුණේ ය. උන්වහන්සේ වාදයට එන්නවුන් ලවා ම පොත් ගෙන්වා ඔවුන්ගේ පොත් වලින් ම ඔවුන්ට නවාංග ශීලය ඇති බව දක්වා ලූහ.[2] වාදකරුවන් අවුත් පරාජය වී යත් යත් ම උන්වහන්සේගේ කීර්තිය වඩ වඩා පතළේ ය. සැතපුම් විස්ස තිස

1. 1905 දී මුද්‍රිත "නවඞ්ග උපොසථය" නම් කුඩා පොත් පිංචකින් දැඩි විවේචනයක් එල්ල විය.
2. අංගුත්තර නිකායේ නවක නිපාතයේ සීහනාද වග්ගයේ නවාංගුපෝසථ සූත්‍රය බලන්න.

Non-Commercial Distribution

දුර ගම්වලින් නගරවලින් පවා ආහාර පාන පරිෂ්කාරයන් රැගෙන කුළුපණ කන්ද කරා මහජනයා එන්නට වන්හ. ගෙනවුත් පාමුල තබා පුදන්නාවූ පරිෂ්කාර බොහෝ විය. ගිහියන් පමණක් නොව නොයෙක් පළාත් වලින් භික්ෂූන් වහන්සේලා ද උන් වහන්සේ දක්නට පැමිණෙන්නට වූහ. උන් වහන්සේ එක් අතෙකින් ගෙන අනිත් අතින් දෙන්නාක් මෙන් තමන් වහන්සේට ලැබී තිබෙන පරිෂ්කාර එන එන භික්ෂූන් වහන්සේලාට පරිත්‍යාග කළහ. මේ කාලයේදී උන්වහන්සේට සියරට බලා වඩනට ඕනෑකම තිබුණේද, විරුද්ධ වාදීන් හට බියෙන් පළාගියහයි කියන්නට අවකාශ නො ලැබෙනු සඳහා එහි ම වැඩ සිටියේක. වර්ෂයක් පමණ ගත වූ කල්හි මෙසේ එන එන භික්ෂූන් වහන්සේට දීත් සියයක් පමණ අට පිරිකර හා තවත් බොහෝ පිරිකර උන්වහන්සේ වෙත ඉතිරිව තිබුණේ ය.

## සිය රට වැඩමවීමට සූදානම් වීම

මේ කාලය වන විට වාද කරුවන් සම්පූර්ණයෙන් ම නිහඬ වී සටි බැවින් උන්වහන්සේ මහා දනයක් දී ඒ පරිෂ්කාර සියල්ල ම පුද සිය රටට වැඩම වීමට සිතා ඒ බව දයකයන්ට දැනුම් දුන්හ. දයකයෝ ද මහා දනය දෙන්නට සූදනම් වූහ. මේ කාලයේ **අමරපුර නිකායික** තෙරුන් වහන්සේලා බුරුම නායක මාහිමියන්ට පක්ෂව ක්‍රියා කළෝ ය. **වැලිතර යූ. ඒ. ඤාණතිලක** නායක මාහිමියන් ඇතුළු බොහෝ අමරපුර නිකායික තෙරුන් වහන්සේලා උන්වහන්සේට උපකාර කළෝ ය. **වැලිතර ධම්මජෝති** තෙරුන් වහන්සේ හා **කොස්ගොඩ සිරි සුසීම** තෙරුන් වහන්සේ ද උන්වහන්සේට විශේෂයෙන් පක්ෂව ක්‍රියා කළ දෙනමෙකි. ඒ දයක මහත්මෝ ද **වස්කඩුවේ සුභූති** නායක මාහිමියන් වහන්සේ වෙත ගොස් දනයට ආරාධනා කළහ. උන්වහන්සේ සියක් නමක් සමඟ වඩනා ලෙසට අරාධනාව පිළිගත්හ. නියමිත දින පැමිණි කල්හි ඒ මහෝත්සවයට සහභාගිවීම පිණිස ඊට පළමු දින රාත්‍රියේ පටන් ම කුළුපණ දෙසට සිය ගණන් ජනයා ගමන් කරන්නට වූහ. දානය දෙන දිනයෙහි පසුව පැමිණි දහස් ගණන් ජනයාට කන්දට යන්නට ද නො ලැබුණේය. මුළු කන්ද ම වසා ජනයෝ උරෙන් උර ගැටී සිටගත්හ. එපමණ මහත් ජනකායක් ඊට පෙර කවදවත් නුදුටු බව මහල්ලෝ

Non-Commercial Distribution


පවා කීහ. දන මහෝත්සවය බලාපොරොත්තු වූවාට ද සිය වාරයෙන් යහපත් සේ සිදු විය.

## පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමය.

මේ මහා දන පුණ්‍යෝත්සවය පවත්වා අවසානයෙහි විනයාලංකාර බුරුම නායක මාහිමියන් වහන්සේට ඉතාමත් හිතවත් ව සිටියා වූ **වැලිගම්පිටියේ ඩී. ඇල් ගුණවර්ධන අප්පුහාමි, කුළුපණ ඩී. එච්. අභයරත්න රාලහාමි, හේනේගම ඩී. සී. සමරක්කොඩි රාලහාමි, කතේවල ඩී. පී. විජයරත්න නොතාරිස් රාලහාමි, වැලිගම් පිටියේ ඩී. සී. සෙනෙවිරත්න රාලහාමි** ආදී දයක මහත්මෝ එක්ව "අපි මේ බුරුම ස්වාමීන් වහන්සේ මේ පලාතේ ම අභිනව විහාරස්ථානයක් කරවා නවත්වා ගනිමුය" යි සාකච්ඡා කරගත්හ. ඉක්බිති ඔවුහු බුරුම නායක මාහිමියන් වෙත ගොස් කරුණු සැලකොට තව කලක් ලක්දිව වැඩ සිටින ලෙස ආරාධනා කළහ. කෙළෙහි ගුණ දන්නා වූ ඒ නායක මාහිමියෝ බුරුමයට වැඩමවීමේ අදහස හැර ඒ මහතුන්ගේ ආරාධනය පිළිගෙන එහි ම වැඩ සිටියහ. ඒ දයකවරු එදින පටන් සංඝාරාමයක් කරවීමට සුදුසු භූමි භාගයක් සොයන්නාහු **පොකුණුවිට, හේනේගම, වැලිගම්පිටිය, මීමන, කුළුපණ, කතේවල** යන ගම් සය මැද පිහිටි රමණීය භූමි භාගයක් මිළයට ගත්හ. එවකට වනලැහැබක් ව පැවැත්තා වූ ඒ භූමිභාගය හාත්පස ගම්වල වෙසෙන ජනයා රැස්ව වල් කොටා මුල් උපුටා දින කීපයෙකින් ම බෙරුසක් සේ සමකළෝය. ඉක්බිති එහි බුරුම ස්වාමීන් වහන්සේලා දෙනමට වාසය පිණිස කුටි දෙකක් හා ධර්මශාලාවක් ද කරවා උන්වහන්සේලා ඒ ස්ථානයට පැමිණ වූහ. ඉක්බිති එම ස්ථානය පොකුණුවිට ආදි ගම් සයෙහි දයක මහතුන් විසින් අවට ගම් වාසීන්ගේ ද උපකාර ඇති ව සංඝාරාමයකට වුවමනා සියලු දෙයින් සම්පූර්ණකොට **ක්‍රිස්තු වර්ෂ 1907 ක් වූ ජනවාරි මස 20 වැනි** දිනදී විනයාලංකාර මාහිමියන් ප්‍රධාන කොට නිකායත්‍රයේ ම සංඝයා වහන්සේ ද පමුණුවා සඟ සතුකොට පූජාකරන ලද්දේ ය. එම ආරාමයට **ශ්‍රී විනයාලංකාරාරාමය** යන නම තබන ලදී. මේ කාලයේ බුරුම රට **ජාගර** මහා ස්ථවිර පරම්පරාගත ත්‍රිපිටක ධර්මයෙහි විශාරද වූ **ඌ. ගුණාභිධාන** මහා ස්ථවිරයන් වහන්සේ ගර්හා පරූපවාද විරහිතවූ ප්‍රියශීලී ශිෂ්‍ය භික්ෂු සමූහයක්

Non-Commercial Distribution

ද සමග දඨාධාතු වන්දනාව පිණිස බුරුම රට සිට ලක්දිවට පැමිණියෙන් උන්වහන්සේලා ශ්‍රී විනයාලංකාරාරාමයට පමුණුවා ඒ **ගුණාභිධාන** මහා ස්ථවිරයන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සීමා බන්ධනයක් ද කරවා ශ්‍රී විනයාලංකාරාරාමය සකලාංගයෙන් පරිපූර්ණ කරන ලද්දේ ය.



**1940 දී පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේ දර්ශනයක්**

දැන් එම ශ්‍රී විනයාලංකාරාරාමය බුරුමයෙන් ගෙනෙන ලද අඩි 6 1/2 ක් උස් වූ වැඩ සිටිනා අගනා ලෝහමය බුද්ධ ප්‍රතිමාවෙකින් යුක්ත ප්‍රතිමා ගෘහයෙකින්ද අඩි 7 1/2 ක් උස් වූ ස්වර්ණලිප්ත මනහර කැටයම් සහිත ආසනයෙක වැඩ සිටින බුද්ධ ප්‍රතිමාවක් වැඩ සිටින දෙමහල් පහයෙකින්ද, දෙමහල් සංඝාවාසයෙකින් හා දෙමහල් සීමා මන්දිරයෙකින් ද ධර්මශාලා භෝජනශාලා ළිං පොකුණු ආදියෙන් ද යුක්ත වූ අගනා සංඝාරාමයෙකි. මහා විහාර පරම්පරානුයාත ක්‍රමයෙන් සූත්‍රාභිධර්ම විනය සංඛ්‍යාත පිටකත්‍රය ධර්මය උගන්වන පිරිවෙනෙකි. මේ ස්ථානයේ ඒ කාලයේ කරන ලද සියලු ම කටයුතු වලට ලංකාවේ සුප්‍රසිද්ධ පඬිවරයකු වූ **ලක්මිණි පහන් පත්‍රයේ** කතෘභූත **ඇම්. ධර්මරත්න මහතා** ද දායකයකු වශයෙන් හා අනුශාසකයකු වශයෙන් ද ක්‍රියා කෙළේ ය.

Non-Commercial Distribution

මේ විනයාලංකාර බුරුම නායක මාහිමියන් වහන්සේ පිටකත්‍රය ධර්මයෙහි විශාරද යහ. **පාලි**, **සිංහල**, **බුරුම**, **ඉංග්‍රීසි**, **දෙමළ**, **හින්දි**, යන භාෂා සයෙන් ම කථා කිරීමෙහි සමර්ථයහ. ජනයන්ගේ සිත් ගන්නා චතුර කථිකයෙකි. උන්හන්සේ මේ පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයෙහි වැඩ වෙසෙමින් කුල දරුවන් සසුන්ගත කරවීමෙන් ද, දහම් දෙසා ජනයන් පහදවා ශීලයෙහි පිහිටවීමෙන් ද, බොහෝ ලෝ සසුන් වැඩ කළහ. උන් වහන්සේගෙන් බණ අසා පැහැද පව්කම් හැර සිල් සමාදන් වූ ස්ත්‍රී පුරුෂයෝ දහස් ගණනෙක් වූහ. මෙසේ එම ආරාමයෙහි කලක් ලෝ සසුන් වැඩ කරමින් සිට උන්වහන්සේ ක්‍රිස්තු වර්ෂ 1911 දී සිය රට බලා වැඩියහ.

## පුනරාගමනය හා බුරුම බුද්ධ ප්‍රතිමා වහන්සේලා

නැවත උන්වහන්සේ ලංකාවාසීන්ට වැඳුම් පිදුම් කිරීම සඳහා බුරුම බුද්ධ ප්‍රතිමා වහන්සේලා මහත් සමූහයක් වැඩමවා ගෙන **1913** දී ලංකාද්වීපයට සම්ප්‍රාප්ත වූහ. උන්වහන්සේ විසින් මෙසේ වරින් වර ලක්දිවට වැඩමවන ලද ලෝහමය වූ ද, කිරි ගරුඬ ගලින් නෙලන ලද්දා වූ ද, බුද්ධ ප්‍රතිමා වහන්සේලා බොහෝ ගණනෙකි. එයින් අඩි 6 1/2 ක් උස් වූ ටොන් තුනහමාරක් පමණ බර වූ ලෝහයෙන් නිමවන ලද්දා වූ වැඩ සිටිනා විශාල ප්‍රතිමා වහන්සේ නමක් හා දෙරියනක් පමණ ඇති කිරි ගරුඬ ප්‍රතිමා වහන්සේ නමක්ද අඩි 7 1/2 ක් උස් වූ ස්වර්ණලිප්ත වජ්‍රාසනයෙක වැඩ සිටින ප්‍රතිමා වහන්සේ නමක්ද **පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේ** වැඩ සිටින්නාහ. **රයිගම් කෝරළයේ බටුවිට සුධර්මාරාමයෙහි** එක් ලෝහ ප්‍රතිමා වහන්සේ නමක් ද, **බොල්ගොඩ බෝධිරාජාරාමයේ** ලෝහ ප්‍රතිමා වහන්සේ නමක් හා වජ්‍රාසනය සහිත ප්‍රතිමා වහන්සේ නමක් ද, කොළඹ **සුදුවැල්ලේ ශ්‍රී විනයාලංකාරාරාමයේ** ලෝහ ප්‍රතිමා වහන්සේලා සතර නමක් හා වජ්‍රාසනය සහිත ප්‍රතිමා වහන්සේ නමක් ද, දෙමටගොඩ **මහා මකුටාරාමයෙහි** වජ්‍රාසනය සහිත ප්‍රතිමා වහන්සේ නමක් ද වැඩ සිටින්නාහ. අඩිය, අඩි දෙක පමණ කුඩා ප්‍රතිමා වහන්සේලා බොහෝ ගණනක් ලංකාවේ නොයෙක් පළාත් වල නොයෙක් ස්ථානවල වැඩ සිටින්නා හ.

*Non-Commercial Distribution*



**බුරුම තායක මාහිමියන් විසින් ලක්දිවට වැඩම වූ ප්‍රතිමාවහන්සේලා ගෙන් එක් නමක ජායාරූපය.**

## තවත් විහාරස්ථාන.

මුන් වහන්සේට මේ කාලයේ කොළඹ නගරයේ විහාරස්ථානයෙක් නො තිබුණේ ය. එබැවින් බුරුමයෙන් 1913 දී වැඩමවා ගෙන ආ බුද්ධ ප්‍රතිමා වහන්සේලා **කොළඹ කුරුඳුවත්තේ ඩී. සී. පේද්‍රික්** මහතා ගේ වත්තේ වඩා හිඳුවන්ට සිදුවිය. ප්‍රතිමා වහන්සේලා නිසා උන්වහන්සේට ද එහි වැඩ සිටින්නට සිදු විය.

Non-Commercial Distribution

ඒ පාඩුව දුටු **ඩී. සී. පේද්‍රිස් මහතා හා එම නෝනා මහත්මිය** ඇතුලු දයක පිරිසක් විසින් මුන්වහන්සේ උදෙසා කොළඹ නගරයේ විහාරස්ථානයක් කරවන්නට අදහස් කරන ලදී. ඒ ළඟදීම (1914) මහා යුද්ධය හටගැනීමෙන් ලෝකය අවුල් වී ගියෙන් ඔවුන්ගේ අදහස සර්වාකාරයෙන් මස්තක ප්‍රාප්ත නොවූ නුමුත් **1915 දී කොළඹ සුදුවැල්ලේ රඩ්ස් ලේන්හි** කුඩා ගොඩනැගිල්ලක් සහිත කුඩා ඉඩමක් මිළයට ගෙන උන්වහන්සේට පූජා කළෝ ය. එයට **සුදුවැල්ලේ ශ්‍රී විනයාලංකාරාරාමයයි** කියනු ලැබේ.

මුන්වහන්සේ නිසා වර්ෂයක් පාසා ම බොහෝ බුරුම-වන්‍දනාකාරයෝ ලක්දිවට ගොඩබසින්නට වූහ. උන්වහන්සේ ලක්දිවට පැමිණෙන බුරුම භික්ෂූන් වහන්සේලාට හා ගෘහස්ථයන්ට වාසය කිරීමට සුදුසු ස්ථානයක් පිළියෙල කරන්ට කල්පනා කොට ඒ බව බුරුම බෞද්ධයන්ට දැන් වූ කල **රංගුන් නුවර දෝපු, දෝගුන්** යන බුරුම නෝනාවරු දෙදෙන ප්‍රධාන බෞද්ධ පිරිසක් විසින් **කොළඹ දෙමටගොඩ පාරේ** ගොඩනැගිලි සමූහයක් සහිතවූ භූමිභාගයක් **රුපියල් 55000** කට ගෙන පරිත්‍යාග කරනු ලැබීය. එය දැන් **මහා මකුටාරාමය** නමින් හඳුන්වනු ලැබේ. දැනට එහි බුරුම බෞද්ධයන්ගේ වියදමින් විශාල දෙමහල් ගොඩනැගිල්ලක් ද කරවා තිබේ. එයට ගිය වියදම **රුපියල් 60000** කි.

මේ බුරුම නායක මාහිමියන් වහන්සේ **මහනුවර** හා **අනුරාධපුරයේ ද** ස්ථාන දෙකක් ඇති කරන්නට කල්පනා කොට ඒ බව බුරුම බෞද්ධයන්ට දැන්වූ කල්හි **ක්‍රිස්තු වර්ෂ 1927 දී බුරුමරට පැගු නුවර යූ. වෙං** නමැති ධනවත් මහතකු ප්‍රධාන පිරිසක් විසින් නුවර දළද මාලිගයට නුදුරු තැනෙකින් ගොඩනැගිල්ලක් සහිත භූමිභාගයක් **රුපියල් 24000** කට මිලයට ගෙන පරිත්‍යාග කරනු ලැබීය. එහි දැනට රුපියල් **10000** ක වියදමින් අභිනව ගොඩනැගිල්ලක් ද කරවා තිබේ. **1936** වෙනි වර්ෂයේදී **අනුරාධපුර** නගරයෙන්ද **රුපියල් 6000** කට ඉඩමක් ගෙන **යූ. උන්බෙං** නමැති මහතා හා එම නෝනා මහත්මිය විසින් පරිත්‍යාග කරන ලදී. මේ ඉඩම එළාර සොහොනයයි කියන ස්ථානය සමීපයේ පිහිටා තිබේ.

Non-Commercial Distribution

## මහනුවර අභිනව දළදා මන්දිරය

මේ බුරුම නායක මාහිමියන්ගේ බාල කල එකට ඉගෙනගත් මිත්‍රයකු වූ **යූ. තාඩැක්** නමැති දනිසුරු මහතෙක් වන්දනාව පිණිස ලක්දිවට පැමිණියේ ය. **දළදාධාතු** වන්දනාව සඳහා මහනුවර දළදා මාලිගයට ගියාවූ එතුමාට බුද්ධාලම්බන ප්‍රීතිය වෙනුවට ඇති වූයේ මහා සංවේගයෙකි. පූජනීයාති පූජනීය වූ ලොවුතුරා බුදුරජාණන් වහන්සේගේ මේ ධාතුන් වහන්සේට වර්ෂ සිය ගණනෙකින් පෙර කළ දිරූ කුඩා ගොඩනැගිල්ලෙක අදත් වැඩ සිටින්නට සිදුවී තිබෙන්නේ මේ දිවයිනෙහි බෞද්ධ රජතුමකු නැති බැවින් ය. ඉදින් අද මේ දිවයිනෙහි බෞද්ධ රජතුමකු ඇති නම් කාලානුරූප නොවූ මේ කුඩා ගොඩනැගිල්ලෙහි දළදා සාමීන් වහන්සේ නොවඩා හිඳුවන්නේ යයි සිතූ එතුමා මහත් සංවේගයෙන් දළදා හිමියන් වහන්සේ වැඳ **විනයාලංකාර** බුරුම නායක මාහිමියන් වෙත පැමිණ තමාට පහළ වූ සංවේගය ප්‍රකාශ කොට එතුමාට අවකාශ දෙත හොත් දළදා සාමීන් වහන්සේ වඩාහිඳවීම පිණිස කාලානුරූප අභිනව මාලිගයක් එතුමාගේ වියදමින් ම කරවන්නට කැමැති බව හා දියවඩන නිලමේ තුමා විසින් කරවනු ලැබේ නම් ඒ සඳහා විශාල පරිත්‍යාගයක් කරනු කැමැති බවද සැලකොට අභිනව මාලිගයක් කර වීමට නිලමේ තුමා උත්සාහවත් කරවන ලෙස උන්වහන්සේට ආරාධනා කෙළේ ය. එතුමා කී කරුණු අසා උන්වහන්සේ ද සංවේගයට පැමිණ එවකට දළදා මාලිගය භාරව සිටි **පී. බී. නුගවෙල දියවඩන නිලමේ තුමා** වෙත ගොස් කරුණු පහදා දී එතුමා අභිනව දළදා මාලිගයක් කරවීමෙහි උත්සාහවත් කරවූහ. ඉන් පසු දියවඩන නිලමේ තුමා ද ඒ ගැන කල්පනා කොට පුරාණ දළදා මාලිගය මැදිකොට **රුපියල් විසිලක්ෂයෙකින්** පමණ නිම කළ යුතු අභිනව මහා දළදා මාලිගයක් කර වන්නට 1927 පමණේදී ආරම්භ කෙළේ ය. එයට මුල් ගල තැබීම සඳහා ද බුරුම ලක්ෂපති මහතා පැමිණියේ ය. එතුමා එදින ම ඒ සඳහා **රුපියල් ලක්ෂයක්** පරිත්‍යාග කෙළේ ය. පසුව ද එතුමා වරින් වර ලක්ෂ එකහමාරක් පමණ මුදල් ඒ සඳහා පරිත්‍යාග කෙළේ ය. අප බුරුම නායක මාහිමියන් වහන්සේගේ අනුශාසනා පරිදි තවත් බොහෝ බුරුම බෞද්ධයෝ ඒ සඳහා මුදල් පරිත්‍යාග කළහ. ලංකා බෞද්ධයෝ ද පරිත්‍යාග කළහ. දියවඩන නිලමේ තුමා 1936

Non-Commercial Distribution

දක්වා ඒ කර්මාන්තය කරවූයේ ය. ඒ වර්ෂය වන විට ඒ සඳහා ලැබී තුබුණු උපකාර මුදල් ද අවසන් විය. ඉදිරියට ද රුපියල් ලක්‍ෂගණනක් වියදම්කොට අවුරුදු ගණනක් මුලුල්ලේ කරවන්නට තිබෙන මේ කර්මාන්තයෙහි යෙදීමට ද එතුමාට අවකාශ නැති විය. එබැවින් එතුමා ඒ කර්මාන්තයට මුල පටන් උපකාර කාරයකු වූ **යූ. විනයාලංකාර** බුරුම නායක මාහිමියන්ට ම ඉදිරියට කරන්නට තිබෙන කොටස සම්පූර්ණ කිරීමේ භාරය පවරන්නට සිතා දළදා මාලිගාවේ නායක ස්වාමීන්‍ද්‍රයාණන් වහන්සේලා සමග ද සාකච්ඡාකොට 1936 දී එසේ කෙළේ ය. දැනට ඒ කර්මාන්තය බුරුම නායකමාහිමියන් ගේ ප්‍රධානත්වයෙන් කරගෙන යනු ලැබේ. ඒ සඳහා යන වියදම් මසක් පාසා උන්වහන්සේගේ මිත්‍ර **යූ. තාඩැක්** මහතා එවන්නේ ය. බුරුම නායක මාහිමියන් විසින් කරවන්නට පටන්ගත් පසුද ඒ මහතා විසින් **ලක්‍ෂයක්** පමණ ඒ සඳහා පරිත්‍යාග කර තිබේ. තවත් බුරුම බෞද්ධයන් විසින් ඒ සඳහා මුදල් පරිත්‍යාග කර තිබේ. දැනට කර ගෙන යන ගොඩනැගිල්ලේ වැඩ තව අවුරුදු එකහමාරෙකින් අවසන් කළ හැකි වේ යයි බුරුම ස්වාමිපාදයෝ කීහ. විදේශික වූ මුන්වහන්සේ ගෙන් ලක්දිවට සිදු වූ මේ වැඩ රාශිය ගැන සැම ලාංකික බෞද්ධයකුම උන්වහන්සේ කෙරෙහි කෘතඥ විය යුතු.

දිනකර නිභ තෙජො මුම්මවංසාභිජාතො
පටුතර මතිමා යො ධම්මවෙදී විනීතො
සිරිධර විනයාලංකාර නාමො ගුරූහො
ඉහ චිරතර කාලං ජීවතං සොත්ථිනා සො

---

(ශ්‍රී දළදා වහන්සේ තැන්පත් කිරීමට සුදුසු මන්දිරයක් සේ මහනුවර නගරයේ උසම ගොඩනැගිල්ල ලෙස මෙය නිර්මාණය කිරීමට විනයාලංකාර නාහිමියන් සැලසුම් කර තිබුණත් ඉංග්‍රීසි ආණ්ඩුවෙන් විරෝධය පළ කිරීම නිසා අභිනව විහාර මන්දිරය දැන් පවත්නා තත්ත්වයෙන් නිම කළ බව රේරුකානේ නාහිමියන් පසුව පැවසූහ. එම නව විහාර මන්දිරය නම් දැනට තායි පිළිමය තැන්පත් කර ඇති ජාතික කෞතුකාගාරයට ආසන්න විහාර මන්දිරයයි.)

සංස්කාල

Non-Commercial Distribution

ශ්‍රී ලංකා

# ශ්වෙජින් නිකාය

ප්‍රථම මුද්‍රණය 1976

Non-Commercial Distribution

අමරපුර මහා සංඝ සභාවේ

# ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

සම්බුද්ධ පරිනිර්වාණයෙන් තෙවන සියවසෙහි දඹදිව එක්සේසත් කොට රජය කරවූ ශ්‍රීමත් **ධර්මාශෝක** නරේන්ද්‍රයන් ගේ කාලයෙහි තීර්ථකයන් ඇතුළුවීමෙන් අවුල් වී ගිය බුදු සසුන යථා තත්ත්වයට පැමිණ වීම සඳහා ත්‍රිපිටකධර ප්‍රතිසම්භිදප්‍රාප්ත දහසක් රහතන් වහන්සේ සමග තුන්වන ධර්ම සඞ්ගායනය කළා වූ **මොග්ගලීපුත්තතිස්ස** මහරහතන් වහන්සේ අනාගතයේ බුදුසස්න මැනවින් කොහි පිහිටවන්නේදැයි විමසන්නාහු ප්‍රත්‍යන්තයන්හි පිහිටන බව දැක, ඒ ඒ රටවල බුදුසසුන පිහිටුවීම සඳහා නවරටකට රහතන් වහන්සේලා යැවූහ. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ නියමය පරිදි **මිහිඳුමාහිමියෝ** ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලා සිවුනම හා ශ්‍රී ලංකාවට වැඩම කොට මෙහි බුදුසසුන පිහිට වූහ. සෝන උත්තර යන රහතන් වහන්සේ දෙනම ම්‍රම්ම දේශයේ කොටසක් වන ස්වර්ණභූමියට වැඩම කොට එහි බුදුසස්න පිහිටවූහ. ඒ පෙදෙසට රාමඤ්ඤ රටයයි ද කියනු ලැබේ. පහත බුරුමයේ රාමඤ්ඤ රට පිහිට වූ බුදුසසුන ක්‍රමයෙන් පිරිහෙන්නට විය. සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙදහස් දෙසියයක් කාලය ගත වන විට එරට උපසම්පදවක් ඇතයයි ස්ථිර වශයෙන් නො පිළිගත හැකි තත්ත්වය උද විය. ඒ කාලයේදී එහි ත්‍රිපිටක ධර්මයෙහි හා නා නා ශිල්ප ශාස්ත්‍රයන්හි නිපුණත්වය ඇති ශාසනෝදයකාමී ශ්‍රද්ධාබුද්ධිසම්පන්න **රාමාධිපති** නම් රජෙක් විය. එතුමා සිය රටේ ශාසන පරිහාණිය ගැන ඉමහත් සංවේගයට පැමිණ නැවත නිර්මල

Non-Commercial Distribution

උපසම්පදාව සිය රටට පමුණුවා ගනු රිසියෙන් ලෝ තතු විමසනුයේ ශ්‍රී ලංකාවේ මහා විහාරපරම්පරාවේ සංඝයා අතර නිර්මල උපසම්පදාව පවත්නා බව අසා එය ලබා ගෙන එනු පිණිස නැව් දෙකකට නංවා එරට භික්ෂූන් අට සාලිස් නමක් ශ්‍රී ලංකාවට පිටත් කෙළේ ය. ඒ පිරිස එකල ජයවර්ධන පුරයේ විසූ **භුවනෙකබාහු** රජුගේ හා මහාසංඝයාගේ අනුග්‍රහයෙන් කල්‍යාණි නදියේ උදකොක්ෂේප සීමාවකදී මහාවිහාර පරම්පරානුයාත නිර්මල පැවිද්ද හා උපසම්පදාව ලබා ගත්හ. ඒ භික්ෂූන් සිය රටට පැමිණි කල්හි රාමාධිපති රජතුමා උන් වහන්සේලා ලවා **කල්‍යාණි සීමා** නමින් සීමාවක් සම්මත කරවා එහිදී එරට විසූ සියලුම භික්ෂූන්ට මහාවිහාරපරම්පරානුයාත නිර්මල උපසම්පදාව ලබා දින. එහි කලින් පිහිටි සොණුත්තර සංඝ පරම්පරාව කෙළවර විය. මහාවිහාර පරම්පරාව පහළ විය.

## ශ්වේජින් නිකායේ ආරම්භය

බුරුමයට ගෙන ගිය ඒ මහාවිහාර පරම්පරාව ද ක්‍රමයෙන් පිරිහෙන්නට විය. කල්යාමෙන් ඒ සඟ පිරිස අතර ද සතුන් යෙදූ රියවලින් ගමන් කරන්නා වූද, පන්සල්වල ගොන් කරත්ත තබා ගෙන සිටින්නා වූද, නක්ෂත්‍ර වැඩ යන්ත්‍ර මන්ත්‍ර වැඩ වෙදකම් ආදිය කොට මුදල් රැස් කරන්නා වූද, මුදල් පොලී කරන්නා වූද, කුල දූෂණයෙන් ප්‍රත්‍යය ලබන්නා වූද, කුඩා සිකපද ගණනට නොගෙන කාය වාක් සංවරයෙන් තොරව හැසිරෙන්නා වූ අප්‍රසාදනීය වූ අලජ්ජී දුශ්ශීල භික්ෂූන් බෝවන්නට වූහ. ඒ නිසා ඉමහත් සංවේගයට පත් **ජාගරාභිධජ සද්ධම්මවංස ධම්මසෙනාපති අතුලාධිපති සිරිපවර මහාධම්ම රාජාධිරාජගුරු** මාහිමියන් වහන්සේ අලජ්ජී දුශ්ශීල භික්ෂූන්ගෙන් ඈත් වී ඔවුන් හා ධර්මාමිෂ සම්භෝගයෙන් වැලකී ශික්ෂාකාමී භික්ෂු පිරිසක් ඇති කර ගෙන ප්‍රත්‍යන්ත ප්‍රදේශයක වැඩ විසූහ. ඉහත කී නාමය ඒ හිමියන්ට රජතුමා විසින් පිරිනමන ලද ගරු නාමය ය. උන්වහන්සේට බාලකාලයේදී ගුරුන් විසින් තබන ලද නාමය **ජාගර** යනුයි. උන් වහන්සේ උපන්නේ ශ්වේජින් නමැති ගමෙහිය. එබැවින් උන් වහන්සේට **ශ්වේජින් ශයාඩෝ** යන නාමය ද කියති. උන්වහන්සේ බුරුම රටෙහි ප්‍රසිද්ධ ශ්වේජින් ශයාඩෝ

Non-Commercial Distribution

යන නාමයෙනි. ලක්දිව ප්‍රසිද්ධ උන් වහන්සේ ගේ ජාගර යන පාලි නාමය ය. උන් වහන්සේ වැඩ විසූයේ **මෙන්ඩුන්** නමැති රජුගේ කාලයේ ය. එතුමා පස්වන ධර්ම සංගායනාව කරවා ත්‍රිපිටක ධර්මය සුදුගල් පුවරුවල කොටවා තැබීම ආදි පින්කම් රාශියක් කළ ශාසනෝදයකාමී ශ්‍රද්ධාබුද්ධිසම්පන්න රජෙකි. සිය රටෙහි භික්ෂූන් අතරින් අලජ්ජී දුශ්ශීලයන් ඉවත් කොට ශාසනය නඟා සිටවීමේ අදහස එතුමාට තිබිණ. එතුමා ධර්ම විනය ආඥාපනත යන නමින් ආඥාපනතක් නිකුත් කොට බුදුසසුන පිරිසිදු කිරීමට උත්සාහ කෙළේ ය. එය බලාපොරොත්තු වූ තරමට සඵල නො විණ. ඒ රජතුමා කුමාර කාලයේ පටන් ජාගර මාහිමියන් හැඳින උන් වහන්සේ කෙරෙහි පැහැදී සිටියේ ය. එතුමා මණ්ඩලේ යන නමින් අභිනව නගරයක් තනවා එහි වෙසෙන කාලයේ කෙසේ හෝ ජාගර හිමියන් මණ්ඩලේ නගරයට පමුණුවා උන්වහන්සේ මුල් කර ගෙන ක්‍රමයෙන් සිය රටේ ශාසනය සංශෝධනය කිරීමේ අදහසින් උන් වහන්සේ මණ්ඩලේ නගරයට වැඩම කරවා මණ්ඩලේ පර්වතයට උතුරුදිග්භාගයෙහි අභිනව සංඝාරාම පසක්ම ඉදි කරවා ඒවා පූජා කොට පිරිස් සහිත ජාගර හිමියන් වඩාහිඳවා ගත්තේ ය. ජාගර හිමියෝ වගන්ති විස්සකින් යුක්ත ධර්මාවවාද ලේඛනයක් පිළියෙල කර එය අනුව ඒ ආරාම පාලනය කළහ. උන්වහන්සේ ගේ පාලන ක්‍රමයේ සුන්දරත්වය නිසා ඒ ආරාමයන්හි වෙසෙන භික්ෂූහු පර්යාප්ති ප්‍රතිපත්ති දෙකින්ම දියුණු වන්නට වූහ. ජාගර හිමියන්ගේ පිරිසෙහි රාජගුරු උපාධිය ලැබූ භික්ෂූන් වහන්සේ එක්විසි නමක් වූහ. ඒ දියුණුව දැක ජාගර හිමියන් කෙරෙහි පැහැදී අන්‍ය විහාරයන්හි විසූ ඇතැම් භික්ෂූහු ද ජාගර හිමියන්ගේ ආරාමවල වාසයට පැමිණියහ. නොබෝ කලකින්ම ජාගර හිමියන්ගේ ආරාමවල වෙසෙන භික්ෂු පිරිස දහසකට අධික වූහ.

අලුත් නිකායක් ඇති කිරීමේ අදහස මෙන්ඩුන් රජතුමාට හෝ ජාගර හිමියන්ට හෝ ඒ හිමියන්ගේ පිරිසට හෝ නො තිබිණ. එහෙත් කාය වාක් සංවරය හා ශික්ෂා ගරුත්වයත් නිසා ජාගර හිමියන්ගේ පිරිස රටේ කැපී පෙනෙන පිරිසක් විය. එබැවින් රට වැසියෝ ශවේජින් ශයාඩෝ යන ජාගර හිමියන්ගේ නාමය අනුව ඒ පිරිසට ශවේජින් නිකාය යයි කියන්නට වූහ. මේ ශ්වේජින් නිකාය

Non-Commercial Distribution

යන නාමය ඇති වූ ආකාරය ය. ක්‍රමයෙන් ඒ නාමය රටේ පැතිරෙන්නටත් පිළිගැනෙන්නටත් විය. ශවේජින් නිකායට නායක කෙනකු වශයෙන් රජු විසින් හෝ සංඝයා විසින් හෝ ජාගර හිමියන් පත් කර නො තිබිණ. එහෙත් උන් වහන්සේ ශවේජින් නිකායේ ගණසමුට්ඨාපක මහා නායකයන් වහන්සේ ලෙස රජු ඇතුළු සැම දෙන විසින්ම පිළිගෙන තිබිණ. උන්වහන්සේගේ ආඥාව ශවේජින් නිකායික ස්ථවිර මධ්‍යම නවක සියලුම භික්ෂූන් වහන්සේලා ඉතා ආදර ගෞරවයෙන් පිළි ගත්හ. ශ්වේජින් නිකායේ ප්‍රධාන දයකයා මෙන්ඩුන් රජතුමා ය. නිකාය ඇති වූයේ ද එතුමා විසින් කර වූ රජමහ විහාරවල ය. එබැවින් එය රාජකීය නිකායෙකි.

ගණසමුට්ඨාපක ජාගර හිමිපාණන් වහන්සේ ගේ කාලයේ ශ්වේජින් නිකාය නාම මාත්‍රයෙන් පැවතුනා මිස නිකායක් වශයෙන් ක්‍රමානුකූලව පිළියෙල වී නො තිබිණ. උන්වහන්සේගේ අභාවයෙන් පසු උන්වහන්සේ විසින් ඇති කළ භික්ෂු පරම්පරාව ඉදිරියටත් උන් වහන්සේගේ කාලයෙහි මෙන් පැවැත්විය හැකි වීම සඳහා සංඝයා විසින් නිකායේ මහානායක ධූරයට **විසුද්ධාචාර ධජාධිපති පවරමහාධම්ම රාජාධිරාජගුරු** මහාස්ථවිරයන් වහන්සේ පත්කර ගන්නා ලදහ. උන් වහන්සේ ත්‍රිපිටක ධර්මය පිළිබඳ උසස් දැනුමක් ඇති මහ පඬිවරයෙකි. නොයෙක් ග්‍රන්ථයන් සම්පාදනය කළ මහ ගත්කරුවෙකි. ඉංග්‍රීසි ආණ්ඩුවෙන් අග්ගමහා පණ්ඩිත උපාධියද ලැබූවෙකි. උන්වහන්සේ ගේ කාලයේ දී නිකායේ වෙනත් තනතුරුවලට ද සුදුසු මහ තෙරුන් වහන්සේලා ද පත් කොට නිකාය ක්‍රමානුකූලව පිළියෙල කරන ලද්දේ ය. ජාගරමාහිමියන්ට උන්වහන්සේගේ ධර්මාවවාද ලිපියෙන් නිකාය පාලනය කළ හැකි වුවද සෙස්සන්ට එය නො කළ හැකි බැවින් විශුද්ධාචාර මහනාහිමියන් විසින් නිකායේ අන්‍ය මහතෙරවරුන්ගේ ද අනුමතිය ඇතිව වගන්ති තිසක් ඇති නීති මාලාවක් හෙවත් කතිකාවතක් පිළියෙල කරන ලදී. දැනට ශ්වේජින් නිකාය පාලනය වන්නේ ඒ කතිකාවත අනුවය. ශ්වේජින් නිකාය දියුණු වී පැතිර ගියේ විශුද්ධාචාර මහනා හිමියන්ගේ කාලයේ ය. දැනට එය ශ්‍රී ලංකා සියම් යන දෙරටට ද පැමිණ ඇත්තේ ය. දැනට බුරුමයේ ශ්වේජින් නිකායෙහි පසළොස් දහසක් පමණ ඇත්තාහ. විහාරස්ථාන

දෙදහසක් පමණ ඇත්තේ ය. දැනට මේ නිකායෙහි උපාධිධාරී බොහෝ පණ්ඩිත භික්ෂූහු ඇත්තාහ. බුරුමයෙහි කළ ඡට්ඨ ධර්ම සංගායනාවේ වැඩ බොහෝවක් කෙළේ ශ්වේජින් නිකායික භික්ෂූන් විසිනි. **ශ්වේජින් නිකාය වනාහි බොහෝ පණ්ඩිතයන් බොහෝ උපාධිධාරීන් බොහෝ ග්‍රන්ථකරුවන් බොහෝ කර්මස්ථානාචාර්යයන් බොහෝ යෝගීන් බොහෝ ආරණ්‍යකයන් බොහෝ ධූතංගධාරීන්** ඇත්තාවූ මහා නිකායෙකි. භාවනා ක්‍රම පිළිබඳ ග්‍රන්ථ රාශියක් සම්පාදනය කළා වූද සතිපට්ඨාන භාවනා ක්‍රමය ලෝකව්‍යාප්ත කළා වූද මහාකර්මස්ථානාචාර්ය **අග්ගමහා පණ්ඩිත මහාසී සයාඩෝ භදන්ත සෝභන** මහාස්ථවිරයන් වහන්සේ ද ශ්වේජින් නිකායික මහතෙරනමකි.

## ශ්‍රී ලංකාවට ශ්වේජින් නිකායේ ආභාසය පැමිණීම

ශ්වේජින් නිකායේ ගණසමුට්ඨාපක ජාගර මහ නා හිමියෝ ක්‍රි. ව. 1872 දී සිද්ධස්ථාන වන්දනාව සඳහා භික්ෂූන් වහන්සේලා සතර නමක් හා දයකයන් සතර දෙනකුන්ද සමග ගාල්ලෙන් ශ්‍රී ලංකාවට ගොඩබටහ. ගාලු පුර වැසි බෞද්ධයෝ ඒ අය අත්‍යාදරයෙන් පිළිගෙන සුදුසු පරිදි ආගන්තුක සත්කාර කළෝ ය. අමරපුර නිකායික භික්ෂූන් වහන්සේලාගේ හා ගිහිපින්වතුන්ගේ සහයෝගයෙන් දඩල්ලේ පිළියෙල වූ තාවකාලික ස්ථානයක ජාගර හිමියන් ඇතුළු පිරිස නැවතී සිටියෝ ය. ජාගර හිමියන් ශ්‍රී ලංකාවට පැමිණි පුවත ඇසූ **බලපිටියේ මහා කප්පිත වලව්වේ රාජපක්ෂ මුදලිතුමා** එහි ගොස් ජාගරහිමියන්ට ආරාධනා කොට සිය වලව්වට වැඩම කරවා ගත්තේ ය. ඒ කාලයේ කොටස් තුනකට බිඳී තුබූ අමරපුර නිකාය ජාගර හිමියන්ගේ සහයෝගයෙන් නැවත සමගි කිරීමට එතුමා අදහස් කෙළේ ය. ජාගර හිමියෝ එහි වැඩ වෙසෙමින් ලාංකික භික්ෂූන් වහන්සේලාට හා දයක පින්වතුන්ට බොහෝ ධර්මානුශාසනා කළහ. සංඝයා සමගි කිරීම සඳහා මුදලිතුමා විසින් ජාගර හිමියන්ගේ උපදෙස් පරිදි උසස් උසස් අමරපුර නිකායික මහතෙර වරුන්ගේ අනුමතිය ද ඇතිව අවිවාදයෙන් කාහටත් පිළිගත හැකි පරිදි උදකෝක්ෂේප සීමාවක් **මාදු ගඟෙහි**

Non-Commercial Distribution

කරවන ලදී. ජාගර හිමියන්ට ගෞරවයක් වශයෙන් ඒ සීමාවට **ශ්වේජින් සීමා** යන නම තබන ලදී. අදත් අමරපුර සද්ධම්මවංස නිකායේ වාර්ෂික උපසම්පද උත්සවය පවත්වන්නේ එහිය. ජාගර හිමියන්ගේ මූලිකත්වයෙන් 1872 වර්ෂයේ එහි අමරපුර නිකායේ උපසම්පද උත්සවය පවත්වන ලදී. ඒ හිමියන්ගේ මූලිකත්වයෙන් සිංහල කුලපුත්‍රයන් විසි අට දෙනකුන්ද පැවිදි කළහ. ශ්‍රී සද්ධර්මවංශ නිකායේ භික්ෂූන් වහන්සේලා විසින් ජාගර හිමියන්ට ගෞරව දැක්වීම් වශයෙන් උන් වහන්සේට **සිරිසද්ධම්මවංසපාල** යන ගරුනාමය ප්‍රදනය කරන ලදී. මෙසේ ජාගර මා හිමියෝ ශ්‍රී ලංකා සම්බුද්ධශාසනයට මහත් සේවයක් කරමින් ශ්‍රී ලංකාවේ සත්මසක් වැඩ සිට වන්දනාව ද නිමකොට බුරුමයට පෙරළා වැඩම කළහ. එහි වැඩම කළ පසුත් උන්වහන්සේ අමරපුර නිකායික සංඝයාගේ යහපත පිණිස **ලංකා සාසන විසුද්ධි කථා** යන ශීර්ෂයෙන් දීර්ඝ ලිපියක් ද සකසා එවා වදළහ. ජාගර හිමියන්ගේ පැමිණීම නිසා ශ්‍රී ලංකාවට ශ්වේජින් නිකායේ ආභාසය ලැබිණ.

## ශ්‍රී ලංකාවට ශ්වේජින් නිකාය පැමිණීම.

බුරුමරට රන්ගුන් නුවර මහා ධම්මදීපිකාරාමයට හා ඤවුන්ඩුන් නුවර ශ්‍රී මහා මංගලාරාමයට ද අධිපති වූ පහත බුරුමයේ ශ්වේජින් නිකායෙහි මහානායක වූ ද රාජපූජිත සංඝපිතෘවරයකු වූ **සාසනාලංකාර සද්ධම්මාභිවංස සිරිපවර කවිධජ මහා ධම්ම රාජාධිරාජගුරු** මහා නාහිමියන්ගේ ශිෂ්‍ය ගරු **යූ. විනයාලංකාර** බුරුම නා හිමියෝ තරුණ කාලයේදීම දන්ත ධාතුන් වහන්සේ ඇතුළු සිද්ධස්ථානයන් වන්දනා කිරීම සඳහා යූ. ජයන්ත නමැති බුරුම භික්ෂුවක් ද සමග ශ්‍රී ලංකාවට වැඩම කළහ. උන්වහන්සේ පා ගමනින් ම වැඩම කරමින් සිද්ධස්ථානයන් වන්දනා කරමින් ද, දින ගණන් නැවතී ඒ ඒ තැන්වල වත් පිළිවෙත් කරමින්ද, අතරින් පතර සොහොන් බිම්වල කැලෑවල නැවතී භාවනාවෙහි යෙදෙමින් ද, ශ්‍රී ලංකාවේ සඤ්චාරය කළහ. ඒ රුවන්මැලිමහා සෑයේ ප්‍රතිසංස්කරණය ආරම්භ වී තුබූ කාලය ය. උන් වහන්සේ අනුරාධපුරයේ නැවතී සාර මසක් ම රුවන් මැලිමහ සෑයේ පස් ඉවත් කළහ. ඒ පිනෙන්දෝ උන්වහන්සේට මහසෑයට

Non-Commercial Distribution

ලක්ෂගණනක් අගනා චූඩාමාණික්‍යය පැලඳවීමේ භාග්‍යය ද ලැබිණ. උන් වහන්සේ මෙසේ කලක් ශ්‍රී ලංකාවේ සැරිසරා ශ්‍රී පාදස්ථානය වන්දනා කොට බුරුමයට පෙරළා වැඩම කරනු රිසියෙන් රත්නපුර පානදුර මහා මාර්ගයේ වැඩම කරන්නාහු දෙතුන් දිනක් නැවතී විඩා සන්සිඳවාගෙන යාමේ අදහසින් කුලුපන කන්දට වැඩම කළහ. බුරුම භික්ෂූන් කිසිවිටෙක දැක නො තුබූ හොරණ පලාත් වැසියෝ උන්වහන්සේ දක්නට වැල නො සිඳී කුලුපන කන්දට එන්නට වූහ. තරුණ කාලයේ දී උන්වහන්සේගේ සිරුර ඉතා ශෝභන විය. මුහුණ ඉතා පැහැපත් විය. ඇතැම් කාන්තාවෝ උන්වහන්සේගේ මුහුණ ඇසිපිය නොහෙලා බලා සිටියහ. ඇතැම් කාන්තාවෝ උන් වහන්සේගේ මුහුණ වරින් වර නොයෙක් පැහැ ගන්නේ ය යි ද ඇතැම් කාන්තාවෝ උන්වහන්සේගේ මුහුණින් රැස් විහිදෙන්නේ ය යි ද කීහ. උන්වහන්සේට ඒ කාලයේ මිනිසුන් ව්‍යවහාර කළේ **තාපස හාමුදුරුවෝ** ය කියා ය. පැමිණෙන සැදැහැවතුන්ට අනුකම්පාවෙන් උන් වහන්සේගේ ගමන මඳින් මඳ පමා කරන්නට සිදු විය.

පැමිණෙන සැදැහැවත්හු අටපිරිකර සහ වෙනත් බොහෝ පරිෂ්කාරයන් ද ගෙනවුත් උන්වහන්සේට පිදූහ. ජනයාගේ පැමිණීම නවතින කාලයක් නො පෙනෙන බැවින් සිවුමසකට පමණ පසු ලැබී තුබුණු පරිෂ්කාර රාශිය සංඝයාට පූජා කොට උන් වහන්සේ කුලුපන කන්දෙන් නික්මයන්ට සූදනම් වූහ. උන් වහන්සේ කෙරෙහි අතිශයින් ප්‍රසන්නව සිටි හොරණ පලාතේ බෞද්ධයෝ මුන් වහන්සේ කෙසේ හෝ මෙහි ම රඳවා ගත යුතුය යි සිතා **වැලිගම්පිටියේ ඩී. ඇල් ගුණවර්ධන අප්පුහාමි** මහතා ඇතුළු දයක පිරිසක් විසින් **පොකුණුවිට හේනේගම වැලිගම්පිටිය මීමන කුලූපන කනේවල** යන ගම් සය මැද මනරම් භූමිභාගයක් මිලයට ගෙන එය පවිත්‍රකොට තාවකාලික ආවාස තනා කුලුපන කන්දේ වැඩවිසූ බුරුම හිමි දෙනම ඒ භූමියට වැඩමවා ගන්නා ලදහ. බුරුම නාහිමියන් කෙරෙහි පැහැදී ප්‍රව්‍රජ්‍යාපේක්ෂකයෝ ද බොහෝ දෙනෙක් උන් වහන්සේ වෙත පැමිණියහ. මේ කාලයේ බුරුම නාහිමියන්ගේ ආචාර්‍ය්‍යවරයකු වූ රැන්ගුන් නුවර මහාධම්මදීපිකාරාමයේ **ඌ. ජින** නමැති ස්ථවිරයන් වහන්සේ ශ්‍රී ලංකාවට පැමිණ සිටියහ.

Non-Commercial Distribution

උන්වහන්සේ ද පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයට වැඩමකරවා 1906 ජනවාරි මස 8 වෙනි දිනයෙහි පැමිණ සිටි ප්‍රව්‍රජ්‍යා-පේක්ෂකයන් සත්විසි දෙනෙක් **යූ. විනයාලංකාර** බුරුම නා හිමියන්ගේ ශිෂ්‍යයන් වශයෙන් පැවිදිබවට පමුණුවනු ලැබූහ. ඒ ශ්‍රී ලංකාවේ පළමුවෙන් ම පැවිදි කරනු ලැබූ ශ්වේජින් නිකායික පිරිස ය.

පොකුණුවිට ඇති වූ ඒ අභිනව ආරාම භූමියෙහි ධර්මශාලා විහාර ආවාසාදිය වහ වහා කොට නිමවා 1907 ජනවාරි 20 වෙනි දිනයෙහි එය යූ. විනයාලංකාර බුරුම නා හිමියන් ප්‍රමුඛ මහා සංඝ රත්නය විෂයෙහි සාංඝික වශයෙන් පූජා කරන ලදදේ ය. ඒ භූමියට ශ්‍රී විනයාලංකාරාරාමය යන නම තබන ලද්දේ ය. ඒ ශ්‍රී ලංකාවේ ඇති වූ ප්‍රථම ශ්වේජින් නිකායික සංඝාරාමය ය. එවකට ශ්‍රී ලංකාවේ විසූ සුප්‍රසිද්ධ පඬිවරයකු වන **ලක්මිණි පහන** යන පුවත් පතෙහි කර්තෘවරයා වූ **ඇම්. ධර්මරත්න** මහතා ද ඒ විහාරස්ථානයේ දායකයෙකි.

## ප්‍රථම සීමා සම්මුතිය

ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකායික භික්ෂූන් වහන්සේලාට විහාරයක් ඇති වුවද විනය කර්ම කිරීමට සීමාවක් නො තිබීම බලවත් පාඩුවක් විය. මේ කාලයේ දී **ඌ. ගුණාභිධාන** මහා ස්ථවිරයන් වහන්සේ ප්‍රමුඛ විංශතිවර්ගික සංඝ පිරිසක් දළදා ධාතු වන්දනාව සඳහා ශ්‍රී ලංකාවට වැඩම කළහ. පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේ දායක පිරිස උන්වහන්සේලාට සීමා බන්ධනය සඳහා ආරාධනා කළහ. ශාසනෝදයකාමී වූ ඒ සුපේසල ශික්ෂාකාමී ශ්වේජින් නිකායික සඟ පිරිස ඒ ඇරයුම කරුණාවෙන් පිළිගෙන පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයට වැඩ වදාරා 1907 පෙබරවාරි මස 7 වෙනි ගුරු දින ත්‍රිවිධ සම්පත්තියෙන් යුක්ත වූ ඒකාදස විපත්තීන්ගෙන් මිදුණා වූ සුපේසල ශික්ෂාකාමී භික්ෂූන්ට විනය කර්ම කිරීමට යෝග්‍ය වූ සුපරිශුද්ධ සීමාවක් සම්මත කළහ. ඒ ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකායික සංඝයා විසින් ම සම්මත කළ ප්‍රථම බද්ධ සීමාවය. එයට සම්මත කළ සංඝයා විසින්ම **ම්‍රම්මවංශික**

Non-Commercial Distribution

**ශාසන මූල විශුද්ධි සීමා** යන නාමය තබන ලද්දේ ය. මේ සීමා බන්ධනයෙන් ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකාය මුල් බැස ගත්තේය යි කිය යුතුය. මේ සීමාබන්ධනයට ඇම්. ධර්මරත්න පඬිතුමා ද ඉතා ඕනෑකමින් සහයෝගය දුන්නේ ය. මේ සීමා බන්ධනය ගැන ධර්මරත්න පඬිතුමා විසින් 1907 පෙබරවාරි 23 වන දින ලක්මිණි පහන පතෙහි දීර්ඝ ලිපියක් ද පළ කර තිබිණ.

## පොකුණුවිට සාමණේර පිරිස බුරුම රට යැවීම

බුරුමරට සෙඃන්ඩුන් නුවර ශ්‍රී මහා මංගලාරාමයේ අනුනායක **ඌ. වායාම** නමැති මහා ස්ථවිරයන් වහන්සේ 1907 අග කොටසේදී දළදාධාතු වන්දනාව සඳහා ශ්‍රී ලංකාවට වැඩම කළහ. එවකට පොකුණුවිට විසූ සාමණේර පිරිස ඒ තෙරුන් වහන්සේගේ මාර්ගයෙන් ඒ ආරාමයට අධිපති වූද පහත බුරුමයේ ශ්වේජින් නිකායේ මහානායක වූද කොළඹ දෙමටගොඩ මහා විශුද්ධාරාමයේ වැඩ සිටි පූජ්‍යාචාර්ය **අරංගල සිරිධම්ම** හිමිපාණන් වහන්සේගේ උපාධ්‍යාය වූද **සාසනාලංකාර සද්ධම්මාභිවංස සිරිපවර කවිධජ මහාධම්ම රාජාධිරාජගුරු** හිමියන් වෙත වැඩිදුර උගෙනීම පිණිස උසස් අධ්‍යාපනය ලබනු පිණිස ධර්මරත්න පඬිතුමා ඇතුළු පොකුණුවිට දායක පිරිස විසින් අත්සන් තබන ලද පාලි භාෂාමය සන්දේශයක් ද බුරුම රටට යවන ලදහ. මෙය ලියන අපිද ඒ පිරිසේ කෙනකු වෙමු.

## කොළඹ දෙමටගොඩ මහාවිශුද්ධාරාමය

දෙමටගොඩ මහාවිශුද්ධාරාමාධිපතිව වැඩ විසූ ගරු ආචාර්ය **අරංගල සිරිධම්ම** මාහිමියන් වහන්සේ බාල කාලයේ ශ්‍රී ලංකා රාමඤ්ඤ නිකායෙහි පැවිදිව පසු කාලයේ දී බුරුමයට වැඩම කොට එවකට රන්ගුන් නුවර මහා ධම්මදීපිකාරාමයේ වැඩ විසූ පහත බුරුමයේ ශ්වේජින් නිකායේ මහනාහිමියන් වන සාසනාලංකාර සද්ධම්මාභිවංස සිරිපවර කවිධජ මහාධම්මරාජාධිරාජගුරු මහානාහිමියන් උපාධ්‍යාය කොට උපසම්පදාව ලබා කලක් ප්‍රගුණ කටයුතු විනය ග්‍රන්ථයන් ප්‍රගුණ කොට උගෙණීම ද කොට වැඩිදුර

Non-Commercial Distribution

උගෙනීම පිණිස උසස් අධ්‍යාපනයක් ලබනු පිණිස බුරුමරට මණ්ඩලේ නුවර ශ්වේජින් නිකායේ මූලස්ථානය වන මහා විශුද්ධාරාමයට වැඩම කොට එහි වැඩවෙසෙන විසුද්ධාචාර කවිධජාධිපති සිරි පවර මහාධම්මරාජාධිරාජගුරු ශ්වේජින් නිකායේ මහනාහිමියන් වෙතින් හා වෙනත් පණ්ඩිත ස්ථවිරයන් වහන්සේලා වෙතින් ද ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කොට එරට රජය මගින් පවත්වන විභාගවලින් ද සමර්ථව එරට ප්‍රසිද්ධ පඬිවරයෙක් වූහ. උන් වහන්සේ විසින් ශ්වේජින් නිකායේ මහානායක විශුද්ධාචාර හිමියන්ගේ චරිතය ගාථාවලින් සම්පාදනය කළහ. එයින් උන් වහන්සේගේ කීර්තිය වඩාත් පැතිර ගියේ ය. පොකුණුවිටින් බුරුමයට යවන ලද පිරිසට අයත් **කිදෙල්පිටියේ විනය විසුද්ධි**, **කබල්ලෑගොඩ අග්ගධම්මාලංකාර** යන දෙනම බුරුමයේ දී සිරිදම් හිමියන් හා එක්ව විසූහ. බුරුමයේදීම පැවිද්ද හා උපසම්පදාව ලත් **ගාල්ලේ ඉන්දසභ** යන භික්ෂූන් වහන්සේ ද සිරිදම් හිමියන් හා එක්ව විසූහ. සිරිදම් හිමියන් වහන්සේ බුරුමයේ ම බොහෝ භික්ෂූන් වහන්සේලාට ආචාර්යවරයකු වශයෙන් සේවය කරමින් වැඩ වෙසෙන කල්හි ශ්‍රී ලංකාවෙන් ලද ආරාධනාවක් අනුව තමන් වහන්සේගේ ජන්ම භූමියටත් සේවයක් කිරීමේ අදහසින් තමන්වහන්සේ හා විසූ අතවැසි සිංහල භික්ෂූන් වහන්සේලා තෙ නම ද සමඟ ශ්‍රී ලංකාවට වැඩම කළහ. රත්නපුර ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ වෙසෙමින් කර ගෙන ගිය වැඩ පිළිවෙළ උන්වහන්සේගේ සතුටට හේතු නොවීමෙන් උන්වහන්සේ නැවතත් බුරුමයට වැඩම කරන්නට සිතූහ. උන්වහන්සේ ඒ විහාරස්ථානයෙන් බැහැරව බුරුමයට වැඩම කිරීමේ අදහසින් කොළඹ බලා වැඩම කරන්නාහු තමන් වහන්සේගේ අතවැසි තෙනමත් සමග පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයට පැමිණ එහි ද මඳ කලක් වැඩ සිටියහ. සිරිදම් හිමියන්ගේ අදහස බුරුමයට වැඩම කිරීම වුවද උන්වහන්සේගේ අතවැසි තෙනමගේ අදහස වූයේ සිරිදම් හිමියන් කෙසේ හෝ ශ්‍රී ලංකාවේ රඳවා ගැනීමය. එහි ප්‍රතිඵලයක් වශයෙන් උන්වහන්සේලාට වැඩ විසීමට කොළඹ මාලිගාවත්තේ තාවකාලික ස්ථානයක් පිළියෙල විය. ඒ කාලයේ පොකුණුවිට විසූ **වැලිගම්පිටියේ සද්ධම්මරංසි**, **රේරුකානේ අරියඤාණ** යන දෙනම සිරිදම් හිමියන්ට

Non-Commercial Distribution

එකතු වූහ. **උඩුවේ විමලරංසි** නාහිමියන් පැවිදිවීම සඳහා සිරිදම් හිමියන් වෙත යැවූයේ ද පොකුණුවිට භික්ෂූන් වහන්සේලා විසින්ම ය. ඒ කාලයේ සිරිදම් හිමියන්ට සහයෝගය දීමට සිටියේ පොකුණුවිට පිරිසය. ඒ අයගේ සහයෝගය නො ලැබිණි නම් සිරිදම් හිමියෝ ශ්‍රී ලංකාවේ වාසය නො කරන්නාහ. සිරිදම් හිමියන් කෙරෙහි බොහෝ ජනයෝ පැහැදුණහ. එයින් **මාළිගාවත්තේ මහාවිශුද්ධාරාමය** ඇති විය. දැනට දෙමටගොඩට සංක්‍රමණය වී ඇත්තේ මාලිගාවත්තේ තුබූ මහාවිශුද්ධාරාමය ම ය. සිරිදම් හිමියෝ එහි වෙසෙමින් උගත් සිල්වත් ගුණවත් ශිෂ්‍ය පිරිසක් තැනූහ. ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ පළමුවන මහානායක ධුරය දැරූ **උඩුවේ විමලරංසි** හිමියන් හා දෙවනවර මහානායක ධුරය දැරූ ආචාර්ය **දෙවිනුවර ඤාණාවාස** හිමියෝ ද සිරිදම් හිමියන්ගේ ශිෂ්‍යයෝ ය. ඒ කාලයේ ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මූලස්ථානය වශයෙන් සැලකුණේ දෙමටගොඩ මහා විශුද්ධාරාමය ය. ආචාර්ය සිරිධම්ම මහාස්ථවිරයන් වහන්සේ නිසා ශ්‍රී ලංකා ශ්වේජින් නිකාය ශ්‍රී ලංකාවේ බැබලිණ. අරංගල සිරිධම්ම මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යානුශිෂ්‍යයෝ බොහෝ දෙනෙකි. උන්වහන්සේලා නිසා ශ්‍රී ලංකාවේ ශ්වේජින් නිකායට අයත් විහාරස්ථාන බොහෝ ගණනක් ඇති විය.

## ප්‍රධාන කම්ස්ථානාචාර්ය කහටපිටියේ සුමතිපාල නාහිමියෝ

කහටපිටියේ සුමතිපාල නාහිමියෝ 1907 දී මහ උඩුවේ ශ්‍රී සුනන්දරාමයේ දී පැවිදිව සත්වසක් පමණ කල් මෙහිදී මූලිකාධ්‍යාපනය ලබා ත්‍රිපිටක ධර්මය පිළිබඳ උසස් අධ්‍යාපනයක් ලබනු පිණිස 1913 දී බුරුම රටට වැඩම කළහ. එහිදී ඇසුරු කරනු ලැබූ සුපේසල ශික්ෂාකාමී තෙරුන් වහන්සේලා කෙරෙහි පැහැදුනා වූ උන්වහන්සේ මණ්ඩලේ නුවරදී සුධම්ම මහා සංඝ සභාවේ ලේඛක **අග්ග මහා පණ්ඩිත ඌ. වායාම** මහා ස්ථවිරයන් වහන්සේගේ ආචාර්යත්වයෙන් හා සුධම්ම මහා සංඝ සභාවේ සභාපති **සංජෝං සයාඩෝ** මහා ස්ථවිරයන් වහන්සේගේ උපාධ්‍යායත්වයෙන් නිර්මල උපසම්පදාව ලබා සත්වසක් පමණ එහි වැඩ ත්‍රිපිටක ධර්මය පිළිබඳ උසස් අධ්‍යාපනය

Non-Commercial Distribution

ලබා 1919 වර්ෂයේ දී ලක්දිවට පෙරලා පැමිණ නැවත 1955 වර්ෂයේ බුරුමයේ ෂෂ්ඨ මහා සංගායනාව පවත්වන කාලයේ එහි වැඩම කොට ධර්ම සංගායනාවට ද සහභාගි වී රැන්ගුන් නුවර **සාසනයිත්සා** නමැති භාවනා මධ්‍යස්ථානයට එළඹ මහා කර්මස්ථානාචාර්ය අග්ග මහා පණ්ඩිත භදන්ත සෝභන මහා ස්ථවිරයන් වහන්සේ වෙතින් සතිපට්ඨාන භාවනා මාර්ගය පුහුණු කර කර්මස්ථානාචාර්යව ශ්‍රී ලංකාවට වැඩම කොට දැනට කඳුබොඩ සියනෑ විපස්සනා භාවනා මධ්‍යස්ථානයෙහි වැඩවෙසෙමින් ගිහි පැවිදි සැදැහැවතුන්ට භාවනාව පුහුණු කරවමින් සම්බුදු සසුන බබලවමින් වැඩ සිටින්නාහ. උන්වහන්සේ විසින් පැවිදි කරන ලද ශිෂ්‍යයෝ දැනට සතලිස් නමක් පමණ ඇත්තාහ. උන්වහන්සේගේ පාලනයෙන් පවත්නා විහාරස්ථාන භාවනා මධ්‍යස්ථාන බොහෝ ගණනක් ශ්‍රී ලංකාවේ නොයෙක් ප්‍රදේශවල ඇත්තේ ය. මුන් වහන්සේගෙන් භාවනා පුහුණු කර ගත් ගිහි පැවිදි ශිෂ්‍යයන් දහස් ගණනක් මෙරට හා පිට රටවල ඇත්තා හ.

ශ්‍රී ලංකාශ්වේජින් නිකාය වනාහි සියක් නමක් පමණ භික්ෂූන් වහන්සේලා ඇති පන්තිසක් පමණ විහාරස්ථාන ඇති කුඩා නිකායෙකි. එහෙත් බොහෝ කර්මස්ථානාචාර්යවරයන් ඇති භාවනා පුහුණු කරවන ස්ථාන බොහෝ ඇති ධර්මධරයන් ඇති ලේඛකයන් ඇති මේ නිකායෙන් සියම් අමරපුර රාමඤ්ඤ යන නිකායත්‍රයේ බොහෝ භික්ෂූන් වහන්සේලාට හා බෞද්ධ ජනතාවට ඉමහත් සේවයක් සිදු වන බව කිය යුතු ය.

චිරං තිට්ඨතු ලොකස්මිං
සම්මා සම්බුද්ධ සාසනං

ශ්‍රී ලංකා ශ්වේජින් නිකායේ මහානායක
**රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරයන්**
වහන්සේ විසින් ලියන ලදී.

Non-Commercial Distribution

# සඟරුවන

මේ ලිපි පෙළ බළන්ගොඩ ශ්‍රී ධර්මානන්ද පිරුවන විසින් පවත්වා ගෙන ගිය **ධම් විජය** පත්‍රයේ 1955 වර්ෂයේ වෙලුම් කීපයකින් තෝරා ගන්නා ලදී. එම ලිපි වල 3, 4 ලිපි අස්ථාන ගත වී ඇති අතර, 5 වන ලිපියේ කොටසක් ද අස්ථාන ගත වී ඇත. 1982 - 08 - 08 **රිවිරුස** පුවත්පතින් උපුටා ගත් ලිපියද සඟරුවන පිළිබඳව ගිහියන්ගේ ආකල්ප සැකසීමටත් සංඝයා වහන්සේටම උපදෙස් දීමටත් ලියවුණු බැවින් මෙහි ඇතුලත් කරන ලදී.

මිෂනාරී අධ්‍යාපනයෙන් මනස කුරවළු කරගත් ලාංකික උගතුන් විසින් සිංහල කමත්, බෞද්ධ කමත්, විශේෂයෙන් එය රැකීමට උපස්ථම්භක වූ මහා සංඝරත්නයත් විවේචනයට ලක් කිරීම හා රජයේ වරප්‍රසාද ලත් ඒ පංතිය අහිංසක සාමාන්‍ය ජනයා විසින් අනුගමනය කරනු ලැබීමෙන් වන හානිය වළකනු සඳහා කරුණු පෙන්වා දීමට නාහිමියෝ මේ ලිපි ලියූහ.

ඉංග්‍රීසින්ගේ නිර්මාණයක් වූ ලංකා ආණ්ඩුව මගින් මෙතරම් වත් ආරක්ෂාවක් සිංහලයාට හා බුද්ධාගමට ලැබුණේ නොබියව අදහස් පළ කළ මෙවැනි වීරවරයන් නිසා ය.

සියලු ආගම් වලට හා ජාතීන්ට සියල්ලන් විසින් ම ගරු කරන තාක් මේ ගැටළු විසඳිය නොහැකි ය. එහෙත් එවැන්නක් අපට බලාපොරොත්තු විය හැකි ද?

**සංස්කාරක**

*Non-Commercial Distribution*

"ධම්ම විජය" පුවත් ලිපි

**පළමුවන ලිපිය**

# සඟ රුවන

බුද්ධරත්නය ධම්මරත්නය සංඝ රත්නය යන මේ වස්තු තුන සත්ත්වයනට මෙලොව පරලොව යහපත හා නිවන් සුවය ද ලබා ගැනීමට උපකාර වන මහත් වූ පිහිට තුනෙකි. ඒ රත්නත්‍රයේ පිහිට ලබන පින්වතා ම නියම බෞද්ධයා ය. ගෙය වනාහි මිනිසාට අව්වෙන් වැස්සෙන් පින්නෙන් සුළඟින් සොරුන්ගෙන් සතුරන්ගෙන් වන්නා වූ කරදර වලින් මිදී සුවසේ විසීමට ඇත්තා වූ මහත් වූ පිහිටෙකි. එහෙත් මිනිසා ගෙය භජනය නොකොට ගෙයින් බැහැරව වෙසෙමින් ගෙය මාගේ පිහිටය ගෙය මට පිහිටවේවා යි කොතෙක් කියුවත් ඔහුට ගෙයින් පිහිටක් නො ලැබේ. එමෙන් මිනිසා රත්නත්‍රය භජනය නො කර රත්නත්‍රයෙන් බැහැරව වෙසෙමින් '**බුද්ධං සරණං ගච්ඡාමි**' යනාදීන් මට රත්නත්‍රය පිහිටය, මට රත්නත්‍රය පිහිටවේවා යි කොතෙක් කියුව ද එයින් රත්නත්‍රයෙන් පිහිටක් නො ලැබේ. එය නිෂ්ඵල වැඩෙකි. රත්නත්‍රයේ පිහිට ලබන්නට නම් රත්නය භජනය කළ යුතු ය. රත්නත්‍රයෙනුදු මිනිසාට ළඟින් ම පිහිට වන රත්නය සංඝරත්නය ය. රජකෙනකු ගෙන් පිහිටක් ලබනු කැමති තැනැත්තා විසින් පළමුවෙන් මැති ඇමති ආදි රජුට පහලින් ඉන්නවුන් භජනය කර ඔවුන් ගේ අනුසාරයෙන් රජුවෙත පැමිණ බලාපොරොත්තු වන දෙය ඉටු කර ගත යුතුවාක් මෙන් රත්නත්‍රයේ පිහිට ලබනු කැමති පින්වතා විසින් සංඝරත්නය ඇසුරු කොට සංඝරත්නයේ අනුසාරයෙන් ඉතිරි රත්නයන් ගේ පිහිට ද

Non-Commercial Distribution

ලබා ගත යුතු ය. සංඝරත්නය ඇසුරු කළ හැකි වීමට ද බෞද්ධ ගිහියා සංඝරත්නය හැඳින ගත යුතු ය. සංඝරත්නයේ ගුණ දත යුතු ය.

මෙකල බොහෝ බෞද්ධයෝ භික්ෂූන් නො හඳුනති. භික්ෂූන් ගේ ගුණ නො දනිති. මෙකල ඇතැම් බෞද්ධයන් භික්ෂූන් වහන්සේ හඳුනන්නේ හිස මුඩුකරගෙන කහ රෙදි හැඳ පොරවා ගත් කෙනකු සැටියට පමණෙකි. ඇතැමුන් හඳුනන්නේ අපේ දනයත් පාංසුකූලයත් ගන්නට ඉන්නා කෙනකු ලෙස ය. ඇතැමුන් හඳුනන්නේ ලෙහෙසියෙන් ජීවත් වන්නට ක්‍රමයක් සාදගෙන වෙසෙන්නකු ලෙස ය. ඇතැමුන් හඳුනන්නේ අනුන් ගෙන් ලැබෙන දේ කා බී නිකම්ම නිදන කෙනකු ලෙස ය. ඇතැමුන් හඳුනන්නේ රටට ජාතියට කිසිම වැඩක් නැති රටට බරක් වන පුද්ගලයෙකු ලෙසට ය. අද ඇතැම් බෞද්ධයන් තවුසන් පසු පස දුවන්නේත් විනයවර්ධන කාරයන් පස්සේ දුවන්නේත් භික්ෂූන් වහන්සේ ගේ ගුණ නො දැනීම නිසා ය. බෞද්ධයන් භික්ෂූන් වහන්සේ කෙරෙහි ප්‍රසාදයක් නැත්තේත් භික්ෂූන් වහන්සේ භජනය නො කරන්නේත් ඒ නිසා ය.

මෙසේ ගිහි පැවිදි දෙපක්ෂය ඔවුනොවුන් නො හඳුනන තරමට ඇත් වූයේ බෞද්ධ භික්ෂූන් වහන්සේ ගේ හෝ ගිහි බෞද්ධයාගේ වරදින් නොව අන් කරුණෙකිනි. **මෙරට ආක්‍රමණය කළ ඉංග්‍රීසිහු** සිංහලයන් ජාතික හැඟීමක් නැති, ආගමික හැඟීමක් නැති, උදාර අදහස් නැති, තමන්ගේ ජාතිය පිළිකුල් කරන, තමන්ගේ ජාතියට සතුරු, තමන්ගේ ආගමට සතුරු, යුරෝපයට ගැති කම් කරන, අභිවාදනය කරන පිරිසක් කළ පසු පහසුවෙන් ම තමන් යටතේ තබා ගත හැකි වන බව දැන, එය සිදු කිරීම සඳහා ක්‍රිස්තියානි පූජකයන් මේ රටට ගොඩ බැස්සූහ. භික්ෂූන් වහන්සේ අත තුබූ අධ්‍යාපනය හැරගෙන පාදිලි වරුන්ට එය හිමි කරන ලද්දේ ය. මිෂනාරීහු රජයේ අනුබලය ලබමින් අධ්‍යාපනය තමන් අතට ගෙන ඒ මගින් සිංහල සිරිත විරිත ඇඳුම පැළඳුම පහත් කොට සිතන, සිංහල ජාතිය සිංහල බස පහත් කොට සිතන, යුරෝපයට අභිවාදනය කරන, සිංහල බසට සිංහල ජාතියට බුද්ධාගමට භික්ෂූන් වහන්සේට සතුරු, ඉංග්‍රීසියෙන් අඳින පළඳින කන බොන කතා කරන කළු ඉංග්‍රීසිකාර

Non-Commercial Distribution

පිරිසක් මේ රටේ ඇති කළහ. රජයේ උසස් ම තනතුරු ද ඔවුනට හිමි කරන ලද්දේ ය. ඒ මගින් **සිංහලයන් පෙලමින් බුද්ධාගම මරමින්** ඔව්හු මහා ධනස්කන්ධයක් ද රැස් කර ගත්හ.

භික්ෂූන් වහන්සේ ඔවුනට කෝලමක් විය. ඔවුන්ගේ සහා-යෙන් ලක්දිව ගම්වල ද පාසැල් පිහිටුවා සිංහල දරුවනට ඒවාට යන ලෙස බල කොට පන්සල් අධ්‍යාපනය සහමුලින් නැති කර දැමූහ. භික්ෂූන් වහන්සේ තනි වූහ. ගිහි පැවිදි සම්බන්ධය එයින් දිනෙන් දිනම නැතිවී ගොස් අන්තිමට ගිහි පැවිදි දෙපක්ෂය ඔවුනොවුන් නාඳුනන අය වූහ. කල්යෑමෙන් භික්ෂූන් වහන්සේගෙන් ප්‍රයෝජනයක් නො ලබන්නා වූ බෞද්ධයනට භික්ෂුව එපා විය. භික්ෂුවට ද ගිහියා එපා විය. එයින් භික්ෂූහු ගිහියා ගැන තැබූ බලාපොරොත්තුව විශ්වාසය හැර දමා තුමූ ම ධනය සපයා ජීවත් වන්නට පටන් ගත්හ. එයින් භික්ෂූහු ද ශාසනික ප්‍රතිපත්තියෙන් හා දැන උගත් කමින් ද පිරිහෙන්නට වූහ. පිරිහෙත් පිරිහෙත් ම භික්ෂුව වඩ වඩා ගිහියන්ට එපා විය. ගිහියෝ නොයෙක් තැන භික්ෂූන්ට දුශ්ශීලයෝ ය යි ගර්හා කරන්නට වූහ. එයින් ගිහි පැවිදි දෙපක්ෂය හොඳට ම භේද වූහ. ගිහියෝ ද ඔවුනොවුන් භේද වූහ. මිෂනාරී ගැටය සර්වාකාරයෙන් සාර්ථක විය. බෞද්ධයෝ දැන් පරාජිත පක්ෂය වී සිටිති.

මේ රටේ පෙර විසූ සිංහලයෝ රජකුට මෙන් දෙවියකුට මෙන් භික්ෂුවට ගරු කළෝ ය. භික්ෂූන් වහන්සේ ගේ අවවාදයට අනුශාසනයට ඇහුම්කන් දුන්හ. එයින් මේ දිවයින **ධර්මද්වීපයක් විය. අද ගිහියාගේ බලාපොරොත්තුව භික්ෂුව ඔහුගේ අණට කීකරුව ගිහියා කියන සැටියට විසිය යුතුය කියා ය**. එබැවින් අද භික්ෂුවට අවවාද කරන්නට අනුශාසනය කරන්නට එන ගිහියන් මිස භික්ෂූන් ගේ අනුශාසනය ලැබීමට භික්ෂූන් වෙත එන ගිහියන් දුලබ වී තිබේ. අද පවත්නා වූ මේ තත්ත්වය ඉතා භයානකය. මෙය ඉදිරියටත් මෙසේම පැවතුන හොත් අපේ මුතුන් මිත්තන් විසින් ජීවිතය සේ උතුම් කොට පවත්වාගෙන ආ බුද්ධාගම ශතවර්ෂයක් ගතවන්නටත් කලින් මේ රටින් අතුරුදන් වනු ඇත. මුලු සිංහල ජාතිය ම මා දැලකට අසුවන මසුන් රැසක් සේ මිෂනාරී දැලට හසු වී ඔවුන්ට ගොදුරු වනු ඇත.

Non-Commercial Distribution

## දෙවන ලිපිය

භික්ෂූන් ගේ අවගුණ කථාව මෙකල නිතර ඇසෙන්නකි. එය බොහෝ ගිහියන්ට ඉතා මිහිරකි. එබැවින් ගිහියෝ ඉතා ඕනෑකමින් එය අසති. පැවිද්දන් ගේ අගුණ දක්වන පුවත්පත් ආදිය මහත් රුචියෙන් කියවති. ඒ නිසා **තවුසා ද විනය වධීත කාරයා ද දේශනා කාරයා ද** භික්ෂූන් ගේ අගුණ වපුරති. ගිහියන් ගේ රුචිය දත් **පත්‍ර සඟරා කාරයෝ ද පොත් කාරයෝ ද** එයම කරති. එයින් දැන් බෞද්ධ ජනයාට භික්ෂූන් ගේ අගුණ හොඳට ම පාඩම් වී තිබේ. මෙතරම් විශාල අන්දමට භික්ෂූන්ට ගර්හාකරන්නට රට වැසියා පටන් ගෙන තිබෙන්නේ භික්ෂූන්ගේ ම වරද නිසා ය යි බොහෝ දෙනා සිතති. අප විසින් මේ ලිපිපෙල ලියන්නට අදහස් කළේ සම්බුද්ධ ජයන්තිය ළංවී බෞද්ධයන් ගේ ප්‍රබෝධයක් ඇති වී තිබෙන මේ අවස්ථාවේ දී එහි නියම තතු බෞද්ධ මහ ජනයාට අවබෝධ කරවීමේ අදහසිනි.

ගර්හා කිරීමට කරුණු සොයා ගත නොහෙන කිසිම පුද්ගලයෙක් අතීතයෙහි ද නොවීය, දැනුදු නැත්තේ ය. හැම දෙනා ම හොඳ හැටියට සලකන දෙයක් ද ලොව නැත. හැමදෙනා ම නරක ලෙස සලකන දෙයක් ද ලොව නැත. ඒ නිසා භික්ෂුව කුමක් කළත් කුමක් කීවත් එය නරක ලෙස පිළිගන්නා අය භික්ෂුවට ගර්හා කරති. එබැවින් කෙසේ හැසුරුණත් භික්ෂුවට ගර්හාවෙන් මිදී නො විසිය හැකිය. **ලොවට වැඩ කරන්නෝ ද ශුද්ධ පුද්ගලයෝ ද විශේෂයෙන් ම ගැරහුම් ලැබීමෙන් නො මිදෙති**. තමා ගේ ධනයත් ඥානයත් වීර්‍ය්‍යයත් සැපයත් පරාර්ථය සිදු කිරීමට ම කැප කළ **'මහාත්මා ගාන්ධි තුමා'** ගැරහුම් ලැබුවා පමණක් නොව අනුන් අතින් මැරුම් ද කෑවේය. **ක්‍රිස්තු තුමාට** වූයේ ද ඒ ඉරණම ම ය.

Non-Commercial Distribution

ඒ ඒ රටවල වැඩ කරන සියලු ම දේශපාලකයෝ ද එසේම ගැරහුම් ලබති. භික්‍ෂුව වනාහි ලොවට වැඩ කරන්නෙක් ද වේ. ශුද්ධ පුද්ගලයෙක් ද වේ. ඒ නිසා භික්‍ෂුවට කොයි ලෙසකින් වත් ගැරහීමෙන් මිදී නො විසිය හැකි ය. ගැරහීම් ලැබීම භික්‍ෂුත්වයේ අංගයකි. අතීතයේ බුද්ධ කාලයේ විසූ භික්‍ෂූන්ට ද මනුෂ්‍යයෝ බොහෝ නින්දා කළහ. බුද්ධ කාලයට පෙර විසූ පැවිද්දන්ට ද එසේ ම ගර්හා කළ හ.

අප බුදුරජාණන් වහන්සේ ගේ කාලයෙන් බොහෝ ඉහත **සුනෙත්ත අරනේමි කුද්දාල හත්ථිපාල ජෝතිපාල අරක** යන ශාස්තෘ-වරයෝ විසූහ. ඒ ශස්තෘවරයෝ ද පැවිද්දෝ ය. ඒ ශාස්තෘවරයෝ බ්‍රහ්මලෝකෝත්පත්තියට හේතු වන ධර්‍මයක් දෙසූහ. ඒ ශාස්තෘ වරයන් කෙරෙහි සිත පහදවා ගත් බොහෝ දෙනා ඒ හේතුවෙන් දෙව් ලොව උපන් බවත් ඒ ශාස්තෘවරයන් කෙරෙහි සිත පහදවා නොගෙන එතුමන්ට ගර්හාකොට බොහෝ දෙනා අපායට ගිය බවත් අංගුත්තර නිකායේ සත්තක නිපාතයේ වදරා තිබේ. එයින් පෙනෙනු යේ පැවිද්දන්ට ගර්හා කිරීම ලෝකයෙහි කවදත් පවත්නා දෙයක් බවය.

ගැරහුම් ලබන බව භික්‍ෂු ජීවිතයේ අංගයෙකි. ගර්හාවට බිය වන කිපෙන කලබල වන තැනැත්තාට මහණකම නොකළ හැකි ය. එබැවින් බුදු රජාණන් වහන්සේ විසින්

**නින්දාය නප්පවෙධෙය්‍ය**
**න උණ්ණමෙය්‍ය පසංසිතො භික්ඛු"**

යනුවෙන් භික්ෂුව විසින් නින්දාව නිසා නො සැලිය යුතු ය, ප්‍රසංසාවෙන් උඩඟු නොවිය යුතු ය යි වදරන ලදී. එක් රහතන් වහන්සේ කෙනකුන් විසින් ද මෙසේ වදරන ලදී.

**බහූහි සද්දා පච්චූහා ඛමිතබ්බා තපස්සිනා**
**න තෙන මංකු හොතබ්බා නහිතෙන කිලිස්සති**
**යො ච සද්ද පරිත්තාසී වනෙ වාතමිගො යථා**
**ලහු චිත්තොති තං ආහු නාස්ස සම්පජ්ජතෙ වතං**

Non-Commercial Distribution

**ගාථාවල තේරුම මෙසේ යː–**

ලෝකයෙහි ඒ ඒ අයට විරුද්ධ ශබ්ද බොහෝ ය. පැවිද්දා විසින් ඒවා ඉවසිය යුතු ය. ඒවා නිසා දුර්මුඛ නොවිය යුතු ය. ඒවා නිසා කිලිටි නොවන්නේ ය.

'සුළඟින් හටගන්නා හඬට බිය වන වනයෙහි වෙසෙන වාත මෘගයා මෙන් හඬට බිය වන භික්ෂුව නො මේරූ සිත් ඇතියෙකැයි කියති. එවැනි භික්ෂුව ගේ පැවිද්ද සම්පූර්ණ නොවේ.'

පිරිසිදු බව හෙවත් සිල්වත් බව ගැරහුම් ලැබීමේ කරුණක් බව මතු දැක්වෙන කථාවෙන් දත යුතු ය. එක් කලෙක **අප මහ බෝසතාණන් වහන්සේ** තවුස් පැවිද්දෙන් පැවිදිව එක් විලක් ඇසුරු කර ගෙන වනයෙහි විසූහ. දිනක් උන්වහන්සේ ශරීරය පිරිසිදු කර ගනු පිණිස විලට බැස එහි වූ පියුමක සුවඳ ආඝ්‍රාණය කරමින් උන් සේක. එය දුටු එක් දෙව් දුවක් බෝසතාණන් සංවේගයට පමුණුවනු පිණිස 'මේ මල් මගේ ය, මාගේ මල් වල සුවඳ ගන්නා වූ ඔබ සුවඳ සොරෙක' කියා බෝසතාණන් වහන්සේට ගර්හා කළාය. "මම තිගේ මල් නො ගතිමි. එසේ වූ මට කුමට සුවඳ සොරෙකැයි කියන්නෙහි දැ"යි බෝසතාණෝ කීහ. එකෙණෙහි තවත් පුරුෂයෙක් ඒ විලට බැස නෙළුම් අල ගලවමින් මල් නෙලමින් හුන්නේ ය. බෝසතාණන් වහන්සේ ඔහු දැක, "තිගේ විල විනාශ කරන අර මිනිසාට තී කුමක් හෙයින් කිසිවක් නො කියන්නෙහි දැ"යි ඇසූහ. එයට දේවතාදුව දුන් පිළිතුර මෙසේ ය ː–

**ආකිණ්ණ ලුද්දො පුරිසො ධාති චෙලං ච මක්ඛිතො**
**තස්මිං මෙ වචනං නත්ථි තංච අරහාමි වත්තවෙ,**
**අනංගණස්ස පොසස්ස නිච්චං සුචිගවෙසිනො,**
**වාලග්ගමත්තං පාපස්ස අබ්භාමත්තං ච ඛායති.**

කෙලෙසුන්ගෙන් පිරුණු සන්තානය ඇති මේ මිනිසා දරුවන් ගේ සෙම් සොටු මළ මූත්‍රාදියෙන් කිලිටි වූ කිරි මවක ගේ හැඳි වතක් සේ කිලිටි ය. එබැවින් ඔහුට කියයුත්තක් නැත. කෙලෙස්

Non-Commercial Distribution

අඩු වූ නිතර පිරිසිදු බව සොයන්නා වූ පුද්ගලයා ගේ කෙසගක් පමණ වරද ද ලොවට මහ වළාකුළක් සේ පෙනෙන්නේ ය. එබැවින් මම ඔබට කියම්ය යනු ඒ ගාථාවල අදහසය.

මේ කථාවෙන් පෙනෙන්නේ ද වරද නැති පිරිසිදු පුද්ගලයා ගේ වරද ලෝකයට මහත්ව පෙනෙන බවය. පිරිසිදු බව හෙවත් සිල් වත් බව ගැරහුම් ලැබීමේ කරුණක් බව කියන ලද්දේ එහෙයිනි. ලෝකයෙහි ගර්හාවක් පැවතීමෙන් පිළිගන්ට තිබෙන්නේ භික්ෂුව ගේ පිරිසිදු බව ය. ලෝකයෙහි පවත්නා අගුණ ඝෝෂාව භික්ෂුව ගේ පාරිශුද්ධිය අභවන ලකුණකි. ඒ නිසා ඒ අගුණ ඝෝෂය භික්ෂුව ගේ ගුණ ඝෝෂය සැටියට ම සැලකිය යුතු ය.

## පස් වන ලිපිය

පෘථග්ජන භික්ෂුව ලෝකයා විසින් ගරු බුහුමන් කළ යුත්තකු වන්නේ සියලු පවින් වැළකී සියලු ඇවැත් වලින් මිදී රහතන් වහන්සේ කෙනකු සේ කල් යවන්නකු නිසා නොව ගිහියන් බැඳී සිටින බොහෝ බන්‍ධන රාශියක් සිඳ දමා, ගිහියන් ලබන බොහෝ සැප හැර දමා, ගිහියන් කරන පව්කම් වලින් බොහෝවක් සම්පූර්‍ණයෙන් ම හැර දමා බුදුසස්නට වැද වැඩිදුරටත් පව්කම් නැති කිරීමටත් පින් කම් වැඩිකිරීමටත් උත්සාහ කරමින් ලෝ සසුන් දෙකටත් වැඩ කිරීමට තමා ගේ සම්පූර්‍ණ ජීවිත කාලය ම ගත කරන්නකු වන බැවිනි.

**පැවිදි වන්නෝ නොයෙක් අදහස් වලින් පැවිදි වෙති. කවර අදහසකින් පැවිදි වුව ද පැවිදි වීමෙන් ඒ තැනැත්තා කලින් සිටියාට වඩා ගුණවතකු වීම නම් ඒකාන්ත ය.** පැවිදි වූ තැනැත්තා සව්ාකාරයෙන් සිවු පිරිසිදු සීලය රකින්නකු නොවතුදු මිනී මැරීම ගවයන් ඌරන් කුකුලන් මැරීම ගෙවල් බිඳීම මං පැහැරීම ස්ත්‍රීන් පැහැර ගෙන යාම සුරාපානය යනාදි ගිහියන් කරන බොහෝ පව්කම් නො කරන්නේ වේ. මිනී මැරීමය හරක් මැරීමය යන දෙක ම කරන්නකු මිනී මැරීම නවත්වා හරක් මැරීමෙහි පමණක් පිහිටියේ ද එයින් ඔහු ගුණවතකු වූ බව කිව යුතු ය. මිනී මැරීම හැර දැමීම ඔහුගේ ගුණය ය. පැවිදිව ගිහියන් කරන පව්කම් බෙහෝවක් හැර දැමූ තැනැත්තා එයින් ගුණවතෙක් නො වේ ද? වේ ම ය.

නුවණැත්තා වූ ඇතමෙක් දහම් අසා සසර කලකිරී තිවන් පසක් කරගන්නා අටියෙන් පැවිදිව නෑමිතුරන් කෙරෙහි ද ලෝකයා කෙරෙහි ද අපේක්‍ෂාව හැර ජනයා කෙරෙන් ඈත්ව විවේකස්ථානයන්ට වී භාවනා කෙරෙති. ඒ පින්වත්හු ද එයින්

Non-Commercial Distribution

පූජ්‍යයෝ වෙති. ඇතමෙක් හැකි පමණින් ගුණ දම් පුරමින් ලෝසසුන් වැඩ කරමින් තමන් ගේ ජීවිත කාලය ගෙවා අනාගතයේ දී නිවන් දක්නා බලාපොරොත්තුවෙන් පැවිදි වෙති. අද රටේ ඇති භික්ෂූන් ගෙන් වැඩි දෙනා ඒ අදහසින් පැවිදි වූවෝ ය.

නගරග්‍රාමයන්හි විහාරස්ථානවල වෙසෙන ඒ භික්ෂූහු නොයෙක් දුක් කරදර විඳිමින් නොයෙක් විට සෑහෙන ආහාරයකුදු නො ලබමින් බුදු දහම රකිති. දහම් පොත් පත් රකිති. දහම් පොත් පත් මුද්‍රණය කරවති. අභිනව ග්‍රන්ථ සම්පාදනය කරති. ධර්මය හා භාෂා ශාස්ත්‍රය උගන්වති. විහාරස්ථාන ආරක්ෂා කරති. දියුණු කරති. දහම් දෙසීම් ආදියෙන් මහජනයා සුමග යවති. බොහෝ දුර බැහැර වුව ද යමින් දුක සේ ගිහියන් ගේ ආගමික කටයුතු සිදු කර දෙති. අද බුද්ධාගම පවත්නේ එසේ කරන්නා වූ ඒ භික්ෂූන් වහන්සේලාගේ ධෛර්‍ය්‍යය නිසා ය. නො එසේ නම් අද බණ පොතක් නැත. බුද්ධාගමක් නැත. නොයෙක් විට ජාතික විපත් වලදී ඉදිරිපත්ව රට ජාතිය රැක ගත්තෝ ද උන්වහන්සේලා ම ය. සිංහල භාෂාව හා අපේ පැරණි ශාස්ත්‍ර රැකී ඇත්තේ ද උන් වහන්සේලා නිසා ම ය.

බොහෝ දෙනකුන් ධනය සැපයීමටත් අඹුදරුවන් පෝෂණය කිරීමටත් පස්කම් සැප විඳීමටත් නොයෙක් අපරාධ කිරීමටත් තමන් ගේ සම්පූර්ණ කාලය ගත කරන මේ ලෝකයෙහි බුදු දහම රැකීමට බුදු සසුන රැකීමට තමන් ගේ සම්පූර්ණ ජීවිත කාලය කැප කර තිබීම වූ මේ එක කාරණයමත් භික්ෂූන් වහන්සේ ගේ මහා ගුණයෙකි. ධනය සැපයීමටත් අඹුදරුවන් පෝෂණය කිරීමටත් ඉන්ද්‍රියයන් පිණවීමටත් තමන් ගේ සම්පූර්ණ ජීවිත කාලය ගෙවන බොහෝ ගිහියෝ භික්ෂූන් වහන්සේ විසින් තමන් ගේ සම්පූර්ණ කාලය යොද ආරක්ෂා කරගෙන ඇති බුද්ධාගමයෙන් තමන්ට වුවමනා වූ විට ප්‍රයෝජනය ද ලබමින් එය රැක දෙන භික්ෂූන් වහන්සේට ගර්හා ද කරති. එය කොතරම් නො මනා ක්‍රියාවක් ද?

**තාපසයන් තපස් කම් කරන්නේත් නියම භික්ෂූන් වහන්සේට පහර දෙන්නේත් විනය වර්ධනකාරයෝය යි කියන අවිනීතයන්**

Non-Commercial Distribution

මහාසංඝයා වහන්සේට පහර දෙන්නේත් භික්ෂූන් වහන්සේලා විසින් ආරක්ෂා කර ගෙන ඇති බුදු දහමෙන් අතනින් මෙතනින් අවුලා ගත් බණපද ටිකකිනි. එක ම ධම්පදය සත්පුරුෂයා අතට පැමිණි කල්හි ලොවට සෙත සලසන උතුම් දෙයක් ද අසත්-පුරුෂයා අතට පැමිණි කල්හි අනුන්ට පහර දෙන ආයුධයක් ද වේ. තවුසන් අතට විනයවඨන කාරයන් අතට පැමිණ ඇති ධම් පද කඩු කිනිසි වී තිබේ.

Non-Commercial Distribution

## හය වන ලිපිය

තථාගතයන් වහන්සේ චතුරසංඛ්‍ය කල්පලක්‍ෂයක් පෙරුම් පුරා ඉතා දුක් ගෙන ලොව්තුරා බුදු බවට පැමිණ මේ බුදු සස්න පිහිටුවා වදාළේ, සත්ත්වයන් අපායට හෙළීමට මහක් සාද තබනු පිණිස නොව, දෙවියන් සහිත ලෝකයා ගේ යහපත පිණිස ය. මේ ශාසනයේ මාර්‍ගයෙන් ලෝකයාට අපායෙන් බේරීම පිණිස ය. දෙව් මිනිස් සැප ලැබීම පිණිස ය. සසර දුකින් මිදී නිවන් පුරයට පැමිණෙනු පිණිස ය. තථාගතයන් වහන්සේ විසින් පනවා ඇති සිකපද ඉතා බොහෝ ය. ඒවායේ ගණන පවා සෙවීම දුෂ්කර ය. ගණනක් නැති සික පද ඇති උපසම්පද ශීලය, පොහෝ දිනයෙහි පමණක් ගිහියන් අටසිල් රකින්නාක් මෙන් කලාතුරකින් දවසක පමණක් රකිනවා නම් කෙනකුට එක සිකපදයකුදු නො කැඩෙන සැටියට අමාරුවෙන් වුව ද එය රැකිය හැකිය. සම්පූර්ණ ජීවිත කාලය ම මහණකම කරන්නකුට නො කැඩෙන පරිදි ඒ සිකපද සියල්ල කවරාකාරයකින්වත් නො රැකිය හැකිය.

ඇතමුන් කියන සැටියට සිකපද කඩන භික්‍ෂූහු එයින් අපායට යෙත් නම් ඔවුනට දන් දෙන ගිහියන් එයින් අපායට යෙත් නම් බුදුසස්නක් පිහිටවීම් වශයෙන් තථාගතයන් වහන්සේ විසින් කර තිබෙන්නේ ලොවට මහා අපරාධයෙකි. ගණනින් ප්‍රමාණයක් දැක්විය නොහෙන තරම් විශාල ජනසමූහයකට අපායට යාමේ මහක් සාද තැබීමකි. අතීතානාගත වර්‍තමාන යන කාලත්‍රයෙහි සියල්ල දැන ගැනීමට සමත් තථාගතයන් වහන්සේ මෙතෙක් සිකපද සමූහයක් භික්‍ෂූන්ට සම්පූර්ණයෙන් රැකිය නො හෙන බව නො දන්නා සේක් ද? දන්නා සේක් ම ය. සම්පූර්ණයෙන් සිපදක රැකිය නුහුණු භික්‍ෂූහු අපායට යෙත් නම් බොහෝ සිකපද පනවා භික්‍ෂූන්ට අපායට යන්නට සිදු වන පරිදි මේ සසුන බුදුන් වහන්සේ නො

Non-Commercial Distribution

පිහිටුවන සේක. උන් වහන්සේ මේ ශාසනය පිහිටුවා ඇත්තේ බොහෝ සිකපද පනවා ඇත්තේ රැකිය හැකි පමණක් සිකපද රැකීම නිෂ්ඵල නොවන නිසා ය.

**කඩවුව හොත් මහණකම සම්පූර්ණයෙන් නැති වන, මහණකමෙන් පිහිටක් නො ලැබිය හැකි වන සිකපද ඇත්තේ සතරක් පමණෙකි.** '**සතර පාරාජිකා**' ය යි කියනුයේ ඒ සිකපද සතරය. ඒ සිකපද සතර රක්නා තුරු භික්ෂුවට භික්ෂු භාවය හෙවත් උපසම්පද ශීලය තිබේ. එයින් ඒ භික්ෂුව දුශ්ශීලයකු නොව සිල්වතෙකි. අනිකුත් සිකපද කොතෙක් බිඳුණේ ද එයින් පැවිද්ද නිෂ්ඵල නො වේ. ඒ බව '**අංගුත්තර නිකාය**' තිකනිපාතයෙහි එන මේ තථාගත දේශන-යෙන් දත යුතු ය.

**'ඉධ භික්ඛවෙ භික්ඛු සීලෙසු පරිපූරකාරී හොති, සමාධිස්මිං මත්තසො කාරී, පඤ්ඤාය මත්තසො කාරී, සො යානි තානි ඛුද්දානු-ඛුද්දකානි සික්ඛාපදානි තානි ආපජ්ජතිපි වුට්ඨාතිපි, තං කිස්ස හෙතු? නහිමෙත්ථ භික්ඛවෙ අභබ්බතා වුත්තා, යානි ච ඛො තානි සික්ඛාපදානි ආදි බ්‍රහ්මචරියකානි බ්‍රහ්මචරිය සාරුප්පානි, තත්ථ ධුවසීලී ච හොති ඨිතසීලී ච සමාදාය සික්ඛති සික්ඛාපදෙසු, සො තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නො හොති අවිනිපාත ධම්මො නියතො සම්බොධි පරායනො'**

මෙහි අදහස 'සතර පාරාජිකාවෙන් වැලකීම වූ ආදි බ්‍රහ්ම චරියක ශීලයෙහි ස්ථිරව පිහිටීමෙන් සිල්වත් වන්නා වූ කුඩා වූ ද ඉතා කුඩා වූ ද ඇවැත්වලට නැවත නැවත පැමිණෙමින් ඇවැත් දෙසීම් ආදියෙන් නැවත නැවත පිරිසිදුවන්නා වූ ද භික්ෂුව එක්තරා ප්‍රමාණයකින් සමාධිය හා ප්‍රඥාව දියුණු කෙළේ වේ නම් එයින් සංයෝජනත්‍රයක් ප්‍රහාණය කොට මතු කිසි කලෙක අපායට නො යන අර්හත්වයට පැමිණීමෙහි නියත පුද්ගලයෙක් වන්නේ ය. කුඩා වූ ද ඉතා කුඩා වූ ද ඇවැත්වලට පැමිණීමෙන් මහපල ලැබීමට අභව්‍යභාවයක් නො කියනු ලැබේ ය, යනුයි.

Non-Commercial Distribution

## හත් වන ලිපිය

# ආපත්තිය පාපයක් ම ද?

අද ලෝකයෙහි බොහෝ දෙනකුන් විසින් සලකන්නේ භික්ෂුවක් කවර ආපත්තියකට හෝ පැමිණිය හොත් එයින් ඒ භික්ෂුව මහා පාපයක් සිදු කර ගත් ලෙසය. ඇවතට පැමිණෙන භික්ෂුව වැඳුම් පිදුම් කිරීමට, භජනය කිරීමට නුසුදුසු මහ පව් කාරයකු ලෙස ය. එය ධර්මවිනය නො දැනීම නිසා බොහෝ දෙනකුට ඇති වැරදි හැඟීමකි. මේ වැරදි හැඟීම මහා ජනයාට ඇති කර දී ඇත්තේ ද අනුන්ගේ ගුණවත් බව නො ඉවසන අනුන් ගේ ගුණ මකා දැමීමට උත්සාහ කරන අනුන්ගේ තත්ත්වය පහත් කිරීමට අනුන්ගේ ලාභය නැති කිරීමට උත්සාහ කරන ඇතැම් විනය වඩීන කාරයන්, තවුසන් බඳු අසත්පුරුෂයන් විසිනි.

**අසත්පුරුෂයා** වනාහි ලොවට යහපතක් කරන්නකු මෙන් පෙනී සිට අපරාධ කරන්නෙකි. භයානක පුද්ගලයෙකි. ඔහු හැඳින ගෙන තිබීම කාහටත් ප්‍රයෝජනවත් වන බැවින් තථාගතයන් වහන්සේ විසින් අසත්පුරුෂයා හඳුන්වා දී ඇති සැටි ද මෙහි දක්වනු ලැබේ.

මහණෙනි, අංග සතරකින් යුක්ත තැනැත්තේ අසත්පුරුෂ-යා යයි දත යුතු ය. මහණෙනි, මේ ලෝකයෙහි අසත්පුරුෂයා අනුන් ගේ යම් අගුණයක් වේ නම් එය අනුන් විසින් නො විචාළේ ද කියන්නේ ය. විචාළහොත් අඩුවක් නො කොට සම්පූර්ණ කොට විස්තර වශයෙන් ම කියන්නේ ය. මහණෙනි, එයින් ඒ තැනැත්තා අසත්පුරුෂයකු බව දත යුතු ය. මහණෙනි, අසත්පුරුෂයා අනුන් ගේ යම් ගුණයක් වේ නම් විචාළේ ද එය නො කියන්නේ ය.

Non-Commercial Distribution

නොවිචාළ කල්හි කියනු ම කිම? විචාරන ලදුව අනුන්ගේ ගුණය කියතත් අඩු කොට අසම්පූර්ණ කොට විස්තර නො කොට එය කියන්නේ ය. මහණෙනි, එයින් ඒ තැනැත්තා අසත්පුරුෂයකු බව දත යුතු ය. තව ද මහණෙනි, අසත්පුරුෂයා තමාගේ යම් අගුණයක් වේ නම් එය විචාළේ ද නො කියන්නේ ය. විචාරන ලදුව කියතත් අඩු කොට සම්පූර්ණ නො කොට විස්තර නො කොට කියන්නේ ය. එයින් ඒ තැනැත්තා අසත්පුරුෂයකු බව දත යුතු ය. මහණෙනි, අසත්පුරුෂයා තමාගේ යම් ගුණයක් වේ නම් එය නො විචාළේ ද කියන්නේ ය. විචාළ කල්හි නො අඩුකොට නො පමාකොට සම්පූර්ණ කොට විස්තර කොට එය කියන්නේ ය. එයින් ඒ තැනැත්තා අසත්පුරුෂයකු බව දත යුතු ය. මෙසේ තථාගතයන් වහන්සේ විසින් **අංගුත්තර නිකාය චතුෂ්කනිපාතයෙහි** අසත්පුරුෂ ලක්ෂණ වදරා ඇත්තේ ය.

තථාගතයන් වහන්සේ විසින් භික්ෂූන්හට පවින් වළකිනු පිණිස බොහෝ පව්කම් ගැන ද සිකපද පනවා ඇත්තේ ය. ජන ප්‍රසාදය රකිනු පිණිස පව් නොවන බොහෝ කරුණු ගැන ද සික පද පනවා ඇත්තේ ය. පව් ගැන පනවන ලද සිකපද **ලෝකවද්‍ය ප්‍රඥප්ති** නම් වේ. ජන ප්‍රසාදය රකිනු පිණිස පනවා ඇති සික පද **ප්‍රඥප්ති වද්‍ය ප්‍රඥප්ති** නම් වේ. තවත් ක්‍රමයකින් කියන කල්හි පාප ක්‍රියා සම්බන්ධයෙන් පනවන ලද සික පද **සාවද්‍ය ප්‍රඥප්ති** නම් වේ. ජනප්‍රසාදය රකිනු පිණිස පනවන ලද සිකපද **නිරවද්‍ය ප්‍රඥප්ති** නම් වේ. ආහාර ගැනීම පාපයක් නොවේ. එහෙත් විකාල භෝජනයෙන් ඇවැත්වේ. විකාල භෝජන ශික්ෂාපදය නිරවද්‍ය ප්‍රඥප්තියකි. විනයෙහි ඇති සික පද වලින් බොහෝමයක් ම එබඳු නිරවද්‍ය ප්‍රඥප්තීහුය.

Non-Commercial Distribution

## අට වන ලිපිය

# දුශ්ශීල කථාව

කුශලය අකුශලය යි කියනුයේ ඒ ඒ ක්‍රියා සිදු කිරීම් වශයෙන් සත්ත්ව සන්තානයෙහි පහළවන සිත්වලටය. "**ද්වත්තිංසෙව හි ආපත්ති සමුට්ඨාපක චිත්තානි අට්ඨ කාමාවචර කුසලානි, ද්වාදස අකුසලානි, දසකාමාවචර ක්‍රියා චිත්තානි කුසලතො ච කිරියතො ච ද්වෙ අභිඤ්ඤා චිත්තානීති**" යනුවෙන් කාමාවචර කුසල් සිත් අටය, අකුසල් සිත් දොළොසය, කාමාවචර කිරියසිත් දශය ය, අභිඥා දෙසිතය යි ඇවැත් සිදු කිරීම් වශයෙන් උපදනා සිත් දෙතිසක් ඇති බව **සමන්තපාසාදිකාවෙහි** දක්වා තිබේ. හැම ඇවතක් ම පාපයක් නොවන බව එයින් තේරුම් ගත යුතු ය.

ධර්‍මදානය දෙමිය කියා සැදැහැයෙන් භික්‍ෂුවක් පුරුෂයකු නැති තැනක ස්ත්‍රීන්ට පමණක් දහම් දෙසුව හොත් **පචිත්ති** ඇවැත් වේ. තුනුරුවන් පුදන්නට ය කියා මල් නෙළුව හොත් **පචිත්ති** ඇවැත් වේ. විහාරමලුව බෝමලුව සෑමලුව පිරිසිදු කරන්නට ය කියා තණ ඉවත් කළහොත් **පචිත්ති** ඇවැත් වේ. ඒ ඇවැත් සියල්ලට භික්‍ෂුව පැමිණෙනුයේ කුශල චිත්තයෙනි. සුරාපානාදියෙන් ඇවැතට පැමිණෙන්නේ අකුශල චිත්තයෙනි. ඇවැතක් වූයේ ය කියා ධර්‍මදේශනාදියෙන් කවරාකාරයකින් වත් පාපයක් නො වේ.

**කුශලය අනෙකකි. ඇවැත අනෙකකි. පාපයත් අනෙකකි. ඇවත අනෙකකි.** ඒ නිසා ඇවැත් දෙසාගත් කල්හි ඇවැත් නැති වේ. ඇවැත් දෙසීමෙන් කුශලා 'කුශල දෙක නැති නො වේ. ඒවා ඉතිරි වේ. ඇවැතක් වූයේ ය කියා ධර්‍මදේශනාදි කුශලයන් ගෙන් අනිෂ්ට

Non-Commercial Distribution

විපාකයක් නො ලැබේ. එයින් ලැබෙන්නේ ඉෂ්ට විපාකයක් ම ය. ඇවැතක් වූයේ ය කියා ධර්මදේශනාමය කුශලයෙන් භික්ෂුව අපායට යන්නේ ය යි කියත හොත් එය ධර්මවිරෝධි කියමනකි.

**අපායට යන්නට ඇවතක් ම වුවමනා නැත. සියලුම පව්වලට ඇවැත් ඇත්තේ ද නැත.** පෙර එක් භික්ෂුවක් සිවුරකට ඇලුම් කරමින් සිට කාල ක්‍රියා කොට ඒ සිවුරෙහි ම උකුණෙක්ව උපන්නේ ය. සිවුරට ඇලුම් කිරීමෙන් ඒ භික්ෂුවට සිදු වූ කිසිම ඇවැතක් නැත. එහෙත් ලෝභය නමැති පාපය නිසා භික්ෂුව තිරිසන් අපායෙහි උපන. කරුණු මෙසේ හෙයින් ඇවතක් වූ පමණින් එය පාපයක් නොවන බවත් හැම පාපයකට ම ඇවැත් නැති බවත් දත යුතු ය.

**පින් පව් දෙක ගිහි පැවිදි සැමට ම සාධාරණ ය.** යමක් පව් නම් එය ගිහියා කළත් පැවිද්දා කළත් පව ම ය. පින ද එසේ ම ය. පව කුඩා මහත් වීමට ද ගිහි පැවිදි බව කරුණක් නො වේ. පැවිද්දකු මෛථුන සේවනය කළ හොත් පරිජි ඇවතට පැමිණේ. ගිහියකු එය කළහොත් ඔහුට ඇවතක් නම් නැත. එහෙත් එයින් යම් පාපයක් වේ නම් එය දෙදෙනාට ම සමය. පරිජි ඇවතින් භික්ෂුවට වන්නේ පව මහත් වීමක් නොව බුදුන් වහන්සේ ගේ නියමය පරිදි උපසම්පදවට අහිමි වීම ය. පාරාජිකාවෙන් ම මිස අනෙක් ඇවතකින් භික්ෂුවට එය සිදු නො වේ. පාපය ගිහි පැවිදි කාටත් සම ව තිබිය දී භික්ෂූන් ගේ වරද මහත් කොට දැක්වීමෙහි තේරුමක් නැත. ප්‍රාණඝාතාදි පංචදුශ්චරිතයෙහි ගැලී සිටීමෙන් පරම දුශ්ශීල වූ ඇතැම් ගිහියන් විසින් භික්ෂුවකගේ කුඩා වරදක් ගැන කථා කිරීම නම් දෙපතුල පටන් හිස දක්වා මුළු සිරුරෙහි අසූචි තවරා ගෙන ඉන්නා කෙනකු විසින් මඩ පැගී ඇති කෙනකු ගේ අපවිත්‍රතාව ගැන කථා කිරීම බඳු හාසෝත්පාදක ක්‍රියාවෙකි.

Non-Commercial Distribution

**තම වත ලිපිය**

# දුශ්ශීල කථාව

මහණකම කුමක් දැ යි විනය නො දන්නා බොහෝ බෞද්ධයෝ වාහනයෙකින් යෑම ය, කුඩයක් ඉහලා යෑම ය, වහන් පය ලා යෑමය, පිඟානෙක දනය වැලඳීම ය, හොඳ පන්සලෙක විසීම ය, වත්තක් කුඹුරක් තිබීම ය, මුදල් ටිකක් තිබීම ය, හොඳ සිවුරක් පෙරවීම ය, බිම බලාගෙන ම නො යෑම ය, සුරුට්ටුවක් සිගරැට්ටුවක් ඉරීම ය, තේ කෝපි බීමය යනාදි සෑම කරුණක් ගැන ම දුශ්ශීල වාදයෙන් භික්ෂූන්ට ගහා කොට බොහෝ පව් සිදු කර ගනිති. ඒ තත්වයට අද බොහෝ දෙනා පැමිණ සිටින්නේ ද බොහෝ දෙනා භික්ෂූන් කෙරෙහි කලකිරී ඉන්නේ ද ඇතැම් කුහකයන් දෙසන බොරු බණ ඇසීමෙනි.

**ගෘහස්ථ දුශ්ශීලයා ය. ශ්‍රමණ දුශ්ශීලයා යයි දුශ්ශීලයෝ දෙදෙනෙකි. "පඤ්ච ගහපති භයානි වෙරානි අප්පහාය දුස්සීලො ඉති වුච්චති. කතමානි පඤ්ච? පණාතිපාතං අදින්නාදනං කාමෙසු මිච්ඡාචාරං මුසාවාදං සුරාමේරය මජ්ජපමාදට්ඨානං"** යනුවෙන් ප්‍රාණඝාතාදි පඤ්ච දුශ්චරිතය නො හළ තැනැත්තා **"දුශ්ශීලයා"** බව තථාගතයන් වහන්සේ විසින් වදාරා ඇත්තේ ය. ඒ දේශනයේ හැටියට පස් පව් නො හළ සෑමදෙනා ම දුශ්ශීලයෝ ය. අපේ බෞද්ධයන් අතර දිනපතා පන්සිල් සමාදන් වන්නෝ ද ඇත. දවසට දෙතුන් වර පන්සිල් සමාදන් වන්නෝ ද ඇත. එහෙත් වුවමනා වූ විට ඔවුහු පස්පවින් කවරක් වුවත් කරති. එ බැවින් ඔවුහු සිල්වතුන් නොව දුශ්ශීලයෝ ය. ඔවුන් ගේ සිල් ගැනීම සිකපද කීමක් පමණෙකි. සත්‍ය වශයෙන් සිල් ගැනුමක් නො වේ.

Non-Commercial Distribution

**දුශ්ශීලයා ය යන්නෙහි තේරුම සිල් නැති තැනැත්තාය** යනුයි. උපසම්පන්න භික්ෂුවක් ලෙහෙසියෙන් දුශ්ශීල නො වේ. උපසම්පද ශීලයට බොහෝ සික පද ඇත්තේ ය. ඒ එක එක සිකපදයක් ම ශීලයෙකි. උපසම්පන්න භික්ෂුවකගෙන් සික පද එකක් දෙකක් නොව සියයක් දෙසියයක් කඩවුව ද තවත් දහස් ගණනක් සික පද ඉතිරි වී ඇති බැවින් උපසම්පන්න භික්ෂුව සිල්වත් ය.

**පුථුජ්ජනස්ස සීලං පඤ්චහි කාරණෙහි භිජ්ජති පාරාජිකා පජ්ජනෙන, සික්ඛාපච්චක්ඛානෙන, තිත්ථිය පක්ඛන්දනෙන, අරහත්තෙන, මරණෙන.**

යනුවෙන් '**මනෝරථපූරණී**' අටුවාවෙහි පෘථග්ජන උපසම්පන්න භික්ෂුවක ගේ ශීලය **පාරාජිකාවට පැමිණීමය, උපසම්පදව ප්‍රතික්ෂේප කිරීමය, තීර්ථක ශාසනයට යෑම ය, රහත් වීමය, මරණයට පැමිණීමය** යන කරුණු පසින් බිඳෙන බව දක්වා තිබේ. උපසම්පද ශීලය බිඳෙන කරුණු පසින් පළමු වන තුන් වන කරුණු වලින් ශීලය බිඳීම පරිහානියෙකි. සතර වන කරුණෙන් බිඳීම දියුණුවකි. පස් වන කරුණෙන් බිඳීම පරිහානියෙක් හෝ දියුණුවෙක් නො වේ. පෘථග්ජනයා ගේ ශීලය කුශල ශීලයෙකි. අර්හත්මාර්ගයෙන් කුශලාකුශලයන් ක්ෂය කරනු ලැබේ. රහත් වීමෙන් පෘථග්ජන ශීලය බිඳෙන්නේ එහෙයිනි. රහත් වීමෙන් පසු රහතුන් වහන්සේ අව්‍යාකෘත ශීලයෙහි පිහිටන්නාහ.

පාරාජිකාවට පැමිණි පැවිද්දාට දුශ්ශීලයෙකැ යි කිය යුත්තේ පරිජි ඇවැතට පැමිණීමෙන් පසු එය සඟවා ගෙන උපසම්පන්න භික්ෂුවක් ලෙස පෙනී සිටිය හොත් ය. පරිජි වීමෙන් පසු සාමණේර ශීලය සමාදන් වුව හොත් එතැන් පටන් හේ සිල්වත් ය. කරුණු මෙසේ හෙයින් පාරාජිකාවට පැමිණ නැති සියලු ම භික්ෂූන් වහන්සේලා අන් කිනම් ඇවැතකට පැමිණ සිටියත් උපසම්පද ශීලය ඇති බැවින් උන් වහන්සේලා සිල්වත්හු ය. සිල්වතුනට දුශ්ශීලැයි කීම ආක්‍රෝශයකි. එය මහා පාපයෙකි. එයින් **සූකරමුඛප්‍රේත පූතිමුඛප්‍රේතාදීනට** මෙන් නපුරු විපාක අනාගතයෙහි ඇති විය හැකි ය.

Non-Commercial Distribution

බුද්ධකාලයෙහි කීටාගිරියෙහි විසූ අස්සජි පුනබ්බසුක යන භික්ෂූන් දෙනම තරමට ඖදරික වැඩ කරන භික්ෂුවක් ගැන මෙ කල කවර රටකින් වත් අසන්නට නැත. ඒ භික්ෂූහු ස්ත්‍රීන් හා එක භාජනයෙහි අහර ගත්හ. එක භාජනයෙහි පැන් පූහ. එක පැදුරෙහි එක යහනෙහි නිදි ගත්හ. ස්ත්‍රීන් හා නැටීම ද ගී කීම ද කළහ. විකාලයෙහි අහර ගත්හ. සුරාපානය කළහ. සූදුව පන්දු ගැසීම ආදි ක්‍රීඩාවල යෙදුණාහ. ඇතුන් අසුන් පිට ගියහ. ඒ සතුන් හා තරඟයට දිවූහ. මල්ලවපොර ඇල්ලූහ. නාටිකාවන්ට රඟ දැක්වීමට තමන් ගේ සඟල සිවුරු බිම එලා දුන්හ. තවත් නොයෙක් ඖදරික වැඩ කළහ. එහෙත් විනය පොතෙහි ඒ භික්ෂූන්ට ද දුශ්ශීල යන පදය යොද නැත. ඒ භික්ෂූන් ගැන විනය පොතෙහි සඳහන් වන්නේ '**තෙන ඛො පන සමයෙන අස්සජි පුනබ්බසුකා නාම කීටාගිරිස්මිං ආවාසිකා හොන්ති අලජ්ජිනො පාපභික්ඛූ**' කියා ය. එ පමණ ඖදරික ක්‍රියා කළ අයටත් ව්‍යවහාර කර නැති '**දුශ්ශීල**' යන වචනය රියෙකින් යෑම වහන් පය ලා යෑම කුඩයක් ඉසලා යෑම මුදලක් තබා ගෙන සිටීම යන සුලු කරුණෙකින් කීම කොතරම් බර පතල අයුක්තක් ද?

විනයෙහි භික්ෂුවකට දුශ්ශීල යන වචනය යොද ඇති තැනක් දක්නට ඇත්තේ පාතිමොක්ඛ ඨපනක්ඛන්ධකයෙහි පමණෙකි. '**අද්දසා ඛො මහා මොග්ගල්ලානො තං පුග්ගලං දුස්සීලං පාප ධම්මං**' යනු පාතිමොක්ඛ ඨපනක්ඛන්ධකයෙහි දුශ්ශීල වචනය ගෙන ඇති පාඨයය. එහි ඒ වචනය යොද ඇත්තේ විනය කර්මවලට ගැනීමට නුසුදුසු පාරාජිකාවට පත් භික්ෂුවක් සඳහාය. පරාජිකා නොවූ භික්ෂුවකට විනයෙහි කොතැනක වත් දුශ්ශීල ව්‍යවහාරය කර නැත.

දුශ්ශීලයෝ ය, දුශ්ශීලයෝ යැයි සිල්වත් භික්ෂූන්ට අපහාස කරන බොහෝ දෙනා පස් පවෙන් නො වැළකුණු ගෘහස්ථ දුශ්ශීලයෝ ය. ගෘහස්ථදුශ්ශීලයාට වඩා බොහෝ කරුණු වලින් ශ්‍රමණ දුශ්ශීලයා උසස් ය. ගෘහස්ථදුශ්ශීලයාට වඩා **ශ්‍රමණ දුශ්ශීලයා කෙරෙහි ගුණ දශයක් ඇති බව මිලින්ද ප්‍රශ්නයෙහි දක්වා ඇත්තේ ය**. ඒ මෙසේ යඃ–

*Non-Commercial Distribution*

කතමෙ දස ගුණා සමණ දුස්සීලස්ස ගිහිදුස්සීලතො විසෙසෙන අතිරෙකා? ඉධ මහා රාජ, සමණ දුස්සීලො බුද්ධෙ සගාරවො හොති, ධම්මෙ සගාරවො හොති. සංඝෙ සගාරවො හොති, සබ්‍රහ්මචාරිසු සගාරවො හොති, උද්දෙස පරිපුච්ඡාය වායමති සවණ බහුලො හොති භින්න සීලොපි මහාරාජ දුස්සීලො පරිසගතො ආකප්පං උපට්ඨපෙති, ගරහභයා කායිකං වාචසිකං රක්ඛති, පධානාභිමුඛස්ස හොති චිත්තං, භික්ඛු සාමඤ්ඤං උපගතො හොති කරොන්තොපි මහාරාජ සමණ දුස්සීලො පාපං පටිච්ඡන්නං ආචරති, යථා මහාරාජ, ඉත්ථී සපතිකා නිලීයිත්වා රහස්සෙ නෙව පාපමාචරති, එම මෙව ඛො මහාරාජ කරොන්තො'පි සමණදුස්සීලො පාපං පටිච්ඡන්නං ආචරති. ඉමෙ ඛො මහා රාජ, දසගුණා සමණදුස්සීලස්ස ගිහි දුස්සීලතො විසෙසෙන අතිරෙකා.

බුදුනට ගරුකරන බවය, ධර්මයට ගරු කරන බව ය, සඟනට ගරු කරන බවය, සබ්‍රහ්මචාරීන්ට ගරු කරන බව ය, ධර්මය උගෙනීම් පිළිවිසීම් දෙකට වීයර්‍ය කරන බවය, බොහෝ කොට බණ අසන බව ය, බිඳුණු සිල් ඇත්තහුද පිරිසක් අතරට ගිය කල්හි ශ්‍රමණාකල්පය ඇති ව හැසිරෙන බව ය, ගර්හාවට බියෙන් කය වචන දෙක රක්නා බව ය, සිත ප්‍රධානයට අභිමුඛ කොට තැබීමය, හැසිරීම භික්ෂුවකට සමාන වන බව ය, පව් කරතත් රහසින් කරන බව ය' යන මේ කරුණු දසය ගෘහස්ථ දුශ්ශීලයාට අතිරේක වශයෙන් ශ්‍රමණ දුශ්ශීලයා කෙරෙහි ඇති ගුණයෝ ය.

රහසින් පව් කරන තැනැත්තා ප්‍රසිද්ධ වශයෙන් පව්කරන්නවුන් සේ බොහෝ කොට පව් නො කරයි. නිතර පව් නො කරයි. එයින් ඔහුට පව් අඩු වේ. රහසින් පව් කරන බව ප්‍රසිද්ධියේ නො කරන බව ගුණයක් වශයෙන් කියනුයේ එහෙයිනි.

Non-Commercial Distribution

**දහ වන ලිපිය**

# දුශ්ශීලයන් කිරීම

විනය නම් කුමක් ද කියාවත් නොදන්නා ඇතැම් කුහකයෝ වාහනයකින් ගිය පමණින් සෙරෙප්පු දෙකක් කුඩයක් පාවිච්චි කළ පමණින් මුදලක් තිබුණු පමණින් පැහැපත් සිවුරක් පෙර වූ පමණින් පිහානක දනය වැළඳූ පමණින් භික්ෂූන් දුශ්ශීලයන් කොට කථා කරමින් භික්ෂුත්වය කුමක්ද විනය කුමක් ද කියාවත් නො දන්නා බෞඩයන් භික්ෂූන් වහන්සේලා කෙරෙහි කල කිරවති. විනයවර්ධන කාරාදීන් පවසන මේ බොරු බණ වලට රැවටී භික්ෂූන්ට අපහාස කොට බොහෝ නුගත් ගිහියෝ අපාගත වෙති.

සිල්වත් ගුණවත් භික්ෂුවකට දුශ්ශීලයකැයි නිගා කිරීම සුළු කරුණක් නොව බරපතල පාපයෙකි. දුශ්ශීලයාය කියනුයේ පරිජි ඇවතට පැමිණි තැනැත්තාටය. පාරාජිකා නොවූ භික්ෂුවකට භික්ෂුවක් විසින් පාරාජිකාවෙන් චෝදනා කළ හොත් ඒ භික්ෂුවට සංඝාදිසේසාපත්තියක් වේ. ගිහියකු විසින් කළ හොත් ඔහුට බරපතල පාපයක් වේ. බොහෝ බෞද්ධයෝ භික්ෂූන් දුශ්ශීලයන් කිරීමට ඉතා සමත්තුය. භික්ෂුවක් හයියෙන් පාරේ ගිය හොත් ඒ භික්ෂුව දුශ්ශීලයකු කරන්නට ඔවුනට එයත් ප්‍රමාණය. එහෙත් විනය ධරයන්ට නම් භික්ෂුවක් දුශ්ශීලයකු බව හෙවත් පරිජි ඇවතකට පැමිණියකු බව ප්‍රකාශ කිරීම පහසු කාර්‍ය්‍යයක් නො වේ. අටුවා සහිත විනය පිටකය මැනවින් උගත් මහා විනය ධරයන්ට පවා අධිකරණයක් විනිශ්චය කොට භික්ෂුවක් දුශ්ශීලයකු කිරීම බරපතළ කරුණෙකි. මහා විනය ධරයෝ ද එයට බිය වෙති. යම්කිසි භික්ෂුවක් අතින් වරදක් සිදු වී එයින් කිනම් ඇවතක් වී දැයි දැන

Non-Commercial Distribution

ගන්නා රිසියෙන් විනය ධරයකු වෙත පැමිණ විචාළහොත් එ කල්හි විනය ධරයා විසින් පිළිපැදිය යුතු ආකාරය විනයෙහි දැක්වෙන්නේ මෙසේ ය.

ආපත්තිය ගැන විමසන්නට ආ භික්ෂුව කියන කරුණු හොඳින් අසා විනය හා සසඳා බලා එයින් ආපත්තියක් නො වේ නම් ඒ බව කිය යුතු ය. ඒ කාරණයෙන් දේශනාගාමිනී ආපත්තියක් වේ නම් ඒ බව කිව යුතු ය. උට්ඨාන ගාමිනී ආපත්තියක් වේ නම් ඒ බව කිය යුතුය. ඉදින් පාරාජිකාවක ලකුණු පෙනේ නම් පරාජිකාපත්තියට පැමිණියේ යයි කියන්නට ඉක්මන් නොවී විනයධරයා ගේ ගුරුවරයෙකු ඇත්තේ නම් එහි ගොස් විචාරන්නට ය කියා ඒ භික්ෂුව ගුරුවරයා වෙත යැවිය යුතුය. ඉදින් වරද කළ භික්ෂුව එහි ගොස් විචාරා අවුත් නුඹ වහන්සේ ගේ ගුරුවරයාගෙන් කාරණය ගැන විචාළෙමි. උන් වහන්සේ මට පිළියම් ඇත්තේ ය කීහ යි කියුව හොත් ඇවැත්නි එසේ නම් උන් වහන්සේ කී පරිදි කරව යි කිය යුතු ය. ඉදින් විනය ධරයා ගේ ගුරුවරයා ජීවත්ව නැත්තේ නම් එකට ඉගෙන ගත් තවත් තෙරුන් වහන්සේ කෙනකුන් ඇති නම් ඇවැත්නි අසවල් තැන අප හා එක්ව ඉගෙන ගත් තෙරුන් වහන්සේ කෙනෙක් ඇතහ. උන් වහන්සේ විනය දන්නාහ. එහි ගොස් විචාරවයි කිය යුතුය. එබඳු කෙනකුන් නැති නම් තමා උගත් අතවැසියකු ඇති නම් වරද කළ භික්ෂුව එහි යැවිය යුතුය. එහි ගොස් විචාරා අවුත් ඒ අතවැසියා පාරාජිකාවක ලකුණු පෙනේය කීයේ නම් එකවර ම පාරාජිකාපත්තියට පැමිණියෙහි ය යි නොකියා ඇවැත්නි විවේකස්ථානයකට එළඹ සිල් පිරිසිදු කරගෙන ද්වතිංසාකාරය සජ්ඣායනා කරන්නය යි කිය යුතුය. ඉදින් ඒ භික්ෂුව පරිජි ඇවැතට පැමිණ නැති නම් සිත එකඟ වී ඔහුට පහසුවෙන් ඒ භාවනාව කරගෙන යා හැකි වෙයි. ඉදින් පරිජි ඇවතට පැමිණ ඇත්තේ නම් ඔහුගේ සිත එකඟ නොවෙයි. කියන ලද පරිදි දින ගණනක් ද්වතිංසාකාරය සජ්ඣායනා කොට නැවත විනයධරයා වෙත පැමිණිය හොත් තොරතුරු විචාරා සිත එකඟ වන බව සංස්කාරයන් හොඳින් වැටහෙන බව කියුව හොත් ඇවැත්නි එසේ නම් ඒ භාවනාව නො නවත්වා කර ගෙන යා යුතුය යි විනය

Non-Commercial Distribution

ධරයා විසින් කිය යුතුය. ඉදින් ඒ භික්ෂුව සිත එකඟ නො වන බව සංස්කාරයන් නො වැටහෙන බව කියුව හොත් ඇවැත්ති තමා අතින් වරදක් වී නම් ඒ බව තමා දන්නේය. ඒ ගැන අපට පිහිටවිය හැකි බවක් නැත. යුෂ්මතාට පිහිට යුෂ්මතා විසින් ම සොයා ගත යුතුය යි කිය යුතු ය. විනය ඉතා සියුම් නය ක්‍රම ඇති දේශනයෙකි. විනයේ සැටියට සියුම් ලෙස පරිජි ඇවතට පැමිණීම ද නො පැමිණීම ද වේ. එ බැවින් ඇවැත් විනිශ්චය කිරීම පරෙස්සමින් කළ යුතු ය.

ආපත්ති දස්සනුස්සාහො
න කාතබ්බො කුදාචනං
පස්සිස්සාමි අනාපත්ති
මිතිකයිරාථ මානසං

පස්සිත්වා'පි ච ආපත්තිං
අවත්වාව පුනප්පුනං
විමංසිත්වා'ථ විඤ්ඤූහි
සංසන්දෙත්වා ච තං වදෙ

යනුවෙන් "ඇවැත් විනිශ්චය කරන විනයධරයා විසින් කිසි කලෙක ඇවතක් දැකීමට උත්සාහ නො කළ යුතුය. සිදු වූ කරුණෙන් ආපත්තියක් නැති බව දකිනු කැමති සිත ම ඇති කර ගත යුතු ය. ඇවතක් දැක ද ඒ බව නො කියා නැවත නැවත විමසා තවත් නුවණැතියන් හා සසඳ ම ඇවත කිය යුතුය" යි විනයෙහි දැක් වේ. මේ විනයෙහි පාරාජිකාව විනිශ්චය කළ යුතු සැටි දක්වා ඇති ආකාරය ය.

විනයෙහි ඇති සියුම් බවත් නුවණැතියන් විසින් පරිජි ඇවත විනිශ්චය කරන සැටිත් මේ කථාවෙන් දත යුතුය. භාතිය රජතුමාගේ කාලයෙහි රුවන්වැලි මහසෑයෙහි මහා පූජාවක් පවත්වන දිනයක එක් භික්ෂුවක් සත්රියන් කහපාට වස්ත්‍රයක් කරෙහි ලා ගෙන රුවන්වැලි සෑමලුවට පිවිසියේ ය, එ කෙණෙහිම වාගේ රජතුමා ද චෛත්‍ය වන්දනාවට පැමිණියේ ය. එයින් සෑමළුවෙහි ජනයා තදවන්නට විය. ඒ මැදට අසුවූ භික්ෂුවට කර

Non-Commercial Distribution

තුබූ වස්ත්‍රය වැටුණු බව නො දැනුනේ ය. මලුවෙන් බැහැර දී ඒ භික්ෂුව තමාගේ වස්ත්‍රය නැති වූ බව දැනී මෙතරම් ජනයා තද බද වන තැනකදී වැටුණු දෙයක් කෙසේ ලැබිය හැකි දැයි සිතා වස්ත්‍රය ගැන බලාපොරොත්තුව හැර ගියේ ය. පසුව එහි ගිය භික්ෂුවක් ඒ වස්ත්‍රය දැක සොර සිතින් ගෙන පසුව තමා අතින් සිදු වූ වරද ගැන සිත කලකිරී සිවුරු හැර යන්නට සිතා කාරණය විනයධරයන් ගෙන් විචාරා පිරිසිදු කර ගෙන ම යමියි සිතා **චූලසුමන තෙරුන් වහන්සේ** කරා ගොස් සිදු වූ දෙය කියා ඒ භික්ෂුවගේ කුකුස විචාළේය.

විනයේ සැටියට පාදයක් අගනා අන්සතු වස්තුවක් සොර සිතින් ගත් භික්ෂුව පාරාජිකා වේ. එබඳු වැඩක් තමා විසින් කළබව කියන භික්ෂුවට කියන්නට ඇත්තේ එයින් පාරාජිකා වූ බවය. එහෙත් විනය ධරයෝ එසේ කිරීමට ඉක්මන් නො වෙති. කුමකින් වුව ද ඇවතක් නොවන සැටියක් ඇත ද කියා සෙවීම නියම විනය ධරයාගේ ස්වභාවය ය. එබැවින් චූලසුමන තෙරුන් වහන්සේ ඇවැත්ති, ඉදින් සිවුර අයිතිකාර භික්ෂුව සොයාගෙන ආවහොත් පිහිටක් වන්නට ඉඩ ඇතය යි කීහ. ඒ භික්ෂුව ඉතා අමාරුවෙන් සිවුරෙහි අයිතිකාර භික්ෂුව සොයා චූලසුමන තෙරුන් වහන්සේ වෙත කැඳවාගෙන ගියේ ය. එකල්හි තෙරුන් වහන්සේ මේ වස්ත්‍රය යුෂ්මතාගේ දැයි අසා, එසේය කී කල්හි වස්ත්‍රය නැති වූ සැටි විචාළහ. අයිතිකාර භික්ෂුව රුවන්වැලි සෑ මලුවෙහි වැටුණ බවත් ඒ ගැන බලාපොරොත්තුව හැර ගිය බවත් කීය. යම්කිසි වස්තුවක් ගැන හිමියා බලාපොරොත්තු හළේ නම් එයින් ඒ දෙය අස්වාමික වස්තුවක් වේ. අස්වාමික වස්තුවක් සොර සිතින් ගත්තේ ද එයින් පරිජි ඇවතට නො පැමිණේ. එබැවින් තෙරුන් වහන්සේ ඇවැත්ති යුෂ්මතා ගෙන තිබෙන්නේ අස්වාමික වස්තුවෙක. එයින් දුකුළා ඇවැතක් මිස පරිජි ඇවතක් නැතය යි අධිකරණය විනිශ්චය කළහ. ඉදින් මෝඩයකුගෙන් ඒ ගැන විනිශ්චයක් ලබාගන්නට ගියා නම් වන්නේ පාරාජිකා නොවීම, පාරාජිකා වූයෙමි යි සිතා සිවුරු හැර යන්නට ය.

විනයධරයන්ට පාරාජිකාපත්තියක් විනිශ්චය කිරීම බරපතළ වැඩකි. වරද කළ තැනැත්තාගෙන් බොහෝ කරුණු

Non-Commercial Distribution

ඇසිය යුතුය. අදින්නාදනයක් පිළිබඳ ඇවතක් නම් ගත් බඩුවේ වටිනාකම සෙවිය යුතුය. සාක්ෂ්‍ය ඇසිය යුතු ය. තවත් විනය-ධරයන් හා සාකච්ඡා කළ යුතු ය. එහෙත් විනය කුමක් ද කියාවත් නො දන්නා විනයවර්ධන කාරයන්ටත් තවුසන්ටත් භික්ෂුවක් පාරාජිකාවට පැමිණවීමට කළ වරදක් වුවමනාත් නැත. සාක්ෂ්‍ය වුවමනාත් නැත. වරද කළ තැනැත්තා දකින්ට වුවමනාත් නැත. සිකපද වුවමනාත් නැත. අටුවාව ටීකාව ථෙරවාදය වුවමනාත් නැත. කවදාවත් දැකලාවත් නැති භික්ෂූන් පාරාජිකාවට පැමිණවීමට ඔව්හු සමර්ථය. මෙය කොතරම් හාස්කමක්ද? ඔවුන් විසින් අද ලංකාවේ තුන් නිකායේ ම එක ම පැවිද්දකුටවත් මහණකම නැත යයි සියලු ම භික්ෂූන් පාරාජිකාවට පමුණුවා තිබේ. මේවාට රැවටෙන මෝඩ බෞද්ධයන්ට මහා සංඝයා වහන්සේ අනුකම්පා කරන සේක්වා!

Non-Commercial Distribution

## එකොළොස් වන ලිපිය

# හොඳ පන්සල් වල විසීම

නගරග්‍රාමවල සැප පහසුකම් ඇති හොඳ පන්සල් වල ආවාස වල විසීමත් හොඳ ඇඳ පුටු කොට්ට මෙට්ට ඇතිරිලි පිඟන් කෝප්ප ආදී භාණ්ඩ පරිභෝග කිරීමත් දුශ්ශීල කමේ අංගයක් කොට දක්වමින් ඇතැම්හු නූගත් ජනයා මුළා කරවමින් ඔවුන් භික්ෂූන් වහන්සේ කෙරෙහි කලකිරවති. ඔවුන්ගේ කීම්වලට රැවටුණු ඇතැම් නූගත් බෞඩයෝ බොහෝ වෙහෙස ගෙන බෞඩයන්ගේ හැම ආගමික කටයුත්තක් ම කර දෙමින් බුදු සස්නෝ පැවැත්මටත් රටේ ජාතියේ දියුණුවටත් තමන්ගේ මුළු කාලය ගත කරමින් ගමේ පන්සලේ වෙසෙන භික්ෂූන් වහන්සේට බඩ ගින්නේ ඉන්නට හැර දුර බැහැර ආරණ්‍යවලට සිව් පසය ගෙන යති. කාහට වුව ද දන් දීම හොඳය. එහෙත් සමීපයේ වෙසෙන භික්ෂූන් වහන්සේට නිග්‍රහ කරමින් දුර බැහැර ඉන්නවුන්ට දන් ගෙන යාම නම් පැසසිය යුතු ක්‍රියාවක් නොවේ.

වාසය කරන ස්ථාන වලින් හා පරිභෝග කරන භාණ්ඩ වලිනුත් යන එන කථා කරන සැටියෙනුත් කෙනකුගේ ශීලාදි ගුණ මනින්නට යාම අනුවණ කමෙකි. නගරග්‍රාම වල සැප පහසුකම් ැති වාසස්ථාන වල වෙසෙන උසස් භාණ්ඩ පරිභෝග කරන ක්ෂූන් අතර ද සිල් ඇති නැති දෙපක්ෂය ම ඇති විය හැකිය. වන මැද ගුහා වල ගස්මුල අතුපැල් වල වෙසෙන දුර්වර්ණ චීවරයන් දරන දඹුමැසි ආදියෙහි නිදන භික්ෂූන් අතරත් සිල් ඇති නැති දෙපක්ෂය ම ඇති විය හැකිය. අනුන්ගේ සිල් සෙවීම පහසු වැඩක් නොවේ.

Non-Commercial Distribution

එ බැවින් තථාගතයන් වහන්සේ කොසොල් රජතුමාට මෙසේ වදාළ සේක.

න වණ්ණ රූපෙන නරො සුජානො
න විස්සසෙ ඉත්තර දස්සනෙන
සුසඤ්ඤතානඤ්හි වියඤ්ජනෙන
අසඤ්ඤතා ලොකමිමං චරන්ති.

පැහැයෙන් හෝ සටහනින් මිනිසා හැඳින ගැනීම පහසු නැත. මදකලක් දැකීම් මාත්‍රයෙන් කෙනෙක් විශ්වාස නො කළ යුතුය. හික්මුණු තැනැත්තන්ගේ, සිල්වතුන් ගේ වේශයෙන් මේ ලෝකයෙහි නො හික්මුණු අය ද හැසිරෙතිය යනු එහි තේරුම යි. යම්කිසිවකු ගේ තතු නිවැරදි ලෙස දත හැකි වන්නේ කලක් ළඟින් ආශ්‍රය කිරීමෙන් ය. එයින් ද අනායයන් ගේ තතු දත හැකි වන්නේ විමසිල්ලෙන් ඉන්නා නුවණැතියන්ට පමණෙකි. එබැවින් තථාගතයන් වහන්සේ විසින් "සංවාසෙන ඛො මහාරාජ සීලං වෙදිතබ්බං තඤ්ච ඛො දීඝෙන අද්ධුනා න ඉත්තරං මනසිකරොතා නො අමනසිකරොතා පඤ්ඤවතා නො දුප්පඤ්ඤෙන" යි කොසොල් මහ රජතුමාට වදරණ ලද්දේ ය.

හොඳ පන්සල් වල විසීමෙනුත් හොඳ බඩු පරිභෝග කිරීමෙනුත් භික්ෂූහු දුශ්ශීල වෙත්නම් ජේතවනාරාම පූර්වාරාමාදි මහා විහාර තථාගතයන් වහන්සේ නො පිළිගන්නා සේක. අනේපිඬු මහ සිටුතුමා විසින් ජේතවනාරාමය කරවන ලද්දේ සිවුපනස් කෙළක් ධනය වියදම් කිරීමෙනි. විශාඛා මහා උපාසිකාව පූර්වාරාම විහාරය කරවන ලද්දේ සත්විසි කෙළක් ධනය වියදම් කිරීමෙනි. එවැනි විහාර අද කිසි ම රටක කිසි ම භික්ෂුවකට නැත. බුද්ධ කාලයෙහි දඹදිව ඒ ඒ රටවල විසූ රජුන් විසින් හා සිටුවරයන් විසින් කරවා සඟනට පුදන ලද තවත් බොහෝ විහාරයෝ වූහ. ඒවායේ ඉතා වටිනා පරිභෝග භාණ්ඩයෝ ද වූහ. එකල විහාර වල තුබූ පරිභෝග භාණ්ඩවල තතු මේ කථාවෙන් තේරුම් ගත හැකිය.

පූර්වාරාමයෙහි විශාඛා මහා උපාසිකාව විසින් කරවන ලද දහසක් කාමර ඇති මහා ප්‍රාසාදයෙහි බුමුතුරුණක් වශයෙන්

Non-Commercial Distribution

අතුරා ඒ පින්කමට සහභාගි වනු කැමති සැදැහැවත් උපාසිකාවක් දහසක් අගනා වස්ත්‍රයක් ගෙනැවිත් එය අතුරන්නට සුදුසු තැනක් දක්වන ලෙස විශාඛා මහා උපාසිකාවට කීය. එකල්හි විශාඛා මහා උපාසිකාව එය අතුරන්නට තැනක් ඒ පහයෙහි නැතය යි කියුවහොත් වස්ත්‍රය ගෙන ආ උපාසිකාවට දොම්නසක් ඇති විය හැකි බැවින් එසේ නො කියා පහයට වැද සුදුසු තැනක් බලා අතුරන්නය යි ඇයට ම කීවා ය. ඕ තොමෝ පහයට පිවිස ඇවිද බලන්නී තමා ගෙන ආ වස්ත්‍රයට පහත් වස්ත්‍රයක් තබා සමාන වස්ත්‍රයකුදු පහයේ කොතැනකවත් නො දැක එලන්නට තැනක් නො ලැබ පහයෙන් බැහැරව මේ පින්කමට සහභාගි වන්නට නො ලබමි යි හඬමින් උන්නාය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ හඬන්නා වූ ඒ උපාසිකාව දැක කරුණු විමසා ඇය කෙරෙහි අනුකම්පාවෙන් භික්ෂූන් වහන්සේ පය සෝදන තැනටත් පහයේ පඩි පෙළටත් අතර පාපිස්නක් කොට ඒ වස්ත්‍රය එලන පරිදි ඇයට උපදෙස් දුන්හ. ඕ තොමෝ එසේ කොට පින්කමට සහභාගි වී සිත සතුටු කර ගත්තාය.

රතින් කළ ආවාසයක වුව ද විසීමෙන් භික්ෂුවකට වන ඇවතක් නැත. වාසස්ථානවලින් භික්ෂූන්ට විනයෙහි තහනම් කර ඇත්තේ අන් කිසිවක් නොගෙන සම්පූර්ණයෙන් මැටියෙන් කළ ගෙය පමණෙකි. කුම්භකාර ශිල්පයෙහි දක්ෂ වූ ධනිය තෙරුන් වහන්සේ උන් වහන්සේට විසීම පිණිස සම්පූර්ණයෙන් මැටියෙන් ගෙයක් කොට වළන් පුලුස්සන්නාක් මෙන් පුලුස්සා ගත්තේය. බුදුරජාණන් වහන්සේ ඒ කුටිය බිඳ හෙළන ලෙස භික්ෂූන්ට අණ කොට එ බඳු කුටි නො කරන ලෙස සිකපදයක් ද පනවා වදාළ සේක. බුදුන් වහන්සේ විසින් එවැනි කුටි තහනම් කරන ලද්දේ ගින්නෙන් දවා කුටිය ශක්තිමත් කිරීමේ දී බොහෝ කුඩා සතුන් විනාශ විය හැකි බැවිනි.

අනුජානාමි භික්ඛවෙ ඨපෙත්වා පහරණිං සබ්බං ලොහ-භණ්ඩං, ඨපෙත්වා ආසන්දිං පල්ලංකං දරුපත්තං දරුපාදුකං සබ්බං දරු භණ්ඩං, ඨපෙත්වා කතකඤ්ච කුම්භකාරිකඤ්ච සබ්බං මත්තිකා භණ්ඩං

Non-Commercial Distribution

යනුවෙන් කඩු කිණිසි ආදි ආයුධ - ලෝහයෙන් කළ සියලු බඩු හා පමණට වඩා උස් අඩුනත් පයෙහි ව්‍යාලරූප පිහිටවා කළ අඩුනත් ලීපාත්‍රයත් ලී සෙරෙප්පුවත් හැර සියලු ලී බඩු ද, කතක නම් වූ මැටියෙන් තනන පාපිස්ස, මැටියෙන් ම කළ ගෙය ය යන මේවා හැර සියලු මැටි බඩු ද භික්ෂූන් වහන්සේට තථාගතයන් වහන්සේ අනුදැන වදළ සේක. මෙසේ තථාගතයන් වහන්සේ විසින් සැප පහසුකම් ඇති වාසස්ථානත් භාණ්ඩත් භික්ෂූන්ට අනුදැන වදරා ඇත. හොඳ ආවාසයක විසීමෙන් ද ඇඳ පුටු කොට්ට මෙට්ට ආදි හොඳ බඩු පරිභෝග කිරීමෙන් ද පිහන් කෝප්ප පරිභෝග කිරීමෙන් ද භික්ෂු ශීලයට වන කිසිම හානියක් නැත. කරුණු මෙසේ හෙයින් පාත්‍රයෙහි මිස පිඟානෙහි දන් වළඳන භික්ෂූහු දුශ්ශීලයෝය: හොඳ ඇඳ පුටු ලස්සන කොට්ට මෙට්ට ඇතිරිලි ආදිය පරිභෝග කරන භික්ෂූහු දුශ්ශීලයෝය යි ඇතමුන් කරන දේශනය සම්පූර්ණයෙන් ම බොරු බණක් බව දත යුතු ය.

Non-Commercial Distribution

**දොළොස් වන ලිපිය**

# භික්ෂූන් වහන්සේගේ ප්‍රත්‍යය පරිභෝගය

හොඳ ගෙවල් වල විසීමෙන් හොඳ බඩු පරිභෝග කිරීමෙන් තෘෂ්ණාව වැඩෙනවා ය. ඒ නිසා අපට මිස නිවන් සොයන භික්ෂූන්ට ඒවා හොඳ නැත. භික්ෂූන් වහන්සේ විසින් සියල්ල හැර වල් වැදිය යුතුයයි කියමින් ඇතමෙක් ලොව මුළා කෙරෙති. ඇතමකු එසේ කරන්නේ භික්ෂූන් වහන්සේගේ සුවසේ විසීම නො ඉවසිය හැකි බව වූ ඊර්ෂ්‍යාව නිසාය. ඇතමකු එසේ කරන්නේ තමන්ගෙන් යමක් දෙන්නට වේය යන බිය නිසා ය.

වාසස්ථාන හා පරිභෝග භාණ්ඩ ජීවත්වීම සඳහා මනුෂ්‍යයාට නැතිව ම බැරිය. එබැවින් හොඳ වාසස්ථාන හොඳ භාණ්ඩ පරිභෝග කරන තැනැත්තාටත් නරක භාණ්ඩ නරක වාසස්ථාන පරිභෝග කරන තැනැත්තාටත් ඒවා ගැන තෘෂ්ණාව ඇති වේ. තෘෂ්ණාව නැති කිරීමේ උපාය හොඳ භාණ්ඩ වර්ජනය කිරීම නොවේ. ආගම ධර්මය නො දන්නෝ වාසස්ථානාදිය නිසා තෘෂ්ණාව ඇතිවීම ගැන කථා කරතත් වාසස්ථානාදිය සම්බන්ධයෙන් ඇති වන කෙලෙස් බොහෝය. ප්‍රත්‍යවේක්ෂා ඥාණයෙන් තොරව ප්‍රත්‍යය පරිභෝග කරත හොත් හොඳ වාසස්ථානයක් ඇති තැනැත්තාට එය නිසාත් නරක වාසස්ථානයක් ඇති තැනැත්තාට එය නිසාත් බොහෝ කෙලෙස් ඇති වේ.

හොඳ ගෙයක් හොඳ පන්සලක් ඇති තැනැත්තාට මේ ගෙය හොඳය ලස්සනය කියා එය ආස්වාදනය කරන තෘෂ්ණාව

Non-Commercial Distribution

ඇති වේ. එවැනි ගෙවල් නැති අන්‍යයන් පහත් කොට හොඳ ගෙය නිසා තමා උසස් කොට සලකන මානය ද අන්‍යයන්ටත් එවැනි ගෙවල් ඇති වෙනවාට හා තමාගේ ගෙයින් අන්‍යයන්ට ප්‍රයෝජන වෙනවාට නො කැමැති බව වූ මාත්සය්‍යීය ද අන්‍යයන් එවැනි ගෙවල්වල වාසය කරනවාට නො කැමැති බව වූ ඊර්ෂ්‍යාව ද තමාගේ ගෙය පහත් කොට කථා කරන දූෂණය කරන අය ගැන ද්වේෂය ද මෝහය ද තවත් කෙලෙස් ද හොඳ ගෙය නිසා හොඳ පන්සල් නිසා ඇති වේ. නරක ගෙයක් ඇති තැනැත්තාට ගෙය නරක් වුවද මෙය මාගේ ගෙය ය කියා තෘෂ්ණාව ඇති නොවන්නේ නො වේ. ඒ තෘෂ්ණාව නරක ගෙයි වෙසෙන තැනැත්තාටත් ඇති වන්නේ මය. අපිරිසිදු අවලස්සන නරක ගෙයි වාසය කරන්නහුට ගෙය නරක ය කියා නිතර දොම්නස ද ඇති වේ. වැස්සෙන් සුළඟින් පින්නෙන් මැසිමදුරුවන්ගෙන් මීයන්ගෙන් කරදර ඇති වන කල්හි ද දොම්නස හා හොඳ ගෙවල් ගැන තණ්හාව ද ඇති වේ. හීනමානය, සක්කාය දෘෂ්ටිය, මෝහය, ඊර්ෂ්‍යාව ආදි තවත් බොහෝ කෙලෙස් ද නරක ගෙය නිසා ඇති වේ. මෙසේ හොඳ ගෙයි සුව පහසු ඇතිව වාසය කරන්නාටත් නරක ගෙයි දුකින් වාසය කරන්නාටත් වෙනසක් නැතිව ගෙය නිසා බොහෝ කෙලෙස් ඇති වන බැවින් හොඳ ගෙවල් හොඳ භාණ්ඩ වර්ජනය කිරීමෙන් සත්ත්වයාට ශුද්ධියක් ලැබෙන බවක් තථාගතයන් වහන්සේ නො වදාළ සේක. මේ සස්නෙහි ඇතැම් භික්ෂූන් වන ගත වන්නේ නගර ග්‍රාමවල විසීමෙන් කෙලෙස් මැඩෙනවාටත් දුශ්ශීල වනවාටත් බියෙන් නොව විවේකය ලබනු පිණිසය. උමතු කම මෝඩකම ආදි තවත් කරුණු නිසා වන ගත වන්නෝ ද නැත්තාහු නො වෙති.

සේනාසනාදි ප්‍රත්‍යය සම්බන්ධයෙන් හටගත හැකි කෙලෙස් නැති කර ගැනීමට බුදුන් වහන්සේ විසින් දක්වා ඇති උපාය හොඳ දේ ප්‍රතික්ෂේප කිරීම නොව ප්‍රත්‍යවේක්ෂා ඥානය ඇති කර ගැනුම ය. බුදුන් වහන්සේගේ උපදෙස් අනුව ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් ප්‍රත්‍යය පරිභෝග කරන්නා වූ භික්ෂුවට හොඳ ගෙයි විසීමෙන් වන කෙලෙස් ද නොවේ. නරක ගෙයි විසීමෙන් වන කෙලෙස් ද නොවේ. ප්‍රත්‍යවේක්ෂාව වනාහි ප්‍රයෝජන ප්‍රත්‍යවේක්ෂාවය, ප්‍රතික්කූල මනස්කාරය, ධාතු මනස්කාරයයි ත්‍රිවිධ වේ.

Non-Commercial Distribution

ශීත නැති කර ගනු පිණිස උෂ්ණ නැති කර ගනු පිණිස මැස්සන්ගෙන් මදුරුවන්ගෙන් අව්වෙන් සුළඟින් පත් වෑ ගෝනුසු ආදි සතුන්ගෙන් වන පීඩා නැති කර ගැනීම පිණිස ඍතුවිපර්‍යාසයෙන් ඇති වන පීඩා නැති කර ගැනීම පිණිස කරදර වලින් මිදී කුශලයෙහි සිත යොදා ගෙන විසීම පිණිස මේ සෙනසුන පරිභෝග කරමියි සැලකීම මෙහෙි කිරීම ප්‍රයෝජන ප්‍රත්‍යවේක්‍ෂාව ය.

ශරීරයේ තැන් තැන් වලින් ලේ ගලන සැරව ගලන කුෂ්ට රෝගියකු ගිලන් හලක වාසය කරන්නාක් මෙන් ඨහදිය ආදි කුණපයන් වැගිරෙන ශරීරයක් ඇති මම මේ සෙනසුනෙහි වෙසෙමිය, එයින් පවිත්‍ර වූ මේ සෙනසුන ද අපවිත්‍ර වන්නේ ය යනාදීන් සැලකුම ප්‍රතික්කූල මනසිකාරය ය.

මේ සෙනසුන ධාතු සමූහයක් ය. මේ ශරීරයත් ධාතු සමූහයක් ය. ධාතු සමූහයක් වූ සෙනසුන භික්‍ෂුව ගේ ශරීරය වූ ධාතු සමූහය තමා තුළ තිබෙන බව නො දන්නේ ය. මේ ශරීරයත් තමා සෙනසුනෙහි තිබෙන බව නො දන්නේ ය. සෙනසුන ශරීරය නො හඳුනන්නේ ය. ශරීරය සෙනසුන නො හඳුනන්නේ ය යනාදීන් ප්‍රතිවේක්‍ෂා කිරීම ධාතු මනස්කාරය යි.

මෙසේ ප්‍රත්‍යවේක්‍ෂා ඥානයෙන් සෙනසුන් පරිභෝග කරන භික්‍ෂුවට හොඳ ආසාව හොඳ බඩු නිසා ඇති විය හැකි කෙලෙස් නරක ආසාව නරක බඩු නිසා ඇති විය හැකි කෙලෙස් ද ඇති නොවේ.

සෙනසුන සම්බන්ධයෙන් පමණක් නොව වස්තු හා ආහාර සම්බන්ධයෙන් ද බොහෝ කෙලෙස් ඇති වේ. වර්‍ණවත් වූ වටිනා චීවරය පරිභෝග කරන්නහුට මෙය ලස්සනය හොඳය කියා සිවුර ගැන තෘෂ්ණාවත් මාන දෘෂ්ටි ආදියත් ඇති වේ. කසට පැහැ ඇති දළ සිවුරු පරිභෝග කරන්නහුටත් මගේ සිවුරය කියා එය ගැන තණ්හාවත් මෙබඳු සිවුරු පොරවන මම විශේෂ පුද්ගලයෙක්මිය යන මානයත් දෘෂ්ටි ආදියත් ඒ සිවුර නිසා ඇති වෙයි. ප්‍රත්‍යවේක්‍ෂා ඥානයෙන් චීවර පරිභෝගය කරන භික්‍ෂුවට හොඳ සිවුර නිසාත් ඇති වන කෙලෙස් ඇති නොවේ. හොඳ සිවුරු වර්ජනය කෙලෙස් නැති කර ගැනීමේ උපාය නොවේ.

Non-Commercial Distribution

ආහාරයත් බොහෝ කෙලෙස් බොහෝ පව් කරන්නකි. ආහාර වළඳන භාජනය නිසා කෙලෙසුන් ගෙන් ශුද්ධියක් නො ලැබේ. පිඟානක් අයත් කර ගෙන ඉන්නා තැනැත්තාට මගේ පිඟානය මේ පිඟාන ලස්සනය හොඳය යනාදීන් පිඟාන පිළිබඳ තණ්හාව ඇති වේ. පාත්‍රයක් අයත් කර ගෙන ඉන්නා මාගේ පාත්‍රය ය හොඳය යනාදීන් පාත්‍රය ගැන තණ්හාව ඇති වේ. පිඟානට වඩා පාත්‍රය වටිනා දෙයක් බැවින් ඒ ගැන ඇති වන තෘෂ්ණාව පිඟාන ගැන ඇති වන තෘෂ්ණාවට වඩා දැඩි විය හැකි ය. පාත්‍රය පරිභෝග කරන්නහුට අත්තුක්කංසනයත් වැඩියෙන් ඇති විය හැකි ය. එබැවින් පාත්‍රය නිසා අමුතු ශුද්ධියක් නො ලැබිය හැකි බව කිය යුතු ය. ආහාරය සම්බන්ධයෙන් හටගන්නා කෙලෙස් වළඳන භාජනය නිසා නැති වන්නේ නොවේ. පාත්‍රයෙහි ආහාර ගන්නා වූ ද පත්කොළයෙහි ආහාර ගන්නා වූ ද වළංකබලෙහි ආහාර ගන්නා වූ ද පිඟානෙහි ආහාර ගන්නා වූ ද රන් රිදී තැටිවල ආහාර ගන්නා වූ ද සැමට ම ආහාරය සම්බන්ධයෙන් හට ගන්නා කෙලෙස් වෙනසක් නැති ව ඇති වේ. ඒ කෙලෙස් නැති කර ගැනීමට ඇත්තා වූ එකම උපාය භාජන වෙනස් කිරීම නොව ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් ආහාර වැළඳීමය. තථාගතයන් වහන්සේගේ උපදෙස් අනුව ප්‍රත්‍යවේක්ෂා ඥානයෙන් යුක්තව කෙබඳු බඳුනක ආහාර වැළඳුව ද ආහාරය නිසා හට ගන්නා වූ තෘෂ්ණාමානාදි කෙලශයෝ නුපදති. භාජන වෙනස් කිරීමෙන් හෝ ප්‍රණීතාහාර වර්ජනයෙන් හෝ ශුද්ධියක් සෙවීම අනුවණ කමෙකි.

Non-Commercial Distribution

"රිවිරැස" පුවත් ලිපිය

# සර්පයා - ගින්න - රජ කුමරා සහ සිල්වත් භික්ෂුව සමග සෙල්ලමට යන්න එපා.

දැන් පැමිණ ඇත්තේ කිසිවකුට හිස නො නමන ඔටුණු පළන් මහ රජවරුන් විසින් පවා ශක්‍රාදි දෙවියන් විසින් පවා දොහොත් මුදුන් දී වඳින උත්තමයන් වන භික්ෂූන් වහන්සේලාගේ හිසට පොලු පහර එල්ල කරන නපුරු කාලයෙකි. අප විසින් මෙය ලියන්නට සිතුයේ **භික්ෂූන් වහන්සේලා රැක ගැනීමේ අදහසින් ම නොව** බොහෝ අනිෂ්ට විපාක ගෙන දෙන භික්ෂූන් වහන්සේලාට පහර දීමේ මහා පාපය ගැන නොදැන මහ සපත් කමකැයි සිතා භික්ෂූන් වහන්සේලාට පහර දී ඒ පවින් මෙලොවත් පිරිහී මරණින් **මතු අපායට යන පුද්ගලයන්ට එහි තතු පහද දී ඔවුන් බේරා ගැනීම පිණිසය.**

භික්ෂූහු වනාහි සතුරු මිතුරු මැදහත් හැම දෙනා කෙරෙහි වෙනසක් නැතිව කරුණාව මෛත්‍රිය පවත්වන බණින්නහුට නො-බණින පහර දෙන්නහුට පහර නොදෙන සතුරන්ට සතුරුකම් නො කරන පළිගැනීම නො කරන පරම ක්ෂාන්තියෙන් යුක්ත උත්තම පුද්ගලයෝ ය. කරුණා පිණ්ඩයෝ ය. මෛත්‍රී පුඤ්ජයෝ ය.

මහජනයාගෙන් ගරු බුහුමන් ලබමින් ප්‍රණීත ආහාර පාන ලබමින් පිරිසිදු ස්ථාන වල හොඳ අසුන්වල වෙසෙමින් කයින් කිසි බර වැඩක් නො කොට වෙහෙසක් නැතිව ජීවත් වන්නා වූ භික්ෂූන් වහන්සේලා දක්නා කල්හි කිසිධර්මයක් නොදත් උන් වහන්සේලාගේ

Non-Commercial Distribution

ගුණ බිඳක් වත් නොදත් ඇතැමුන්ට උන් වහන්සේලා ගැන මහත් ඊර්ෂ්‍යාවක් ඇති වේ. ඒ නිසා ඔවුහු මහසපන් කමක් කරන ලීලාවෙන් පළිගන්න නො එන භික්ෂූන් වහන්සේලාට නොයෙක් අයුරින් අවමන් කරති. බණිති. භික්ෂූන් වහන්සේලා සතු වස්තූන් සොරා ගනිති. සඟසතු දේපලවලට අලාභහානි කරති. ඒ පව්කම් වඩ වඩා කරන ඇතැම්හු ඒවායේ විපාක වශයෙන් මහ විපත්වලට පැමිණ අසරණ වී භික්ෂූන් වහන්සේලාගේ පිහිට සොයා පසු-කලෙක විහාර ස්ථානවලට ද පැමිණෙති.පිළිවත් කාලයේ භික්ෂූන් වහන්සේට සතුරුකම් කොට පැමිණියා වූ එබඳු පුද්ගලයන් පන්නා නො දමා ඔවුන්ටත් භික්ෂූහු පිහිට වෙති. ඒ භික්ෂූන් වහන්සේගේ කරුණා මහිමය ය. මෛත්‍රී කරුණාදි මහා ගුණ ස්කන්ධයක් ඇති බැවින් භික්ෂූන් වහන්සේ දෙවියන් සහිත ලෝකයා විසින් ගරු බුහුමන් කිරීමට සුදුසු උත්තම පුද්ගලයෙකි. උත්තම පුද්ගලයකු වන භික්ෂූන් වහන්සේට පහර දීමෙන් අවමන් කිරීමෙන් අලාභහානි කිරීමෙන් සිදු වන්නේ පරලොවෙහිදී පමණක් නොව මෙලොවදී ද නොයෙක් අනිෂ්ට විපාක ගෙන දෙන මහා පාපයකි. ඌරන් කුකුලන් එලුවන් ගවයන් මැරීමෙන් සිදුවන පාපයට වඩා අතිශයින් බලවත් පාපයකි. මාපියන්ට පහර දීමෙන් සිදු වන පාපය වැනි බරපතල පාපයෙකි.

සංඝරත්නය වනාහි ශීල සමාධි ප්‍රඥා මෛත්‍රී කරුණාදි අනන්ත ගුණවලින් යුත් මහා පුද්ගල සමූහයකි. එදින පැවිදි වූ සාමණේර නමගේ පටන් සිවුරු හැඳ පොරවා ගත් තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයන් වශයෙන් පෙනී සිටින සෑම දෙනම සාමාන්‍යයෙන් තථාගතයන් වහන්සේගේ ශ්‍රාවක සංඝරත්නයට අයත් ය.

"ඒක භික්ඛුසම්මපිහි අගාරවෙ කතෙ සංඝෙ අගාරවො කතො හොති" යනුවෙන් දැක්වෙන පිරිදි සංඝරත්නයට අයත් එක් භික්ෂුවකට වුවද අගෞරව කිරීම සංඝ රත්නයට ම අගෞරව කිරීමකි. භික්ෂුවකට එක් සාමණේර නමකට වුව ද පහරදීම සංඝරත්නයට ම පහර දීමකි. අපහාස කිරීම අලාභහානි කිරීම සංඝරත්නයට ම අපහාස කිරීමකි. අලාභ හානි කිරීමකි. රජුන්

Non-Commercial Distribution

විසින් දෙවියන් විසින් පවා ගරු බුහුමන් කරන භික්ෂූන් වහන්සේ නමකට පහරදීම ආනන්තර්ය අකුශල කර්මයන්ට පමණක් දෙවෙනි වන මහා පාපකර්මයෙකි. ආනන්තර්ය කර්ම යයි කියනුයේ පොළොව පුරා භික්ෂූන් වහන්සේලා වඩාහිඳුවා මහදන් දුන්නත් තථාගතයන් වහන්සේගේ සිවුරු කොණ අල්ලා ගෙන සිටියත් බේරීමට නො හැකි මරණින් මතු ඒකාන්තයෙන් අපායට යන්නට සිදු වන මහ පව් කම් පසකට ය. එනම් මව මැරීම, පියා මැරීම, රහතුන් මැරීම, බුදුකෙනකුගේ දේහයෙහි ලේ මතු කිරීම, සංඝයා භේදකිරීම යන පව්කම් පස ය. මේවායින් සංඝභේද කර්මය පැවිද්දකුට මිස ගිහියකුට කළ නොහෙන පාප කර්මයෙකි.

භික්ෂූන් වහන්සේලාට පහරදීමේ කරදර කිරීමේ පාපය දෙවන ජාතියේ විපාක දීම නියත කර්මයක් නුවූව ද එය කළ අයට බොහෝ සෙයින් සිදු වන්නේ මරණින් මතු අපායෙහි ඉපදීමට ය. මැරෙන පුද්ගලයාට දෙවන ජාතියේ උපත බොහෝ සෙයින් සිදුවන්නේ මරණාසන්නයේ සිහි වූ කර්මය අනුවය. ලෝකයා විසින් ගරු බුහුමන් කරන රජුන් විසින් දෙවියන් විසින් ගරු බුහුමන් කරන සහරුවනට අයත් කෙනකුට පහරදීමත් වෙනත් අපරාධයක් කිරීමත් බරපතල කරුණෙකි. එය කළ තැනැත්තාට අමතක නොවන මුලු ජීවිතකාලයේ ම මතක තිබෙන කරුණක් වේ. එබැවින් කොතෙක් පින් කර ඇතත් ඔහුට මරණාසන්නයේ ඒ පාපය සිහි වේ. එයින් කළ පින් යටපත් වී ඔහුට අපායෙහි ඉපදීමට සිදු වේ.

අන්‍යයන්ට අපරාධ නො කරන කරුණා මෛත්‍රියෙන් වෙසෙන සත්පුරුෂයන් වන භික්ෂූන් වහන්සේලාට අපරාධ කරන්නවුන්ට ඒ නිසා මෙලොවදී ම සිදු වන විපත් දසයක් තථාගතයන් වහන්සේ විසින් 'වේදනං ඵරුසං ජානිං සරීරස්ස ච භෙදනං' යනාදීන් වදාරා ඇත්තේ ය.

(1) **තුන්දොස් කිපීම් වස විස ශරීරගතවීම් ආහාරය අපථ්‍යවීම් වැටීම් සැපීම් ආදියෙන් ශරීරයේ ඒ ඒ තැන්වල බෝ කල් පවත්නා සමහර විට මරණය තෙක් පවත්නා දරුණු වේදනා හට ගැනීම එක් විපතෙකි.**

Non-Commercial Distribution

**(2) බෝකල් වෙහෙසී දුකින් සපයා ගත් වස්තුව සොරුන් ගැනීම් ගින්නට හසු වීම් ආදියෙන් විනාශ වී යාම එක් විපතෙකි.**

**(3) වැටීම් ගැටීම් ආදියෙන් අත් පා ආදි කුඩා මහත් ශරීරාවයවයන් සිඳීයාම එක් විපතෙකි.**

**(4) කොරවීම් කුදු ගැසීම් අන්ධ වීම් බිහිරි වීම් පිළිකා අපස්මාර ඇදීම දියවැඩියාව නපුරු වන කුෂ්ට ක්ෂය රෝග නපුරු උණ යනාදිය එක් විපතෙකි.**

**(5) තුන් දොස් කිපීම් භූත කෝපාදියෙන් උමතු වීම එක් විපතෙකි.**

**(6) වස්තුව පැහැර ගැනීම් ගමෙන් රටෙන් නෙරපීම් තනතුරෙන් පහ කිරීම් බන්ධනාගාරගත කිරීම් ආදි වශයෙන් රජුන්ගෙන් දුක් කරදර ලැබීම එක් විපතෙකි.**

**(7) තමා විසින් නොකළ නොසිතූ අපරාධ කෙළේ ය කියා චෝදනා ලැබීම එක් විපතෙකි.**

**(8) තමාට පිහිට වීමට සමත් හිතවත් නෑයින් පිරිහී යාම, නැතිවී යාම එක් විපතෙකි.**

**(9) බොහෝ දුක් ගෙන බොහෝ වෙහෙසී සපයා ගෙන තුබූ වස්තූන් දිරායාම් සතුන් කෑම් ආදියෙන් විනාශ වීම එක් විපතෙකි.**

**(10) වාසය කරන ගෙවල් වරින්වර ගිනි ගැනීම එක් විපතෙකි.**

භික්ෂූන් වහන්සේලාට කරදර කිරීමේ පවින් උන්වහන්සේලා සතු වස්තු සඟසතු වස්තු සොරකම් කිරීමේ පවින් නපුරු රෝග වැළඳී බොහෝ කල් දුක් විඳ අකාලයේ මිය ගියා වූ ද නො මළා වූ වාසය කළ නො හැකි වී ගම හැර ගියා වූ ද කෝලාහල වලින් තුවාල ලැබූවාවූ ද උමතු වූ ද සර්පයන් දෂ්ට කරනු ලැබූවා වූ ද ටික දෙනකුන් ගැන අපිදු දැන ගතිමු. විපතට පත් වූ ඒ අය නම් ඒ කාරණය දැන නො ගන්නට ඇතැයි සිතමු.

Non-Commercial Distribution

**භුජංගමං පාවකඤ්ච**
**ඛත්තියඤ්ච යසස්සිනං**
**භික්ඛුං ච සීල සම්පන්නං**
**සම්ම දෙව සමාචරෙ.**

සර්පයා සමගත් ගින්න සමගත් යසස් ඇති රජ කුමරුවා සමගත් සිල්වත් භික්ෂුව සමගත් හොඳින් හැසිරිය යුතු ය. සෙල්ලමට නොයා යුතු ය යනු එහි අදහස ය. සිල්වත් භික්ෂුවය කියනුයේ බණින්නහුට නොබණින කෝලාහලයට එන්නවුන් හා කෝලාහලයට නො යන පහර දෙන්නහුට පහර නො දෙන ඉවසන ස්වභාවය ඇති භික්ෂුවය. එබඳු භික්ෂුවට අවමන් කිරීමෙන් වන විපත සර්පයන්ගෙන් ගින්නෙන් රජ කුමරුන්ගෙන් වන විපතට වඩා ඉතා මහත් ය. එවැනි භික්ෂුවගේ ශීලතේජස ඉතා තියුණු ය. ඉතා බලවත් ය. ඒ භික්ෂුන් වහන්සේට අවමන් කළ තැනැත්තන්ගේ දරු මුණුපුරන්ට පවා ඒ අපලය ඇති වන බව තථාගතයන් වහන්සේ විසින් වදරා ඇත්තේ ය. පරෙස්සම් වෙත්වා.

## සඟරුවන ට දේශපාලනය සුදුසු නැ.

නොයෙක් විට භික්ෂූන්ට නොයෙක් කරදර විඳින්නට නින්ද ලබන්නට ගුටි බැට කන්නට සිදු වන්නේ දේශපාලනයට යෑමෙනි. දේශපාලනය භික්ෂූන් වහන්සේලාට සුදුසු වැඩක් නොවේ. බුරුමයේ නම් භික්ෂූන්ට දේශපාලන වැඩවල යෙදීම නීතියෙන් ම තහනම් ය. ගිහි ගෙය හැර පැවිදි වන්නේ එක් පවුලක් පාලනය කිරීමත් නිවන් දැකීමට බාධාවක් නිසා ය. පැවිද්ද ලබා ගන්නේ ද සබ්බ දුක්ඛ නිස්සරණ නිබ්බාන සච්ඡිකරණත්ථාය යනා දි වැකියකින් සියලු දුකින් මිදුණු නිවන පසක් කර ගැනීම සඳහා මා පැවිදි කරන්නටය කියා මහතෙර නමකගෙන් ඉල්ලීමෙනි. එසේ පැවිද්ද ලබා ගත් තැනැත්තා එය අමතක කොට රට ම පාලනය කරන්නට සූදනම් වීම බොහෝ දුරට නොමඟ යෑමෙකි. එය නුවණැතියන් ගේ සිනහවට කරුණෙකි.

බොහෝ දෙනා දේශපාලන වැඩට බසින්නේ ඒ වේලාවේ දී තමන් වැඩ කරන තැනැත්තාගෙන් යම් කිසිවක් ලබා ගැනීමේ

Non-Commercial Distribution

හා ඔහුට ඒ පක්‍ෂය ට ජය අත් වුවහොත් අනාගතයේදී යම් කිසිවක් ලබා ගැනීමේ ආශාවෙනි. ලෝභ චේතනාවෙන් කරන එය අකුශල පක්‍ෂයට අයත් ය. භික්ෂූන්ට නොගැළපෙන ක්‍රියාවෙකි. රැස්වීම් වලට ගොස් විරුද්ධ පක්‍ෂයේ අයගේ ඇති ගුණ අවලංගු කිරීමත් මහත් ගුණ සුලු කොට දැක්වීමත් බණ පොත් වල මක්ඛ යන නාමයෙන් දැක්වෙන පව් කමය. නොයෙක් අගුණ කියා නැති අගුණ ඇති කොට කියා පුද්ගලයකුට හෝ පක්‍ෂයකට පහර ගැසීමත් භික්ෂූන්ට නො ගැළපෙන පව් කමෙකි. පුද්ගලයකුට හෝ පක්‍ෂයකට වාසි ලබා දීම සඳහා ජනයා භේද කිරීමත් භික්ෂූන්ට කොහෙත් ම නො ගැළපෙන පාප ක්‍රියාවෙකි. බොරු සැබෑ මිශ්‍ර කර තමන්ගේ වාසියට කථා කිරීමත් භික්ෂුවට නො ගැළපෙන හීන ක්‍රියාවෙකි.

එක් පක්‍ෂයකට වැඩ කරන භික්ෂුව කෙබඳු කෙනකු වුවත් එය විරුද්ධ පක්‍ෂයේ අයට ඉතා අප්‍රිය ය. ඔවුහු ඒ භික්ෂුවගේ නම පවා හරියට කියන්නට, සුදුසු පරිදි හාමුදුරුවෝ, ස්වාමීන් වහන්සේ යන වචන යොදා කථා කිරීමට නො කැමැති වෙති. ගිහියන් ගැන කථා කරන්නාක් මෙන් භික්ෂුවගේ නම පමණක් කියා කථා කරති. සමහරු නමවත් හරියට නො කියා විකෘති කොට කථා කරති. සමහරු විසුළු නම් යොදා ගෙන කථා කරති. ඌ, අරූ, මූ, ඕකා. මේකා යනාදි ඉතා පහත් වචන වලින් ද භික්ෂුව ගැන කථා කරති. ඒවායින් දේශපාලක භික්ෂූන් නිසා බොහෝ දුරට සංඝ ගෞරවය ද පිරිහේ. දේශපාලනයට යන භික්ෂූන්ට ඒ වේලාවට එයින් සුළුසුළු ලාභ ලැබෙන්නට බැරි නැත. එහෙත් එයින් බුදු සසුනටත් ගිහි සමාජයටත් ඉමහත් හානියක් බව කිය යුතු ය. භික්ෂු ගෞරවය නැති වී යාම භික්ෂූන්ගේ තත්ත්වය පහළයාම බුදුසසුනට වන හානිය ය. භික්ෂූන් වහන්සේලාට අගෞරව කොට අවමන් කොට ඒ පවින් අපාගත වීමට සිදු වීම බෞද්ධ ගිහි ජනයාට වන මහා හානිය ය. එබැවින් දේශපාලනයෙන් වැළකී සිටින ලෙස සියලු ම භික්ෂූන් වහන්සේලා ගෙන් ඉල්ලමු.

Non-Commercial Distribution

"ජාතිය" පුවත් ලිපිය

# ජාතික අනන්‍යතාව

සිංහලකම හා බෞද්ධ කම ගැන කථා කිරීම නිදහස ලද ද සිට ජාතිවාදී ලේබලය පැළඳ ගැනීමට සුදුසු කමක් විය. මූලික කටයුතු ඉටු නොවී බුද්ධ ජයන්තිය වැනි කටයුතු වලට රජයේ සහනයන් සැලසීම, පණ අදින ලෙඩකුට තව ටිකක් ජීවත් වීමට බෙහෙතක් සැපයීමක් වැනි විය.

එද නාහිමියන් දුටු පරිදි ම මිෂනාරී ආක්‍රමණයන් හා ද්‍රවිඩ බලපෑම් නිසා සිංහල බෞද්ධයා අකර්මණ්‍ය වී ඇත. චින්තනයෙන් ද ආර්ථිකයෙන් ද ගැති බවට පත්ව සාම්ප්‍රදායික ජීවන රටාවෙන් වෙන්ව අසාර්ථක තරහයක යෙදී තමන් හෙම්බත්ව අනුන් පෝෂණය කරන තත්ත්වයට ඔවුන් ඇද වැටී ඇත.

ජාතිය සමගි කළ නොහැකි වූ භික්ෂූන් වහන්සේ ද ඒ ඒ දේශපාලන පක්ෂවල ගැත්තන් බවට පත්ව ජාතිය භේද භින්න කරති. කැකුණ තලන හබන් කුකුලන් අස්සේ ඌරෝ පිනුම් ගසති. එකතු වන්නට නොහැකි මහජාතියක නියමුවෝ බලය රැක ගැනීමට සුළු ජාතීන්ට අත පාති.

ජාවා සුමාත්‍රා ආදී බෞද්ධ රටවල් අබෞද්ධ වූවා සේම අප ද ඒ මග ගමන් ගනිමින් සිටිමු.

මේ ලිපිය, ජාතික අදහස් පිළිබඳව රේරුකානේ හිමියන් 1955 - 01 - 18 දින "ජාතිය" පුවත්පතෙන් කළ අදහස් දැක්වීම ඔබට ඉදිරිපත් කරයි.

**සංස්කාරක**

*Non-Commercial Distribution*

# සැප නින්දට කාලයක් නෑ
# නිදා උන්නොත් මරණය

බුද්ධාගමය සමග උපන් බුද්ධාගමය සමග ජීවත් වන බුද්ධාගමය සමග මැරෙන ජාතියකි සිංහල ජාතිය!

බුද්ධාගමයේ මරණය සිංහල ජාතියේ මරණය ය.

මිනිසා සෙමින් මරණ පරංගි රෝගයත් ලාදුරු රෝගයත් බඳු නපුරු රෝග දෙකක් සිංහල ජාතියට වැළඳී තිබේ.

ඉන් එකක් නම්, ක්‍රිස්තියානි මිෂනාරි රෝගය ය. අනික ඉන්දියානු දෙමළ රෝගය ය. ප්‍රතිකාරයක් නො කළ හොත් මේ රෝග දෙකින් එක එකක් ම ශතවර්ෂයකින් මොබ බුද්ධාගමයත් සිංහල ජාතියත් නැසීමට සමත් ය.

### ක්‍රිස්තියානි සිංහලයෝ

අතීතයේ අප රටේ එක ද ක්‍රිස්තියානි කාරයෙක් නො වීය. දැන් ලක්ෂ සතකට වැඩි ගණනක් ක්‍රිස්තියානි කාරයෝ අප රටේ වෙසෙති. ඒ ගණනින් ලක්ෂ සයකට අධික සංඛ්‍යාවක් සිංහලයෝ ය. ඒ ක්‍රිස්තියානි සිංහලයන් ගෙන් කොටසක් මිෂනාරීන් විසින් උපායෙන් ක්‍රිස්තියානියට හරවා ගත් බෞද්ධයෝ ය. අනික් කොටස එසේ හරවා ගත් බෞද්ධයන් ගෙන් පැවතෙන්නෝ ය. අපේ සිංහල බෞද්ධයන්ගෙන් මෙතරම් විශාල සංඛ්‍යාවක් ක්‍රිස්තියානියට හසු වී යාම සිංහල බෞද්ධයන්ට වූ ඉමහත් පරාජයකි.

ක්‍රිස්තියානි පූජකයන් හට මෙ තරම් තද පහරක් සිංහල ජාතියට ගසන්නට ලැබුණේ ආණ්ඩුව ක්‍රිස්තියානි වීමත් රජයේ බස පාදිලි බස වීමත් නිසා ය.

*Non-Commercial Distribution*

## ක්‍රිස්තියානි අධ්‍යාපනය

දැන් අප රටේ අධ්‍යාපනයත් ක්‍රිස්තියානි කාරයන් අතේ ය. ආණ්ඩුකාර ධුරයේ පටන් රජයේ උසස් තනතුරුත් ඔවුන් අතේ ය. ධනයත් ඔවුන් අතේ ය. බෞද්ධයෝ දුප්පත් කමේ පරමාන්තයට පැමිණ සිටිති.

දැන් ඔවුන්ට ඇත්තේ කිරි පිහියත් කැත්තත් උදැල්ලත් ය. සර්වප්‍රකාරයෙන් බලයට පත්ව සිංහල බෞද්ධයාගේ කරට නැඟ සිටින පාදිලිවරු දැන් නා නා උපාය යොදා පෙරට වඩා පුළුල් අන්දමින් සිංහල බෞද්ධයන් ක්‍රිස්තියානියට හැරවීම කර ගෙන යති. දිළිඳු කමින් පීඩිත වූ සිංහල බෞද්ධයෝ රක්‍ෂාව නිසා ද දරුවන්ට උගන්වා ගැනීම නිසා ද නො කැමැත්තෙන් වුව ද ක්‍රිස්තියානියට හැරෙති.

පාදිලි කෙනකුගෙන් ලියුමක් ගතහොත් රක්‍ෂාව ලැබිය හැකිය යන කතාව අද රටේ නොයෙක් තැනදී අසන්නට ලැබෙන්නකි. බෞද්ධ රටේ පාදිලි බලය වැඩී තිබෙන තරම එයින් ද වටහා ගත හැකි ය.

## හොඳම උපාය

පල්ලියෙන් හා පාදිලි වරුන්ගෙන් ක්‍රිස්තියානි ජනයා වෙන් කර දැමීම ක්‍රිස්තියානිය නැති කිරීමේ හොඳම උපාය ය. පන්සලෙන් හා භික්ෂූන් වහන්සේගෙන් බෞද්ධ ජනයා වෙන් කර තැබීම බුද්ධාගම වැනසීමේ හොඳම උපාය ය. දැන් ඒ උපාය ක්‍රියාවෙහි යොදා පෙර පන්සල් වල පැවති අධ්‍යාපනය නැති කර සිංහල බෞද්ධයෝ පන්සලෙන් හා භික්ෂූන් වහන්සේගෙන් වෙන් කරනු ලැබ සිටිති. එබැවින් අද ලක්‍ෂ ගණනක් බෞද්ධයෝ නමින් පමණක් බෞද්ධව ක්‍රිස්තියානියට ද නො ගොස් වැට උඩ හිඳිති. මිෂනාරී ඇම කැවුණු විගස වැට උඩ ඉන්නා ඒ බෞද්ධයෝ ද ක්‍රිස්තියානියට හැරෙනු නො අනුමානය.

Non-Commercial Distribution

## සිද්ධස්ථාන මත කුරුසිය

මිනිසකුට ලක්‍ෂයක් හම්බ කිරීම දීර්ඝ කාලයක් ගතවන අමාරු වැඩකි. ලක්‍ෂය ලැබූ තැනැත්තාට දෙලක්ෂය කර ගැනීමට වැඩි කලක් නුවුවමනා ය. එසේ ම දෙලක්‍ෂය පන් ලක්‍ෂය කිරීමටත් පන් ලක්‍ෂය දශ ලක්‍ෂය කිරිමටත් දශ ලක්‍ෂය කෝටිය කිරීමටත් දිගු කලක් වුවමනා නැත.

එමෙන් දැනට ලක්‍ෂ හයක් පමණ බෞද්ධයන් ක්‍රිස්තියානියට හරවා ගැනීමෙන් ජන බලයෙන් ද ධන බලයෙන් ද රජයේ බලයෙන් ද පරම බලයට පැමිණ සිටින පාදිලි වරුන්ට ඉතිරි බෞද්ධ ජනතාව ද දුබල කොට ක්‍රිස්තියානියට හරවා ඉවර කරන්නට වැඩි කලක් වුවමනා නැත. මිෂනාරි රෝගයට ඔරොත් දෙන සැටියට බෞද්ධ ජනතාව සංවිධානය නුවුවහොත් 2600 වන විට මේ ලක් බිමේ බුද්ධාගමයේ ඇටසැකිල්ල වූ ගල් ගොඩවල් ගඩොල් ගොඩවල් පමණක් දැකිය හැකි වනු ඇත. ඒවා මත ද ක්‍රිස්තියානි කාරයන්ගේ කුරුසිය නැග සිටිනු ඇත.

## සංවිධානයට කාලය යි මේ

නායක හාමුදුරුවරුනි, පරිවේණාධිපති වරුනි, තරුණ භික්ෂුවරුනි, පැමිණෙන විපත ඉතා භයානක ය. දැන් ඔබතුමන්ලාට සැප නින්දට කාලය නො වේ. බෞද්ධ ජන නායකයෙනි! බෞද්ධයෙනි! දැන් නින්දට කාලය නොවේ. වහ වහා සංවිධානය වනු මැනවි. නිද සිටියහොත් බුද්ධාගමයේත් සිංහල ජාතියේත් මරණය නියත ය.

බුද්ධ ජයන්තියේත් එක්තරා බලයක් ඇත්තේ ය. ඒ බව දැනට පවත්නා බෞද්ධ ප්‍රබෝධයෙන් පෙනේ. එහෙත් බුද්ධ ජයන්තිය වෙනුවෙන් අප විසින් දැනට කර ගෙන යන වැඩ, මුල් පණුවන් කමින් තිබෙන ගසක අතුපතර සැරසීමක් වැනි ය. එබැවින් ඒවායින් ඒ වේලාවට බුද්ධාගමයේ බැබලීමක් වීම මුත් අනාගතයට රැකීමක් නොවේ. මේ අවස්ථාවේදී අප විසින් ප්‍රධාන වශයෙන් කල්පනා කළ යුත්තේ බුද්ධාගමය මැරෙන්නට නො දී රැක ගැනීම ගැන ය.

Non-Commercial Distribution

## පාදිලි බස

පාදිලිවරුන් හට බුද්ධාගම මරන්නට බොහෝ උපකාර වූයේ රජයේ බස ය. පාදිලි බස රජයේ බස වී තුබුණ හොත් බුද්ධාගම රැක ගැනීම අති දුෂ්කර ය. එබැවින් බුද්ධාගම රැක ගැනීමේ මුල් පියවර වශයෙන් අපට කරන්නට තිබෙන්නේ රජයේ බස ලංකාවේ වැඩි දෙනා ව්‍යවහාර කරන සිංහල බස කර ගැනීමත් පන්සල් වලින් උදුරා ගත් අධ්‍යාපනය නැවත ලබා ගෙන ඉඩ ඇති හැම පන්සලක ම පාසලක් ඇති කිරීමත් ය.

ඉංග්‍රීසි ආණ්ඩුව තුබුණා නම් මැරෙන්නට නොදී බුද්ධාගමය රැක ගන්නවා නො අනුමානය. ඔවුන් එසේ කරන්නේ අපට ඇති ආදරයක් නිසා නොව රට භේද කර තැබීමට ඔවුන් කැමති නිසා ය.

අපේ වර්තමාන ආණ්ඩුව සිංහල ජාතියට හා බුද්ධාගමට කුමක් කෙරේ ද යන බව තීරණය කර ගත හැකි වන්නේ රාජ්‍ය භාෂා ප්‍රශ්නය විසඳන සැටියෙනි.

අපේ ආණ්ඩුවෙන් හැටපන් ලක්‍ෂයක් පමණ ඉන්නා සිංහලයන් ගේ බසත් නව ලක්‍ෂයක් පමණ වන ලංකා දෙමළුන් ගේ බසත් සමතන්හි තැබුව හොත් එය දුටුගැමුණු රජ කාලයේදී දහස් ගණනින් දස දහස් ගණනින් සිංහල ජීවිත පුද සිංහල ලේ වගුරුවා දෙමළුන්ගෙන් බේරා ගත් මේ රට නැවතත් දෙමළුන්ට පාවා දීම කී. එය කෙරුණ හොත් සිංහල ජාතියේ ආයුෂය හොඳට ම කෙටි වනු ඇත.

## රෝග දෙක

ඉහත කී රෝග දෙකින් සිංහල ජාතියත් බුද්ධාගමත් බේරා ගන්නට නම් මේ කාලයේදී ම ඒ ගැන ක්‍රියා කළ යුතුය. තවත් අවුරුදු විස්සක් තිහක් ගත වුවහොත් ඒ රෝග වලින් බේරා ගත නොහෙන අන්දමට සිංහල ජාතිය දුබල වනු ඇත. බුද්ධාගමයත් සිංහල ජාතියත් මැරෙන්න අරිනවාද බේරා ගන්නවාද යන්න දැන්ම ම තීරණය කර ගත යුතු කරුණකි.

Non-Commercial Distribution

අතීතයේ නොයෙක්වර මෙ බඳු උවදුරු වලින් සිංහල ජාතිය බේරා ගෙන තිබෙන්නේ පැවිදි පක්‍ෂය ඉදිරිපත් වීමෙනි. සංවිධානය වුවහොත් මේ උවදුරු දෙකින් ම රට බේරා ගැනීමේ ශක්තිය පැවිදි පක්‍ෂයට ඇත්තේ ය. **ඒ ශක්තිය ක්‍රියාවේ යෙදිය හැකි වීමට පැවිදි පක්‍ෂයට ඇත්තේ එක්සත් වීම පමණකි**.

මුළු රටේ ම සිටින භික්ෂූන් වහන්සේලා එක්සත් වී එක බසකට එක අණකට ක්‍රියා කරන්නට පටන් ගත හොත් සංඝ බලයෙන් මෙහි නො කළ හැකි දෙයක් නැත. මහා සංඝයා වහන්සේ දැනට ඉන්නා සැටියටම තම තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය පමණක් බලමින් නිකාය වශයෙන් හා තවත් ක්‍රම වලිනුත් බෙදී උදාසීනව විසුව හොත් සංඝ රත්නයත් සමගම සිංහල ජාතිය ශත වර්ෂයක් තුළදී වඳවී යන්නට බැරි නැත.

මේ ගැන මහා සංඝයා වහන්සේ ද බෞද්ධ ගිහි පින්වත්හු ද කල්පනා කරත්වා.

Non-Commercial Distribution

# විනයාලංකාර සම්ප්‍රදාය

සැරියුත් මුගලන් පරම්පරානුයාතව සිල්වත් ගුණවත් බව ආරක්‍ෂා කරමින් ථෙරවාදී න්‍යාය පිළිගැනීම (ශ්වේජින් නිකායික) විනයාලංකාර සම්ප්‍රදයයි.

අල්පේච්ඡතාව හා නො ඉල්ලීම වැනි ලක්‍ෂණ එහි ගුණයෝ ය.

එතෙක් මෙතෙක් පැවති විනයාලංකාර සම්ප්‍රදය පැවසුණු තැනක් ලෙස විහාර කර්‍මාන්තයේදී නිකුත් කළ අය වැය ලේඛණයෙන් උපුටා ගත් පුණ්‍යානුමෝදනාව ඉදිරිපත් කරමු.

අද දක්වා සිදු කර ඇති විහාර සංවර්ධනයේදී මේ පිළිවෙත නොකඩා ඇති බවත්, එහෙත් විනයානුකූල දිවිපෙවෙතක් ගත කිරීම තුළින් දයක - කාරකාදින් සියලු අවශ්‍යතා ඉටු කර ඇති බවත් සටහන් කරනු රිසිමි.

**සංස්කාරක.**

Non-Commercial Distribution

විනයාලංකාර විහාර කර්මාන්ත

# පුණ්‍යානුමෝදනාව

'පුඤ්ඤං සුඛං ජීවිත සංඛයම්හි'
දිවි කෙළවරදී සැපය පිණිස පවත්නා එක ම දෙය පිනය.

විහාර යනු තථාගතයන් වහන්සේට වැඩ විසීම පිණිස කරවා තිබෙන මන්දිරයන්ට මෙකල ව්‍යවහාර කරන නාමය ය. අජීවමාන බුදුරජාණන් වහන්සේට වැඳුම් පිදුම් කිරීමෙන් ජීවමාන බුදුන් වහන්සේට වැඳුම් පිදුම් කරන්නා සේ ම පින් සිදු වන්නාක් මෙන් අජීවමාන බුදුන් වහන්සේ උදෙසා විහාර කරවන්නා වූ පින්වතුන්ට ජීවමාන බුදුවරයන්ට විහාර කරවීමෙන් ලැබෙන පිනට සමාන පිනක් ලැබෙන්නේ ය. බුදුවරයකු උදෙසා විහාරයක් කරවීමෙන් පමණ නො කළ හැකි තරමට මහත් වූ පුණ්‍යසම්භාරයක් රැස් වන්නේ ය. එබැවින් විහාරයක් කරවීමට සහභාගිවන්නට ලැබීම එයට සහභාගි වන සැදැහැවතුන්ට මහත් භාග්‍යයෙකි.

සැදැහැවත් බෞද්ධයෝ අත්‍යුත්තම අතිපරිශුද්ධ තථාගතයන් වහන්සේට පූජා කිරීමේදී තමන්ගේ ප්‍රයෝජනයට ගන්නා දේවලට වඩා උසස් දෙයකින් ම පිදීමට සැමකල්හි උත්සාහ කරති. බුදුන් වහන්සේ උදෙසා විහාරයක් කරවීමේදී එය සාමාන්‍ය මනුෂ්‍යයන් ගේ වාසය සඳහා කරන ගෙයකට වඩා උසස් ලෙසින් කරවීමට උත්සාහ කරති. ජේතවනාරාම විහාරය සඳහා අනේපිඬු මහ සිටුහු සිවුපනස් කෙළක් ධනය වියදම් කෙළේ ද, විශාඛා මහා උපාසිකාව පූර්වාරාම විහාරය සඳහා අටොළොස් කෙළක් ධනය වියදම් කෙළේ ද එහෙයිනි. පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයෙහි කරවන ලද මේ අභිනව විහාර මන්දිරය ද ඒ බෞද්ධ චාරිත්‍රය වූ

Non-Commercial Distribution

පරිදි බුදුන් වහන්සේට යෝග්‍යවන පරිදි ශක්ති පමණින් උසස් ලෙස කරවන ලද්දකි.

මෙකල විහාර කරවන්නවුන් විසින් බුදුන් වහන්සේට පූජාවක් කිරීම සමග ම තවත් බලාපොරොත්තු වන කරුණක් නම් බොහෝ දෙනාට පින් සිදු කර ගැනීමට සැලැස්වීම් වශයෙන් ලොවට ද යහපතක් කිරීම ය. විහාරයක් කරවා තැබූ කල්හි එහි පැමිණ වැඳුම් පිදුම් කොට බොහෝ ජනයා පින් සිදු කරගෙන සගමොක් සැප ලබති. විහාර නැති කල්හි මහජනයාට ඒ පින සිදු කර ගැනීමට මග නැති බැවින් විහාර කරවන්නෝ මහජනයාටත් පින් ලබා දෙන්නෝ ද සගමොක් සුවය ලබා දෙන්නෝ ද වෙති. ඒ කාරණයෙන් ද විහාර කරවන්නෝ මහත් වූ පිනක් ලබති. ශ්‍රී විනයාලංකාරාරාමයෙහි කරවා තිබෙන මේ විහාරය කිසි ම බාල ද්‍රව්‍යයක් නො යොදවා ඉතා හොඳ ද්‍රව්‍යයන් ම යොදවා පරම්පරා ගණනක් පවත්නා ලෙස කරවන ලද්දකි. එබැවින් පරම්පරා ගණනක් ගතවනතුරු ලක්‍ෂ සංඛ්‍යාත ජන සමූහයක් මේ විහාරයට පැමිණ වැඳුම් පිදුම් කොට පින් සිදු කරගනු නො අනුමානය. එබැවින් මේ විහාර කර්මාන්තය කරවූ එයට සහභාගි වූ පින්වත්හු බොහෝ දෙනාට පින් ලබා ගැනීමට උපකාරවීමේ කුසලය ද විශාල ලෙස ලබන්නාහ. මෙබඳු උතුම් වැඩවලට තමන් සපයන ධනය වියදම් කිරීම ධනයෙන් ලැබිය හැකි උසස් ම ප්‍රයෝජනය ලැබීමය.

කාලයේ සැටියට රුපියල් සතලිස් දහසක පනස් දහසක පමණ වටිනා කමක් පෙනෙන මේ විහාර මන්දිරය නිමවන ලදුයේ බෞද්ධ මහජනයා ගෙන් ලත් ආධාර වලිනි. **එහෙත් මේ කර්මාන්තයට ආධාර ලබනු සඳහා බණ පින්කම් පිරිත් පින්කම් එකකුදු නොකරන ලද්දේ ය. සල් පිල් නොපවත්වන ලද්දේ ය. තෑගි තියම කොට ආධාර පත්‍රිකා නොතිකුත් කරන ලද්දේ ය. ආධාර නොකොට මඟ හැරිය නොහෙන උපක්‍රම යොද කිසිවකු ගෙන් කිසිම ආධාරයක් මේ කර්මාන්තය සඳහා නොගන්නා ලදදේ ය.** මේ විහාර කර්මාන්තය සම්පූර්ණයෙන් ම කරවා තිබෙන්නේ ශුද්ධ ශ්‍රද්ධාවෙන් ම මහජනයා විසින් කරන ලද පරිත්‍යාග වලිනි. විහාර කාරක දයක සභාව කෙරෙහි විශ්වාසය තබා මහජනයා විසින් මෙයට ඉතා ඕනෑ

Non-Commercial Distribution

කමින්ම ආධාර දුන් බැවින් ඉතා කෙටි කාලයකින් ම විහාර කර්මාන්තය නිම කළ හැකි විය. එය මෙයට ආධාර කළ සැම දෙනාගේ ම ප්‍රීතියට හේතු වනු ඇත. ශුද්ධ ශ්‍රද්ධාවෙන් ම මේ විහාර කර්මාන්තයට මුදලින් හා ද්‍රව්‍ය වලින් ද ආධාර කළා වූ සියළු ම පින් වත්හු අති පරිශුද්ධ අති ශ්‍රේෂ්ඨ පුණ්‍ය සම්භාරයක් රැස් කර ගත්හ. එහි වටිනා කම මෙතෙකැයි පමණ කළ නො හැකිය. මෙයට සහභාගි වීමෙන් පින් ලබා ගත්තා වූ සියල්ලෝ ම ඒ පින් බෙලෙන් සසර වසනා තාක් කිසි කලෙක අපායකට මිසදිටු කුලයකට අසත්පුරුෂ සේවනයකට නොවැටී දෙව් මිනිස් දෙගතියෙහි ම මතු සංසාරයේදී ඉපද මතු මතු ද මෙසේ ම පින්කම් කිරීමෙන් පෙරුම් දහම් පුරාගැනීමෙන් තම තමන් විසින් ප්‍රාර්ථනය කරන බෝධියකට පැමිණීමෙන් අමාමහ නිවන් පුරයට පැමිණෙත්වා යි ප්‍රාර්ථනය කෙරෙත්වා!

මීට - ශාසනස්ථිතිකාමී,

**රේරුකානේ චන්දවිමල ස්ථවිර.**

1952 - 10 - 30

පොකුණුවිට

ශ්‍රී විනයාලංකාරාරාමයේදී ය.

"විනයාලංකාර සම්ප්‍රදය" යන මාතෘකාව යටතේ ම පහත සඳහන් පොත් වල අදාල ලිපි කියවන්න.

"අභිධර්මයේ මූලික කරුණු" - **අභිධර්මය පසුකාලීනද?**

"පටිච්ච සමුප්පාද විවරණය" - **අන්තරාභවය හා පුනර්භවය**

"බෝධි පූජාව" - **ධර්ම චක්‍රය**

"පාරමිතා ප්‍රකරණය" - **පඤ්ච ශීලය හා ආජීවාෂ්ඨමක ශීලය**

Non-Commercial Distribution